

kathapothak.blogspot.com

# සමනළයෙකුගෙන් පාට ඇසුවෙමි

ගංගා ෂයිනි ගමගේ

kathapothak.blogspot.com

කඳුළු දෙනෙත් මාගේ
වසන්තයක් වාගේ
ජීවිත සිතළ හිමිගේ
රත්තරං ඉරක් වාගේ
ඔබ පහළ වුණා සත්තයි
මම දිවුරා පවසන්නම්
මම වසග වුණා සත්තයි
මාවම අමතක කරමින්

# 01

**පහන්** පැලට ගිනි ඇවිලිණි. මට දැනුණේ මගේ මුළු ජීවිතයටම, මුළු මහත් අනාගතයටම ගිනි ඇවිළුණා සේ ය. මම ඉකි බිඳ බිඳ හැඬුවෙමි.

"දැන් ඉතිං මය ඇඬුව මදෑ... අපි වෙන පහන් පැලක් හදාගමු."

කාමරයට කර පෙවූ අම්මා කීවා ය. ඇය දුකෙන් බව මම හඬෙන්ම හැඳින ගතිමි. අම්මා දුක් වන්නේ මා මෙසේ හඬා වැටීම ගැන මිස පහන් පැලට ගිනි ඇවිලීම ගැන නොවේ. කම්මලේ බල්ලාට සේ, අම්මාට තියෙන්නේ දුකට පදම් වූ හදවතකි. අහිමි වූ - නොලැබී ගිය දේවල් මත්තේ හඬන්නට ගියා නම් ඇ මුළු ජීවිතයම හඬමින් ගත කළ යුතු වනු ඇත. වෙනසක් උවමනා වූයේ මට ය. වෙනසත් වෙනුවෙන් පැතුමක් පැතුවේ මා ය. ගිනි ඇවිළුණේ මගේ පහන් පැලට ය.

"ආර්යා... බත් කටක් කාල නිදා ගනිංකො පුතේ. දවල්ටත් කෑවෙ පාන් පෙත්තක් විතරනෙ..."

මගේ දුප්පත් අම්මාගේ අහිංසක කටහඬ ආයෙමත් කාමරය පාමුලින් ඇසිණි. දවල් නොකෑවත් මට කිසි කුසගින්නක් දැනුණේ නැත. හිතේ ගින්දර අභියස දී කුස ගින්දර වූ කලී කදෝපැණියෙකි. ඒ වුනාත් අම්මාගේ හිත රිදවන්නට බැරි කමට යාන්තමින් බත් දෙකටක් කෑ මම, අයේම වතාවක් අපේ ගෙදරට තියෙන එකම

එක අඳුරු කාමරයේ වන කබල් ඇඳට වැටී ගුලි ගැසුණෙමි.

''තාම... මේ... නො... දිරනා... කුණු... ක... ය... දිරනා...''

නැමදුමක් සේම අදත් තාත්තාගේ බීමත් කැකෝස්සම කවුල්ල පැත්තෙන් ඇසිණ. මම දෑස තද කොට පියා දෑතින් දෙසවනත් වසා ගත්තෙමි.

අපේ තාත්තා රැකියාව වශයෙන් කළේ මේසන් බාස් කෙනෙකුට අත් උදව් දීම ය. හෙතෙම දෛනිකව ලබන්නේ සොච්චමක් විද, ඉන් අපට වේලක් ඇර වේලක් එකක් එක්ක හෝ බත් ටිකක් හා සතුටින් ජීවත් වෙන්නට බැරි කමක් නැත. නමුත් තාත්තා උපයන එකෙන් වැඩි කොටසක් වැය කරන්නේ බීමතට ය. මිත රැයේ කටගොන්නක් බීගෙන ගෙට ගොඩ වෙන හෙතෙම, පාදුරේ නිදි ගන්නවා නම් ඒකත් එකකි. පොඩි දෙයක් හෝ අල්ලාගෙන අම්මාට බැණ වදින තාත්තා බොහෝ දිනවල ඇයට අතින් - පයින් ද පහර දෙයි. කොයි තරම් ගුටි කැවත් අම්මා අපට ඇහෙන්නට නම් තාත්තාට දොසක් කියන්නේ නැත. නුගත් ගැමි ගැහැණියක වන අම්මා, පහළ පාන්තික මිනිසෙකු වන තාත්තා එක්ක දිග ඇවිත් අසිමිට වූ නගරයේ අන්ත අසරණියක වී හිඳින්නිය. ඒත් ඇයට සෙනෙහස පිරුණු හදවතක් තියේ. අම්මා ගැන මට මේ තරම් දුක හිතෙන්නේත් ඒකම ය.

කෙළවරක් නැති සිහිවිලි ලෝකයක කරවටක් ගිලී දුක් විඳිමින් සිටි මට නින්ද යන්නට ඇත්තේ මැදියම් රැයත් ගතව ගිය ඉක්බිතිව විය යුතු ය. පළි මා අවදි වූයේ ''ආර්යා... ආර්යා... පුතේ...'' කියමින් අම්මා මගේ ඉසටියෙන් අල්වා සොලවා කතා කරද්දී ය.

''පුතාගෙ අර යාළුව ඇවිත්.''

විදුලියක් වැදුණා සේ නැගිට මම ඇඳේ හිඳ ගතිමි.

''කව්ද...? හංසි ද...?''

''ඔව්. ඒ ළමය තාම වාහනේ. මං ගෙටවත් එන්න කිව්වෙ නෑ.''



ඔවුන් සිටින සිටු මැඳුරුවල හැටියට, හංසිලාට අපේ පැල්පත්වලට පය නොගැසිය හැකි බව මමත් දනිමි. ඒත් ඈ අහංකාරකමක් හිතේ ඇතිව මා ඇසුරු කළ කෙනෙකු නොවේ. ඊටත් වඩා ඇය නිතර දෙවේලේ මෙහි ආ ගිය කෙනෙකු නොවන හින්දා ගෙට එන්නැයි නොකියා සිටිය නොහැකි ය.

''මං මූණ හෝදගෙන එන්නං ඉක්මනට. අම්මෙ හංසිට ගෙට එන්න කියන්න.''

මා කාමරයෙන් කුස්සිය පැත්තට යන්න හදද්දි අපේ ඉස්තෝප්පු කෑල්ලට ගොඩ වෙන හංසිව මම දුටුවෙමි.

''මම මූණ හෝදගෙන එන්නං. ඉඳගන්න හංසි.''

''අනේ අනේ ගෑනු ළමයි දන් නේ නැගිටින්නෙ...?''

මා මගේ තරම් නොදන ඇය ඇසුරු කළා නොවේ. ඉගෙන ගන්නට තිබුණ හපන්කම නිසා පස් වැන්නේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ මට කොළඹ ලොකුම බාලිකාවට ඇතුළු විය හැකි වූයේ ය. කොයි තරම් නැති බැරිකම් තිබුණත් ඒ සිටු කුමාරියන් අතර දී හිස කෙළින් තබගෙන ඉන්නට මට තිබුණු ලොකුම සුදුසුකම, උපතින්ම උරුම කරගත් මගේ හැඩ තිලයි.

''ලේඩි එකේ ලස්සනම කෙල්ල ආර්යා.''

මා වැඩි විය පැමිණි අලුත, අපේ පන්තියේ දැරියක් මටත් ඇහෙන්නට කීවා ය. එවෙලේ ලැජ්ජාවෙන් බිම බැලුවාට අදටත් මට ඒ කතාව විශ්වාස කළ නොහැකි තරම් ය. පාසලේ දී කොහොම වුනත් ගමේ දී නම් මගේ රූව මට ආශිර්වාදයක් වූයේ නැත.

''පොත්ත රතුවට තිබුණයි කියල ඇඟිල්ලෙ තරමට වඩා ඉදිමෙන්න යන්න එපා කියල උඹේ ලොකු එකිට කියපන්.''

අපේ අම්මා ණයට බඩු වගයක් ඉල්ලා ගෙන ගිය වෙලාවක කඩේ මුදලාලි එහෙම කියා තිබේ.

"අනේ මුදලාලි ලැප්පාවට බයට කාත් එකක්වත් වැඩිපිප්පෙනකට නොගියට ඒකි තවම පුංචි එකී."

එවෙලේ අම්මා එහෙම කිවාලු. නමුත් අම්මා නොදන්නා, මුදලාලිගේ කරගවට නේතුව මම දනිමි. මුදලාලිගේ පුතණුවන් මගේ ප්‍රේමය පතාගෙන කොතෙකුත් පස්සෙන් ආවේ ය. ඔහුගේ තරුදරයෙන් බේරෙන්නට බැරි තැන, දවසක් මම ඔහු දුන් පෙම් හසුනක් ඉස්කෝලේ ගිහින් එන ගමන් මුදලාලි අතට දී ආවෙමි. හෙතෙම සිතුවේ මා කළ දෙයින් ඔවුන්ට මදි පුංචි කමක් සිදු වූවා තියා ය.

"ආර්යා... ඉක්මන් කරන්නකො අනේ."

ඉස්තෝප්පුවේ කෙටි තාප්පයෙන් එබී ගෙන හංසි හඬ ගෑවා ය. බාල්දියේ ඉතිරි වූ වතුර ටික කකුල් දෙකට හලා ගත් මම පරණ තුවායෙන් මූණ පිස ගෙන ගෙට ගොඩ වූයෙමි.

"ලැස්ති වෙන්න අපේ ගෙදර යන්න."

හංසි ඇයට පුරුදු දඟකාර හුරතලය පෑවා ය. මම මදහසක් නගා ගෙමි.

"ඇයි මේ හදිස්සියෙ?."

"අද පොඩි පාටි එකක් අනේ... යාළුවෙක් නැතුව මට පාළුයි."

"අනේ නංසි පාටිස්වලට නං මට එන්න බෑ."

"පාටිස්වලට නෙමෙයි. මයා එන්නෙ මාත් එක්ක දවස ස්පෙන්ඩ් කරන්න. හුඟ දවසකින් අපි කතා කළෙත් නැතෙ. ආන්ටි... ආන්ටි කැමති වුණා නේද මං ආර්යා එක්ක යනවට...?"

"මගේ නං අකමැත්තක් නෑ ඉතිං. ඒත් ආර්යාගෙ තාත්තා මොනා කියයිද මන්ද..."

අම්මා කතා කළේ අවංක ආදරණීය ස්වරයකිනි. තාත්තා මොන තරම් බෙබද්දෙක් වුනත් ඔහු ඉක්ම යන සූදානමක් අම්මාගේ නැත.



"අංකල්... අද ආර්යාව අපේ ගෙදර එක්කං යන්නද...? බය වෙන්නෙපා... මං එයාව හොඳට පරිස්සං කරල එක්කගෙන එන්නං."

"අනේ ඉතිං මේ පුංචි තෝනලගෙ වගේ ගෙදරකට අපේ කෙල්ල ගියා කියල මොකක් වෙනවද...?"

කියමින් තාත්තා ඉස්තෝප්පුවෙන් මිදුලට බැස යන්න ගියේ ය. දැන් ඉතින් අවසර ලැබී තියේ. මා කොතෙක් පැකිළුණත් ඉතින් හංසිගෙන් ගැලවුමක් නොවන්නේ ය. කාමරයට රිංගා ගත් මම මට තියෙන හොඳම ඇඳුම - සුදු පාට මල් වැටුන ලා කහ පාට දිග ගවුම හැඳ ගතිමි. පසුගිය සිංහල අවුරුද්දට මේ ගවුම් රෙද්ද මට තෑගි කළේත් හංසි ය.

"අක්ක යන්නෙ පාටියකට ද...?"

නංගී ඇවිත් මගේ ඇගේ දවටුණා ය. කලිසම් කොටයක් විතරක් ඇඳගෙන උන් ඇගේ සිරුරේ වූ කෘෂ බව අද දුටුවා සේ මගේ පපුව දැවුණි.

"නෑ නංගී."

"එහෙනං අර අක්ක කිව්වෙ...?"

"එයාට පිස්සු."

නිකඹ තෙක් දිග කොණ්ඩය කනි කරලකට ගොතා පිට මැදට දමූ මම එළියට ආවෙමි. ඊයේ රාත්‍රියේ හැඬූ - නිදිවැරූ කෙඩෙත්තුව ඇස් පිදවමින් තිබිණ.

"ගෙට උදේට එක්කගෙන එන්නං ආන්ටි."

මගේ අතින් ඇදගෙන අලුත්ම පන්නයේ රිය වෙතට දුවන ගමන් හංසි කෑගැව්ව ය. මම අම්මා දෙස බැලුවෙමි. ඇගේ දෑසේ වූයේ අහිංසක ආඩම්බරයකි. අම්මා ආඩම්බර වෙන්නේ ඇයි? ඇගේ ලොකු දුවට පොහොසත් යෙහෙළියක හිඳින හින්ද ද? නැත්නම් සිටු කුමාරියක්, ඇගේ දුප්පත් දියණියට හිතවත්කම් පෑම

ගැන ද? මට තේරුණේ නැත. රතු බොරළු පාර දිගේ ටිකක් දුරට වියඇදී යන තෙක්ම නංගී ඒ පසුපස දුවගෙන ආවා ය. මගේ පපුව හිර වෙමින් - රිදෙමින් - දැවෙමින් තිබිණි.

"ආර්යා."

හංසි කතා කළේ හැඟුම්බරව ය.

"ම...?"

"ඇස් ඉදිමිලා ඇයි...? රීයෙ රෑ ඇඬුවද...?"

මම කතා නොකළෙමි. මගේ නිහැඬියාව එකඟ වීමක් බව ඇය තේරුම් ගන්නට ඇත.

"රීයෙත් තාත්ත බීගෙන ඇවිත් රණ්ඩු කළාද...? කුණුහරුප කිව්වද...?"

"බීගෙන ආව. ඒත් රණ්ඩු කළේ නං නෑ."

"එහෙනං...?"

"පතන් පැලට ගිනි ඇවිළුණා හංසි."

උගුර හිර වී, කට තඩ විදි, නෙතු තෙත් වී මට හැඩුම් ආවේ ය. මම විය තවුළුවෙන් පිටත බලා ගතිමි. හංසි මගේ අතකට මුදු ලෙස තට්ටු කළා ය.

කිසි ලැජ්ජාවක් නැතිව මගේ පවුල් පසුබිම පිළිබඳ සියලු තොරතුරු මා හංසිට කීවේ ඇයි කියා මම නොදනිමි. මුළු මහත් බාලිකාවෙන්ම ඒ සියල්ල දැන සිටියේ හංසි විතර ය. ඇ මා කී සියල්ල අසා සිටියා ය. දුක් වූවා ය. ඒත් ඇයට අප ගෙවන පවිකාර ජීවිතය ගැන අල්ප මාත්‍රික අවබෝධයක්වත් තිබුණා දැයි මා දන්නේ නැත.

"පෙරේද අයිය ආව. අද එයාගෙ යාළුවන්ටයි තාත්තිගෙ යාළුවන්ටයි තමයි පාටි එක දෙන්නෙ."

ඔවුන්ට සාදයක් දමන්නට මහ ලොකු හේතුවක් උවමනා



නැත. ඒ වුනත් අද නම් - අවුරුදු කිහිපයක් විදෙස් ගතව සිටි අයියා ආ එක නම් සතුටු වෙන්නට විශේෂ හේතුවකි. ඒ හින්දා මේ සාදය අතිශය උත්සවශ්‍රීයක් ගතු ඇත. එවැනි තැනකට මා වැනි හිඟන කෙල්ලක එක්කගෙන ගොස් හංසි මේ මොනවා කරන්නට හදනවාද?

සාදයක් පැවැත්වෙන්නට නියමිතව තිබුණත්, ඒ ගෙදර කරන්නට වැඩක් තිබුණේ නැත. වැඩ කළේ සේවකයන් ය. මමත් හංසිත් කාමරයට වැදී සල්ලාපයේ යෙදී සිටියෙමු.

"නංගි."

කියාගෙන වතාවක් සදෙව් අයියා කාමරයට ආවේ ය. නම අසා තිබුණාට, පින්තූර දැක තිබුණාට මා මේ හැබැහින් ඔහු දුටුවේ අදම ය. මා තිගැසෙන්නට ඇත්තේ ඒ නිසාවෙනි. මවෙත යොමුව තිබූ ඇස් හංසි වෙතට හැරවූ සදෙව්, "මගෙ ඇල්බම් එක කෝ?." කියා ඇසුවේ ය. ඔහු දෙස බලා සිටියෙන්, මට හංසි කිව නැසිණ. සදෙව් බස්නායක වූ කලී දැන උගත්කමත්, පරම්පරාගත ධන සම්භාරයකුත්, කඩවසම් පෙනුමකුත් ඇති රාජ කුමාරයෙකි.

හැන්දෑවේ අපි ගෙඋයන කෙළවර පොකුණ ළඟට වී රත්තරන් මාළු දෙස බලා ගෙන සිටියෙමු. හංසි පසුවූයේ සතුටෙනි. උසස් පෙළ ලියා ඉස්කෝලෙන් සමු ගත්තාට පස්සේ අප දෙදෙනා මේ හමුවූයේ අදම ය. ඒ නිසා කතා කරන්නට දේවල් ඕනෑ තරම තිබිණි.

"නාම නැගෙ අප්ප මූං එකෙක්වත්."

කියාගෙන සදෙව් බස්නායක අප වෙත ආවේ ය.

"ඔයාගෙ යාළුවොත් ඉතිං ඔයා වගේම ඇතිනෙ. පාටි එක එන්ජෝයි කරනව කොහොම වුනත් ඇවිල්ල බිල යයි."

"කව්ද නංගි මෙයා...?"

මගේ හදවත ප්‍රකෝටි වාරයක් තිගැස්සිණි. සදෙව් අයියා

ඇස් පුංචි කොට එක එල්ලේ මදෙස බැලුවේ ය. ඉක්මන් බැල්මක් පා මම බිම බැලුවෙමි. මොකට මං අද මෙතැනට ආවා දැයි, හිත පසුතැවිලි වෙමින් තිබිණ.

"වන් මන් මයි බෙස්ට් ෆ්‍රෙන්ඩ්ස්... ආර්යා..."

"වන් මන් පුවර් ෆ්‍රෙන්ඩ්ස්..?"

සදෙව්ගේ ඇස්වල අමුතු බැල්මකුත්, හඬේ වෙනස් විද්මයකුත් තැවරී තිබිණි.

"මචං... ඇයි...?"

"ඔයාට මෙහෙම යාළුවෙක් හිටියෙ නෑනෙ."

"ආර්යා මට ළඟින් ආශ්‍රය කරන්න හම්බ වුනේ ඒ ලෙවල් ක්ලාස් එකේදි. දැ එයා තමයි මගෙ හොඳම යාළුවා. ඒක නෙවෙයි... අයියට මගෙ පරණ යාළුවො නාම මතකයි එහෙනං නේද...?"

"මූණු නං මතක නෑ."

"එහෙනං...?"

"ඒ වුණාට වියතකට වඩා දිග ඇඳුමක් අඳින යාළුවෙක් ඔයාට හිටියෙ නෑ කියල මතකයි."

"යනව යන්න මෝඩයා."

හංසි 'දඩාස්.' ගා සදෙව් අයියාගේ පිටට ගැසුවා ය. ලැජ්ජාවක් දැනුණා වුනත් මටත් සිනහ ආවේ ය. හයියෙන් සිනාහසුණු සදෙව්, එතැනින් නික්ම ගියේ මා විනිවිදලන බැල්මකුත් සමගිනි. ඔහුගේ සිනහවත් - බැල්මත් දෙකම කෙල්ලකගේ හිතක් වශී කරලන සුළු ය.

"පිස්සෙක් මහ."

අයියා යන මඟ බලා සිට මිමිණූ හංසිගේ හඬේ බොරු තරහවක් තිබුණත්, ඇගේ ඇස්වල වූයේ දෝරෙ ගලන සොයුරු පෙමකි.



අමුත්තන් එන්නට පෙර අප දෙදෙනාම දිය නා අලුත් ඇඳුම් අඳින්නට හංසිට උවමනා විය. මුලින්ම නාන කාමරයට වැදුණේ ඈ ය. ඈය යළි එළියට ආවේ හුඟක් වේලාවකට පස්සේ ය.

"පුදුමයි දිය නොවුණා."

මම විහිළුවක් කළෙමි. මගේ තම්මුලක් මිරිකූ ඕ අල්මාරියෙන් අලුත්ම අලුත් රෝස පුදු මල් වැටුණ ත්‍රී-ක්වාටර් කලිසමක් හා රෝස පාට බ්ලවුස් එකක් ගෙන මවෙත පෑවා ය.

"මෙච්චර හොඳ එකක් මොකටද...?"

"අද කොල්ලො එනවා..."

ඇසක් වසා ඉඟිමැරූ ඕ මා ඇදගෙන ගොස් නාන කාමරයට දමා දොර වැසුවා ය. මට ලැවෙන්ඩර් සුවඳක් දැනිණ. අපේ ගැඹුරු ළිඳේ වතුර තරම් සීතල නොවුණාට මේ නාන කාමරය මොන තරම් සුඛෝපභෝගී ද...? නංගී හා මල්ලී පමණකුදු නොව මගේ අම්මාත් මෙවැනි නාන කාමරයක් දැකලාවත් නැති බව මට විශ්වාස ය. ඔවුන්ගේ ජීවිතවල, අපේ පැල්පතට එහා ලෝකයක් ගැන හීනයක්වත් නැත. මට දරා ගන්නට බැරි අන්න ඒ අවාසනාවයි.

"වාව්."

මා නාන කාමරයෙන් එළියට එනවිම හංසිගේ නෙතු දැල්විණි.

"ජස්ට් ලයික් රානි මුකර්ජි. පාටි එකට එන කොල්ලන්ගෙං මට තමුසෙව බේර ගන්න බැරි වෙයිද දන්නෙත් නෑ."

කණ්ණාඩි මේසයේ කැඩපතින් මාව දුටු මා පවා කැළඹිණි. අපේ අම්මා අහිංසක ගැමි ළියකි. තාත්තා රළු ජීවිතයකට හැඩ ගැසුණු කම්කරුවෙකි. ඔවුන්ට දාව උපන් මට මේ ඇන්දළ පාට සිරුරත්, වාත්තු කළා වැනි මූණත් කොහොම උරුම වූවා ද...?

"නංගි මාත්තෙක්ක තරහෙං ඇති."

මහා බර හුස්මක් මගෙන් අතැරිණි.

"ඇයි...?"

"එයාට ඇහුණ අද මෙහෙ පාටි එකක් තියනව."

"අපිට නංගිවත් එක්කගෙන එන්නයි තිබුණේ."

මා මදහස පෑවා විතර ය. කුස ගින්දරත් එකක් - නැති බැරිකමුත් එක්ක මට්ටු වෙමින් දවසට මූණ දෙන නංගිට හෝ මල්ලිට මෙවැනි තැනක මට තරම්වත් පහසුවෙන් හැසිරිය හැක්කේ නැත. තමන් පය ගසා සිටින පොළොවේම තැනක මේ වගේ මුදල් වියපැහැදම් කරලන සාද පැවැත්වෙනවායි ඔවුන් දන්නේත් නැත. අනන්තවත් වේල් පිටින් බඩ ගින්නේ සිටින උන්ට වේලක් ඇර වේලක්වත් බත් විකක් ලැබෙනවා කියන්නේත් ලොකු දෙයකි.

හංසි විදුලි වියළනයෙන් ඇගේ කෙටි වරලස තෙත වියළුවා ය. මම මගේ දිග කොණ්ඩය කඩාගෙන - මගේ තෙත බෙර බෙරාම පසත මාලයට බැස්සෙමි.

"අපි අයියල ඉන්න පැත්තට යං."

හංසි මගේ අතින් අල්වා ගත්තා ය.

"තව්ද මං ඒ දිය කිදුරි...?"

කොල්ලෙක් සදෙව්ගෙන් එහෙම අහනවා මට ඇසිණි. හංසි අතේ ග්‍රහණය දැඩි කළා ය.

"මං කිව්වෙ බොරු ද...?"

ඒ රාත්‍රිය අතිශය විසිතුරු වූයේ ය. විදුලි කොටනවා වාගේ හැම තැනම වෛවර්ණ විදුලි පහන් දැල්විණි. ඒ සියල්ලට වඩා මගේ හදවතට විදුලි සැර එල්ල කළේ සදෙව්ගේ ඇස් දෙකයි. මිතුරන් හා එක්ව සව්දිය පුරමින් සිටියත් ඔහුගේ ඇස් මා ලුහුබඳිනවා වාගේ මට දැනිණ.

"හංසි... අයිය බොනව...."

"බොයි නෙවෙයි ඔකුං බියර්වලින් නායි."



හංසි සිනහ වූවා ය. ඇයට ගාණක්වත් නැත. ඒත් සදෙව් අයියා තොල ගාන මධුවිත බිඳක් ගානේ මගේ පපුව දැවිල්ල ගත්තේ ඇයි? මට තාත්තා සිහි වූයේ ඇයි?

"හායි ගර්ල්ස්."

මම තිගැස්සී නෙතු එසවීමි. අපේ කුඩ සෙවන යටට ඇවිත් බමන නෙතුවලින් බලා සිටියේ කලිනුත් මා ගැන මොනවාද කියවූ තරුණයා ය.

"හංසිගෙ යාළුවෙක් ද මෙයා...?"

"ඔව්. ඇයි තිශාන් අයියා...?"

ඒ යොවනයා හෙලූ බැල්ම "වල්" කියා මට සිතිණි. මම බිම බලා ගතිමි. හිතට දැනෙමින් තිබුණේ කියා ගන්නට නොතේරෙන අප්‍රසන්නතාවයකි.

"මිස් වෙරි බියුටිෆුල් නො..."

"තිශාන් අයියාට ටිකක් වැඩියි වගේ."

හංසි කතා කළේ සිනාසිසී ය. මෙවැනි සාද සේම ඒවායේ දී සිදු වෙන මෙවැනි සිදුවීම් ද දත් ඇයට පුරුදු ය.

"වට්ස් හර් නේම් හංසි...?"

වැරූ නැතිව හිය තිශාන් පුටුවක් අල්වා ගත්තේ ය. මට එතැනින් නැගිට යන්නට සිත් වූ තරම්.

"මිස් ආර්යා."

"ආර්යා.. නයිස් ටු මීට් ඹූ ආර්යා. වුඩ් යූ ලයික් ටූ ඩාන්ස් විත් මී...?"

සර්වාංගයම ගැහෙන්නට ගත්තේ ය. මා මෙහි ආවේ ඇයි...? නුපුරුදු තැනක, නුපුරුදු මිනිසුන් අතරට වැටි දියෙන් ගොඩ දමූ මාළු පැටියෙක් සේ අසරණ වෙන්නට මා මෙහි ආවේ ඇයි...?

"කමෝන් බේබි... කමෝන්... ලෙට්ස් ඩාන්ස්..."

බලාපොරොත්තු නොවූ ආකාරයකට ඔහු මගේ අතින් අල්වා ඇද්දේ ය. දෙවියනි මා වෙව්ලා ගිය තරමක්...!

" ප්ලීස් අතාරින්න. මං ඩාන්ස් කරන්නෑ."

කොහොම ඒ වචන ටික කියා ගත්තාද කියාත් මම නොදනිමි. ඒත් ඒ බීමත් පිස්සාට මගේ ප්‍රතික්ෂේප කිරීමෙන් වගක් නොවීණි. ඔහු මගේ අත තවදුරටත් අල්වාගෙනම සිටියේ ය. ඒ ග්‍රහණය මුදහැරීමේ හැකියාවක් මගේ සියුමැලි අත්වලට නොතිබිණි. මොනවා කළ යුතු ද කියා මට තේරුණේත් නැත. අන්තිමේදී මම දුටුවෙමි. සදෙව් අයියාගේ දිළිසෙන ඇස් දුටුවෙමි. වචන ගොළු වී තිබුණේ මගේ ඇස්. දෙවියනේ - මුදුන් පාමුල ඉන්නා යතිවරියක සේ ඔහුට කන්නලව් කරන්නට ඇත. ඊළඟ තත්පරයේ දී මා දුටුවේ අත වූ විදුරුව මේසය මත තබා නැගිටගත් සදෙව් වය. මොහොතකින් නියාන්ගේ ග්‍රහණයෙන් මා නිදහස් විය. මිට මොළවුණු සදෙව්ගේ සක්තිමත් අත්වලින් නියාන්ට පහර පිට පහර වැදිණ. සියල්ල සිහිනයක් සේ ය. ඇසිල්ලකින් මුළු සාදයම නැවතිණ. සදෙව්ගෙන් නියාන් මුදවා ගත් තරුණයන් කිහිප දෙනෙක් ඔහුව පසෙකට ගෙන ගියෝ ය.

"මොකද පුතා මේ... මොකක්ද මයා කරපු වැඩේ තේරුම... ඉන්වයිට් කරල මෙතනට ගෙන්නපු මනුස්සයෙක්ට එහෙම ගහනවද...?"

සියල්ලන් අතරින් ඉදිරියට ඇවිත් හංසිගේ අම්මා සදෙව් අයියාට දොස් කිවා ය. මේ සියල්ල සිදු වූයේ මා නිසා නොවේද...? මම වෙව්ලමින් සිටියෙමි. හංසි මුදු ලෙස මගේ අතක් අල්වා ගත්තා ය. මට කිසියම් හව්හරණයක් දැනිණ.

"මං ඉන්වයිට් කළා තමයි. ඒත් ඒ පාටි එකට මිසක්... හංසිලාව බයිට් එකට ගන්න නෙවෙයි."



හුඟක් දෙනා සිතන්නට ඇත්තේ හංසිට නියාන් අනවශ්‍ය විහිළුවක් කරන්නට ඇත කියා ය. ආයේමත් සාදය යථා තත්ත්වයට පත් විය. ඒත් මගේ අතින් අල්වා ගත් හංසි උඩු මහලේ ඇගේ කාමරයට ආවා ය.

"අනේ සොරි ආර්යා... මට එවෙලෙ මොනා කරන්නද කියල තේරුනේ නෑ."

"හංසි... මං ආපු හින්දයි මේ ඔක්කොම කරදර."

"අපේ ගෙදරදි අපි ඔයාව පරිස්සං කරන්න ඕනෙ... වෙක් ඉට් ඊසි."

කාමරයේ දෙරට පිටතින් තට්ටු කරන හඬ ඇසිණ. හංසි ඉක්මන් කොට දොර හැරියා ය.

"කෝ ආර්යා...?"

ඒ සදෙව් ගේ කටහඬ ය. හදවත අලුතෙන්ම තිගැස්සිණි. මා ඔහුට මූණ දෙන්නේ කොහොමද...? තමන්ගේ මිතුරෙකුට ගෙදරදීම ගුටිබැට දෙන්නට ඔහුට සිදුවූයේ මා නිසා නොවේ ද...? හංසි දොරකඩින් මෑත් වූවා ය. සදෙව් අයියා කාමරයට ඇතුළු විණි. මා ඔහු දෙස බලන්නට ඇත්තේ බියපත් - බැගෑපත් ඇස්වලින් විය යුතු ය.

"එයා හොඳටම බය වුණා. නංගි එයාට බොන්න මොනව හරි දෙන්න."

අසාධ්‍ය රෝගියෙක් ළඟදී දොස්තර මහත්තයෙක් ළඟ තියෙන කාරුණිකත්වයකම මම සදෙව් වෙතින් දුටිමි. හංසි එවේලේම කාමරයෙන් පිට වූවා ය. මට කිසි බියක් නොදැණිනි. කැගැහුවත් පිටතට නොඇසෙන හුදෙකලා කාමරයක, මත් පැන් බී හිඳින තාත්පාදුනන යොවුනයෙක් එක්ක තනි වෙද්දි කෙල්ලකගේ හිතට දැනිය යුතු බිය මට නොදැනිණි. තමන්ගේම කෙනෙක් ළඟ හිඳිනවා වාගේ පහසුවක් මට දැනෙන්නට ගත්තේ ය.

"මං කොහොමටත් කල්පනාවෙං හිටියෙ... ඌ හොඳටම බීල... එකයි..."

මගේ ඇස් මගහරින්නට එවෙලේ සඳෙව් උත්සාහ කළාවත් ද...? මට ආයේම තාත්තා සිහි විය. අම්මා සිහි විය. නිදන්ගත බියකින් ආත්මය වෙව්ලා ගියේ ය.

"බොන්නෙපා අයියා."

ඔහු ක්ෂණිකව මදෙස බැලුවේ ය. ඔහුට පමණකුදු නොව මට පවා මා අදහාගත නොහැකි වූයේ ය. සඳෙව් බොනවා මා දුටු බව ඇත්ත ය. එවෙලේ අමුතු පිච්චීමක් පපුවට දැනුණ බවත් ඇත්ත ය. ඒත් ඔහුට "බොන්න එපා." යි කියන්නට තරම් අයිතියක් මට කොහෙත් ද...? මීට කලින් මා ඔහු එක්ක එක වචනයක්වත් කතා කොට තිබුණේ නැත. ඉතින් කතා කළ මුල් වචන දෙකෙන්ම එවැනි ඉල්ලීමක් කරන්නට මා ඔහුගේ කවුරුන් ද?

ජීවිත කාලයක් හදවතේ තියාගෙන සුරකිය හැකි තරම් වටිනා දේවල් එක තත්පරයක දී ජීවිතය විසින් හඳුනාගනු ලබනවා දැයි මා දන්නේ නැත...!

බරැති පියවර හෙමිහිට තබා සඳෙව් කාමරයෙන් පිට විය. සිහින් උස විදුරුවක දුම් සිසිල් බීමක් සමඟ හංසි කාමරයට ඇතුළු වූවා ය. හෝරා ගණනක් තිස්සේ ඒ බීම එක තොල ගෑවා මිස රාත්‍රියේ මම වෙන කිසිදු අහරක් නොගත්තෙමි. මුළු රැයේම නොනිඳ සිටියත් උදෙන්ම නැගිටගත් මම මූණකට සෝදගෙන මගේ දිග ගවුම හැඳගතිමි.

"මෙච්චර උදේම යනවද...?"

තවමත් ඇඳේ වැතිර අඩ නින්දේ උන් හංසි මදෙස බලා ආයේම ඇස් පියවූවා ය.

"ඔයා නැගිටින්න ඕන නෑ. මං යන්නං."

"තනියම...?"



"ඔව්. බස්සෙකේ යනහැකි."

"පිස්සු ද...?"

අසාගෙන හංසි නැගිට යහනේ හිඳ ගත්තා ය.

"බ්‍රේක්ෆස්ට් අරං යං. ඊයෙ රෑත් ඔයා කෑවෙ නෑනෙ."

"කන්න බෑ."

කුසෙහි නොව වෙන කොහේදෝ මා නොදන්නා - මට නොතේරෙන තැනක හිස් වීමක් පිළිබඳ හැඟීමක් නම් යටිහිත පහුරු ගාමින් තිබිණ. ඒ අඩුව කුමක්දැයි හඳුනා ගන්නට මට ඕනකමක් තිබුණේ නැත. නැත්නම් එය හඳුනා ගන්නට මම බිය වීමි. සමහර දේවල් ජීවිතය පුරාම නොදැන - තේරුම් නොගෙන ඉන්න එක හොඳ ය...!

අප එන්දින් ගෙදර ඇත්තන් පසු වූයේ නින්දේ ය. මම හංසිගේ අම්මාට පමණක් කතා කොට, ඇගේ දෙපා නමැද සමු ගත්තෙමි. රියෙන් ගොස් අපේ ගේ ළඟ බැස ගත්දිත් - හංසි මා ළඟ සිටියදීත් මට දැනුණේ මොනවා හෝ දෙයක් ඒ ගෙදර අමතක වී - අත්හැර ආවා සේ ය.

මා යනකොට නංගී හා මල්ලී පාන් කමින් සිටියහ. ඊයේ රාත්‍රියේ ගෙනා පාන්වලින් ඉතිරි වූ කැබැල්ල දෙකට කපා අම්මා ඔවුන්ට දී තිබිණ. පාන් මදියි කියමින් නංගී කන්කෙඳිරි ගාන්නට පටන් ගත්තා ය.

"තාගෙයං අඩන්නැතුව තියෙන දෙයක් කාලා ඉන්න පුරුදු වෙනව ළමයො."

මම ඇයට සැරවීමි.

"අක්කටනං මොකද...? අක්ක හොඳට කන්න ඇතිනෙ පාටියෙදි."

හදවත කඩාගෙන වැටිණි. අමු - අමුවේ ගින්දරක දැවෙනවා

සේ මට දැනිණ. ඒ ලෝකයත් මේ ලෝකයත් අතර තියෙන්නේ මොන තරම් ලොකු වෙනසක් ද...? ඒ පරතරය වූ කලී කවදාකවත් පියවිය නොහැකි ආකාරයේ එකකි. අපට ඒ ලෝකය ගැන අවබෝධයක් හෝ හංසිලාට මේ ලෝකය ගැන අවබෝධයක් කවදාකවත් ලැබිය නොහැකි වනු ඇත.

හෙමිහිට ඇවිද ගිය මම අපේ පුංචි අඳුරු කාමරයේ ඇති කබල් ඇඳට වැටුණෙමි. හංසිලාගේ ගෙදර අමතක වී ද ආවේ මොකවද? මා යළි අරගෙන නොආවේ මේ ගෙදරින් අරගෙන ගිය තුමක්ද? මම දස අතේ සිතුවෙමි.

"ලොකු පුතේ... ආර්යා..."

අම්මාගේ සෙනෙහෙබර ඇමතුම හඬ කුස්සිය පැත්තෙන් ආවේ මා නුසෙත් වෙලා ඇඳට වැටී කල්පනා කර - කර සිටි ඉස්සිසිව ය. හෝන්දු මන්දු ගතියෙන් වාගේ ඇ වෙතට ඇවිදගෙන ගිය මම, අම්මා ඇතිඳිමින් හිටි පළා මිටියෙන් මුකුණුවැන්න අත්තක් ගත්තෙමි.

"මොකෝ පුතේ මූණ අමුතු වෙලා වගේ... තාම මහන්සිද...?"

මා අම්මාගෙන් මූණ හංගා ගන්නට උත්සාහ කළත් ඇ මගේ වෙනස දක තිබිණ. ඇ උගත් ගැහැණියක් නොවේ. ඒත් සම්පතමයන්ගේ හදවත තේරුම් ගැනීමේ අපූරු හැකියාවක් අම්මා සතු ය.

"ඒ මිනිස්සු එක රැයකදි නාස්ති කළේ මොන තරං සල්ලියක් ද අම්මෙ...? අපි ජීවත් වෙන්නෙ නරාවළක කියල හිතෙන්නෙ ඒ දේවල් දකිනකොට. අඩු ගානෙ මෙච්චර හොයනෙකේ තාම මට පොඩි රස්සාවක්වත් හම්බ වුණේ නැනෙ."

"පුතා ශිෂ්‍යත්වෙ පාස් වෙලා ලංකාවේ හොඳම ගැණු ඉස්කෝලෙකට යයි කියල අපි හිතෙකින්වත් හිතුවද...? අපේ මේ පැල්පත ඉස්සරහට වාහනේකිං ඇවිත් පුතාගෙ අතිං අල්ලගෙන යන යාළුවෙක් පුතාට ලැබිල තියෙනව. සංසාරෙ කවදහරි කරපු



පවකට මේ වගේ දුප්පත් ගෙදරක ඉපදුනාට ආර්යා ගිය ආත්මවල වැදගත් තෝනා කෙනෙක් වෙලා ඉන්නැති. කරපු පව් ගෙවිල යයි පුතේ ඉක්මනට... ඔයාගෙ ජීවිතේට හොඳම හොඳ දේවල් ළං වෙයි."

මගේ පපුව කිරි ගැසිණි. පළපුරුදු අනාවැකි කියන්නියක සේ අම්මා මේ වාගේ දේවල් කියන්නේ ඇයි...?

අප උපන්නේ සඳුන් කැට අතින් අරගෙන නොවේ. දිළිඳුකමේ අන්තිම පත්ලටම වැටී දුක් විඳින දෙමව්පියන්ට දව දුප්පත්කම මිට මොළවාගෙන ය. එද සිට අද - අද වෙන තුරාත් ජීවිතයේ අංගුමාත්‍රික වෙනසක් වූවා කියා මම නොසිතමි. උසස් පෙළට ලියා අවසන් කළ ද සිටම මා රැකියා සඳහා අයදුම්පත් වැවූයේ හදවත පැතුම් ගොන්නකින් පුරවා ගෙන ය. ඒත් ඒ අහිංසක පැතුම් තවමත් හීන විතරම ය. සියල්ල එසේ තිබියදීත්, මට හොඳ කලදවසක් යනු ඇතැයි අම්මා සිතාගෙන හිඳින්නී ය. ඇය මොනතරම් අසරණ ද?

"අන්න මල්ලි අලුත් පහන් පැලක් හැදුව ඊයෙ හවස."

අම්මාගේ කටහඬින් මගේ කල්පනා ලෝකය බිඳී විසිරිණ.

"හැදුව...?"

"හ්ම්."

මම ඉක්මන් නොට නැගිට ගතිමි. හිත කළබල වී තිබී හින්ද උදේ එන්දී මා එය නොදකින්නට ඇත. කුස්සිය පැත්තෙන් එළියට බැස මැටි බිත්තිය අයිත දිගේ ඉස්සරහට ගිය මගේ හිත "හෝස්." ගා පත්තු විය. මගේ අලුත් පහන් පැල හදා තිබුනේ ලී දණ්ඩක් මත සවි කළ පරණ පිටි ටින් එකකිනි. බුදු රුවක් සහිත වෙසක් කාඩ් එකක් ඒ තුළ තියා තිබිණි. මටම දරන්නට බැරි තරම් බර හුස්මකින් ළය පුරවා ගත් මම වේගයෙන් එය මුද හැර ආයේ අම්මා වෙතටම පැමිණියෙමි.

"මල්ලී කියන්නෙ එයා ඉස්කෝලෙ යන එක නවත්තල මොකක් හරි රස්සාවක් හොයා ගන්නව කියල."

"පිස්සුද එයාට...?"

තරහවකුත් දුකකුත් එකවර ගියේ මෝදු වීය. අසරණකම උහුලා ගන්නට බැරිව මගේ පපුව හිර වී, නාස් පුඩු දැවිල්ල ගෙන මට හැඩුම් ආ කරමි. අඩුපාඩු ඕනවටත් වඩා ඇති බව මා නොදන්නවා නොවේ. ඒත් මල්ලී තවම සාමාන්‍ය පෙළවත් නොකළ පොඩි එකෙකි. ඉගෙන ගන්නේ නැතිව කොහොම රස්සාවක් හොයා ගන්න ද? ඔහු හදන්නේ තාත්තා වගේම මෙසත් මිස් කෙනෙකුගේ ගෝලයෙක් වෙන්නද...? එතකොට තව තවත් මේ නාටවළෙහි පත්ලටම ගිලී යනවා මිස අපට ගොඩ වීමක් ඇත්තේම නැද්ද...?

"ඒකා කියන එකෙත් ඇත්තක් තියෙනව ලොකු පුතේ."

"මොකක්ද අම්මෙ ඇත්ත...? ඉස්කෝලෙ ගිහිං විභාග පාස් කරන්න බැරි තරං අපිට අඩුපාඩු තියෙනව... ඒකද ඇත්ත...? කුලී කාරයෙක් ළඟ වැඩට ගියහම ඒ ඔක්කොම ප්‍රශ්න විසඳෙනවද අම්මෙ? ඇත්ත... අපි අපිට විඳින්න බැරි තරං දුක් විඳිනව... සමාජේ ඉස්සරහ ලැජ්ජා වෙනව. ඌත් ආස ඇති ඒ වයසෙ අනිත් කොල්ලො වගේ ලස්සනට ඉන්න. ඒත් කුලී කාරයෙක් වෙලා මල්ලිට පුළුවන් වෙයිද අම්මෙ ලස්සනට ඉන්න? කවදාහරි ඌං අපිට දෙස් කියයි ඉගැන්නුවෙ නෑ කියල. මං කොහොම හරි රස්සාවක් හොයා ගන්නං... මල්ලිට දිගටම ඉස්කෝලෙ යන්න කියන්න."

"මල්ලී කියන්නෙ එයා කුලී වැඩ කරල හරි අක්කව විශ්ව විද්‍යාලෙ යවන්න ඕනෙ කියල."

"විශ්ව විද්‍යාලෙ නොගියයි කියල ගෑණියෙක්ට ඒක අඩුපාඩුවක් වෙන්නෑ අම්මෙ. පුළුවන්කමක් තිබුණොත් මං රස්සාවක් කරන ගමං ඉගෙන ගන්නව. ඒත් අඩු කරමිං



ඕලෙවෙල්වත් නොකර කොල්ලෙක්ට මේ සමාජෙ ඔළුව උස්සල ජීවත් වෙන්න පුළුවන් වෙන්නෑ."

"අනේ මන්දන්නෑ දරුවො."

හිත හොඳටම බරව තිබිණ. ඉටු කරන්නට යුතුකම් පෙළ ගැසී තියේ. අපේ පවුලේ වැඩිමලා මා ය. උසස් පෙළ දක්වාම මට උගන්වන්නට අම්මා නොසෑහෙන්න දුක් වින්දා ය. තාත්තා උපයන තුට්ටු දෙක ඔහුගේ බීමතටම වැයවෙන හින්ද ජීවිත අරගලය හමුවේ සටන් වදින්නට අම්මාටත් සිදු විණි. සමහර කාලවල දී ඇ හඳුන්කූරු එතුවා මට මතක තිබේ. තවත් කාලයකදී අම්මා බුලත් විට හද කඩවලට දමුවා ය. වතාවක් ඇය ලියුම් කවර ඇලවූවා ය. තවදුරටත් අම්මා වෙහෙසවන්නේ නැතිව මේ පවුල් බර කරට ගන්නට මම කැමැත්තෙන් හිඳිමි. එය මගේ වගකීමකි. නමුදු තවමත් මා අසරණ ය.

"ලොකු පුතේ."

මා තිගැස්සිණ. ඇස්වල තෙතමනයත්, නාස් පුඩුවල හිරවීමත් එක්කම මම හිස නගා බැලුවෙමි. පිලි පිලි බෑග් එකක දමූ සාලයත් මාළු වගයක් තාත්තා මා වෙත දික් කරගෙන හිටියේ ය. මේ හදිස්සියේ ඔහුට මාළු ගේන්න හිතුණේ ඇයි?

"අනේ... මාළු..."

මටත් කලින් පැන බෑග්එක අතට ගත් නංගිගේ ඇස් දිලිසෙමින් තිබිණ. මට හිතුණේ එකම එක දෙයකි. ඒ අප හැම දෙනාම පළි කියා ය.

"මාළු ගන්න සල්ලි කොහෙන්ද තාත්තෙ...?"

"වෙන කොහෙන්ද ලොකු පුතේ... ඔය මං හම්බ කරපුවම තමයි."

"පුදුමයි තාත්තා අද වෙලාසන ඇවිත්."

අහිංසක විදිහට හිනැහුණා මිස තාත්තා මුකුත් කිවේ නැත.

මත් පැනින් මත් නොවී හිඳින්දී තාත්තා කොයි තරම් අහිංසක මිනිහෙක්ද? ඒත් ඒ අහිංසකකම දැක ගන්නට අපට ලැබී ඇති අවස්ථා ගණන අතේ ඇඟිලිවලටත් වඩා අඩු ය.

"දුවගෙ අර යාළුවටත් දවසක බත් ටිකක් කන්න දෙන්න එපෑ. නේද විමලාවතියෙ...?"

අපේ පුංචි කුස්සියේම බිම ඇන තියාගන්නා ගමන් තාත්තා අම්මාගෙන් ඇසුවේ ය. මා විතරක් නොව අම්මා පවා බැලුවේ පුදුමයෙනි.

"හරි සිදේවි ගෑණු දරුවෙක්. පෝසත් පවුලක වුණාට ආඩම්බරකමක් ගෑවිලාවත් නෑ. මං හිතුව ඒ ළමය දවල් වෙනකල් මෙහේ ඉඳියි කියල."

මට වැටහුණේ දැන් ය. එතකොට තාත්තා අද මාළුත් අරගෙන වේලාසන පැමිණ ඇත්තේ හංසි දවල් බතට මෙහි හිඳිවි කියා ය. අපේ පුංචි පැල්පතට විතරක් නොව අපේ අහිංසක ජීවිතවලටත් ඈ දේවතා එළියක් වී ඇති අපූරුව...!

"තාත්තා මහොම බොන්නැතුව ඉන්නවනං කොච්චර හොඳ ද...?"

"ඇතේ අමාරුවටනෙ ලොකු පුතේ."

මගෙන් ගැලවී ගන්නට සිතාදෝ ඉක්මන් කොට නැගිටගත් තාත්තා මහිස පිරිමැදගෙනම කුස්සියෙන් පිට විය. එදා දවල් බතට සාලයන් කිරි හොදිත් මුකුණුවැන්නා මැල්ලුමකුත් විය. අම්මාගේ කිරි මාළුවේ දෙහි මුසු සුවඳ කන්නටත් පෙරම මගේ රස නහර පිනවී ය. මාළුත් එක්ක බත් කෑ සතුටට නංගී හිටියේ පුදුම උද්‍යෝගයකිනි.

අසල්වැසි නිවසකින් සිළුමිණ පත්තරය ඉල්ලා ගෙන මම තවත් ඉල්ලුම්පත් කිහිපයක් තැපැල් කළෙමි. ඒත් දැන්වීම්වල ඔවුන් බලාපොරොත්තු වී තිබෙන සුදුසුකම් හා පළපුරුද්දේ හැටියට



ඒවා ගැන ඒ තරම් බලාපොරොත්තු තැබිය නොහැකි ය. හංසිගේ තාත්තාට කියා හෝ ඔහු දන්නා කියන තැනකින් රැකියාවක් හොයා ගන්නට ඇත්නම්... මට මහා ලොකු ආයතනයක - ඉහළ වැටුපක් සහිත ලොකු තනතුරක් උවමනා නැත. අවුරුදු ගණනක් තිස්සේ අපේ ජීවිත මත ගොඩගැසුන ප්‍රශ්න මාසික වැටුපකින් විසඳිය නොහැකි තරමය. යාන්තමින් හෝ හිස ඔසවා ගන්නට පුංචි රැකියාවක් වත් ඉක්මනින් ලැබෙනවා නම්...

## 02

එක ඉරිදා උදයක මා මිදුල අතුගාමින් සිටියදී අපේ ගේ ඉදිරිපිට නැවතුණ රියක් දෙවරක්ම නලා හැඬවී ය. ඒ හංසිලාගේ ගෙදර වාහනයක් බව මා හැඳින ගත්තේ පමා වී ය. ඉදල බිත්තියට හේත්තු කළ මම සිනාසීගෙන දිව ගියෙමි.

"ගුඩ් මෝනිං."

"ගුඩ් මෝනිං කෙල්ලෙ. ඉක්මනට එන්න අපිත් එක්ක යන්න."

"කොහෙ යන්නද...? මේ උදේ පාන්දර...?"

රියදුරු අසුනේ හිඳින්නේ වෙනදට එන රියැදුරු නොව සදෙව් අයියා බව මා දුටුවේ එවෙලේ ය. මා මුහු දුටු ගමන් සදෙව් අයියා සැහැල්ලුවට අතක් වැනීය. පසුව ඇතුලේ හුනුරු රිදුමක් ඇති විය.

"අපි ට්‍රිප් එකක් යන්න හදන්නෙ. ඔයාව එක්කගෙන යන්නයි ආවෙ."

මම ආයේම වතාවක් සදෙව් අයියා දෙස බැලුවෙමි. ඔහු හිසක් හරවාගෙන ඒ පැත්තේ විදුරු කවුළුවෙන් එපිට බලා ගෙන සිටියේ ය. එද මා දුටු සදෙව් බස්නායක මේ තරම් ආඩම්බරකාරයෙක් වූයේ නැත. අද අපේ ගෙදරට ඇවිත් හරියටම මගේ තත්ත්වය දැන



ගත්තාට පස්සේ, හොඳම හෙළියක් තරම් ළඟින් මා ඇසුරු කිරීම ගැන ඔහු හංසි එක්කත් තරහ ගන්නට ඇත.

"අනේ මට බෑ හංසි. ඔයාල ගිහිං එන්න."

"ආර්...යා..."

රිය දොර හැරගෙන හංසි බිමට බැස්සා ය. එවෙලේම සදෙව් අයියා මවෙත තියුණු බැල්මක් හෙලනු මම දුටිමි. අසරණ හිගන්නියක සේ බිම බලා ගන්නට මට සිදු විය.

"මොකද්දනේ... මායි අයියයි අවන්තයි විතරයි යන්නෙ. ඔයා ආවෙ නැති වුනොත් මේ කොල්ලො දෙන්නෙක් එක්ක ගිහිං මට කම්මැලියිනෙ."

"අවන්තයිය ඉන්නවනං කම්මැලි වෙන්නෙ මොකද?."

මම අසරණකම සිනහවකින් වහගන්නට හැදුවෙමි.

"ඒ දෙන්න ඉතිං පොලිටික්ස් ගැනයි වාහන ගැනයි බිස්නස් ගැනයි කතා කර කර යයි. පණ්ඩිතය නොවී එනව යන්න."

කියමින් මගේ අත අල්වා ගත් ඕ අපේ ගේ පැත්තට මාත් ඇදගෙනම ආවා ය.

"හංසි... කියන දේ අහන්නකො බබා ඉතිං."

"අංකල්. අපි ට්‍රිප් එකක් යන්න මෙයාවත් එක්කං යන්නයි ආවෙ... එයා බෑ කියනව...."

තාත්තාට පිටුපසින් අම්මාත්, ඔවුන්ට මුවහ වී නංගී හා මල්ලීත් අප දෙස බලා ගෙන සිටියහ. මල්ලීත් නංගීත් විනෝද ගමනක් ගිහිං තියෙන්නේ හරි කලාතුරකිනි. ඉතින් ඔවුන් බලාගෙන සිටියදී මා කොහොම යන්න ද? ඊටත් වඩා මගේ දුප්පත්කම දැනගෙන වුනත් හංසි මට ආදරයෙන් සැලකුවාට, ඒ ගෙදර අනිත් අයගෙන් මා කොහොම එවැන්නක් බලාපොරොත්තු වෙන්න ද? රූපියල් අස්සේ අලුක්කාල් ගහන්නට ගිහින් ලැජ්ජා වී හිත රිදවා ගන්නේ කුමට ද?

"අනේ ඇයි ලොකු පුතේ බෑ කියන්නෙ...? ගිහිං එන්නකො. මේ පුංචි ගෝල්ලත් එක්ක යන්න බය වෙන්න එපායැ."

"බයක් නෙවෙයි තාත්තෙ. හැම වෙලේම කරදර කරන්න මං ආස නෑ."

"අපි ඔයාව ඔළුව උඩ තියාගෙන යන්නෙ නෑ. එනව මෙන්න මෙහෙ."

"තාත්තවත් මුකුත් හද ගන්නෙ නෑනෙ පුතේ."

උම්මා සාංකාවෙන් වාගේ කිවා ය.

"මුකුත් එපා ආන්ටි. කන්න පුළුවං යන තැනකිං."

"කලිං කිව්වනං මං පොලොස් ගෙඩියක්වත් උයල බත් ටිකක් බැඳල දෙනව."

"ඒකනං කියනකොටත් කටට කෙළ ඉනුව. වෙන දවසක යනකොට කියන්නංකො ආන්ටි. යං ආර්යා."

"ඉන්න ඇඳුමක්වත් ඇත්දෙ නෑ."

"අපේ ගෙදර ගිහිං පුළුවං."

"ළමයො මේ ගෙදරට අඳින ඇඳුම පිටිං ඉන්නෙ."

"කවුරු බලන්නද? යං යං පරක්කු වෙනව."

මා ඇඳගෙන ගිය හංසි රියෙහි පිටුපස අසුනට මා ගොඩ කොට දොර වසා දැමුවා ය. රිය පණ ගන්වන ගමන් ඉදිරි කැඩපතින් සදෙව් මදෙස බැලිය. මා සිනැසෙන්නට හැදුවත් ඔහුගේ බැල්මේ සිනහ බිඳුවක්වත් තිබුණේ නැත. ක්ෂණික බියක් හදවතට දැනිණ.

පරණ චීත්ත ගවුමක් ඇඳගෙන, ගෙවුණු රබර් සෙරෙප්පු දෙකක් පයලා ගෙන උන් මා හංසිලාගේ ගෙදර වැඩකාරියකටත් වඩා අන්තය කියා මට සිතිණි. මා කොයිතරම් දුප්පත් අසරණියක්ද කියා දන්නවා නම් හංසිගේ දෙමව්පියන් ඇයට මා ඇසුරු කරන්නටවත් නොදෙනු ඇත. ඒ අස්සේ ඇය හිතුවක්කාරකමට



මට තරමක්වත් හොඳ ඇඳුමක් ඇඳගන්නට ඉඩ නොදුන්නා ය. හිඟන්නියකටත් වඩා අසරණ පුලන්නියක වාගේ මා ඒ මැදුර මැදින් ඇවිදගෙන යන්නේ කොහොමද...?

"එන්න එන්න... මෙයා නිකං අපේ ගෙදරට අදම ආව වගේනෙ."

ඉඟවටේ අත දමා මා ළංකොට ගත් හංසි, ඇගේ කාමරයට යන පියගැට පෙළ නැංගා ය. ආලින්දයේ කවුරුන්වත් නොවීම හිතට සහනයක්ම විය.

"අවන්න එන එකක් නෑ මෙහෙට. අපි එහෙ යන්න වෙනව. ඉක්මනට ලැස්ති වෙමු ආර්යා. ආ ඒක නෙවෙයි ඔයාට දෙන්න තෑගි ගොඩක් තියෙනව."

"තෑගි...?"

දැසත් ලොකු කරගෙන මා බලා හිඳියදී හංසි ඇගේ අල්මාරියේ දොරක් හැරියා ය.

"අපේ අයිය මට කියල අරං ඇවිත් තියෙන ඇඳුං. එයා ඒවයෙං බාගයක්ම ආපහු අරගන්න මට වඩා ඔයාට ලස්සනයි කියල."

"පිස්...පු... මට මොකටද...? ඔයා තියා ගන්න."

"ඔන්න ඔන්න ඉතිං ගණං උස්සනව. ම්...මේව ඔයාගෙ..."

ඈ අලුත් ඇඳුම් තොගයක්ම ඇඳ උඩට දැමුවා ය. ඒවායේ අලුත් සුවඳ කාමරය පුරාම විසිරිණි. අලුත් ඇඳුම්වල සුවඳ ජීවිතයට අලුත් බලාපොරොත්තු දෙන්නේ ය. නමුත් මම ඒවාට අතවත් නොතැබීමි.

"ට්‍රිප් එකට අඳින එක මං තෝරන්නෙ හොඳේ. හැබැයි ඔන්න නුවර කොල්ලංව අවුස්සල එන්න බෑ."

දඟකාර තරුවටු බැල්මකින් මදෙස බැලූ හංසි කලු පාට ඩෙනිම් කලිසමකුත් සුදු ලස්සන ටී-ෂර්ට් එකකුත් මට දුන්නා ය.

"උදේ යද්දි හදිස්සියට ගෙනියන්න අමතක වුණා. අයිය මගේදියි ඇහුවෙ ගත්ත ද කියල. මං අමතක වුණා කිව්වහම මිනිහ තරහෙං ගියේ. දන්නෙ නැද්ද... මූණ දෙක කරගෙන හිටියෙ..."

එහෙනම් සදෙව් අයියා මගේ පිරිනුත් යවා තියෙන්නේ ඒ තරහව ය. බෙහෙවින්ම පොහොසත් මිනිසුන් වූවාට හංසිලා, සදෙව් අයියලා කොයිතරම් කරුණාවන්ත හදවත් ඇති අය ද...? ඔවුන් මේ තරමට දුප්පත් මට ළෙංගතුකම් පාන්නේ පෙර සංසාරේ හුරු පුරුද්දකට විය යුතු ය. යෙහෙළියකටත් වඩා හංසි මට නිවුන් සහෝදරියක් තරම් සමීප ය.

"බලාගෙන ඉන්නෙ... ඉතිං වොෂ් එකක් දාගෙන ඇඳගන්නව."

"මේ ට්‍රිප් එකට මාවත් අඩගහගත්තෙ අපරාදෙනෙ... බලන්නකො දෑ අවන්තයිය බනියි හනිමූන් යනකොටත් ඔයා ආර්යාව එක්කගෙන එයි කියල."

"ඒ පිස්ස මිත හැම තිස්සෙම කියනවනෙ. අයියගෙ පාටි එකටත් අවන්නට එන්න බැරි වුනානෙ. ආර්යා ඒකයි මේ ගමන දාන්නෙ. අපි දෙන්නට ලව් කරන්න යන්න නෙවෙයි. ඒක නිසා වුරු වුරු ගානෙන නවත්තල ඉක්මන් කරන්න. ලේට් වුනොත් අද රෑ කැන්ඩිවල තමයි ඉන්න වෙන්නෙ."

"අනේ මේ මට බෑ."

හංසි තෝරා දුන් ඇඳුමත් අරගෙන මම නාන කාමරය වෙතට දිව්වෙමි. දෙර වසන්දීත් ඇගේ උස් සිනහ හඬ කාමරය පුරා රැව් දෙමින් තිබිණි.

මිදුල අතුගා දහඩිය දමූ හින්ද ඇඟ හෝද ගන්නට හිතුවත්, කල්පනාව අවුල්ව තිබී නිසාද මන්ද වතුර මලට හිස ඇල්ලිණි.



එහෙමම හිඳ ගෙතු කොණ්ඩය ලිහා දමූ මම බොහෝ වෙලාවක් වතුර බිංදුවලට මා දෙවන්නට ඉඩ හැර බලා සිටියෙමි.

"ඒයි... හනිමූන් යනව නෙවෙයි. ඉක්මනට එනව..."

හංසි පිටතින් දෙරට ගැසුවා ය. මඳ සිනහවක් මගේ දෙතොල් මත පිපිනි. මල්ලිවත් මේ ගමනට එකතු කර ගන්නට තිබුණා නම් හොඳ ය. මා එවැන්නක් කීවා නම් හංසි නිසැකවම මල්ලිටත් ගමනට ඇරයුම් කරනු ඇත. ඒත් මේ තරම් මා ගැන හිතන ඔවුන්ගෙන් තවත් ඉල්ලීම් කරන්නට මට හිත් දෙන්නේ නැත.

මා නාන කාමරයෙන් එළියට එන්දී හංසි කාමරයේ හිටියේ නැත. මම කැඩපත අභියස හිඳ ක්‍රීම් බිඳක් කොපුල් මත තැවරුවෙමි.

"ලස්සනයි."

මවෙත ආ හංසි මගේ කොපුලක් සිපගත්තා ය. සහෝදරකමක උණුහුම මට දැනිණ.

"නැවද කෙල්ලෙ මේ සීතලේ... අම්මෙ... මාවනං හිතනකොටත් වෙව්ලනව."

"හිතනකොට සීතල වුණාට නානකොට සනීපයි."

"ඇත්...ත...ද...?"

ඈ ඇද පැද තිබෙව් අමුතු බැල්මක් ඇස් දෙකට අරගෙන ය. මම ඇගේ තත් පෙත්තක් අල්වා රිදෙන්නට මිරිකුවෙමි.

"වචනයක් කිව්වොත් කුණුහරුපයක් හිතනව නේද?."

"ඌ...යි... කවුද දං කුණුහරුප කිව්වෙ...? මම එහෙම දෙයක් කිව්වද...?"

"එන්න එන්නම වල් වෙනව. මං කියන්නංකො අවන්තයියට."

හංසි මහ හයියෙන් සිනහ වූවා ය. සදෙව් අයියාගේ රුව දෙර ළඟින් මතු වූයේ එවෙලේම ය.

"කොමල කර කර ඉඳල එන්න රෑ වුණා කියන්නෙපා හරිද...?" මූණේ නැති තරහවක් ඔහු කටහඬේ ඇති කරවන්නට හැදුවේ ය.

"ඒක තමයි. මෙයා දෝවනය වෙන්න පැය ගාණක් ගන්නකොට මං කිව්වෙ."

මගේ සිතොළඟ හිරිගැන්විණ. මා සදෙව් අයියා දෙස බැලුවේ අසරණව ය.

"ආ... එයත් නාල- දැං බලනකොට මේ අපි විතරනෙ හඩ්ඩො වගේ යන්නෙ."

හංසිත් බොරු තෝක්කාඩුවක් මවා ගත්තා ය. තපුරු නැති බැල්මකින් එක වතාවක් විතරක් සදෙව් අයියා මදෙස බැලිය. හුඟක්ම හිතවත් සිනහවක් - ස්තූති පූර්වක සිනහවක් ඔහු වෙත පුද කරන්නට මට සිතෑ වුනත්, මගේ සිනහව පිපෙන්නට පෙරම ඔහු පිටුපා යන්නට ගියේ ය.

"ආ... යට බාගෙත් ඇවිත් නේ?."

හංසිගේ අනාගත සැමියා. අවන්ත අයියාගේ ගේ ළඟ නැවතුන රියෙහි මං සිටිනු දුටු මෙන් ඔහු රියට එබී කීවේ ය. මාත් හංසිත් එකවර හිනැහුණෙමු.

"කවුරු...?"

සදෙව්ට තේරුණේ නැත. මටත් හංසිටත් ආයේම සිනහ නැඟිණි.

"මස්සිනාට ඉතිං ඕව මුල ඉඳලම කියල දෙන්න වෙනවනෙ. මෙයා යට බාගෙ. අරය උඩ බාගෙ. දෙන්න සෙට් වුනාහම තමයි එකක් වෙන්නෙ."

භයියෙත් සිනහ වුණු සදෙව් රියේ ඉදිරි කැඩපතින්, පිටුපස උන් මදෙස බැලුවේ ය. මම යාන්තමින් සිනහ වීමි. ඔහු ළෙංගතු



- වඩාත් ළෙංගතු බැල්මක් හෙළුවේ ය. සදෙව් අයියාගේ තරහව නිවී ඇතැයි සැනසිලිදයක හැඟීමක් මා තුළ ඇති විණි.

"යනව යනව පිටිපස්සට."

අවන්ත අයියා හංසිව පිටිපස්සට එවා ඉදිරි අසුනට ගොඩ වූයේ ය. සතුටින් ගමන ඇරඹිණ. දෙමස්සිනාලාට කතා කරන්නට ඕන තරම් දේවල් තිබිණ. අවන්ත, සදෙව්ගේ මිතුරෙකි. හංස හා අවන්ත අතර ප්‍රේමයක් ඇතිවෙන්නේත් ඒ හිතවත්කමට ගෙදරට ආ-ගිය අතරවාරයේ ය. හොඳ පවුල් පසුබිමකුත් ආර්ථික තත්ත්වයකුත් තිබෙන නිසා හංසිගේ ගෙදරින් අවන්තට විරෝධයක් ඇති වෙන්නේ නැත. ඒ අතින් හංසි මොන තරම් වාසනාවන්ත යුවතියක් ද...? එක අතකට ලෝකයේ තියෙන හැම යහපත් දෙයක්ම ඇගේ දෙපා පාමුලට ලැබීම පුදුම වෙන්නට කාරණයක් නොවේ. හංසිට තියෙන්නේ ආදරය, දයාව, කරුණාව පිරුණු මුදු මොළොක් හදවතකි. එවැනි සිතැත්තන්ට දෙවියෝ ආශිර්වාද කරති.

මුලින්ම අප ගියේ දළදා මන්දිරයට ය. මාත් හංසිත් මල්කාරයෙක් ළඟට දිව ගොස් මල් මිටි දෙකක් මිලදී ගතිමු. මල් අරගෙන එන්දී ඉස්සරහට හමු වූ පිරිමි ළමයි කිහිප දෙනෙක් අපට මොන - මොනවාදෝ කියා විහිළු කළහ.

"දැං මල් හොයාගන්න බැරි වෙනව. කෝකද මල කියල රැවටෙනවනෙ..."

"කොළඹ මල් වගේ නේ..."

හංසි ගාණක් නැතිව සිනහ වූවා ය. ඒත් අවන්ත අයියා සිටියේ කේන්තියෙනි.

"මොකද විරිත්තන්නෙ... මොනාද උං කිව්වෙ...?"

"මල හොයා ගන්න බැරුව රැවටෙනවලු. මට නෙවෙයි ආර්යාට. එයානෙ ඉතිං මලක් වගේ ඉන්නෙ."

"අනේ මේ මට නෙවෙයි."

"නෑ ඒක හරි. මෙයාට කිව්වනං කියන්නෙ වෙල් කරත්තෙ කියල."

"මයි...ය ඉතිං... මෝඩයා."

හංසි අවන්තයියාගේ අත් ගොබය සැපුවා ය. අපි කවුරුත් සිනහ වීමු.

"මල් අරගෙන එහෙම දළද වඳින්නයි යන්නෙ... මීනි මස් කන..."

අවන්තයියාගෙන් ඈත් වී හංසි මගේ අත අල්වා ගත්තා ය. දළද වැඳ විත් වැව රවුමේ ඇවිදිනදීත් ඈ හිටියේ මා ළඟින්ම ය. වැව පුරා බෝට්ටුව බෝට්ටු සවාරිය බෙහෙවින්ම මසිත ගති. වැව පුරා බෝට්ටුව ගමන් කරන තුරාවට මා හිටියේ දකුණතින් දිය කඳ ස්පර්ශ කරගෙන ය. බිඳි විසිරෙන දිය බින්දු සිතල පටලයක් සෙයින් මගේ කම්මුල් මත බැඳී තියෙනවා මට දැනිණ.

අප දිවා ආහාරය ගත්තේ "වෙවෝන්." අවන්හලෙහි උඩු මහලේ හිඳ ය.

"ආර්යා කනවද අනගානවද ආ...?"

සුළු වෙලාවක් තිස්සේ මා ගැන අවධානයෙන් හිඳ ද මන්ද අවන්ත අයියා ඇසුවේ ය. මම විළිබර සිනහවක් පා බත් පත දෙස බලා සිටිමි.

"මහොම තමයි. කුරුලු පැටියෙක් වගේ පැය දෙකක් විතර බත් ඇට ඇහිදියි. ඔයා දන්නවද අවන්ත... ආර්යාව බඳින මනුස්සයෙක්ට ඒ තරං ලොකු වියදමක් යන්නෙත් නෑ."

"ඇයි...?"

"ඇයි ඉතිං මෙයා කන්න බොන්න උනන්දුවක් තියෙන කෙල්ලෙක් නෙවෙයිනෙ."



"හන්තානෙ යන්ද...?"

ඒ කතාව මැද්දෙන් පැන හදිස්සියේම සදෙව් ඇසුවේ ය. අවන්ත අයියා අඩ සිනහවක් පානු මම දුටුමි.

"ඔහොම හන්තානෙ ගිහිං වැඩක් නෑ. ඉක්මනට කෙල්ලෙක්වත් හොයා ගත්තනං ඔන්න..."

අවන්ත අයියා වෙතට නැවුණු හංසි ඔහුගේ කනට කොට රහසක් කීවා ය. ඊළඟට ඔවුන් දෙදෙනාම සිනහ වූයේ මදෙස බලමිනි. මුළු සිරුර පුරාම දුවමින් තිබුණ රුධිරය ක්ෂණිකව කම්මුල්වලට පිරුණා සේ පුපුරු ගැසීමක් මට දැනිණ. කොපුල් රතු වී තියෙන්නට ඇත. මම බත් පිඟාන දෙසට වඩාත් හිස පහත් කළෙමි.

"හන්තානෙ නගින්න නං වෙලාවක් නෑ මචං. ටිකක් හවස් වෙනකල් ගාඩින් එකට වෙලා ඉඳල යන්න ලැස්ති වෙමු. ඊළඟ සැරේ හන්තානෙ එමුකො... අවශ්‍යකා ටික එහෙම සම්පූර්ණ කරගෙන... නේද ආර්යා?."

මම හිස නගා බැලීමි. හැම ඇසක්ම තිබුණේ මවෙත හැරවී ය. හැම කතාවකටම ඔවුන් මාවත් පටලවා ගන්නට හදන්නේ ඇයි...?

වෙවෝන් අවන්හලෙන් නික්මී අප ගියේ පේරාදෙණියේ මල් වත්තට ය. නුවර වැව ළඟදී අරගත් අන්නාසි අච්චාරු කමින් මාත් හංසිත් මල් බල - බලා ඇවිද්දෙමු.

"ඔයාට බෝරිංද ආර්යා...?"

හදිස්සියේම හංසි ඇසුවා ය.

"නෑ ඇයි එහෙම ඇහුවෙ...?"

"බෑ කියද්දි බලෙන්නෙ ඇදගෙන ආවෙ. ඒකයි."

"බෝරිං වෙන්නෙ කොහොමද...? ඔයයි අවන්තයියයි ළඟ

ඉන්නකොට ජීවිතේ හැම ප්‍රශ්නයක්ම අමතක කරල සතුටෙං ඉන්න පුළුවං. ඔයා වගේ හොඳ කෙනෙක්ට අවන්ත අයිය වගේ හොඳ කෙනෙක් ලැබිච්ච එක කොච්චර වාසනාවක් ද...?"

"ඇත්තටම අවන්ත මුණ ගැහුණට පස්සෙ මගෙ ජීවිතේ ගොඩක් වෙනස් වුණා තමයි ආර්යා... ඔයා දන්නවනෙ... ඉස්සර මං මොනතරං පිස්සු නටපු කෙල්ලෙක් ද? අවන්ත එහෙම නෑ. එයා හරි සීරියස්."

"ආයෙත් එහෙම පිස්සු නටන්න හිතන්නවත් ඕනෙ නෑ. දැං ඉතිං තියෙන්නෙ දෙන්නත් එක්ක ජීවිතේ පිළිවෙළක් කර ගන්න එකයි."

"මන්නං දැන්ම බඳින්න ආස නෑ. ඒත් අවන්ත එක්ක සෙල්ලං කරන්න හම්බ වෙන්නෑ. එයා කියන දවසට බඳින්න ලෑස්ති වෙලා ඉන්නලු. බබාලත් දුසිමක් විතර හදනවලු."

හංසි ඒ ටික කීවේ මුණ ඇඹුල් කරගෙන ය. අන්නාසි කෑල්ලක් කටේ තිබියදී සිනහ වෙන්නට ගිය මට හිස්මොළයේ ගියේ ය. හංසි මගේ පිටට තට්ටු කළා ය. මගේ ඇස්වලින් කඳුළකුත් එළියට පැන තිබිණ.

"අපි යන්ද අරගොල්ලො ඉන්න දිහාට...?"

අවන්ත හා සදෙව් මහවැලි ගං ඉවුර සමීපයේ තණ බිම මත ඉඳගෙන කතා කර කර සිටියහ.

"දෙළුකද...?"

අච්චාරු බෑග් එක දෙස බලා අවන්ත ඇසුවේ මගෙනි.

"මේ බලන්නකො... මගෙනුයි අහන්නෙ..."

සිනාසුනු හංසි, අච්චාරු අන්නාසි කැබැල්ලක් අවන්ත අයියාගේ කටට දැම්මා ය.

"වහින්න වගෙයි හදන්නෙ."



කියාගෙන නැගිට ගත් අවන්ත අයියා, ගං ඉවුර දෙසට පල්ලම් බැස්සේ ය. ඔහු යන මග දෙස බලාගෙන සිටි හංසි ඊළඟ තත්පරයේ දී ඒ වෙතට දිව්වා ය. සදෙව් අයියා එක්ක මා මෙතැන තනිවී ඉන්නේ කොහොමද...? මා අඩියක් පෙරට තැබුවේ තනියම ටිකක් ඇවිදින්නට හිතාගෙන ය.

"යටබාගෙ කොහෙද යන්නෙ...?"

මා තිගැස්සිණි. දැත් දෙපසට විහිදුවා බිම හිඳගෙන සිටි සදෙව් හිස නගා මදෙස බලා සිටියේ ය.

"ඒ මනුස්සයංට ටිකක් තනියම ඉන්න දෙන්නැද්ද...?"

මට දැනුණේ පුදුම ලැජ්ජාවකි. පොළව පැලී මෙතන මෙහෙමම මා මිහිදන් වෙනවා නම් කියා මට සිතිණ. සදෙව් අයියා අද අමුතු ය. එද වාගේ සුහද නැත. කතා කළත් අරෝචවටම ය. අන්ත අසරණ තමත් මා පිඩාවට පත් කොට තිබිණ.

"මෙහෙට එන්න."

ඔහු හිසත් එනා කතා කළේ ය. මම හෙමිහිට පිය තබා ඔහු ළඟට ගියෙමි.

"ඔහොම ඉඳ ගන්න."

අවනත නොවී - සිතරු නොවී සිටිය නොහැකි මොකක්දෝ බලවේගයක් සදෙව් ඔස්නායකගේ කටහඬේ තිබුණා සේ ය. මම එතැන - එහෙමම බිම ඉඳ ගතිමි. ඉඳගත්තා ඔහුට ළඟ වැඩි යැයි හිත පසුතැවිලි වූයේ දෙවනුව ය.

"මට කෑල්ලක් අරං දෙන්න ඕකෙන්."

පුංචි බෑග් එකට ඇඟිලි දෙකක් දමා ලොකුම අච්චාරු කෑල්ලක් ගත් මම එය සදෙව් අයියාගේ අත වෙත පෑවෙමි. ඒත් ඔහු කට ඇරියේ ය. ඉතින් අන්නාසි කෑල්ල ඔහුට කවන්නට මට සිදු විය.

"ඇයි එද මට බොන්න එපා කිව්වෙ...?"

ඔහු අහන්නේ මං අමාරුවේ වැටෙන දේවල්ම ය. එද සිද්ධි පෙළක්ම සිනමා පටයක රූප රාමු සෙයින් මගේ සිතේ මැවිණි. මත්පැන්වලට රතු වී තිබූ සඳෙව් අයියාගේ ඇස් මට සිහිපත් විය.

"අපේ තාත්තා හැමදාම රෑට ගෙදර එන්නෙ හොඳටම බීල සඳෙව් අයියෙ... තාත්ත වෙනුවෙං අප්‍රමාණ කැපකිරීම් කරන අම්ම කොච්චරක්නං ගුටි කනව ඇත්ද? අයියට මේව කියන්න මං ලැජ්ජ වෙන්න ඕන නෑ. හංසිත් මේ හැමදේම දන්නව. මුලිං චුට්ට චුට්ට බීල තමයි අපේ තාත්තලත් පහු වෙනකොට ඔහොම පුරුදු වෙලා තියෙන්නෙ. කවදහරි අයියල බැන්ද දවසක... ඒ ගෑණු ළමයත් අපේ අම්ම වගේ දුක් විඳිවි අයිය දිගටම බිව්වොත්..."

මගේ ඇස්වලට කඳුළක් නෙත පුරා, ඇසි පිය බර වී තියෙනවා මට දැනිණ.

"එතකොට ඒ බඳින ගෑනි ගැන දුකට ද බොන්න එපා කිව්වෙ...?"

මම ඔහු දෙස බැලුවෙමි. ඒ ඇස්, මිදී යා නොහැකි ලෙස මගේ ඇස් අල්වා ගත්තේ ය.

"ම... ඒ නිසා විතර ද බොන්නෙපා කිව්වෙ...?"

නැත. මා දුක් වෙන්නේ ඒ පවුකාර ගිනි වතුරෙන් සඳෙව් අයියාගේ ජීවිතය නාස්ති වෙතැයි යන බයට ය. ඒත් එහෙම කියන්නේ කොහොමද? සඳෙව් බස්නායක වූ කලී රාජ කුමාරයෙකි. ඇසිපිය නොහෙලා ඔහු දෙස බලා සිටින්නට තරම් ලෝභකමක් කෙල්ලකගේ සිතේ ඇති නොවුණොත් පුදුම විය යුතු ය. ඒත් හීනයෙන්වත් ඒ ගැන හිතන්නට පුළුවන් කමක් අප වාගේ අසරණයන්ට කොයින්ද? මම මගේ ඇස් බිමට හරවා ගත්තෙමි.

"මොකද කතා කරන්නැත්තෙ... ම්....? පූසෙක්ට අහු වුන මී පැටියෙක් වගේ බය වෙලා ඉන්නෙ ඇයි...?"



"අයිය අද එද වගේ නෙවෙයි."

"ඇයි...?"

"සැර කරනව... වසයි වගේ...."

සඳෙව් හයියෙන් හිනැහිණ. ඒත් හිනා වෙන්නට හේතුවක් මට නම් නොතිබිණි. අනිත් එක, ඔහු එක්ක ඒ වගේ දෙයක් කිව් එක ගැන මම හදවතින්ම පසුතැවුණෙමි.

තත්පරයෙන් තත්පරයට අඳුර මෝරා ආවේ ය. අප මල් වත්තෙන් සමුගෙන රිය වෙත එද්දී පොද වැස්සක් ඉහිරෙමින් තිබිණ. මම මගේ වත අඳුරු - ගැඹුරු අහස දෙසට ඔසවාගෙන සිනහ වීමි. හිරිපොද, මලක් සිපගන්නා පිණිබිඳු තරම් මෘදු ලෙස මගේ වත සිප ගත්තේ ය. හිතත් සැහැල්ලු වී තිබිණි. උදේ ඉඳන්ම මට ආඩම්බරකම් පෙන්ව - පෙන්වා හිටිය සඳෙව් බස්නායක සුහද ලෙස වචනයක් - දෙකක් හෝ කතා කිරීම කොයි තරම් සතුටක් ද...? හංසි රියෙහි සිටම කෑගැවා ය.

"පිස්සුද ළමයො තෙමෙන්නෙ...? වහිනව නේද...?"

"නුවර වැස්ස ලස්සනයි හංසි."

"මට ඔයාගෙ කවිනං තේරෙන්නෑ කෙල්ලේ. නගින්න නගින්න."

"මං ඩ්‍රයිව් කරන්නද සඳෙව්...?"

රියදුරු අසුනට ගොඩ වෙන්නට ගිය සඳෙව් සිනාසී ආපසු හැරිණි. ඒ හිනාව ඒ තරම් ලස්සනට මා ඒ දුටුවා ම ය. හදවතට මොකක්දෝ වුනත් එවැන්නක් නොවුන ගාණට මම බලා සිටියෙමි. රියෙහි යතුර සඳෙව් අවන්තයියා වෙතට විසි කළේ ය.

"නියමයි. අද යනකල්ම බොනව."

මගේ දෙතොලතර ඇඳී තිබුණ තුනී මදහස ඇසිල්ලකින් වියැකී යන්නට ඇත. පසුපස දොරෙන් රියට ගොඩ වූ මම වීදුරු කවුළුව අයිනටම වී හිඳ ගතිමි.

"නංගි යනව ඉස්සරහට."

"තමත් නැද්ද...?"

"තමත් නෑ යන්න."

"තමත් නැද්ද." යි අසන්නට වාගේ නංසි අවන්ත අයියා දෙසත් බැලුවා ය. ඔහු ඇයට ඇස්වලින් "එන්න."යි කියනු මම දුටුවෙමි.

"ආර්යාට පාළු වෙයි ද...?"

"නෑ නංසි යන්න..."

"දන්නවද සදෙව්... නංසි තනිමුත් යන්න ගිය දවසටත් ආර්යාවත් එක්කගෙන යමුද කියල අහනව... බලපංකො බොරුද කියල."

මහිස පිරිමැදි නංසි, රියෙන් බැස යළි ඉදිරි අසුනට ගොඩ වූවා ය. සදෙව් අයියා වෙතින් විහිදුන සියුම් විලවුන් සුවඳක් මා වෙලා ගෙන තිබිණ. මට දැනුනේ ඒ සුවඳ අයිති විලවුනයකට නොව සදෙව් අයියාගේම ආත්මයට වාගේ ය. ඒ සුවඳ මා මත්මත් කරන්නට සමත් වුවත්, මා ඔහු දෙස බැලුවේවත් නැත.

"අවන්ත මහත නවත්තපං."

"කොහෙද...? ඇයි...?"

"මග සිංහ පැවිලියක් ඉන්නෙ බං. එතන නවත්තපං."

"මටනං ගේන්න එපා සදෙව්. ඩ්‍රින්ක්ස් අරං බෑ. පාරත් ටිකක් ස්ලිප් වෙනව වගේ... වැස්සනෙ..."

රියෙන් බැස පොද වැස්සේම දිව ගිය සදෙව් බියර් කෑන් එකක් රැගෙන ආවේ ය. බියර් එකක් බිව්වාට පිරිමියෙක්ට හානියක් වෙන්නේ නැති බව මා නොදන්නවා නොවේ. ඒත් සදෙව් මේ වෙලාවේ මෙහෙම කරන්නේ මගෙන් පළි දරන්න ය. පිරිමින්ගේ හිතුවක්කාරකම් ළඟදි ගැහැණු අප මොන තරම් අසරණ ද?



ආත්මානුකම්පාවට හිත දියකරගෙන කඳුළක් මගේ කොපුල් තලා දිග ගලා ගියේ ය. නංසි ඒ කඳුළ නොදක්කා වුනත්, අඩ අඳුරු රිය තුළ මට ළංව හිඳ උන් සදෙව් ඒ දුටුවේ ය. අසුන මත වූ මගේ අත්ල තද කොට අල්වා ගත් ඔහු වීදුරුවක් පහත් කොට බියර් ටින් එක පිටතට විසි කළේ ය. අවන්තයියා අඩැසින් බලනු මම යාන්තමට දුටිමි.

සදෙව්ගේ අතේ සිට මගේ අතැඟිලිවලින් ඇතුළු වූ හිරිවැටීමක් මුළු සිරුර පුරාම පැතිර ගියේ ය. ඒත් ඔහුගේ දැඩි ග්‍රහණයෙන් මගේ අත නිදහස් වූයේ තව හුගක් දුර ගිය ඉක්බිතිව ය. මම හිස අසුනට බර කොට නෙතු පියවා ගතිමි.

"මොනා හරි කාල යං නේද...? ගෙදර යනකොට රෑ වෙයිනෙ."

රිය නැවතෙනුත් අවන්තයියා ඉන්න පැත්තේ දොර ඇරෙනුත් මට ඇසිණ. මම නෙතු නොහැරීමි.

"ආර්යා... ඇයි...?"

"ටිකක් හිසරදේ නංසි. මට මුකුත් කන්න බෑ. ඔයාල ගිහිං එන්න."

"මටත් කන්න බෑ නංගි. ජින්ජර් බියර් එකක් ගෙනත් දෙන්නකො. ආර්යාත් තනියම නිසා මං ඉන්නං."

ඔහු මේ මොනවා කරන්නට හදනවාද...? මම අවදි වී වීදුරුවෙන් එපිට නෙතු දිවවීමි. නුවර වැසි මෙහෙට වැස්සේ නැත්තේ ඇයි...?

"මං බිව්වෙ නැතෙ ඉතිං."

සදෙව් කතා කළේ හරි හෙමිහිට - වරදක් කරන්නට ගිහිං අහු වී අම්මා ළඟ ගතු කියන පොඩි එකෙක් වාගේ පැකිළෙමිනි. මා මොනවා කියන්නද...? ඔහු බිව්වත් නොබිව්වත් ඒ ගැන කතා කරන්නට මා පාවිච්චි කළේ කොහේ තිබුණ අයිතියක් ද...? ඊටත් වඩා හඬන්නට මා තුමට ඇස්වලට ඉඩ දුන්නා ද...?

"අහින් එක ඒක බියර් එකක්නෙ... එනි වේ... සොරි... මං ආයි ඔයාගෙ හිත රිද්දන්නෑ. අයි ප්‍රොමිස් යූ."

දෙවියනි; මේ සිදුවන්නේ කුමක්ද? සියල්ල මෙහෙම වෙන්නට ඉඩ දී ඔබවහන්සේ බලාගෙන හිටියා ද...? නැත්නම් අහක බලාගෙන හිටියා ද...?



# 03

**මල්ලීගේ** හැසිරීමේ වෙනසක් සිදුවෙන්නට ගත්තේ ය. ඔහු අම්මා එක්කත්, තාත්තා එක්කත් එකටෙක කියන්නට පටන් ගනු මා බලා සිටියේ ටික දිනකට පෙර සිට ය. මුලදී විශේෂ හේතුවක් මත පමණක් පාසල් යාමට අදිමදි කළ ඔහු, ඔහුට හිතුන හිතුන දවසට ගෙදර නවතින්නට පටන් ගත්තේ ය. එයින් අම්මාටත් වඩා හිත රිදුනේ මගේ ය.

"හිතුන හිතුන දවසට ගෙදර නවතින්නෙ... නිකං දෙන අධ්‍යාපනයවත් ගන්න ඕනමත් නැද්ද...?"

මල්ලී ගෙදර නතර වුන දවසක මම ටිකක් තදින් කතා කළෙමි. අම්මාට තාත්තාට එකටෙක කිවත් ඔහු මාත් එක්ක කට ගසාගෙන එන්නේ නැත.

"අධ්‍යාපනේ නිකං දෙනව කිව්වට ගුරුවරු කළු ලෑල්ලෙ ලියන එක විතරනෙ අක්කෙ නිකං කරන්නෙ. නිකමො වගේ ඉස්කෝලෙට ගිහිං අපි නිකං තෝන්ඩි වෙනව."

මට තවත් කතා කරන්නට ඉඩක් නොතබා මල්ලී ගෙයින් නික්ම ගියේ ය. ඔහු දැන් කතා කරන්නේ ද ඔහුගේ මුවින් නොවෙයි මට සිතෙන තරම්.

මල්ලී ගමේ කොලු තඩයට වැටී පාරේ ඒ මේ අත ඇවිදිනු ද මම කොතෙකුත් දුටුවෙමි. හදවත සත් කඩකට පැලී යනවා

වාගේය මට දැනුනේ. මා මගේ මල්ලිව බේරා ගන්නේ කොහොමද? මේ සමාජය තරක බව මම දන්නෙමි. මේ සමාජය බලා ඉන්නේ නව උත්තෙනෙක් හෝ සිය බිල්ලක් කරගන්නට ය. මල්ලී එය තේරුම් නොගන්නේ ඇයි? අධ්‍යාපනය කඩාකප්පල් කරගෙන රජ්ජියාදූකාරයෙක් වෙන්නට මල්ලීට ඉඩහැර අහක බලාගෙන ඉන්නට මට නුපුළුවන. මට ඕනෑ කෙසේ හෝ මේ තාරාවළෙන් ගොඩයන්නටයි. තනිව නොවේ. මල්ලී හා නංගී ද කැටිව ය. නමුත් මේ විදිහට ඔහු අකාලයේම නැලේ පනින්නට ගත්තොත් මගේ බලාපොරොත්තු සුදු විසුළුව යන්නේ ය. මගේ විතරක් නොව පවුලේ වශයෙන් අප සියලු දෙනාගේම බලාපොරොත්තු සුනු විසුනුව යන්නේ ය.

හංසිලා උත්ත නුවර ගිහිං ආ සතුට විඳගන්නට මගේ සිතට ඉඩක් නොදෙන තරමට මල්ලී ගැන වේදනාව මා තුළ ඔඩුදුවමින් තිබිණ.

"දං පුදුම හිතුවක්කාරකමක් තියෙන්නෙ. කිව්වට අහන්නෙ නෑ."

මගේ ශෝකවීම ගැන අම්මා කිවේ එවැනි කතාවකි. ඔවුන්ට එපමණකින් හිත හදාගත හැකි විද මට එසේ කළ නොහැකි ය. අරමුණ කරා යන්නට නම් මට මල්ලීගේත්, නංගීගේත් සහාය අවශ්‍ය වේ. නංගී නම් තවම පුංචි ය. නමුත් මල්ලී ඉන්නේ නොතේරෙන වයසක නොවේ.

මේ දේවල් ගැන සිතමින් සංකාවෙන් ගෙවුනු හවසක හංසිලාගේ ගෙදර වාහනයක් අපේ කවුල්ල ඉදිරිපිට නැවතින. සිත විසල්-ඉරිතලා ගිහිං තිබි වෙලාවේ හංසි වගේ හදවතට වඩාත් සමීප යෙහෙළියක සමග ටිකක් කතාබහ කරන්නටවත් ලැබීම මොනතරං අස්වැසිල්ලක් ද...? ඒ වෙලාවේ මා සිටියේ මිදුලේ කොට්ටම්බා ගහ යට සවි කරන ලද දිරා ගිය බංකුව මත හිඳගෙන පාර බලාගෙන ය. මගේ මුවෙහි සිනහ මලක් පිපෙන්නට ඇත. මම රිය වෙත ඉගිළුණෙමි.



හංසිගේ සිනහ සපිරි වත දකින්නට මා දිව ගියත් ඇය සිටියේ නැත. සදෙව් අයියාගේ රතු වූ ඇස් දෙක මගේ දෑස් මත නැවතිණ. මා අඩියක් දෙකක් පසුපසට විසි වන්නට ඇත.

"ස...දෙව්... අයියා..."

තත්පර කිහිපයක් යන තෙක් සදෙව් අයියා වචනයක්වත් කතා කළේ නැත. නමුත් ඒ නිහඬ තත්පර කිහිපය ඇතුළත දී ඔහුගේ දෑස දිගු කතාවක් කියමින් තිබුණා සේ මට දැනිණ. සදෙව් අයියා නිහඬව සිටිනා හින්දා අපහසුතාවයට පත් මමම යළි මුනිවත බින්දෙමි.

"හංසි ආවෙ නැද්ද?."

"නංගි තමයි කිව්වෙ ඔයාව එක්කගෙන එන්න කියල."

මා යන්නේ කෙසේද? සදෙව් බස්නායක කියන්නේ මා ඇසුරු කොට ඇති අයෙක් නොවේ. තන්නාදුනන තරුණයෙකු සමග තනිපංගලමේ රියක නැගී ගියහොත් ගමේ මිනිසුන් මට මොන මොන කතා කියනු ඇත් ද...?

"නංගිට හොඳටම සනීප නෑ."

"සනීප නෑ...?"

"ඔව්. උණ. එයා තමයි කිව්වෙ මට ගිහිං ඔයාව එක්ක එන්න කියල."

හංසි කියන්නේ මගේ හැම උවමනා එපාකමකදීම මා ළඟ සිටි දයාබර යෙහෙළියකි. එහෙව් ඇය ගිලන් වී හිඳිනවා නම්, ඇයට මගේ සමාගමය අවශ්‍ය වී තිබෙනවා නම් මා "බැහැ." යි කියන්නේ කෙසේ ද...?

"අයිය පොඩ්ඩක් ඉන්න."

කියාගෙන මම ගේ දෙසට ගියෙමි. අම්මා හිටියේ කුස්සියේ කොස් ඇට තලමිනි. නිසැකවම අද දිවා ආහාරය, තැම්බූ කොස් ඇට විය යුතු ය.

"යාළුව ආව නේද පුතේ...?"

මා දුටු අම්මා හිස නගා මදෙස බැලුවා ය.

"හංසි ආවෙ නෑ අම්මා. හංසිට හොඳටම උණ ගැනිලලු."

"අනේ දෙයියනේ. මේ දවස්වල මය බෝවෙන උණේනං හැම තැනම තියෙනව නමයි."

"හංසි වාහනේ එවල මට එන්න කියල. මං ගිහිං එයාව බලල එන්න ද අම්මෙ...?"

"මව් ඉතිං... නොයා බැනෙ එහෙනං."

මම ඉක්මනට කාමරයට ගොස්, හංසි මට දුන් - සදෙව් අයියා මට දෙන්නට කියා තිබූ කෙටි සායකුත් බ්ලවුසයකුත් හැඳ ගතිමි. බිත්තියේ ගසා තිබූ පැලුණු කණ්ණාඩි කැබැල්ලෙන් බලාගෙන මා හිස පීරන්දී අම්මා කාමරය දොරකඩට ආවා ය.

"ඔය ඇඳුම් ඇඳගෙන පාරට බහිනකොට ආර්යා මේ ගෙදර ළමයෙක් කියල කියන්න බෑ."

මම අම්මා දෙස බැලුවෙමි. ඇගේ දෑස් දිළිසෙමින් තිබුණේ ආඩම්බරකමිනි.

"කාට ලොකුකං පෙන්නන්නද අම්මෙ... අපි කවුද කියල කවුද නොදන්නෙ." කියා අසන්නට මට සිතින. නමුත් එවැනි දෙයක් අසා අම්මාට මේ ආඩම්බරකම නැති කරන්නට - ඇගේ හිත රිදවන්නට මට සිතුනේ නැත. ඒ නිසා කොණ්ඩය පෝනිටේලයක් දමාගෙන ගෙයින් පිටතට ආවෙමි. පිරිමියෙක් එක්ක පමණක් යන ගමනක් නිසා අම්මා මට විශේෂයෙන් "පරිස්සමෙං." කීවේ නැත. මගේ පරිස්සම ගැන මට අමුතුවෙන් යමක් පැවසිය යුතු නැතැයි විශ්වාසයක් ඇය තුළ ගොඩනැගී ඇති නිසාදැයි නොදනිමි.

බොරළු පාර ගෙවා අහවර තාර පාරට රිය පිවිසෙන තුරුත් සදෙව් බස්නායක මදෙස බැලුවේවත් නැත. මම නිසංසලේ



කල්පනා කරමින් ආවෙමි. එදා නුවර ගමනෙහි අවසානයේ භාගය තවමත් මට සිහිනයක් සේ ය. ඒ අවසානය අප අතර සිදු නොවිය යුතු යමක් සිදු වූවායි කිහිප වතාවකදීම මට සිතිණ. ඒ නිසා එදා සිට අද වෙනතුරුත් මා හංසි දකින්නට ගියේ නැත. සදෙව් බස්නායක කියන්නේ ඉනිමං බදින්නටවත් කෙකි තනන්නටවත් මට හැකි ගසක පිපුන මලක් නොවේ.

"මාත් එක්ක තරහෙන්ද ඉන්නෙ...?"

හදිස්සියේම සදෙව් ඇසුවේ ය. මා ඔහු දෙස බලන්නට ඇත්තේ සසල දෑසිනි. ඔහු එහෙම ඇහුවේ ඇයි? නමුත් ඔහුගේ මූණ මත වැටී එන රැවුල් කොට දෙසත්, වියළී ගිය දුක්බර දෙතොල් දෙසත් බලා සිටියෙන් මට ඒ ප්‍රශ්නය අසා ගන්නට අමතකව ගියේ ය.

"එදා නුවර ගිහිං ආවට පස්සෙ ඔයා අපේ ගෙදර එයි කියල මං හිතුව."

මා එහි හිතාමතාම නොගොස් සිටියේ සදෙව් අයියා මා හිතට ළං වූ වේගය වැඩියි කියා සිතුන හන්දා ය. අනිත් අතට හිතෙහි ගැස්මක් ඇති වුනත් මට මා රවටාලිය නොහැකි ය. මුලා කළ නොහැකි ය. මගේ ආත්මයට තව තවත් දුක එක්කාසු කොට දිය නොහැකි ය.

"ඇයි මට මෙච්චර ලොකු දඬුවමක් දෙන්නෙ...?"

හදවත සෙලවිණි. ඒ හරියට භූමිකම්පාවක් සේ ය.

"අනේ සදෙව් අයියා. මං මොනාද කළේ?."

"ඇත්ත. ඔයා මොනාද කළේ...? ඔයා අහිංසකයි. හැමදේම කළේ... හැමදේම කළේ ඉරණම."

ඔහු මේ කියවන්නේ මොනවාද...? හිත කියන්නේ ආස ආස දේ පස්සේ දිව යන දෙයක් බව සැබැවි. නමුත් එහෙම දුවන්නං වාලේ දුවන්නට හිතට ඉඩ දිය නොහැකි ය. පසුගිය සතියකට

වැඩි කාලය පුරාම, සඳෙව් අයියාගේ විදුලි කොටන ඇස් දෙක මතක නැතිවා වාගේ ඉන්නට මා උත්සාහ කළේ එක ය. ඒ වුනත් සඳෙව් බස්නායකලා එහෙම හිත් පාලනය කරන්නට පුහුණු වූ අය නොවේ. සමහරවිට ඔවුන්ගේ නොදමුණු හිතුවක්කාර හිත්වලට වසඟ වී අප වැනි අහිංසක යුවතියන් ජීවිත වරදවාගන්නට වුව බැරි නැත. ක්ෂණික බියක් මට දැනෙන්නට ගත්තේ ය.

"ආර්යා."

ඊළඟට සඳෙව් අයියා මදෙස බැලුවේ දඟකාර සිනාවකිනි. සත්තකට මම මොහොතකට වසඟ වීමි.

"නංගිට ඇති අසනීපයක් නෑ."

"අසනීපයක් නෑ...?"

සඳෙව් හිස සලමින් අර දඟකාර සිනාව පුළුල් කළේ ය.

"එහෙනං සඳෙව් අයිය කිව්වෙ? මාව එක්කගෙන යන්න ආවෙ...?"

"ඔයාව දකින්න ඕන කියල හිතුන නිසා."

ඔහු මේ තර කියමින්නේ කුමක් ද...? ක්ෂණික පෙම්වත්කමකින් සිත කිතිකැවුණත් ඊළඟ නිමේෂයේ මට තරහක් දැනිණ. ඔහු හදන්නේ සෙල්ලම් කරන්න ද...? මගේ අවසරයක් නැතිවම මගේ ජීවිතයත් එක්ක සෙල්ලම් කරන්න ද?

"මට ඔයාව දකින්න ඕන කියල හිතුන එක වරදක් ද ආර්යා...?"

මගේ මූණ අඳුරු වූ වග ඔහුට තේරෙන්නට ඇත. ඔහු එවැනි ප්‍රශ්නයක් අසන්නට ඇත්තේ එනිසාවෙනි. මගේ ඉක්මන් කෝපය ගැන පසුතැවීමක් මට දැනිණ. සඳෙව් බස්නායකලා වැනි වැදගත්, ධනවත් තරුණයන් අප වැනි අසරණයන්ගේ රැවුම් ගෙරවුම් බැලිය යුතු ද...?



හංසිලාගේ ගේ දෙසට රිය ධාවනය වෙමින් තිබිණි. මා හිටියේ තැතිගෙන ය. හංසිට දන් මා කියන්නේ මොනවා ද? සඳෙව් අයියා ගිහින් බොරු කියා මාව ගෙන ආවායි කිවොත් මොනවා සිදුවනු ඇත්ද? ඇයත් මාත් අතර පන්ති බේදයකින් තොරව මෙතෙක් දවස් තිබි මතුගෘත්වයටත් අවසන් කිරීමේ තිත වැටෙනු ඇත. මම බියෙන් බිරාන්ත වීමි. මොන මොනවා නැති කරගත්තත් හංසිගේ හිතවත්කම නැති කරගන්නට මට නුපුළුවන.

රිය පෝටිකෝව යට නැවතෙද්දීම හංසි ගෙතුළ සිට එබී බැලුවා ය. මාව දුටු ඇය පුදුම වී එළියට ආවා ය.

"ආර්...යා... අයියට කොහොමද ආර්යාව හම්බවුනේ...?"

"මේ පාරෙ එනකොට දැකල මං කා එකට නග්ග ගත්ත."

"පුදුමයි මෙයාට මාව බලන්න එන්න මතක් වුණා. මං ඒත් හිත හිත හිටියෙ... මංම ගියොත් මිස තිකමට මෙයා එන්නෙ නෑ කියල."

හංසි මගේ අත අල්වා ගත්තේ ආදරණීය තරවටුවකිනි. මම ඇය දෙස බලා ඒ බැල්මම සඳෙව් අයියා වෙතට ද යොමු කළෙමි. ඔහු හිටියේ සතුටකිනි. ඒ සතුට දක මගේ දෑස් ද පිබිදෙන්නට හැලුවේ ය. නමුත් දුරදිග අනතුරක සේයා හැඳිනගන්නා ඉවකින් මෙන් මම බිම බැලුවෙමි.

"යං රූම් එකට. ඉනිං ඉනිං..."

හංසි මගේ අතින් ඇදගෙන පියගැටපෙළ නගින්නට වූවා ය. එය නැගෙන ගමන් මම යාන්තමට හිස හරවා බැලුවෙමි. සඳෙව් අයියාගේ ඇස් විදුලි කොටනවා මට පෙනිණ. මා හිත සන්සුන් කරගෙන හිටියේ අමාරුවෙනි.

"කෙල්ල එන්න එන්නම ලස්සන වෙනව නේ...?"

"අනේ පිස්සු."

"පිස්සු හැදෙනව නේන්නං දැක්කහම."

හංසි හඬනගා හිනැහුණෙ ය. මම බොරුවට ඇයට රවා ඉවත බලා ගතිමි.

"ඉතිං ඉතිං... මොනාද ආර්යා අලුත් තොරතුරු...?"

"සුභ ආරංචි නං මං ළඟ නෑනෙ."

ඈ දෑස් පුංචි කොට බැලුවා ය.

"ඒ කියන්නෙ... මොකක්ද අසුභ ආරංචිය...?"

"මල්ලි එන්න එන්නම දඩබ්බර වෙනව හංසි. දැං ඉස්කෝලෙ යන්නත් හරි නොරයි. කොල්ලො කට්ටියට වැටිල."

"කොල්ලො ඉතිං එහෙම තමයි."

"අපේ මල්ලිලාට යමක් තමක් තියෙන තැංවල කොල්ලො වගේ හිතන්න පුළුවන්කමක් නෑනෙ හංසි. එයාලට ලොකු වගකීමක් තියෙනව. ඒ වගකීම තේරුං ගන්නෙ නැත්තං වෙන්නෙ ජීවිතේ තව තවත් සාලකන්නි වෙලා යන එක."

ලොකු සුසුමක් හෙලූ හංසි මගේ උරහිසට හෙමිහිට තට්ටු කළා ය. මා දුකෙන් සිටින නිසා දුක් වෙනවා මිස මේ කාරණා ගැන ඇයට අවබෝධයක් හෝ හැඟීමක් නොතිබෙන්නටත් පුළුවන. ඒ වුණත් හිතේ තියෙන ශෝක සංකා මේ විදිහට කතා කරන්නට තරම් ළෙංගතු හිතවතියක සිටින එකත් ලොකු දෙයකි.

"මාත් දැං ඇප්ලිකේෂන්ස් කොච්චරනං දැම්මද? තාමත් ජොබ් එකක් නෑනෙ."

"ආර්යා. ඔයා ජොබ් එකකට යනවටනං මං කැමති නෑ. ඔයා කැම්පස් යන්න ඕන. ඔයාට කොච්චර හොඳට ඉගෙන ගන්න පුළුවන්ද...?"

මගේ දෙතොල් මතට මදහසක් ආවේ ය. එය තේරුම් ගත නොහැකිව හංසි එදෙස බලා සිටින්නට වූවා ය.

"අපේ අම්මත් හීන මවනව මාව විශ්ව විද්‍යාලෙ යවල ලොකු තෝන කෙනෙක් කරන්න. ඇත්තම කියනවනං මාත් ආස නැතුව නෙමෙයි හංසි ඒත්... විශ්ව විද්‍යාලෙකට යවල මට තව අවුරුදු ගාණකට වියදං කරන්න තරං සල්ලි ඒ දුප්පත් මිනිස්සුන්ට කොහෙංද...?"

"දුක් වෙන්නෙපා ආර්යා. හැමදේම හොඳම විදිහට විසඳෙයි කියල හිතන්න."

මම තුනී මදහසක් පෑවෙමි. ඇය කියනවා සේ අප වැනි අයට හිතන්නට වන හොඳම විදිහ එය ය. ඒත් ඒ හොඳම විදිහ කොයි විදිහද කියා නම් මම නොදනිමි.

"නංගී."

කියාගෙන සදෙව් අයියා කාමරයට ආවේ ය. මගේ ඇතුලාන්තයෙහි කම්පන තරංග මාලාවක් ඇතිව ඈතට විහිද යනවා මට දැනිණ. හංසිට කතා කෙරුවාට ඔහුගේ දෑස් මාවම ලුහුබඳින්නේ ඇයි...? කිසියම් කාන්දම් බලයකට විරුද්ධව ක්‍රියා කරනවා සේ මම අමාරුවෙන් මගේ ඇස් මා ළඟට ඇදගෙන බිමට යොමු කළෙමි.

"මාර කම්මැලියි අප්ප. යන්න තැනකුත් නෑනෙ."

"ඉතිං කොහෙහරි යංකො...?"

හංසි ගත් කටටම කීවා ය. මම සදෙව් අයියා දෙස නොබලාම සිටියෙමි. ඔහුගේ දෑස් මා වටේ දඟ කරමින් තිබෙන බව මට දැනිණ. නමුත් අප ඉන්නේ ඔවුන් සමග හරි හරියට දඟ කළ හැකි තත්ත්වයක නොවේ.

"කොහෙද යන්නෙ...?"

සදෙව් අයියා එකම ප්‍රශ්නය නැවත වෙනත් විදිහකට ඇසුවේ ය.

"අයියෝ... යනවනං කොහේ යන්න බැරි ද...?"

හංසිට තිබුණේ පුදුම උනන්දුවකි. කොහොමටත් ඇය සැහැල්ලු සෙල්ලක්කාර දිවිපෙවෙතකට හුරු වූ යුවතියකි.

"අවන්ත අද වැඩ ද...?"

"අපෝ ඔව්. එයාහං එන එකක් නෑ."

"හැබැයි ඉතිං දැන් දවල් වෙලානෙ නංගි...?"

"ඔව් නේ. එහෙනං අපි වෙන දවසක කොහෙහරි යං. අවන්තටත් එන්න කියලම්. මන්න ආර්යා ඔයත් එන්න ඕනේ."

"අනේ බෑ."

එහෙම කියන ගමන්ම මා සදෙව් දෙස බැලුවේ ඇයි...? හංසි මගේ වරළ මුලින් අල්වා ගත්තා ය.

"ඒව කොහෙද...? ගෙදරට ඇවිත් බලෙං උස්සගෙන එන්නෙ."

මම සිනාවකින් හංසි දෙස බැලුවෙමි. ඇගේත් සදෙව් අයියාගේත් සිනහවේ තිබුණේ එකම ආකාරයක සෙනෙහසකි. එහෙම දයාබරත්වයකට ලෝබ නොවන හිතක් මිහිමත තියෙන්නට පුළුවන් ද...?

"කලිං ට්‍රිප් එකට මං ආවනෙ. ඒක ගිහිං ඒතරං දවසක් වුනෙත් නැතෙ."

"මේ නංගි ගණන් උස්සගෙන එන්න එපා හරිද...? කඩේ මුදලාලිගෙ පුතාට කියල උස්සන්නෙ."

හංසි ඒ ටික කිවේ උච්චාරණය හා ඉරියව් වෙනස් කොට හරියට චණ්ඩියෙක් වාගේ ය. මම 'හිච්ස්.' ගා සිනාසුනෙමි. සදෙව් අයියා තේරුම් ගත නොහැකිව බලා සිටියේ ය.

"මොකද්ද නංගි ඒ මුදලාලි කෙනෙක්ගෙ පුතෙක්ගෙ කතාව...?"



මා රතුව යන්නට ඇත. කිසිත් කියන්නට එපායි හඟවමින් මම හංසිගේ අතක් තදකොට මිරිකා ගතිමි. ඇය හඬනගා සිනාසෙන්නට වූවා ය. සදෙව් අයියා තවත් කුතුහලාත්මක විය.

"ඈ නංගි... කවුද මුදලාලිගෙ පුතා...?"

"ආ... අයිය දන්නැනෙ. ආර්යාගෙ බෝයි ෆ්‍රෙන්ඩ්."

මම අයිස් කැටයක්ව මිදුනෙමි. සදෙව් අයියාගේ ප්‍රීතිමත් මුහුණ මොහොතකින් වෙනස් විය. සමහරවිට හංසි එය නොදකින්නට ඇත. නමුත් මම දුටුවෙමි. මගේ පපුව පත්තු වෙනවා සේ මට දැනුනේ ඇයි...? හංසි කිවේ බොරු කතාවකි. කඩේ මුදලාලිගේ පුතා මගේ පස්සෙන් එන පුවත ඇය දනී. ඔහු කෙරේ මගේ වන අකමැත්ත නිසා හංසි ඒ ගැන කියා නිතර මට විහිළු ද කරයි. නමුත් ඒ කිසිදු අවස්ථාවක මේ වෙලාවේ සේ අපහසුතාවයක් මට දැනී නැත. සදෙව් අයියා මට පෙම්වතෙකු සිටිනවායි වරදවා වටහා ගැනීම ගැන සිතෙන් ද...? ඉතිං ඔහු කොහොම සිතුවත් මා කලබල වන්නේ ඇයි...?

ඒ මොහොතේම සදෙව් අයියාගේ ජංගම දුරකතනය හැඬවෙන්නට ගත්තේ ය. ඔහු එයට පිළිතුරු දෙමින් කාමරයෙන් පිටව ගියේ මට නොතේරෙන ගිනි රස්නයක් මගේ පපුව තුළ ඉතිරි කරමිනි.

"මෝඩිය. දැං සදෙව් අයිය හිතයි මං මුදලාලි පුතෙක් එක්ක යාළුයි කියල."

"ඉතිං මොක්කෙ. අපේ අයිය හිතේ මවාගත ඇති ආර්යාගේ බොයි ෆ්‍රෙන්ඩ්ව... බඩ මහත... තොට... බකල ගගහ ඇවිදින..."

"ගහනව මං."

මම හංසිට ගහන්නට පැන්නෙමි. ඇය හඬනගා සිනාසිගෙන පසෙකට පැන්නා ය. ඊළඟට හිනැහෙමින්ම මා වැළඳ ගත්තා ය.

"බය වෙන්නෙපා. ඔයා බඩ මහත මුදලාලි පුතෙක්ව

කෙළෙයි ඔඳින්නෙ. ඔයාට හුගක් ආදරේ කරන... ඔයා ඊටත් වඩා ආදරේ කරන ලස්සන කොල්ලෙක්ව.''

ඇයත් අපේ අම්මා සේම අනාවැකි කියන්නට හදනවාද...? ඔය වගේ දේවල් කියනකොට අම්මාගේ දෑසේ වන සෙනෙහස පිරි බලාපොරොත්තුවම මේ වෙලාවේ මම හංසිගේ දෑසින් ද දුටිමි.

හංසිත් ඇගේ අම්මාත් වද කරමින් මට ලොකු බත් පිඟානක් කැවූහ. මා කොයිතරම් ප්‍රතික්ෂේප කළ ද ඔවුන්ගේ පෙරැත්තය ජය ගත්තේ ය.

''මේ බත් ටික විතරයි.''

මා ආහාර ගෙන නිම වෙන්නට සූදානම් වෙද්දී අනෝජා ඇන්ටි තවත් බත් හැන්දක් බෙදුවා ය.

''අනේ... තවත්නං බත් ඇටයක්වත් කන්න ඉඩක් බඩේ නෑ ඇන්ටි.''

''අයියෝ... ඔය වයසෙදි අපිනං කෑවෙ බත් කොරස් ගණං. තරුණ ළමිස්සියෝ කුරුල්ලෙක් වගේ කාල හරියනවද...?''

''මේ මාළු කෑල්ල මගෙ ගානෙ.''

''හංසි.''

''ෂ්... කන වෙලාවට කතා කරන්න හොඳ නෑ. කන්න කන්න.''

ඔවුන්ගේ ගෙදරදී කවදත් මට මේ සෙනෙහස ලැබෙන්නේ ය. දත් දත් පෙරදිටත් වඩා අනෝජා ඇන්ටිගේ ආදරය වැඩි වී තිබේ. ඒ අතින් මා කොයිතරම් වාසනාවන්ත ද...? හැම කෙනෙක්ගේම ආදරය නොඅඩුව ලැබීමේ මොකක්දෝ වාසනා ගුණයක් මට තිබේ. එහෙත් තනිව ආදරය හෝ වෙනත් වරප්‍රසාද විඳ මට ඇති පලක් නැත. මේ වරප්‍රසාද විඳින හැම විටකම මගේ උඹුර දුවිල්ල ගෙන ඇස්වලට කඳුළක තෙත උනා එයි. ඒ මගේ



පවුලේ අහිත් අසරණයන් සිහිපත් වී ය. විශේෂයෙන්ම මගේ නංගී හා මල්ලී සිහි වී ය. අපේ කටුමැටි පැල්පතෙන් එහා වන සොඳුරු ලෝකය ඔවුන් දකින තෙක් මගේ ආත්මයට සැනසිල්ලක් අත් නොවේ.

''ආර්යාගෙ බෝයි ෆ්‍රෙන්ඩ් කොහෙද ව(ර්)ක් කරන්නෙ...?''

හදිස්සියේම සදෙව් අයියා ඇසුවේ ය. කටට ගන්නට ගිය බත් කට මම යළි පිඟාන මතට දැම්මෙමි.

''ආ... ආර්යාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නව ද...? මං දනගෙන හිටියෙ නැතෙ ඔහොම දෙයක්. එහෙනං දෙකට ගණින්න බෑ වගේ හිටියට ඒ ඔක්කොම සම්පූර්ණ කරගෙන යි ඉන්නෙ නේද...?''

අනෝජා ඇන්ටි නෝක්කාඩුවට ආදරය තුනට එක අනුපාතයට මුසු කොට ගෙන මදෙස බැලුවා ය. මම විපිළිසරව උන්නෙමි. හැම නෙතක්ම මවෙත යොමු වී තිබේ. මා මේ ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නේ කොහොමද? එක්වරම හංසි මේසයේ මූණ ඔබාගෙන සිනාසෙන්නට ගත්තා ය.

''මේ මොකද මේ? පිස්සු ද අම්ම මෙයාට...?''

''හංසි. දත් කැමත් හිස්මොල්ලෙ යවාගන්නව. මොකද ළමයො ඔය හිනාවෙන්නෙ...?''

හංසි සිනාසෙමින්ම කතා කළා ය.

''අයියෝ... අපේ අයියත් කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව ලණු කතාවෙන ලස්සනට.''

''ලණු...?''

සදෙව් අයියා දෑස් පුංචි කොට මදෙස බැලුවේ ය. මම හෙමිහිට බිම බැලුවෙමි.

''ආර්යාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නෑ අම්මා. එයාලගෙ

ගෙවල් පැත්තෙ ඉන්න කඩ මුදලාලි කෙනෙක්ගෙ පුතෙක් එයා පස්සෙන් එනව. ඒකයි මං ජෝක් කරන්නෙ''

මට එක්වරම සදෙව් අයියා දෙස බැලිණි.

''පිස්සුනෙ.''

ඔහු හංසි වෙත නොසතුටු බැල්මක් හෙළුවේ ය. ඒ ඇස් මවෙත හැරෙන්නට පෙර බිම බලාගන්නට මට හැකි විය.

''ඒකනෙ මාත් බැලුවෙ. මේ මල් පැළයක් වගේ ඉන්න කෙල්ල.''

''ආ... මල් නෙවෙයි. නිදිකුම්බා පැලේ. නිදිකුම්බා පැලේ.''

මට සැනසිල්ලක් දැනුණේ ඇයි...? මම නොදනිමි. ඒ ගැන දුරට දිගට සිතන්නට ද මට අවස්ථාවක් නොලැබිණි.

නැන්දාගේ ගෙදර යන්නට සූදානමින් මම හංසි සමග පහළට ආවෙමි. සදෙව් අයියා පේන්නට සිටියේ නැත.

''අයියා නිදි. මං ඉස්සෙල්ල රූම් එකට එබිලා ආවෙ. නැත්තං මට ඔයාව එයා එක්ක යවන්න තිබුණා. අද ඩ්‍රයිවර් කෙනෙක් නෑනෙ.''

''අනේ කමක් නෑ හංසි. මට බස් එකේ යන්න පුළුවන්.''

''ඒ වුණාට...''

''ඒ වුණාට කමක් නෑ. අපි බස් වල ගිහිං හොඳට පුරුදු මිනිස්සු.''

''ඔන්න ඔන්න ඉතිං.''

රිය දොරක් ඇරී වැසෙන හඬ ඇසිණ. හංසි සේම මම ද හැරී බැලුවෙමි. සදෙව් අයියා රිය පණ ගන්වමින් සිටියේ ය.

''අයියෙ අයියෙ...''

හංසි මාවත් ඇදගෙනම රිය වෙත දිව ගියා ය.



''මං ඉස්සෙල්ලා බලානකොට ඔයා හොඳටම නිදිනෙ.''

''යාළුවෙක්ව මීට් වෙන්න තියෙනව නංගි. නින්ද ගියානෙ. දැනටමත් ලේට්.''

සදෙව් අයියා කලබලයෙන් අත් ඔරලෝසුව දෙස බැලුවේ ය.

''අනේ අයියෙ... මේ ආර්යාව...''

''අනේ එපා හංසි. අයියා හදිස්සි ගමනක්නෙ යන්නෙ. මට බස් එකේ යන්න පුළුවං.''

''අනේ අයියෙ එහෙනං ආර්යාව බස් හෝල්ට් එකෙං වත් ඩ්‍රොප් කරන්නකො.''

''ඔන්නෑ හංසි.''

''හ්ම් හ්ම්. මං බස් හෝල්ට් එකෙං ඩ්‍රොප් කරන්නං.''

හංසි රියේ ඉදිරි දොර ඇරියා ය. මට ලතවෙවී පමා වෙවී සිටිය නොහැකි ය. සදෙව් අයියා ඉන්නේ පමා වූ ගමනක් යන කලබලයෙනි. ඒ නිසා මම තව වරක් ඇවිටිලි කරන්නට පෙර නැගගතිමි.

උදේ මාව ගෙදර සිට රැගෙන එන වෙලේ නම් සදෙව් අයියා ආඩම්බරයක් නැතිව කතා කළේ ය. දැන් ඔහු මාව ගණං ගන්නේවත් නැතිව රිය පදවයි. ඔහු මාව අරගෙන ආවේ කුමට ද...? සමහරවිට හදිස්සි ගමනක් යන නිසා ඔහුගේ සිත ඒ වෙත යොමු වී ඇතැයි මම සිතුවෙමි. බස් නැවතුම සමීප විය. නමුත් රියෙහි වේගය බාල වූයේ නැත. මම සදෙව් අයියා දෙස බැලුවෙමි. ඔහු මාව දකින බවක්වත් හැඟවූයේ නැත.

''සදෙව් අයියා බස් හෝල්ට් එක පහු වුණා.''

මා තරමක් කලබල වී සිටියත් ඔහු බිඳකිනිදු නොසෙල්විණ. රිය නැවතෙන සලකුණක් දිස් වුණේ නැත. අඩු තරමින් සදෙව් බස්නායක මා කී දෙය ඇසුණු බවක්වත් හැඟවූයේ නැත.

''සදෙව් අයියා...''

මම තරමක් ඔහු වෙත නැඹුරු වී කතා කළෙමි. ඔහු තොත්කොත් බැල්මක් හෙළුවේ ය.

''බස් හෝල්ට් එක පහු වුණෙ.''

එවර ඔහුගේ බැල්ම තියුණු විය. ඔහු මට රවා බැලුවා ද...? මම මොහොතකට පසුබැවෙමි.

''උස්සගෙන ආවනං ගෙදරට ගිහිං දාන්නත් එපැයි.''

''අනේ... ඒකට කමක් නෑ සදෙව් අයියා. අයියට හදිස්සි ගමනක් යන්නත් තියෙනවනෙ. මට බස් එකේ යන්න පුළුවං.''

සදෙව් ඔස්තායකට තියෙන්නේ පුදුම ආඩම්බරකමකි. ඔහු මං කී දේ හෝ මගේ මැනැපත්වීම පිළිවිසියකට මායිම් කළේ නැත. ඒ ආඩම්බරකාර පිරිමිකම් ඇසට මා වශී නොවුණා පුදුමය.

රිය දිගටම ධාවනය වෙමින් තිබිණ. වමතින් දකුණතේ ඇඟිලි වල නියපොතු කොනිති ගසමින් මම කල්පනා කළෙමි. කල්පනා කළාප සිවිවාට සත්තකට මා සිතූ දෙයක් නැත. සිහිවිලි ජාලයක පැටලී අවුල් වී සිටියා පමණකි.

''මුදලිලාගෙ පුතා ලස්සන ද...?''

හදිසියේම සදෙව් අයියා ඇසුවේ ය. මගේ ඇස් නැතිගත් බැල්මෙන් ඔහු දෙස බලන්නට ඇත.

''ආ... මුදලාලිගෙ පුතා ලස්සන ද...?''

මම විදුරු කවුළුවෙන් ඉවත බැලුවෙමි. හංසිගේ අනවශ්‍ය විහිළුව නිසා සදෙව් අයියා මා ගැන කොයි විදිහකට හිතාගෙන ඉන්නවාදැයි මා දන්නේ නැත.

''එයා ගැන අපිත් එක්ක කියන්නවත් කැමති නෑ වගේ. හා හා කමක් නෑ.''



''අනේ සදෙව් අයියා... හංසිගෙ පිස්සු කතානෙ. මට ඔනෑකි මුදලාලි පුතෙක් නෑ.''

''මං ඇහුවෙ එයා ලස්සන ද කියලනෙ.''

ඔහු මාව කොටු කරගන්නට හදන්නේ ඇයි...? මම අසරණ බැල්ම සදෙව් වෙත යොමු කළෙමි. ඔහු මන්දහාසයක් නගාගත්තේ ය.

''ඕකේ. ඕකේ. අපි එයා ගැන අහන්නැතුව ඉන්නංකො.''

ටික වෙලාවක් මුණිවත රජ විය. මම හිස්ව සිටියෙමි. කඩේ මුදලාලිගේ පුතා වන රොෂාන් තවමත් අපේ ගේ වටේ කැරකෙයි. ඔහුගේ මෝටර් බයිසිකලය හඬ දෙවමින් අපේ කඩුල්ල ඉදිරියෙන් එහාට මෙහාට යයි. නමුත්, මගේ හිත ඔහු නිසා බිඳුවකිතුදු සසල නොවේ. ඔහු ඒ බව තේරුම් ගන්නේ නැත.

''එයා ඔයාට හුගක් ආදරෙයි ද...?''

අහසින් පොළවට වැටුණා සේ මා කැළඹිණ. සදෙව් අයියා මේ අහන්නේ මොනවා ද...?

''ඒ... ඒක මන්දන්නෑ. හැබැයි මටනං ඒ මනුස්සයා ගැන එහෙම කිසිම හැඟීමක් නෑ.''

සදෙව් හඬනගා හිනැහිණ. මම ඊනැවටත් වඩා කලබල වී සිටියෙමි.

''එහෙනං... වෙන කෙනෙක් ගැන හරි එහෙම හැඟීමක් තියෙනව ද...?''

සදෙව් අයියා ඒ ප්‍රශ්නයත් පෙර ප්‍රශ්නය සේම සරදම් ස්වරයෙන් ඇසුවානම් කෙතරම් හොඳ ද...? එහෙනම් මා මේ තරම් අපහසුතාවයට පත් නොවන්නට තිබිණ. ඔහුගේ ප්‍රශ්නය විහිළුවක් නොවූ නිසා මා පිළිතුරක් දිය යුතු විය. ඔව් කියනවා ද...? නැත්නම් නෑ කියනවා ද...? අවංක පිළිතුර මොකක්ද කියා මා පවා දන සිටියේ නැත.

සඳෙව් අයියා හාරා අවුස්සා ඒ ප්‍රශ්නයට පිළිතුරක් විමසුවේ ද නැත. එය මට සහනයක් විය. මම වීදුරු කවුළුවෙන් පිටත බලාගෙන මගේ මෙන් කළෙමි. සඳෙව් අයියා කිසියම් සතුටකින් සිටින බව, ඔහු විටින් විට කළ උරුවම්බෑම හා ගීත මිමිණීම අනුව මට අනුමාන කළ හැකි විය.



## 04

සාමාන්‍ය පෙළ විභාගය ගන්නා තුරුවත් මල්ලීව පාසල් යවන්නට මා කළ උත්සාහය ගතට ඉණි කැපිමක් සරි විය. ඔහු පිය හිතුවක්කාරකම් අත්හැරියා පමණකුදු නොව කවදාවත් නැතිව මාත් එක්ක ද රණ්ඩුවට ආවේ ය.

"අක්කෙ මේ තමුසෙ තමුසෙගෙ පාඩුවෙ ඉන්නව. තමුසෙ මගෙ අම්ම නෙවෙයිනෙ..."

කවදාවත් මල්ලීගේ මුවින් එවැනි රළු වදනක් අසා නැති මම කැළඹුණෙමි.

"තමුසෙට ලැජ්ජා ඇති නේද මල්ලි ඕලෙවල්වත් කරල නෑ කියල අර සල්ලිකාර කෙල්ලගෙ අයියල දැනගන්නවට."

"මල්ලී..."

මම කැගැසුවෙමි. මල්ලීගේ මූණේ අවඥාසහගත සිනාවක් විය. මල්ලී...! මගේ මල්ලී...!! මා බෙහෙවින් ආදරය කළ මගේ පුංචි මල්ලී...!!! අපට ඔහු අහිමි වී තිබේ. මට ඔහු අහිමි වී තිබේ. ඔහුට හිමි වී තිබෙන්නේ කාවද...? සමාජය නොරුස්සන, සමාජයේ ඉහළට ගමන් කරන අය නොරුස්සන, අමාරුවෙන් ඉහළ සමාජයට පය ගසාගත් අයට වෛර කරන, හීනමානයෙන් හිස පිරුණු උප කුලකයකට ය. ඒ උප කුලකය මේ මිනිස් ප්‍රජාවේම කොටසකි. මල්ලීව මගේ පැත්තේ තබාගන්නට මට බැරි විය. ඒ කියන්නේ

පොහොසත් සමාජයේ වන පහසුකම්වලට ආශා කරන හා ආදරය කරන ඒ සමාජයට කෙසේ හෝ පිවිසෙන ආශාවකින් හිඳින මගේ පැත්තේ මල්ලීව තබාගෙන, ඔහුගේ අතින් ද අල්ලා ගෙන මගේ ගමන යන්නට මට බැරි විය.

"දං ඉතිං ඒකා ගැන කොච්චර කල්පනා කළත් ඇති වැඩක් නෑ ලොකු පුතේ."

මං ගුලි වී හිඳින අඳුරු - කබල් ඇඳ වෙතට ඇවිත් අම්මා එහි හිඳ ගත්තා ය. ඇඳ කිරි - කිරි ගෑවේ ය. මගේ පපුව දෑවේ ය. මල්ලී අපේ පුංචි කුරුලු කූඩුව අතැර ඉගිළ ගිය ඉක්මන...!

"උඹ ආපෙ ඔය රස්තියාදු නවෙං ඇදලා ගන්න හම්බවෙන් නෑ. ඔය අදත් ඒකුං එක්ක කුලී වැඩකට ගිහිං තියෙන්නෙ."

"කුලී වැඩකට...?"

"ඔව්. වටුමේ බිල්ඩිමක් හදන තැනක අත් උදව් දෙන්නලු."

"ඌවට ගිහිං ගේන එක සතයක්වත් ගෙදර වියදමට ගන්න එපා අම්මේ. කන්න නැත්තං තුන් වේලම හරි බඩගින්නෙ ඉන්න එකයි තියෙන්නෙ."

මගේ හඬ සැර වැඩි වෙන්නට ඇත. මැල්මද වෙන කවදාවත් නැති තරම් රළු වෙන්නට ඇත. අම්මා අසරණව වගේ මදෙස බලා සිටියා ය. මම ආයේම ඇඳේ වැතිරගතිමි. මගේ හිස පුපුරු ගසන්නට එයි. අත වැලමිට ළඟින් නවා මම නළල මතින් තබා ගතිමි. අම්මා හෙමිහිට ඇඳ මතින් නැගිට යනු මට දැනිණ. එක අතකට මා මෙහෙම හැසිරෙන එකත් වැරදි ය. පවුලේ වැඩිමහල් තැනැත්තා වී ද තවමත් මගෙන් එක රුපියලක තරම් උදව්වක් ගෙදරට ලැබී නැත. තවමත් මා ජීවත් වෙන්නේ අම්මා කුලියක් මලියක් කොට උපයන යමකින් හෝ තාත්තා කුලියක් කොට ගෙදරට කියක් හෝ දුනහොත් එයින් අම්මා උයා - පිහා දෙන යමකිනි. දුක් විඳිල්ලේත් සීමාවක් තිබිය යුතුය. මා ඉවසා සිටියා කියා අනිත් අයත් එසේම ඉවසාවියි බලාපොරොත්තු විය නොහැක. අනිත් අතට මා අහස



අල්ලන්නට හීන මැව්වාට අනිත් අයට උවමනා කෙසේ හෝ පොළොවේ පය ගසා ජීවත් වෙන්නට ය. කුලියක් කොට හෝ අතට කීයක්හරි ගන්නට මල්ලීට උවමනා නම් මා විරුද්ධ වී ඇති පලය කුමක් ද...? ඔහුගේ අවශ්‍යතා සපුරාගන්නැයි අතමිට මොළවන්නට එක සතයක්වත් මට තිබෙනවා ද...?

දරුණු හිසරදයක් මා පෙළන්නට ගත්තේ ය. එදා පමණක් නොව තවත් දෙතුන් දිනක් ගතවනතෙක්ම විටින් විට උග්‍ර ලෙස ඒ හිසරදය මා පෙළන ලදී.

ආත්ම වේදනාව කෙතරම් බලවත් වී ද යත් මම මල්ලීගේ මූණවත් නොබැලුවෙමි. එක හවසක ඔහු හාල් එළවළු මාළු දමූ මල්ලක් ද අතැතිව ගෙදර එනවා පිළ උඩ හිඳ උන් මම දුටිමි. පපුවට පිහියකින් අනිනවා වැනි වේදනාවකි මට දැනුණේ. මම විගස පිළ මතින් නැගිට ගෙතුළට ගියෙමි. වටින් ගොඩින් අඳුර ගලා ආවත් මා නොවේ ඇඳෙන් නැගිට්ටේ. අම්මා තනිව කෑම පිසින හඬ ඇසිණ. ඈ ගැන අනුකම්පාවෙන්වත් මම නොනැගිට්ටෙමි. මල්ලී කුලී වැඩ කොට ගෙනෙන මුදල් ගන්නට එපායි මම කට නැවෙනතුරු අම්මාට කීවෙමි. ඒත් අද ඇය මගේ ඇස් පනාපිටම ඔහු ගෙනා අඩුම කුඩුම බෑගය දෝතින්ම පිළිගෙන තිබේ. මට මේ ගෙදර ඇති වටිනාකම කුමක් ද...? සතයක්වත් නූපයන මා සතයක්වත් වටින්නේ නැ නොවේ ද...?

"අක්කෙ... අක්කෙ..."

නින්දත් නොනින්දත් අතරේ මා දුක් විඳිමින් සිටි රාත්‍රියේ නංගී ඇවිත් මගේ ඇඟෙන් අල්වා සොලවා කතා කළා ය.

"ම්...?"

"බත් කන්නෙ නැද්ද අක්කෙ...? අද එළවළු ගොඩායි... මාළුයි ඔතුයි තියෙනව. මන්නං බඩ පැලෙනකල් කන්නයි හදන්නෙ. එන්න එන්න අක්කත් කන්න."

නංගී කතා කළේ පුදුම සතුටකිනි. වේල් ගණනක් තිස්සේ

කුසගින්නේ සිටි කෙනෙකුට රස අහරක් පෙන්වූ විට දනෙන සතුට එය ය. පුංචි කෙල්ලට එහෙම දෙයක් දී සතුට බලන්නට තවමත් මට බැරි විය. ඒ අතින් මල්ලි මට වඩා ඉදිරියෙන් හිඳී.

"ඔය, මගේ හොදිවල සුවඳ එනකොට මගෙ බඩගින්නත් වැඩි වෙනව. මං යනව කන්න."

නංගී මා තනිකොට දමා දිව ගියා ය. අද ඇය කිහිප විටක්ම අම්මාගෙන් බත් ඉල්ලාගෙන කනු ඇත. වේලක් නැවොත් තව දෙකුත් වේලක් බඩගිනි ඉවසන්නට සිදුවන බව පුංචි වුනත් නංගි අත්දැකීමෙන්ම දනී. මම අතින් ඇලයට හැරී නිදන්නට උත්සාහ කළෙමි.

"ලොකු... ආර්යා... නිදි ද ලොකු පුතේ..."

දාවිය පුවද ඉස්සර කරගෙන අම්මා කාමරයට ඇවිත් තිබේ. මම නිදි ලෙසටම හඟවාගෙන උන්නෙමි.

"පුතේ..."

අම්මා මගේ ඇඟට අත තබා කතා කළා ය.

"බත් ටිකක් කාලම නිදාගත්තනං. නැත්තං උදේට හාමත් වෙලා ඉඳියි."

මා නිදි නැති බව අම්මා ඉවෙන්මෙන් වටහා ගන්නට ඇත.

"බඩගිනි නෑ අම්මෙ."

"බඩගිනි නැති වෙන්නෙ කොහොම ද...? ගල් ගිලලා ඉන්නව නෙවෙයිනෙ. හ්ම් හ්ම්, යමු කන්න."

"මට කන්න බෑ. අම්මල කන්න."

අම්මා කොතෙක් පෙරැත්ත කළ ද මම කාමරයෙන් පිටතට නොආවෙමි. ඒ වේදනාව මෙන්න මේ ආකාරය කියා පැහැදිලිව වෙන් කොට පෙන්විය නොහැකි ය. එක පැත්තකින් දුකකි. තවත් පැත්තකින් පශ්චාත්තාපයකි. පරාජයක් පිළිබඳ හැඟීමක් ද එහි ලියවී



නොතිබුණා නොවේ. පිටතට එන්නට අවසර නොලැබූ ඊර්ෂ්‍යාවට ළඟ හැඟීමක් ද මට වද දෙමින් නොතිබුණයි කිව නොහැකි ය. ඒ ඊර්ෂ්‍යාවට නිශ්චිත හැඟීමක් නැත. නමුත් මෙතෙක් පවුලේ ලොකු දුව ලෙස මට හිමිව තිබූ තත්ත්වය එක් රැයකින් - දෙකකින් මල්ලිගේ පැත්තට බර වූවා වැනි හැඟීමක් මා රිදවී ය. දැන් කාටවත් මා ගැන වගේ නැත. තිකං මූනිච්චාවට ඇවිත් කන්නයි කිවාට කාටවත් මා ගැන මතකයක් නැත. කලින් නම් හොද්දේ ලුණු ඇඹුල් බලන්නටත් අම්මාට මා නැතිව බැරි විය. නමුත් මගෙන් නොකෙරෙන මෙහෙයක් දැන් මල්ලිගෙන් ගෙදරට සිදුවෙයි. ඒ, අපි තාත්තාගෙන් බලාපොරොත්තු වුණු දේ ය.

"අක්කෙ..."

හිසට අකුණු පහරක් වැදුණා සේ මා සසල විය. මල්ලි ඇඳ මතින් හිඳගත්තේ මට කිසිත් කියන්නටවත් ඉඩක් නොතබා ය.

"අක්කා නොකා ඉන්නෙ අද හාල් එළවළු මං ගෙනාපු නිසයි කියල මං දන්නව."

මල්ලි මෙහි පැමිණ ඇත්තේ දුකත්, දුකට හේතුවත් දැනගෙන ය. මා නිදහසට කාරණා කිව යුතු නැත.

"අක්කෙ, අක්ක දකින හීනෙ ගැන මට නොතේරෙනව නෙවෙයි. ඒත් අක්ක දකින හීනෙ දකින්න පුළුවන්කමක් මට නෑ. බඩගොස්ස පිට පොත්තට ඇලිලා තියෙද්දි බත් ටිකක් කන්න කුලී වැඩක්හරි කරල කීයක් හරි හොයා ගන්නව මිසක්... කලන්තෙ දදා ඉස්කෝලෙ යන්න තරං හීන කන්දක් මට නෑ. අක්ක අක්කගෙ හීනෙ හැබෑ කරගන්න. මං මට පුළුවං විදියට කීයක්හරි හොයං ඇවිත් ගෙදර උංගෙ බඩවල් පුරවන්නං. කියපං අක්කෙ, මං වෙන මොනාද කරන්නෙ...?"

මල්ලි හැඟුම්බරව සිටියේය. ඒ වෙලාවේ මටත් ආවේගය වාවගන්නට බැරි විය. මට ඇඬුම් ආවේ ය. කලින් ඇති කරගෙන සිටි සම්මුතියකින් සේ අප දෙදෙනා කාන්දම් බල යුග්මයක් සරිව

උන්නු වෙත පැන තරයේ වැළඳ ගතිමු. මම හොඳටම හැඬුවෙමි. මට දැනුණු ලෙසට මල්ලී ද හැඬුවේය. කොයිතරම් වෙලාවක් අප උනුන් වැළඳගෙන හඬා වැටුණෙ ද කියානම් මම නොදනිමි.

"බත් ටිකක් කාල නිදාගන්න අක්කෙ. මං කුලී වැඩක් කරල ගේන්න සියතින්හරි බත් වේලක් කන එක ලැජ්ජාවක් කියල හිතන්නෙපා."

"නෑ මල්ලියෙ නෑ."

මල්ලීත් එක්කම මම කාමරයෙන් පිටතට ආවෙමි. අම්මා කිසිත් ඇසුවේ හෝ කීවේ නැතිවම අප දෙදෙනාටම බත් බෙදා දුන්නාය. කුසපුරා කන්නට තරම් මට කෑම රුචියක් හෝ පිරියක් වූයේ නැත. යන්තමින් මා බත් කටවල් කිහිපයක් කෑවේ මල්ලීගේ හිත රිදවන්නට තිබුණ අකමැත්තට ය.

ඒ රාත්‍රිය බෙහෙවින් නිශ්චල විය. තාත්තා වුව බීමතින් කෑකොස්සන් ගැසුවේ නැත. රාත්‍රී කෑමෙන් පස්සේ කවුරුත් තම තමන්ගේ නිදිපොළවල් වෙත ගියහ. ඇඳට වැටුණොට නින්දක් නම් මවෙත ආවේම නැත. මල්ලී මට පසක් කරන ලද සත්‍යය කෙතරම් නිර්ව්‍යාජ ද...? මගේ පැත්තෙන් මා අවංක වුවා සේම මල්ලීගේ පැත්තෙන් ඔහු ද අවංක ය. එක මව් කුසයක එක පියෙකුට දාව උපන්න ද අප එකිනෙකා එක එක ආකාර ය. පාසලේ උද්භිද විද්‍යා විෂයට උගත් ප්‍රවේණිය පාඩම මට සිහි විය. දුහිතෘ ශාකවලට මාතෘ හා පිතෘ ලක්ෂණ එක එක අනුපාත වලින් ප්‍රවේණිගත වෙන්නට පුළුවන. එකම මව් ශාකයක දුහිතෘ ශාක, එක එක ප්‍රභේද වලට අයත් වන්නේ ඒක ය.

පසුදා උදයේ මා අවදි වූයේ අලුත් දවසකට සේම අලුත් ජීවිතයකට කියා මම සිතමි. හරියට තිමිර දෙපළ කරගෙන සත්‍යයේ හිරු කිරණ පතිත වූවා සේ ය. පොල් අතු රටාව තබා මම සුදු වැලි බිම අතුගෑවෙමි. අම්මා දියේ දමූ පොල් අතු දෙකක් ගෙනවිත් මිදුල මැද දමමින් බිම හිද ගත්තේ සිනා වතකිනි.



"මල්ලි අද වැඩට ගියේ වෙනදට වඩා සතුටෙං. අපි කාටවත් වඩා ඌ මේ ගෙදරිං ආදරේ කරන්නෙ ලොකුටනෙ."

මට හිනාවෙන්නට බැරි ය. හද බරව තිබිණ. සත්‍යය කවරක් විද මල්ලී පාසල් ගමන පසෙකට විසි කොට කුලී කරුවෙකු වීම මට දරාගන්නට නුපුළුවන. අඩු තරමින් ඔහු තවම කරදඬු උස් මහත් වූ පිරිමියෙකු නොවේ. පොඩි කොල්ලෙකි. දූලි රැවුල වැවී එන ගැටවරයෙකි. ඉතින් ඔහුට ජීවිතයේ එක් විශාල පැත්තක් අහිමිව යන්නේ ය. නමුත් ඒ පරම සත්‍යය අමතක කොට මම වැඩිදෙනෙක් හිතන ඇත්ත ගැන සිතා නිසල වුණෙමි.

"පොඩි එකිත් දං කොයි වෙලාවෙද කියන්න බෑ. තාත්තෙක් හිටියයි කියල කිසි දෙයක් ගැන බරක් පතලක් තියෙන එකක්යැ. අඩු ගානෙ ඊසිවෙ කන් දෙකට වූටි මල් කරාබු දෙකක්වත් අරං දාන්නෙ කොහොමද කියලයි මං මේ කල්පනා කර කර ඉන්නෙ."

අම්මලා කොයිතරම් දුරට හිතනවා ද...? ඉගෙනගෙන විභාග සමත් කොට නැති වුණොට - මල පොතේ අකුරක් බැරි වුණාට ඔවුන්ට ජීවිතයේ දුර පෙනේ. නංගි ලොකු ළමයෙක් වෙච්චයි කවදාවත් මට සිහි තිබුණේ නැත. හැමදාමත් මගේ ලෝකයේ ඇය පුංචිම පුංචි දැරියකි. ජංගි කොටය ඇඳගෙන මිදුලේ වැලි තලාව මත කෝම්පිට්ටු හදන පුංචි එකියකි. නමුත් ඇයව කුසින් වැදූ අම්මා නංගි වැඩිවිය පැමිණෙන බව - දිනෙක ඇය ඔය ළමා වියේ හැව හැර ලොකු ගැහැනියක වන බව දැනගෙන ජීවත් වන්නී ය. ඒ දවසට නංගීගේ කන පැළඳිය යුතු මල් කරාබු යුගල ගැන ද අම්මා සිතින් සැලසුම් හැද තිබේ. ඒ අතින් බලනවිට අප සිටින්නේ අම්මලාට වඩා කෙතරම් පසුපසින් ද...?

"තාම නංගි වූටිනෙ අම්මෙ..."

මා කතා කරගත්තේ උගුර යටිනි. ඒ කී කතාවත් කොච්චර මෝඩ ද කියා තේරුණේ කියාගෙන යද්දී ය. අම්මාගේ දෙතොල් අතරට අනුකම්පා සහගත සිනහවක් නැගිණි.

''ඒකි නැති වුණොත් අපිට ඉතිං පුංචිනෙ ලොකු..''

ඒ කතාවේ මොන තරම් ලොකු සත්‍යයක් ගැබ්ව තිබේ ද...? විද්‍යාවක් ගැබ්ව තිබේ ද...? අම්මා මේ විදියට වචන තෝරාගෙන කතා කරන්නේ ජීවිතය කියන විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ජීවිත පාඨමාලාවකට අනුව ද...? නැතිනම් පෙර සංසාරයේ පුරුදු පුහුණු කරනු ලැබූ අත්දැකීම් වල ඉවට අනුව ද...? මම නොදනිමි.

''ලොකුත් ලොකු ළමයෙක් වුණේ ඔය වයසෙදි තමයි. ඇඟට පතට ගුණ දෙයක් වැටෙන්නෙ නැති නිසා ඇඟවල් හැදිලා නෑ.''

අම්මා එහෙම කියනවා නම් එය එසේම සිදු වනු ඇත. නංගී වැඩිවිය පැමිණෙන දවසක ඇගේ කරට රත්තරනිං පුංචි මාල පොටක් දමන්නටවත් ඇගේ අක්කා පොහොසත් නැති හැටි...!

මම ඒ සතියේත් ඉල්ලුම්පත්‍ර කිහිපයක් සතිපතා පුවත්පත්වල තිබුණු ලිපින වලට තැපැල් කළෙමි. ඒවා තැපැල් කිරීම සඳහා මුද්දර - ලියුම් කවර ගන්නට මා මුදල් ඉල්ලා ගත්තේ අම්මාගෙනි.

''උයන්න පිහන්න උවමනා දෙයක් ගන්න කියලා මල්ලි දීලා තිබුණ එකෙං මයෙ...''

ඒ සොබාදහම විසින් මට එල්ල කරන ලද කම්මුල් පහරක් ද...?

පසුවදා අපේ ගේ ළඟ තැපැල්කරු බයිසිකල් සීනුව හැඬවී ය.

''අක්කෙ අක්කෙ... ලියුං ඇවිත්.''

නංගී මිදුල මැද සිට කෑගැහුවා ය. මම ගෙතුළ සිට දිවගෙන එළියට ආවෙමි. ලියුම ඇවිත් තිබුණේ ලියාපදිංචි තැපෑලෙනි. අත්සන යොදා ලියුම අතට ගත් මම ඉතා හනික කවරය කැඩුවෙමි.

'සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන්න.' යනුවෙන් එහි සඳහන්ව තිබිණ. මම සතුටෙන් පිනා ගියෙමි. දිනය තිබුණේ පසුවදාට ය. තනියට යාම සඳහා මම මල්ලිට කතා කළෙමි.



''අක්කෙ මට එහෙම තැනකට ඇඳං යන්න හොඳ ඇඳුමක්වත් නෑ හලෝ...''

හදවත හෝස් ගා දැවිණ. මගේ මූණ බලා සිටියදීම අඳුරු වෙන්නට ඇත.

''එහෙමනං අර යාළුවටවත් කතා කරගන්නනං පුතේ.''

''අනේ අම්මෙ හංසිට එහෙම තැං තැං වලට යන්න කතා කරන්නෙ කොහොම ද...?''

මා හිටියේ දුක්බරවය. මල්ලී සැලී ගිය ඇස් ඇතිව මදෙස බලා සිටියේ ය.

''අක්කෙ, මං එහෙනං කාගෙංහරි ෂර්ට් එකකුයි කලිසමකුයි ඉල්ලගෙන එන්නං.''

මල්ලී එහෙමම මිදුලට බැස යන්නට ගියේ ය. මගේ උගුර දවෙමින් නාසය රිදුම් දෙමින් තිබිණ. මිතුරෙකුගෙන් ඉල්ලාගෙන ආ ඇඳුම් කට්ටලය මල්ලී පොල්කටු ඉස්තිරික්කයෙන් මැද, රැළි නොවැටෙන සේ නවා පුටුවක් මතට දැමුවේ ය. ඔහු ලකලෑහැස්ති වූයේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන්නේ ඔහු විලසටය. නමුත් දැන් මල්ලී ඒ අවස්ථාවත් අහිමි කරගෙන තිබේ. ඔහු ගැන දුක මගේ පපුවේ අලුත් විය.

සම්මුඛ පරීක්ෂණය සඳහා විශාල පිරිසක් පැමිණ සිටියහ. මම කලින් ඇතුළට ගිය සමහර අය එතැන රැඳී සිටි විනාඩි කිහිපය තුළ දී සුහද වූ අය සමග ඇතුළේ සිදු වූ දෑ ගැන පිටතට විත් පැවසූහ. ඔවුන් හැම කෙනෙකුටම වාගේ කියා තිබූ 'දන්වල එවන්නං' යන ප්‍රකාශය මට ද එලෙසම ප්‍රකාශ කරන ලදී.

දන්වා එවනා තෙක් මම දින ගණනක් බලා උන්නෙමි. උනන්දුවත් කුතුහලයත් තුනී වී ගොස් මා ඒ ගැන උදාසීන වෙනතුරුම කිසිත් දන්වා එවුණේ නම් නැත.

''තාමත් අර ගිය තැනිං දනුංදීමක් කළේ නෑ නේද ලොකු...?'' අම්මා වරක් - දෙවරක් නොව කිහිප වරක්ම එසේ ඇසුවා ය.

"අනේ අම්මේ මන්න ඔය කෙහෙල්මල මං දූං අතෑරල දාල ඉන්නෙ..."

මා එහෙම කිවේ නොරිස්සුමෙනි. කවදාවත් මා ඒ විදිහට වචන වලින් අම්මාගේ මූණට දමා ගසා නැත. මා නොරිස්සුම වූයේ ඇත්තටම අම්මා එන්න නොව සුන් වී ගිය මගේ බලාපොරොත්තුවත් එක්ක ය.

"මෙයානං හරිම ළමයා තමයි. මං එතකල්ම නිකමටවත් අපේ ගෙවල් පැත්තෙ ආවෙ නෑ නේද...?"

ඒ ආදරණීය නොක්කාඩුවත් එක්කම දවසක් පිනිබර උදයේ හංසි අපේ ගෙදර ආවා ය. ඈ ඇවිත් තිබුණේ තනිව නොවේ, සදෙව් අයියාත් සමග ය.

"අනේ ඒක නොන්නං දරුවො, එදා මේ දරුවට අසනීපයි කියලා අර මහත්තයා ඇවිත් අපේ ආර්යා එක්කගෙන ගියාට පස්සෙ... මේ දරුවත් මේ පැත්තෙ ආවෙම නැතෙ."

බෝම්බයක් පුපුරා ගියා සේ මා කම්පිත විය. හංසිගේ ඇස් වල ද එවැනිම සසල වීමක් මම දුටිමි. දන් ඉතින් සියල්ල විනාශ වී තිබේ. අතින් දෙවිල් කෙසේ වී ද මිත්‍රත්වයේ විශ්වාසය විනාශ වී තිබේ. ඉතින් මා හංසිගේ මූණ බලන්නේ කෙසේ ද...? මම හිස වවාත් බිමට හරවා ගතිමි. ලැජ්ජාවට පොළොව පලාගෙන ගොස් නැංගෙන්නට ඇත්නම්...!

"දූං කොහොමද පුතේ...? අසනීප එහෙම හොඳ ද...?"

"ආ... මචී ආන්ටි. දූං හොඳයි. ආර්යා... යමුකො අපිත් එක්ක. අපි පොඩි ගමනක් යන්න කියලයි හදන්නෙ..."

"අනේ බෑ හංසි."

මම ගත් කටටම කීවෙමි. හංසි කොහොම වුණත් අම්මා නම් පුදුම වෙන්නට ඇත. හංසිගේ යෝජනාවක් හෝ ඉල්ලීමක් ඒ තරම්ම දරදඬු විදිහට ප්‍රතික්ෂේප කරන්නට තරම් හයියක් මට කොයින් ද...? නමුත් ඒ වෙලාවේ මට තිබුණ එකම හයිය ඒ දරදඬු



වීම පමණකි. හංසි හෙමිහිට මගේ අතකින් අල්වාගෙන මෘදු ලෙස මනෙතට එබුණා ය. ඒ දෑසින් මිදී පලා යන්නට මට පුළුවන් වූයේ නැත. මම අසරණ ලෙස බලා සිටියෙමි.

"හරි හරි. අපි යමුකො ලැස්ති වෙන්න. කම්මැලි කමේ බැරි නිසා මං අයියට කිව්ව අපි සූ එක බලන්න යං කියලා."

"අනේ හංසි..."

"මහ දුරක් නෙවෙයිනෙ. අපි ඉක්මනට එනව. යමුකො..."

වෙනදා ඇති දඟකාරකමින් තොරව, හංසි හෙමිහිට මගේ අතින් අල්වාගෙන මිදුල දිගේ ළිඳ වෙත ඇවිද යන්නට වූවා ය. ඇය මා කැඳවාගෙන යන්නට පැමිණි හැම වතාවකම - මුලින්ම මා ළිඳ ළඟට ගොස් මූණ සෝදාගත් නිසා වන්නට ඇත. හංසි නොදන්නා රහසක් කවදුරටත් මගේ හදවතේ සඟවාගෙන ඉන්නට මට හිත් දුන්නේ නැත.

"අනේ මට සමාවෙන්න හංසි..."

හැඬුම් එන්නට හැදුවත් මම ඒ හැඬුම වළකා ගතිමි.

"එදා සදෙව් අයිය අපේ ගෙදර ඇවිත් මාව එක්කගෙන ගියේ ඔයාට අසනීපයි කියලා. මගෙදි තමයි කිව්වෙ... එයා එහෙම කිව්වෙ බොරුවට කියලා. හැබැයි සදෙව් අයියා මට කිව්වෙ නෑ ඔයාට ඒක කියන්න එපා කියලා. මං නිසා ඔය දෙන්නා අතරෙ ප්‍රශ්නයක් වෙයි කියලයි හංසි... මං සදෙව් අයිය අපේ ගෙදර ආව කියල ඔයාට කිව්වෙ නැත්තෙ හැබැයි ඊට පස්සෙනං එයා ආවෙ නෑ."

මා කියාගෙන කියාගෙන ගිය කතාව හංසි අසා සිටියේ කිසි කලබලයක් නැතිව නිසංසලේ ය. සමාව ඉල්ලන බැල්මකින් මම හංසි දෙස බලා සිටියෙමි. මා බලාපොරොත්තු වූ නොරිස්සුම ඇය වෙත වූයේ නැත.

"අයියෝ... ඕක මහ ලොකු දෙයක් ද...? අපේ අයිය ඔය වගේ පිස්සු වැඩ කරනව තමයි කොහොමත්... හරි හරි... ඉක්මනට

යමුකෝ..."

ඇය කොයිතරම් සන්සුන් ද...? ඇගේ හදවත මොනතරම් නොකිළිටි ද...? ඒ අතින් බලනකොට මගේ හිත කෙතරම් අපිරිසිදු ද...? මට මං ගැන මහත් කලකිරීමක් දනෙන්නට ගත්තේ ය. හංසිගේ ද...? මට මං ගැන ... වද කිරීමට මා යන්නට ලෑස්ති වුවත් හිතේ උනන්දුවක් තිබුණේම නැත. බරපතල විස්සෝපයක් මට වද දෙන ලදී.

"පිස්සි. වැඩක් නැති දේවල් ගැන හිත හිත ඉන්නැතුව පොලියෙ ගිහිං එමු ද...?"

රිය තුළ දී මා ඉවත බලාගෙන යද්දී හංසි පිටුපස හැරී හෙමිහිට කීවා ය. සදෙව් අයියා අපේ ගෙදර පැමිණ මාව රැගෙන ගිය කාරණය ගැන මා ලොකුවට සිතුවාට ඔවුන්ට එය මහ ලොකු දෙයක් නොවෙයි අන්තිමට මම සිතා ගතිමි.

"මොකද අද යටිබාගෙ මූණ ඇඹුල් කරගෙන...?"

අවන්ත අයියා එකම බැල්මකින් මගේ වෙනස දැක තිබිණ.

"හරි හරි. කොල්ලො කොල්ලංගෙ පාඩුවෙ ඉන්නකෝ. කෙල්ලංගෙ ඒවා හොයන්න එන්නැතුව."

මාව අපහසුතාවයකට පත් වෙන්නට පෙර හංසි මා වෙනුවෙන් ඉදිරිපත් වූවාය.

"කෙල්ලො ගැන කොල්ලො හොයන්නැත්තං වෙන කවුරු හොයන්න ද...? නැද්ද සදෙව්...?"

අවන්ත අයියා සදෙව් දෙසට ඇසක් ඉඟිමරනු මම දුටිමි. සදෙව් නොපිපුණු සිනහව ඇති අව නෙතින් මදෙසට මඳ බැල්මක් හෙළුවේ ය. මම විගස බිම බැලුවෙමි.

සදෙව් අයියා එදා දවස තුළ කොයිතරම් වාර ගණනක් මදෙස බලන්නට ඇත්ද කියන්නට මට නිනව් නැත. නමුත් මම පුළුවන් තරම් ඔහුගේ නෙත් වලට හසු නොවී හිඳීමේ උත්සාහයක ගතිමි.



මිත්මැදුර බලද්දී හංසි අවන්ත අයියාගේ අතක පැටලීගෙන ඉස්සර වූවා ය. මම තරමක් පමා වීමි. සදෙව් අයියා හිටියේ මටත් වඩා පිටුපසිනි. නමුත් මා වෛවර්ණ මත්ස්‍යයෙකු අභියස වයි වී සිටි මොහොතක ඔහු මට වඩාත් ලං වී තිබිණි.

"තාමත් මාත් එක්ක තරහ වෙලා ද ඉන්නෙ...?"

ඔහුගේ සුසුම්සර පවා දැනුණ නිසා මම තරමක් සසල වීමි. මා පිළිතුරක් ගලපා ගත්තේ තරමක් පමා වී ය.

"අනේ... මං ඇයි සදෙව් අයියත් එක්ක තරහ වෙන්නෙ."

මගේ ස්වරය වඩාත් බැගෑපත් වන්නට ඇත. ඒ බැගෑපත් බව ගැන ඔහු තුළ තරමක තොසතුටක් ඇති වූ බව පෙනිණ.

"තරහ වෙනවනං ඒකට හේතු ඕනතරං තියෙනවනෙ හලෝ."

ඔහු එහෙම කීවේ දඩබ්බර - හිතුවක්කාර කොල්ලෙක් වාගේ ය. ඒ මා සදෙව් බස්නායකගෙන් දක නොමැති පැත්තකි. ඔහුගේ තරවටුව තරමක් තදින් හිතේ වැදී ගිත්දා මම බිම බලා ගතිමි.

"ආර්යා..."

මගේ ගැහැනු හිත අභ්‍යන්තරයෙහි භූමිකම්පාවක සෙලවීම ඇති විය. ඔහුගේ ස්වරය හදවත් බිත්ති මත ඒ තරම් සියුම් ලෙස වැදුන හෙයිනි.

"හංසි දන්නව ද එදා මං ඔයාව එක්කගෙන ගිය එක."

උදේ හංසි ළඟ දී දැනුණ බියපත් අසරණකම යලි මට දනෙන්නට ගත්තේය.

"ආ... දන්නව ද...?"

'ඔව්.' යි හඟවන්නට මා හිස සැලුවා පමණකි. සදෙව් අයියා තරමක් හිගැස්සිණ.

"එදා ඔයා අපේ ගෙදර ගිය දවසෙදිම ද දන්නෙ...?"

"නෑ. අද උදේ. නංගි ආපු වෙලාවෙ අපේ අම්ම ඇහුව අසනීප හොඳයි ද කියලා. ඉතිං මට කියන්න වුණා."

"තමත් නෑ. ඒක හොඳයි."

ඔහු 'ඒක හොඳයි' කියන්නට හේතුව මොකක්ද කියා මම නොදනිමි. ඔහු විමසන්නට තරම් ආත්ම ශක්තියක් මට තිබුණේ ද නැත. මේ දෙහේතුව මත මම වඩාත් අසරණ වීමි.

නංගිට නොකියා සඳෙව් අයියා අපේ ගෙදර පැමිණි පුවත නංගි දනගන්නාය කියා විශේෂ වෙනසක් මට සඳෙව්ගෙන් නොපෙනිණ. දවසේ ඉතිරි කොටස ගෙවී ගියේ සාමාන්‍ය අයුරිනි. නමුත් මගේ හිත අසාමාන්‍ය හැඟීම් සමුදායක ගිලෙමින් පා වෙමින් පැවතිණ.

"මට ඔයත් එක්ක කතා කරන්න හුඟක් දේවල් තියෙනවා. ඒකට මට වෙලාවක් ඕනෙ."

සත්වෝද්‍යානයෙන් පිටතට විත් රියට නැගෙන්නට මත්තෙන් සඳෙව් මුදු පිරිමි හඬකින් කීවේ ය. මා ඇස් ලොකු කර බලන්නට ඇත. ඔහුගේ දෙතොල මදහසකින් පිපිණි.

"ඉතිං වෙලාවක් කියන්න."

මය විරාන්තව මෙන් මම රිය දොර හැරගෙන ඊට ගොඩ වීමි. ඊට පස්සේ මා ගෙදර යනතුරුත් යළි ඒ ප්‍රශ්නය අසන්නට අවස්ථාවක් සඳෙව්ට නොලැබිණ.

"අක්ක හරි තරහයි. සූ එක බලන්න මාව එක්කං ගියෙ නෑ."

මා සත්වෝද්‍යානය බලන්නට ගිය පුවත අම්මාගෙන් දනගෙන සිටි නංගි, ගෙදර ආ වෙලාවේ සිටම මට කනිපින්දම් කියන්නට වූවාය.

"අනේ අනේ, ඒ ළමයි එක්ක ගිහිං පැහෙන්න පුළුවන් කමක් උඹලට නෑ."

අම්මා නංගිට එරෙහි වූවා ය. නමුත් නංගි පසුබැවේ නැත.



"එහෙනං අක්ක යන්නෙ...?"

"අක්ක වගේ ද උඹ...?"

"ඇයි...? මොකද...?"

පුංචි කමට නංගි ද එකට එක කියාගෙන ආවා ය. මම කම්පිතව ඇය දෙස බලාගෙන සිටියෙමි. පෝෂණය හීනකම නිසා සමවයස් දරියන්ට සාපේක්ෂව නංගි කෘෂ ය. නමුත් දැන් ඇය මීට මාස කිහිපයකට පෙර සිටි දරියට වඩා තරමක් වැඩී ඇතැයි මම මුල්ම වතාවට දුටිමි. සමහර විට අම්මා මෑත දවසක දී නංගි මල්වර වීම ගැන කතාවක් මා හා කියන්නට ඇත්තේත් ඒ වෙනස දැක විය යුතු ය.

"පොඩි කෙල්ලේ... උඹ දං එකට එක කියාගෙන එනව වැඩියි. යකෝ මූංගෙ හොස්ස ළඟට උරිස්ස එනකොට අපිට ඉහගහන්න නම්බවෙන්නෙ නැතෙ."

"එහෙනං ඉතිං අම්මා අපිවත් සූ එක බලන්න එක්ක යන්න."

"හිටපං හිටපං, උඹට දං සත්තු වත්ත විතරනෙ අඩුවකට තියෙන්නෙ. මං හෙටම නැන්දගෙන ගිහිං පෙන්නන්නංකො."

නංගි අම්මාට ගස්සා - මට ද රවාගෙන අප වෙතින් ඈත්ව ගියා ය. මම අලුතෙන්ම කම්පිත වීමි.

"මූං අද ගසාදාලා එනකොට අපිට වසන්න වෙන්නෑ. මොකටද ඉතිං මගෙ කට."

අම්මා රෙදිපොට ලිහා යළිත් එය තදකොට ඉනෙහි ගසා ගත්තා ය. හිතේ තද කේන්තියක් ඇති වූ කල ඇය එසේ කරනු මම දැක ඇත්තෙමි. තාත්තා කැකෝ ගසද්දී වචනයක්වත් නොකියා ඉවසා සිටින ඇය කේන්තිය රහසිගතව පිට කරන්නේ එලෙසිනි. උගුරේ සිට පපුව දෙසට බැසගෙන යන දැවිල්ලක් මට දැනිණ. ඒ දැවිල්ල අම්මා හා නංගි දෙදෙනාම වෙනුවෙන් ඇති වූවකි. නමුත් තවමත් මගේ උරුමය ඒ දැවිල්ල හා කම්පනය පමණකි. යමක් කරන්නට බැරි එකේ මා කොහොම වචනයක් කියන්න ද...?




සඳෙව් බස්නායකගේ ජීප් රථය දවසක් අපේ ගේ ඉදිරිපිට පාරේ හෙමිහිට ඇදී යනු මම දුටිමි. ඒ වෙලාවේ මා හිටියේ ඉස්තෝප්පුවේ රෙදි නවමිනි. තාත්තා ඉස්තෝප්පුව දොරකඩ පඩිය මත හිඳ සිටියේ ය. රිය අපේ ගේ ඉදිරිපසින් ගියේ වඩාත් හෙමිහිට ය. සඳෙව් අයියාගේ නෙත් අපේ ගේ දෙසට හැරවී තිබෙනු මම හොඳටම දුටිමි. නමුත් ඔහු රිය නතර කළේ නැත. සමහර විට තාත්තා සිටි නිසා වන්නට ඇත. කවදාවත් අත්විඳ නැති විදිහේ හුස්ම හිරවීමකින් මම පීඩාවට පත් වීමි. හදවත ගිඩි ගිඩි ගා ගැහෙන්නට ගත්තේ ය. මේ සිදුවෙන්නට යන්නේ කුමක් ද...? සඳෙව් අයියා රිය නොනවත්වා යන්නට ගියේ ඇයි...? ඔහු නතර වී වචනයක් කතා කළා නම් මෙතෙම කුකුසක් හිතේ ඇති නොවනු ඇත. රෙදි නැවුවාට මා සිටියේ ඒ ගැන සිහියකින් නොවේ.

"මේ මොකද අයියගෙ ඇඳුං මගෙ රෙදි ගොඩේ නවල තියලා."

නංගි මහ හඬින් අසද්දී මා සිහි ලබන්නට ඇත.

"ආ..."

මම ඉක්මනින්ම මල්ලීගේ ඇඳුං කෑලි ටික වෙනම ගොඩකින් තැබුවෙමි. අම්මා එකටම සෝදන රෙදි මා නවද්දී වෙන් වෙන් කොට ගොඩවල් ගැසුවාට, අපේ ගෙදර අයගේ රෙදි දැමීමට වෙන



වෙනම අල්මාරි තිබුණා නොවේ. වෙන වෙනම තබා එක අල්මාරියක්වත් තිබුණේ නැත. අප කුඩා කාලයේදී අම්මා රෙදි තැබුවේ පොට්ටනියක ගැට ගසා ය. එක්කෙනෙකුට ඇඳුමක් ඕන වුන විට රෙදි පොට්ටනිය ලිහා ඇද බැලිය යුතු විය. සේදූ රෙදි නවන පුරුද්දක් අම්මාට නොවිණ. ඕ කළේ රෙදි ටික වියළුන පසු එකතු කොට පොට්ටනියකට දමා ගැට ගැසීම ය. සමහර විට සේදූ රෙදි වේලෙමින් තෙමෙමින් දින ගණන් වැල් වලම තිබිණ. මට යමක් තමක් තේරෙන්නට ගත් දිනවල අම්මා එක්ක කඩයට ගිය වෙලාවක මම අම්මා ලවා මුදලාලිගෙන් හිස් කාඩ්බෝඩ් පෙට්ටියක් ඉල්ලා ගතිමි.

"කෙල්ල දම්ම පෙට්ටි එකතු කරන්නෙ... කසාද බැඳලා යන දවසට දැවැද්ද ගෙනියන්න වෙන්න ඇති."

මුදලාලි අපහාසයට හෝ උපහාසයට හඬනගා හිනැහිණ. මා තුළ නොරිස්සුමක් හෝ කේන්තියක් ඇති වුණත් එය පිට කරන්නට තරම් මුහුකුරා ගිය වයසක් නොවේ එය.

"සෙල්ලමටනෙ මුදලාලි."

අම්මා මා වෙනුවෙන් කතා කළේ මගේ හිස ද පිරිමදිමිනි.

"සෙල්ලං නෙවෙයි. ඔය කාඩ්බෝඩ් පෙට්ටිය වුණත් ගාණකට විකුණන්න පුළුවං. මං අර උඹට හින්දා දුන්නෙ."

මුදලාලිලා කියන්නේ පුළුවන්නං තමංව වුණත් විකුණන්නට පුළුවන් මිනිස් කොට්ඨාශයක් බව එදා මා දැන සිටියේ නැත. අම්මා බැගෑපත් බැල්මකින් කඩයෙන් දොට්ට බැස්සා මට තවමත් හොඳට මතක තිබේ. මම ඇගේ රෙදි පොටේ එල්ලීගෙන, ලොකු පෙට්ටිය අමාරුවෙන් ඔසවාගෙන ගෙදර ආවෙමි.

"කාඩ්බෝඩ් පෙට්ටිය ඉල්ලගත්ත එකේ... උඹ ඕක ගලවල කාඩ්බෝඩ් එක බිමට එලාගෙන නිදියපං..."

අම්මා එන ගමන් කීවා ය. ඇගේ හඬ ආදරයෙන් සන්තෘප්තව තිබිණ. මම හිස නගා අම්මා දෙස බැලුවෙමි.

"අනේ බෑ... මේක මට එපා..."

අම්මා පුංචි සිනාවක් පෑවා පමණි. වෙහෙසකර බවක් තැවරී තිබූ ඇගේ මූණේ එහෙම සිනාවක් වූව පිපෙන්නේ කලාතුරකිනි.

පෙට්ටිය ගෙදර ගෙනා මම රෙදි පොට්ටනිය ලිහා එහි තිබූ ඇඳුම් ටික කාඩ්බෝඩ් පෙට්ටියට එබුවෙමි. එදා පටන් අපේ රෙදි අල්මාරිය එය විය. මගේ මතක ඉතිහාසයේ හැටියට, තරාවලක් වූ අපේ ජීවිත පැවැත්මෙන් ගොඩ එන්නට මා තැබූ ප්‍රථම පියවර එය විය යුතු ය. අම්මා දෑස් ලොකු කරගෙන මදෙස බලා සිටියා ය. ඊටත් කාලයකට පස්සේ පුළුවන් වෙලාවට මල්ලිව කඩයට යවා මම කාඩ්බෝඩ් පෙට්ටි කිහිපයක් ගෙන්වා ගතිමි. ඒ දැවැද්ද අනුරා තබන්නට නොවේ. අප පස් දෙනාගේ රෙදි වෙන වෙනම ඒවා තුළ අසුරා තබන්නට ය. එදා සිට අද දක්වාම අපේ රෙදි අල්මාරි ඒවා ය.

හලා තවින් මම තිගැස්සිමි. සදෙව් අයියාගේ රිය නැවතත් පාරේ යමින් තිබිණ.

"අර කාර් කාරයා මොකද මෙතන කැරකෙන්නෙ. දං එක හැරේකුත් මං බලාගෙන ඉඳිමෙත් යන තරං හෙමිහිට මෙතනිං යනවා. දං ආයෙත් හෝන් එක ගහගෙන යනවා."

බිම ඇන තියාගෙන උන් තාත්තා නැගිට්ටේ ය. ඔහුගේ හඬට අම්මා ද ඇතුල්ගෙයි සිට පිටතට ආවා ය.

"කවුද...?"

"කවුද කියල කවුද දන්නෙ...? ඇහැට කනට පේන කෙල්ලො ඉන්නකොට ඕව නවත්තන්න බෑ."

කවදාවත් හෝදන්නේ නැති ලේන්සුව ගසමින් තාත්තා කුස්සිය පැත්තට ගියේ ය. අම්මා ද ඔහු පසු පස ඇදුනාය. ඊට පෙර අම්මාගේ බැල්ම මා විනිවිදලනවා මට දැනිණ. මම කිසිත් නොවුණා සේ - කිසිත් නොදුටුවා සේ - කිසිත් නොදන්නවා සේ රෙදි නැවුවෙමි.



ඒ වුනත් හදවතෙහි යමක් ඉතිරි විය. ප්‍රශ්නයක්...! ප්‍රශ්න වලින් පිරුණු මගේ ජීවිතයට තවත් ප්‍රශ්නම ළඟා වෙන්නේ ඇයි...? සදෙව් අයියා ආවේ ඇයි...? ඇවිත් කතා නොකර ගියේ ඇයි...?

"අක්කෙ..."

අඳුරු වැටුණ පසුවත් බිත්ති කණ්ඩිය අයිනේ ඉඳගෙන කල්පනා කරමින් සිටි මවෙත මල්ලි ඇවිත් තිබිණ. ක්ෂණික සුසුමකින් මම ළය පුරවා ගතිමි. මල්ලි මට සමීපයේ බිත්ති කණ්ඩිය මතින්ම හිඳ ගත්තේ ය.

"ජොබ් එකක් ගැන හිත හිත ඉන්න ඕන නෑ අක්කෙ. අක්ක කැම්පස් යන්න."

මල්ලිට පිළිතුරක් නොදුන් මම ඔහු කී දේ ගැන තරමක් දුරට හිතාගෙන ගියෙමි. විශ්ව විද්‍යාලය...! ඒ කාලයක් තිස්සේ මගේ හිතේ තිබුණ සිහිනයකි. නවක වදය... නවක හා පැරණි සිසුන් අතර ඇති වෙන සුහද බැඳීම, දේශන, නේවාසිකාගාර, මහපොළ - ශිෂ්‍යත්ව ආධාර, විශ්ව විද්‍යාලයීය ප්‍රේම සම්බන්ධතා - ඒ සිහින ලෝකයකි. සුන්දර සිහින ලෝකයකි. වෙනත් ඕනෑම බාලිකාවක සේම මම ද ඒ සුන්දර සිහින ලෝකයට ආශා කරමි. එහි ජීවත් වෙන්නට ආශා කරමි. වාරාවසානයෙහි මා ගෙදර එන විට අම්මා පෙරමගට දිව විත් මගේ ඇඳුම් බෑග් එක අතට ගන්නා හැටි මගේ හිතේ සිතුවම් විණි. ගෙදර හැමෝම මේ ඉස්තෝප්පුවෙහි මා වට කරගෙන විශ්ව විද්‍යාලය ගැන තොරතුරු විමසති. මම රස කර කර ඒ කතා කියමි. ගෙදර අය මුව අයා ගෙන ඒ කතා අසා සිටිති.

"අක්කෙ..."

මල්ලිගේ හඬ...! වාරාවසාන නිවාඩුවට ගෙදර ආ ආර්යා නොව බිත්ති කණ්ඩිය අයිනේ හිඳ අහස පොළොව ගැටගහන්නට තරම් කල්පනා කරමින් සිටි ආර්යා මල්ලි දෙස හැරී බැලුවා ය. එවර මගේ මුවින් පිට වූයේ ආත්මානුකම්පනීය සුසුමකි.

"මං කිව්වනෙ මං කොහොම හරි ඔහා වියදං ටික කරන්නං කියල. අක්කා විශ්ව විද්‍යාලෙ යන්න..."

"උඹව ඕලෙවල් වෙනකල්වත් ඉස්කෝලෙ යවාගන්න බැරිවෙලා... මං විශ්ව විද්‍යාලෙ ගිහිං මොකට ද මල්ලියෙ...?" මගේ හදවත මුරගෑවේ ය. නමුත් මම මුවින් වචනයක් වත් නොකිවෙමි.

"ඒලෙවල් වලිං ජොබ් එකක් හොයාගන්න අමාරු වුණාට කැම්පස් ගිහිං උපාධිය ගත්තට පස්සෙ අක්කට අනිවාර්යයෙන්ම හොඳ රස්සාවක් ලැබෙයිනෙ."

පපුවට මහත් බරක් දැනෙන්නට ගත්තේ ය. මම මල්ලීගේ හිස පිරිමැද්දෙමි. ඊළඟට ඔහුගේ අතක් ගෙන පිරිමැද්දෙමි. පෙර කිසි දාක මල්ලීගේ අත්ලෙහි එහෙම රළු බවක් මට දැනී නැත. මම වඩාත් පරීක්ෂාකාරීව ඒ අත්ල දෙස බැලුවෙමි. අත්ල ගොරෝසු වී, කරගැට මතු වී තිබිණ. මා යළි මල්ලීගේ මූණ බලද්දී ඔහුගේ දෙතොල් මත අසරණ මදහසක් විය.

"කරගැට අක්කෙ"

එහෙමම මල්ලීගේ දෝත මත මූන ඔබාගත් මම හොඳටම හැඬුවෙමි. සැබැවටම මා හඬන්නට සිටියා නොවේ. මට හැඬිණි. පාලනය කරගන්නට බැරිව - වාවාගන්නට බැරිව මට හැඬිණ. මා හැඬුවේ ඇයි...? මල්ලීගේ අතේ කරගැට දුටු හින්දා ද...? කරගැට කියන්නේ අපට නුහුරු දෙයක් නොවේ. පුංචි කාලේ සිටම තාත්තාගේ විතරක් නොව, කුලී වැඩ කළ අම්මාගේ අත් වල ද අපි කරගැට දුටුවෙමු. ඒ කාලේ අම්මා අත්ලෙහි පොල්තෙල් ගා ලාම්පු දැල්ලට අල්වා රත් කරනු අපි දැක ඇත්තෙමු. මා පැතුම් පැතුවේ ඒ ජීවිතය අතීතයේ අත් හැර එන්නට ය. නමුත් ඒ පැතුම සඵල වී නොමැත. මා නොපැතූ ලෙස අද මල්ලීගේ අත්ලෙහි ද කරගැට මතු වී තිබේ. මහු පරම්පරාවෙන් උරුම කරගත්තේ කරගැට ද...? අතීතයේ අත්හැර දමා එන්නට මා පැතූ ඒ උරුමය කරුමයක්



ලෙස මල්ලී අනාගතයට ද අරන් යමින් හිඳි. ඉතින් හඬනවා මිස මා සිනාසෙන්න ද...?

"අපිට මොනා වුණත් කමක් නෑ. අක්ක අක්කගෙ හීනෙ හැබෑ කරගන්න. අක්කට යන්න ඕන තැනට යන්න මාත් පුළුවං උදව්වක් කරන්නං. පිටිපස්සෙං ඉඳං හරි."

මට ඕනෑ වුනේ තනිවම යන්නට නොවේ. නංගිගේ හා මල්ලීගේ අත් දෙකෙන් ද අල්වාගෙන යන්නට ය. නමුත් මා පමා වූවා වැඩි ය.

අම්මා හොද්දක් හා බතක් පිස තිබුණත් මට කෑම රුචියක් තිබුණේ නැත. ඒ නිසා හිස් බඩම මම ඇඳට වැටුණෙමි. හිස යකාගේ කම්මල සේ අවුල් වී තිබේ. සදෙව් බස්නායකගේ කුමාර සිනාව ඒ අවුල වියවුලක් බවට පත් කරන්නට සමත් විය.

මම දස අතේ කල්පනා කළෙමි. සදෙව් අයියා අපේ ගේ අවට කැරකීම ලෙහෙසියෙන් හිතෙන් අමතක කර දමනට පුළුවන් වූයේ නැත. වෙන දෙයක් නැතිවත්, ඔහු එහෙම කළේ ඇයි කියා දැන ගන්නටවත් මට ඕනෑ විය. දිය පිපාසය සන්සිඳුවා ගන්න නොහැකිව නොසන්සුන් වී සිටින පිස්සු බැල්ලක සේ මම ද අතෘප්තිමත් රාත්‍රියක් ගත කළෙමි.

උදේ අවදි වී ගෙයත් මිදුලත් අතුගෑ ගමන් මම හංසිලාගේ ගෙදර යන්නට සැද ගෙමි.

"කොහෙද ආර්යා මේ උදේ පාන්දරම යන්න ලෑස්ති වෙන්නෙ...?"

අම්මා තරමක් පුදුම වී සිටියා ය. සාමාන්‍යයෙන් මා ඇයට පූර්ව දැනුම්දීමකින් තොරව කොහේවත් යන්නේ නැත.

"හංසිලගෙ ගෙදර අම්ම."

"දව-සෙම ගෙදරට වෙලා ඉන්නකොට ලොකු පුතාට හරි කම්මැලියි නේද...? කරන්න වැඩකුත් නැනෙ..."

මට මා ගැනම කෝන්තියක් දැනිණ. මේ දුප්පත් අසරණ අම්මාගේ ආදරයටත් මා බොරු කරනවා නොවේ ද...? මේ හදිස්සියේ මා හංසිලාගේ ගෙදර යන්නට ලෑස්ති වූයේ ගෙදර ඉන්නට තිබුණ කම්මැලිකම නිසා නොව ඊයේ සදෙව් අයියා මෙහි පැමිණි ගමන ගැන කිසියම් හෝඩුවාවක් දැන ගන්නට හිතේ වූ යටපත් කළ නොහැකි උවමනාව නිසා ය.

මා ගිය එක ගැන හංසි බෙහෙවින් සතුටු වූවා ය. ඊළඟට ඈය මගේ කනට කොට රහසක් අසන්නට සූදානම් වූවාය.

"අදත් මයාව එක්කගෙන ආවෙ අපේ අයිය ද...?"

මගේ ඇස් බියෙන් විසල් වෙන්නට ඇත. හංසි හඬ නගා සිනහ වූවා ය.

"අනේ නෑ හංසි. මං බස් එකේ තනියම ආවෙ. ගෙදර ඉන්න කම්මැලි නිසයි මං ආවෙ."

"ඉතිං ආපු එක කොච්චර හොඳ ද...? අපේ බ්‍රදර් මයාව එක්කගෙන ආවනං ඊටත් වැඩිය හොඳයි..."

හංසි මනමාල සිනාවක් පෑවා ය.

"පිස්සු දොඩෝනව..."

මම මද නෝක්කාඩුවකින් කොඳුලෙමි. සදෙව් අයියාගේ රිය නෙවත්නට ඇතුලු වූයේ එවේලේමය. හංසි මා දෙසත් සදෙව් දෙසත් අමුතු ඇසකින් බැලුවා ය. ඈ තුළ යම් සැකයක් තිබුණානම් දැන් එය තවත් වැඩි වෙන්නට ඇත. නමුත් මා වරදක් නොකළ බව මම දනිමි. මෙහි පැමිණෙන තෙක් - ඊයේ සවස අපේ ගේ ඉදිරියෙන් ගිය අවස්ථාවෙන් පසු මට සදෙව් අයියා හමු වී තිබුණේ නැත.

"ආ... යටිබාගෙ උදෙංම මොකද...?"

සදෙව් අයියා අප වෙත ආවේම නැවතෙන සූදානමිනි. හංසි මුලින් මට පෑ මනමාල සිනහව යළිත් පෑවා ය. මොකට මේ ගමන ආවෙම්දැයි මම පසුතැවුණෙමි.



කොයිතරම් අපහසුතාවයකට මා පත්ව සිටියත්, මගේ ඇස් වල යමක් තිබුණා නිසැක ය. ඒ නොඉවසිල්ලකි. තලියැමකි. පාට පාට සීනි බෝල බෝතලයක් දකින කුඩා දරුවෙක් තුළ ඇති වෙනාකාරයේ තලියැමකි එය. සදෙව් අයියා ඊයේ අපේ ගෙවල් පැත්තේ කරක්ගැසුවේ ඇයි...? ඇවිත් මට කතා නොකොටම යන්නට ගියේ ඇයි...?

"මේ, එයා ඇවිත් තියෙන්නෙ මාව හම්බවෙන්න."

හංසි කට දම්මා ය.

"ඉතිං, මං කිව්වයැ මාව හම්බවෙන්න කියලා."

සදෙව් එකවෙක තිවේ ය. මගේ හද මඬලෙහි තෙරපී දුක්විඳි බර ගතිය ද තරමක් අඩුව යනවා සේ මට දැණින.

"අනේ අයියා මයා ආර්යා එක්ක ටිකක් කතා කර කර ඉන්නව ද..? ටී රෙඩි කරන්න කියලා මං මැගි අම්මට කියල එන්නං."

"මේ මේ එක එක්කෙනාට තනි රකින්න මං කවුරු කියල හිතුව ද...?"

සදෙව් බස්නායක අහංකාරකමක් මවා ගත්තේ ය. ආයේම මට අසරණ හැඟීමක් දැනිණ.

"මයා කවුද කියලයි එන්නෙ මොකාටද කියලයි ඉතිං මං නොදන්නවයැ."

හංසි සදෙව්ගේ කන මිරිකාගෙන යන්නට ගියා ය. මම වසාගැනීගෙන බලා සිටියෙමි. සදෙව් බස්නායක කියන්නේ රජකම අතපොවන මානයේ හිඳින රාජ කුමාරයෙකි. මගේ දුගී පැල අවට ඉතිං ඔහු කුමට කරක් ගැසුවා ද...?

නොතු පියා නොහෙලා මා බලා සිටිය දී සදෙව් මගේ දෑස් මගහැර, පොකුණෙහි නෙළුම් කොලයක් මත ලැග උන් දිය ගෙම්බෙකුට ගල් කැටයක් ගැසුවේ ය. නිහඬතාවය මහ පරතරයක්

ඇති කරනවා මට දැනිණ. නමුත් කට ඇර එක වචනයක් කතා කරන්නට තරම් ශක්තියක් මට තිබුණේ නැත.

"මං දන්නව උදේම ආවෙ මොකද කියල..."

හදිසියේම මා සසලවාගෙන සඳෙව් එහෙම කීවේ ය. මා නෙතු පියන් විසවා බලන්නට ඇත්තේ මවිතයෙනි. සඳෙව්ගේ ආඩම්බරකාර දෙතොල් ලස්සන මන්දස්මිතයකින් හැඩ විය.

"ඊයෙ මං එහෙ ආවෙ ඇයි කියල බලන්න නෙ...?"

ඔහු ප්‍රශ්නය අසා ඔහුම පිළිතුරත් දුන්නේ ය. සඳෙව් බස්නායකට පරචිත්ත විජානන ඥානය තිබෙනවා ද...?

"හරි නේ...?"

මගේ මූණෙන්ම ඔහු සිය ප්‍රකාශය මා ස්ථිර කළ වග පසක් කරගන්නට ඇත. අර මන්දස්මිතය ලස්සන සිනහවක්ව පිපුණේ මා බලා සිටියදීම ය.

"දන්න නේ...? මට ඔයාගෙ හිත කියවන්න පුළුවං."

ඇත්තටම ඔහු විජ්ජාකාරයෙක් ද...? මට මේ මොහොතේ සිතෙන දේ පවා ඔහු මුවින් කියන්නේ කෙසේ ද...? සඳෙව් හඬ නගා සිනාසෙන්නට ගත්තේ ය. ඔහුට මොනවා සිදුවෙලා ද...? මම එහෙම්පිටින්ම තැළුණි සිටියෙමි.

"මොකද නිකං යකෙක් දැකල වගේ බයවෙලා...?"

තව මොහොතකින් හංසි මෙතනට එනු ඇත. ඉන් පස්සේ සඳෙව් අයියා සමග මෙහෙම තනිවම කතා කරන්නට මට අවස්ථාවක් උදා නොවනු ඇත. ඒ සිතිවිල්ලත් සමග මම ඉක්මන් වීමි.

"ඇයි සඳෙව් අයියා ඊයෙ අපේ ගෙවල් පැත්තෙ ගියේ...? ඇයි කා එක නතර නොකරම ගියේ...?"



මගේ ස්වරයෙහි කලබලයක් තිබුණා නිසැක ය. මා කලබල වූයේ කොපමණට ද, එපමණටම සඳෙව් සැහැල්ලුවක් පෙන්වූයේ ය.

"ප්‍රශ්න දෙකක්නෙ. මුලිංම පළවෙනි එක. මං ඕගොල්ලංගෙ ගෙවල් පැත්තෙ ආවෙ මොකද..? නේ...? ඔයාව බලන්න..."

හදවත 'දඩස්' ගා සෙලවිණ. ඒ ගමන ඔහු මගේ දූප්පත්කම හෝ අසරණකම සෙල්ලමකට ගන්නට හදනවා ද...? නමුත් ඒ සැහැල්ලු - සෙල්ලක්කාර - දඩබ්බර පිරිමිකම්වලට මා වශී වූ වගනම් කිව යුතුවම තිබේ.

"ඊළඟ ප්‍රශ්නෙ... කා එක නතර නොකර ගියේ ඇයි...? උත්තරේ. ඔයාගෙ තාත්තා හිටියනෙ ඉස්සරහම. පොලිසිය පේන්න ඉන්නව දක්කම හොරකං කරන්නෙ නැහැනෙ සාමාන්‍යයෙං."

හොරකම කුමක් ද...? මගේ අහිංසක ගැහැනුකම් සමග සෙල්ලම් කරන්නට හැදීම ද...? ඔවුන්ගේ ජීවිතවල තියෙන සැහැල්ලුව අපේ ජීවිත මත පතිත කළ නොහැකි වග සඳෙව් අයියා දන්නේ නැත. කොටින්ම මාව හංසිගේ ගොඩට දමා කටයුතු කිරීමට නොහැකි වග සඳෙව් අයියා දන්නේ නැත. මා හිස එසවූයේ අසරණව ය. යමක් කියන්නට මට උවමනා විය. නමුත් එතකොටම ගෙතුල සිට හංසි මිදුලට ආවා ය. අප අතර යම්කිසි කතාබහක් සිදු වෙන බව ඒ දුරට වුව ඇය දකින්නට ඇත. මට පසුතැවීමක් දැනිණ. ඇය තව ටිකක් පමා වී ආවා නම් හොඳයි කියා සිතිණ.

හංසිගේ මූණේ කල්පනාබර බවක් මොහොතකදී දැකිය හැකි විය. ඇගේ ගමන් වේගය අඩු වූයේ ය.

"අනේ පොඩ්ඩක් ඉන්න ආර්යා..."

කියාගෙන ඇය යළි ගේ දෙසට දිව්වා ය. සඳෙව් බස්නායකගේ තොල් කොනක සිනහවක් විය. හංසිගේ හැසිරීමේ හෝ සඳෙව්ගේ තොල් කොන් සිනාවේ තේරුම මට තේරුණේ නැත.

"මුයාගෙං මං මීට වෙන්න වෙලාවක් ඉල්ලුවා. කෝ තාම මට චාන්ස් එකක් ලැබුණෙ නැතෙ."

සඳෙව් මගේ ඇස්වලින් ආත්මය පත්ලටම රිංගන්නට හැදුවේය. නොත් තවුළු වසන්නට නොව අඩවන් කරන්නට වුව මට සිතුණේ නැත. හිතුවක්කාර පිරිමිකම් වලින් මිදී පලා යන්නට ගිනි ගැනුණු ආත්මයක් මිහිමත තියෙන්නට පුළුවන් ද...? විශ්ව නිහිය නිර්මාණය වී තිබෙනුයේ ආකර්ෂණයවීම හා විකර්ෂණය වීම මතය.

"මුයා මට ඒකට අවස්ථාවක් දෙන්නෙ නැත්තං... කියන්න තියෙන දේ මං දැං තෙවියෙං කියන්නං ආර්යා..."

මම බිය වීමි. සසල වීමි. නමුත් ඔහු කියන්නට යන දෙය දැනගන්නට නොඉවසිලිමත් වීමි.

"අ'ලව් යූ. දිසිස් නොට් අ ජෝක්. අයිම් සීරියස්."

තතුල් දෙක පණ නැතිව යනවා මට දැනිණ. තියපොතු තුළේ සිට ජේෂ්ඨත්වය තෙක්ම කම්පනයෙන් ගැහෙන්නට ඇත. සඳෙව් අයියා මගේ නෙතින් නොමිදීම සිටියේ ය. ඔහුගේ දෙනෙත් පහසත් - මගේ සිරුරේ හා හදේ වූ තිගැස්මත් එක් වූ කල මැවුණේ සුවිශේෂ ආනන්දයකි. මම ඒ ආනන්දනීය හැඟීමෙන් මුසපත් වීමි. හදවතට රිසි සේ ඒ හැඟීම විඳගන්නට හැර නිසලව සිටීයෙමි. මා බලා සිටියේ ඔහු මය ටික කියන තෙක් නොවනු ඇත්ද...? මගේ කුත් හිතෙහි උපවිඥානයීය ප්‍රාර්ථනය එය නොවූවා විය හැකි ද...? මෙතුවක් කල් මා බලා සිටියේ - සිහින මැවුමේ සඳෙව් බස්නායක වගේ පුර කුමරුවෙක්ගේ ප්‍රේමාරාධනයක් වෙනුවෙන් නොවන්නේ ද...? කිසියම් තෘප්තිමත් බවක් මට දැනෙන්නට ගත්තේය. ජයග්‍රාහී හැඟීමක් දැනෙන්නට ගත්තේ ය. කවදාවත් මට ඔහුගේ පාදපරිචාරිකාව වන්නට නුපුළුවන. මේ ඇති - නැති පරතරයක් ඇති සමාජය මට ඔහුගේ වහල යටට එන්නට ඉඩ නොදෙන්නේම ය. නමුත් දැන් ඉතින් ප්‍රමාණවත් ය. මට එපමණකින් සෑහීමට පුළුවන.



"ආ එන්න. මං එළියටම තේ ගෙනාව."

හංසි ආවා ය. ඇය තේ හා කේක් සහිත බන්දේසිය උදසාන මේසය මතින් තැබුවා ය. සඳෙව් මදෙසත් හංසි දෙසත් මාරුවෙන් මාරුවට බලමින් අසුනකට බර වූයේ ය. ඔහුගේ දෙතොල් අග තවමත් නලියන මන්දහාසය, හංසිටත් කිසියම් කතාවක් නොකියා කියන්නට ඇත.

ඉක්මනට තේ ටිකක් බී සිදෙව් අයියා ගෙතුළට වැදිනි. යළි මා හංසිලාගේ ගෙදරින් නික්මෙන තුරුත් මම ඔහුව නොදුටිමි. අයියා කෝ කියා හංසිගෙන් අසන්නට නුපුළුවන. ඇයත් මා සමග සඳෙව් ගැන එක වචනයක්වත් කතා කළේ නැත. අඩු තරමින් තේ ගේනකල් අයියා කීවේ මොනවා ද කියා ඇහුවේවත් නැත. මා නික්මෙද්දී සඳෙව්ගේ රිය පෝටිකෝව යට විය. ටික දුරක් මා ඇවිද ගිය විට හෝ ඔහු ඒවිධි යටිහිත සිතා සිටියේ ය. නමුත් මා බසයකට ගොඩවෙනතුරුත් ඔහු ආවේ නැත.

# 06

දැන් ඉතින් කුමක් කරන්න ද කියා මම නොදැන සිටියෙමි. සිනාසෙන්න ද නැතිනම් හඬන්න ද කියා තේරුමක් තිබුණේ නැත. මගේ කෙළිකාර හදමඬලෙහි චමත්කාරයක් දනා වූ සදෙව් බිස්නාසෙක මට ආදරය ප්‍රකාශ කළේ ය. නමුත් එය පිළිගන්නට පුළුවන්කමක් මට නැත. මට නොව මගේ ජීවිත පසුබිමට ඔහු වද්දාගන්නට පුළුවන් කමක් නැත. ඒ ගැන කිහිපවිටක් නොව එක වරක්වත් සිතන්නට අවශ්‍ය නොවේ. ඉතින් මා සිනාසෙන්න ද නැත්නම් හඬන්න ද...?

සිහිවිලි රසවත්වද, සිත කෝන්තුවාවෙන් ද දෝලනය වෙමින් තිබ් දින වල විශේෂ සිදුවීමක් සිදු විය. එනම් ප්‍රාදේශීය දේශපාලකයන් තෝරා ගැනීම සඳහා නාමයෝජනා බාර ගැනීම ය. උදේ වැඩට ගිය මල්ලී දිවා ආහාර වෙලාවටත් පෙර කඩිනමින් කඩුල්ල පනිනු මම දුටිමි. පාසල් ගමන නවතා කුලී වැඩට යන්නට පටන් ගත් මේ ටික කාලයට මල්ලී උසින් මහතින් වැඩී තිබෙනවා මුල්ම වතාවට මම දුටිමි. ඔහුගේ දෙඋරහිස් බෙහෙවින් පුළුල්ව තිබිණ. උස් වූ සිරුර වැඩුණ පිරිමියෙකුගේ සෙයින් වර්ධනය වී තිබිණ. දින කිහිපයකින් නොකැපූ - මූණ පුරා වැවුණ රැවුල, ඔහු තවදුරටත් පාසල් ශිෂ්‍යයෙකු නොවන බව මට සනාථ කළේය . මල්ලීගේ දෙතොල් මත මම අලුත් ආරක සිනහවක් දුටිමි.

"අනේ පුතේ මොකද මේ වේලාසන ඇවිත්...?"



මල්ලීව දුටු අම්මා කම්පිතව ඉස්තෝප්පුවට ආවා ය. මල්ලීගේ දෙතොල් මත නලිය - නලියා තිබ් මදහස පුළුල්ව පිපුණේ ය. ඔහු කමිසයේ බොත්තම් ගලවමින්ම කෙටි බිත්ති කණ්ඩිය මතින් හිඳගත්තේ ය.

"ආයි මං ඔය කුලී වැඩ කරන්න යන්නෑ අම්මෙ."

මට දැනුණ සැනසිල්ලම, මන්දහාසයක් ලෙස මම අම්මාගේ මුහුණේ දුටිමි.

"දෙයියංගෙ පිහිටයි පුතේ. දැංවත් උඹ ඉස්කෝලෙ යන්න තීරණේ කළානං ලොකු දෙයක්."

"ඉස්කෝලෙ...?"

එවර මල්ලී සිනාසුණේ සමච්චලයෙනි. මා සේම අම්මා ද බැලුවේ පුදුමයෙනි.

"ඉස්කෝලෙ ගිහිං කාටද අම්මෙ තරියන්නෙ...?"

මගේ පපුව 'දඩස්' ගා ගැහිණ. මල්ලී ද ක්ෂණිකව නෙතු හරවා මදෙස බැලුවේ ය. තමන් අතින් කියවුණේ වැරදි වචනයකැයි පසුතැවීමක් ඔහුට දැනෙන්නට ඇත.

"නෑ මං කිව්වෙ... මං ඉස්කෝලෙ ගියා කියල ගොඩයාමක් නෑ. ගොඩයන අතක් ගැනයි දැං අපි බලන්න ඕනෙ."

"එතකොට... උඹ මොකද්ද පුතේ කරන්න යන්නෙ...? ඉස්කෝලෙ ගමනත් නතර කරල ගිය කුලී වැඩටත් ආයෙ යන්නෙ නැත්තං...?"

"හතරවරීගෙම නිවන් දකින්න නෙවෙයි අම්මෙ... හතරවරීගෙම ගොඩ යන්නනං දේශපාලනඥයෙක්ගෙ කරේ එල්ලෙන්නම ඕනෙ. වෙන මාර්ගයක් නෑ."

මල්ලී එහෙම කිවේ හරි සැහැල්ලුවකිනි. ස්ථිරසාර විශ්වාසවන්ත බවකිනි. ඒ තරම් පැහිච්ච කතාවක් කියන්නට තරම්

සමාජ අවබෝධයක් ඔහුට කොයින්ද...? දේශපාලන දැනුමක් කොයින් ද...? ඔහු තවමත් සාමාන්‍ය පෙළටවත් ලිවේ නැත.

"හත් දෙයිය... නේ..."

අම්මා නිකටෙහි අත තබාගත්තා ය. මල්ලි තවදුරටත් සාමාන්‍යපෙළ සිසුවෙකු නොවන, සමාජයෙන් පරිනත වූ මිනිසෙකු බව මම සිතට කියා දුන්නෙමි.

"මට පොඩි වැඩක් සෙට් වුණා."

එවර මල්ලි කතා කළේ කෙලින්ම අම්මාට පමණක් නොව මටත් එක්ක බව, ඔහු මදෙස බලන අයුරින් සිතාගත හැකි විය. ඔහුට දෙයක් කියන්නට තිබෙනවා නම් අප සවන්දිය යුතු ය. මේ ගෙදර දී ඔහුව තනි කරන්නට නුපුළුවන.

"මොකද්ද මල්ලි වැඩේ...?"

මම උනන්දුවක් පෙන්වූයෙමි. මල්ලිගේ උනන්දුව තිව්‍ර විය.

"අද තොම්පේත්තෙත් දුන්නනෙ අක්කෙ..."

"මොකද්ද බං දුන්නෙ...?"

"තොම්පේත්තෙත් කියන්නෙ අම්මෙ නාමයෝජනා. ඡන්දෙට..."

"ආ... පුංචි ඡන්දෙට..."

"එහෙනම තිලකෙ අයියත් ඡන්දෙ ඉල්ලනවනෙ අක්කෙ. මටත් කිව්ව ඇවිත් වැඩට උදව් කරන්න කියලා. තිලකෙ අයියා ගොඩ යනවා කියන්නෙ ඉතිං මාත් ගොඩ යනව කියන එක තමයි. ඒ කියන්නෙ අපේ මුළු පවුලම ගොඩ..."

"අනේ පුතේ පරිස්සමෙං. මන්නං ඔය දේශපාලනේට කිසි කැමැත්තක් නෑ."

අම්මා තරමක් පසුබා සිටියා ය. කුමක් කිව යුතුදැයි මට වැටහුණේ නැත. දේශපාලනය කියන්නේ මඩ ගොහොරුවකි. නුගත්



වුනත් අම්මාට ඒ ගැන කුමක් හෝ ඉවක් වැටී ඇතිවා සේ පෙනේ. මට ද දේශපාලනය තිත්ත කදුරු තේමාවකි. ඒ වුණත් මගේ අකමැත්ත ගැන කියා පලක් නැත. මල්ලි සිටින්නේ අප කාටවත් නතර කළ හැකි තැනක නොවේ.

"දේශපාලනේට තමයි අම්මෙ කැමති වෙන්න ඕනෙ."

මල්ලි කෙටි තාප්පය මතින් බිමට බැස්සේ නැවත වරක් දෙතොල් මත ඇඳුන අවඥාසහගත සිනාවෙනි.

"තිලක් අයියා දිනුවොත් මට අනිවාර්යයෙන්ම ජොබ් කට්ටක් සෙට් කරල දෙනව කිව්ව, මං කිව්ව මට විතරක් නෙවෙයි අක්කටත් හොඳ පෝස්ට් එකක් ඕන කියලා."

"අනේ මල්ලි දේශපාලකයො අල්ලගෙන ජොබ් වලට යන්න මං කොහොමටවත් කැමති නෑ. ඒකට තමත් නෑ. මල්ලිට ජොබ් එකක් හොයගන්න පුළුවන්නං ඒක කරගන්නකො."

මල්ලීත් අම්මාත් ඉස්තෝප්පුවෙහි හිඳදීම මම කුස්සිය පැත්තට ගියෙමි. ඔවුන් දෙදෙනාම මදෙස බලා සිටියේ විපරීතව ය. සැබැවින්ම මා නොකිවයුත්තක් කීවා ද? බත් බෙදන ගමනුත් මම කල්පනා කළෙමි. නැත. මගේ හිතේ කා ගැනවත් කිසිම කහටක් නැත. මා කීවේ ඇත්ත ය.

කොහොම වුණත් මල්ලී දේශපාලනඥයෙකුට ලං වීම ගැන තිගැස්මක්, දෙතුන් දිනක්ම හදවත මත එහෙ මෙහෙ වෙමින් තිබිණ.

"ඔයා පොලිටික්ස් වලටයි පොලිටීෂන්ස්ලටයි කැමති නැති වුණාට ආර්යා... මේ කාලෙ රටේ ෆවුන්ඩේෂන් එක ඒ මිනිස්සු තමයි. දං දං ඒගොල්ලන්ට ගැනියෙක් මිනිහෙක් කරන්නයි මිනිහෙක් ගැනියෙක් කරන්නයි වුනත් පුළුවන්ද කියලා හිතෙන තරමයි."

මල්ලී අනාගතයේ දේශපාලනයට පිවිසෙන්නට

බලාපොරොත්තු වෙන තැනැත්තෙකුට සහයෝගය දක්වන්නට ගත් තීරණය ගැන මා සියපත්ව ගිඳියදී හංසි මහිත හඳන්නට ද මන්දා තිවා ය.

"ඒ වුනාට මට මල්ලි ගැන බයයි..."

"ඔයා ගෙදර අක්කා බව ඇත්ත ආර්යා. ඒ වුනාට මල්ලි කොල්ලෙක්. අනික් එක ඒ ළමය නොදරුවෙක් නෙවෙයිනෙ. කරන්න ඕන මොනාද නැත්තෙ මොනාද කියල දැං එයාට තේරෙනවා ඇති."

එක බඩවැල තුවාගෙන උපන් සහෝදරිය වශයෙන් මල්ලි ගැන මට දනෙන හැඟීම හංසිට නොදනෙන්නේ ය. ඒ වුනත් ලේ බැඳීම නිසා මා දකින්නට උත්සාහ නොකරන පැත්තක් හංසිට පෙනෙනවා විය නැත. මම හිත යටපත් කර ගැනීමට උත්සාහ ගතිමි.

"ආ... මෙයා වැස්සට ද මෙහෙට ගහගෙන ඇවිත් තියෙන්නෙ...?"

සඳැල්ලෙහි වේවැල් පුටුවල හිඳ කතා බහේ යෙදී සිටි මාත් හංසිත් දෙදෙනාම තිගැස්සී හැරී බලන්නට ඇත. සදෙව් බස්නායක සඳැල්ලට ඇතුල් වෙමින් සිටියේ ය. හුරුපුරුදු වෙමින් තිබි දෙපා වෙව්ලීමකුත්, හදවත් ගැස්මකුත් නැවත වතාවක් දැනිණ. මම අමාරුවෙන් ඒ දිළිසෙන ඇස් වලින් මිදී ගතිමි.

"ඊකනං ඇත්ත අයිය, තියෙන අහංකාරකමට තිකමට මේ පැත්තෙ ඇවිත් යන්න බෑ. නිකං ගෙදරට වෙලා ඉන්න එක නේද...?"

"අනේ අහංකාරකමක්නං නෙවෙයි හංසි."

"නැත්නං ඉතිං වෙන මොකද්ද...? කරීනා කපූර් වගේ ඉන්න නිසා අයිය... ගෙවල් ළඟ මුදලාලිගෙ පුතා ශාරුක්ගෙ කැරැක්ට එක ප්ලේ කරනවනෙ. ඒකයි ඔය..."

"හං... සි..."



මගේ හඬ බෙහෙවින් පහළ ස්වරයක් ගත්තත්, දෑස්වල තරවටුවක් තිබෙන්නට ඇත. හංසි හඬනගා හිනැහුණා ය.

"කමක් නෑ කමක් නෑ ඉතිං... කොල්ලත් හැන්ඩියනෙ."

ඒ වතාවේ වචනයක්වත් මුවින් නොකියූ මම හංසිට රැව්වෙමි. ඒ රැවුම ආදරණීය ය. මිත්‍රශීලී ය.

"ඔකේ. ඔකේ. තරහ ටිකක් අඩු වෙනකල් රානි මුඛර්ජී මෙහොම ඉන්නකෝ. මං පහළට ගිහිං බලන්නං කන්න මොනාහරි තියෙනව ද කියල..."

හංසි තික්ම ගියේ මට සදෙව් අයියා හා තනිවීමේ අවස්ථාවක් සලසා දෙන්න ද...? එය එසේයි සිතන්නට තුඩුළුවන. සැහැල්ලු ජීවිතයක් ගත කළාට හංසි බරපතළ ලෙස සිතන්නට දන්නා යුවතියකි. ඉතින් සදෙව් අයියා හා මා අතර පෞද්ගලික ඇසුරක් ඇති කරන්නට හංසිට උවමනායි සිතිය නොහැක.

"ඉතිං ඉතිං... රානි මුඛර්ජී..."

සදෙව් බස්නායක මගෙනට එබිණ. ඒ දඟකාර - හිතුවක්කාර පිරිමි නෙත් දෑලේ පෙම්වත් වත්නට කෙල්ලකට නොසිතුනොත් පුදුම විය යුතු ය. නමුත් එක දිගට ඔහු දෙස බලන්නට තරම් හයියක් මගේ ගැහැනු ආත්මයෙහි වූයේ නැත.

"ලස්සනයි..."

කිව්වා නොව ඔහු මිමිනුවා මෙනි. අයිස් කන්දක එරුණා සේ මගේ සර්වාංගය සීතලව ගියේ ය.

"තාම මට උත්තරයක් හම්බවුණේ නෑනෙ."

ප්‍රශ්නයක් වී නම් ඒ තියෙන්නට ඇත්තේ මගේ දෙනෙතු මත ය.

"මට ආදරෙයි නේද...?"

හිත දියවී කඳුළු සයුරක් වෙන්නට හැදුවේ ය. යටිතොල්පට සපා මම අමාරුවෙන් නාඩා හිටියෙමි.

"මං දන්නව ආදරෙයි කියල..."

ක්ෂණිකව මා හිස නගා බලන්නට ඇත. දෙවියනි...! මේ තවරක් කෙසේ සිදුවෙන්නට යනවා ද...? මගේ දෑසේ වූ බිය වෙනුවට සදෙව්ගේ මූණේ නම් තිබුණේ දඟකාර සිනාවකි.

"දක්ක මුල්ම දවසෙ ඉඳලනෙ මට ආදරේ කළේ...? ඒකනෙ මට බොත්ත එපා කියල ඇඬුවෙත්..."

ඔහු කතා කළේ පරම සත්‍යය ය. නමුත් ඒ සත්‍යයට එකඟ වී මට සසරට තවත් දුක් එකතු කරගත නොහැක.

"සදෙව් අයියා මේ මොනවා කියනව ද මන්දා."

මම උගුර යටින් - අමාරුවෙන් කියා ගතිමි.

"ආර්යා කියන්න යන්නෙ... ඔයා මට ආදරේ කරන්නෙ නෑ කියල ද...?"

ඔහු හතර වටින්ම වටලා තිබේ. යටත් වෙන්නට මිස සටන් කරන්නටවත් පලා දුවන්නටවත් ඔහු ඉඩ තබා නොමැත. නමුත් මම යටත් නොවී ගැලවීම පිණිස බයාදු උත්සාහයක් ගතිමි.

"මගෙ තත්වෙ මොකද්ද කියලා... සදෙව් අයියා හොඳටම දන්නවනෙ..."

"ආර්යා... මං ඔයාට ආදරෙයි කියලා කිව්ව. ඔයා ඒ ආදරේ පිළිගන්න කැමති ද නැද්ද කියලා ඇහුව. මට ඒ ප්‍රශ්නෙට කෙටි උත්තරයක් දෙන්න. ඔයා මගෙ ආදරේ පිළිගන්න කැමති ද නැද්ද...?"

එවර ඔහු තරමක් කෝපත්ව සිටියේ ය. ඒ තරම් තදින් සදෙව් අයියා කවදාවත් මට කතා කොට නොමැත. සත්තටම මම බිය වීමි. මගේ දෙකොල් පවා කට - කට ගා එකිනෙක ගැටෙන්නට ඇත.

"ඇයි...? උත්තරයක් නැද්ද...?"



උත්තරයක් තිබේ. දැනටමත් ඔහු මෙලෙස කේන්ති ගෙන සිටින එකේ, උත්තරය දුන්නොත් කෙතෙක් කේන්ති යනු ඇත්ද...?

"සදෙව් අයිය ප්ලීස්, මාව තේරුං ගන්න. මං අන්තිම අඩියෙ ජීවත් වෙන පවුලක ළමයෙක්. අපේ පවුල් පසුබිම කොහොමටත් ඔයාලට ගැලපෙන්නෙ නෑ. හංසි එයාගෙම සහෝදරියක්ට වගේ මට ආදරෙයි තමයි. ඒත් ඒ එයාගෙ අයියට මාව දෙන්නනං නෙවෙයි. මේ දේවල් නිසා හංසිගෙ හිතවත්කමත් මට නැති වෙලා යයි."

"ඔම්බුවක් කතා කරනව. තමුසෙට ඕනෙ මාව ද නැත්තං හංසිව ද...?"

සදෙව් අයියා නැගැස්සුවේ ය. කේන්තියෙන්ම සදැල්ලෙන් නික්ම යන්නට ගියේ ය. එහෙමත් කුකුල් කේන්තිකාරයෙක්...! මගේ පපුව ගැහෙමින් තිබුණත් ඔහු නික්ම ගියාට පස්සේ මට මද පහසුවක් දැනිණ. ලොකු හුස්මකින් ළය පුරවාගත් මම පුටුවක් මතට වැටුණෙමි. සදෙව් බස්නායක කියන්නේ තමන්ගේම මතයට වැඩ කරන හිතුවක්කාරයෙක් බව දත් මට පැහැදිලි ය. ඔහුට මේ ප්‍රශ්නය ලෙහෙසියෙන් තේරුම් බේරුම් කොට දිය නොහැකි වනු ඇත.

"අර මොකද අයිය වෙඩි කාපු ඌරා වගේ දිව්වෙ...?"

හංසි බැදපු අලපෙති කෑන් එකක් ද ගෙන ආවා ය. ඇය නැවතත් පිටුපස හැරී බැලුවේ සදෙව් අයියාගේ ස්වභාවය තේරුම් ගත නොහැකිව ද...? ප්‍රශ්නාර්ථය රැඳි දෑස්, හංසි මදෙස ද යොමු කළා ය. ඒ වෙලාවේ ඇගේ ඇස් මට පෙනුනේ රහස් පරීක්ෂකයෙකුගේ වාගේ ය. මම බිම බලාගතිමි.

"අපි පොටෑටෝ ක්‍රිස්ප්ස් කමු අනේ."

අල පෙති අහුරක් අතට ගත් හංසි කෑන් එක මවෙත පෑවා ය. 'එපා' කියන්නට බැරි කමට මම එකම එක අල පෙත්තක් අර ගතිමි.

''අයියෝ.. එක ද අනේ ගත්තෙ...? ඔන්න තව කන්න.''

හංසි එසේ කීවාට ඒ එතුවත් කෑම පිරියක් මවෙත වූයේ නැත. සදෙව් අයියා යන්නට ගියේ ගිනේ කේන්තියෙනි. මා ඔහුගේ සිත රිදවූ බව විශ්වාස ය. නමුත් මා කොයිතරම් අසරණ ද කියා ඔහු දන්නේ නැත. සිටු කුමාරවරුන්ගේ රාජ කුමාරවරුන්ගේ ආදරය පිළිගෙන ජීවිතය දුකක් කරගත් ගිහන්නියන්ගේ කතන්දර කොපමණනම් ඉතිහාසය අපට තිළිණ කොට තිබේ ද...?

ඉන් අනතුරුව මා ගෙදරින් නික්ම එනතුරුත් සදෙව් අයියා ගැන කිසිවක් හංසි මගෙන් විමසුවේ හෝ කතා කළේ නැත.

මට දැනුණේ මා පඹගාලක පැටලී ඇතිවා මෙනි. මිදෙන්නට තතනද්දී - තතනද්දී තව තවත් මා එහි පැටලෙනවා සේ දැනිණ. හංසිලාගේ ගෙදරින් මා පිටවෙන්නට පෙර සදෙව් අයියාගේ රිය නික්ම ගියේ ය. මට මිද සැනසුමකුත් - තුනී දුකකුත් දැනිණ. නමුත් මම ඒ මිස්සේ දුරට - දිගට සිතන්නට නොගියෙමි.

''ඉන්න ආර්යා වෙහිකල් එකක් එනකල්. මං ඔයාව ගෙදරට යවන්නං.''

හංසි කොතෙකුත් පෙරැත්ත කළා ය.

''අනේ ඕන්නෑ හංසි. මට බස් එකේ යන්න පුළුවන්. පොඩ්ඩක් ඇවිදගෙන යන්න තියෙන්නෙ...''

''දුර මෙළ්ඩියක් තියෙනෙ. නිකමටවත් යන්න ඉස්සල්ල කිව්වෙ නෑ යනව කියල.''

හංසි ඒ කීවේ සදෙව් ගැන ය. මම කිසිත් නොකියා සිටියෙමි. ඔහු සිටියේ මාත් එක්ක තරහෙනි. මගේ මූණ බලන්නට නොසිට ඔහු යන්නට ඇත්තේත් ඒක ය.

මංපෙත දිග මා ඇවිද ආවේ වඩාත් හෙම්හිටය. මොකක්දෝ බරකින් හෝ දුකකින් හිත ආතුරව තිබිණ. මම ජීවිතයේ සතුට අහිමි කොට ගතිමි. ඒ කියන්නේ ජීවිතය ද අහිමි කොට ගතිමි. ඒ



වුණත් මට හඬන්නට අවසර නැත. සදෙව් බස්නායක අහිමි වූවාය කියා හඬන්නට මට අවසර නැත.

මගේ ඇඟේ වැදී - නොවැදී - හඬ නගාගෙන රියක් නතර විය. සදෙව් බස්නායකගේ මෝටර් රථය...!

''නගින්න...''

ඔහු ඇරයුම් කළේ මදෙස බලන්නේවත් නැතිව - පුදුම අහංකාරකමකිනි. ඕනේනම් මට ප්‍රතික්ෂේප කරන්නට තිබිණ. ඒත් එකවරම එහෙම කරන්නට හිත මට ඉඩ දුන්නේ නැත. ගැහැනු හිත්වල හැටි එහෙම ය. නමුත් මම එකවර රියට නැගෙන්නට ද කලබල නොවුණෙමි.

''ඇයි නගින්න බැරි ද...?''

එවර සදෙව්ගේ ස්වරයෙහි නොරිස්සුමක් විය. මම බියගුළු - කුළෑටි කෙල්ලක වගේ රිය ඉදිරි අසුනෙහි හිඳගතිමි. ටික වෙලාවක් යන තෙක් සදෙව් අයියා කතා කළේ නැත. ඒ නිහැඬියාව දැනවූයේ පහසුවක් ද නැත්නම් අපහසුවක් ද කියා හරියටම කිව නොහැක. නමුත් මටත් මුනිවත රකින්නට සිදු විය.

''ඔයා ඉද්දි මං ගෙදරිං ආවෙ නංගිට වුනත් සැකයක් හිතෙන්නෙ නැතිවෙන්න.''

නිහඬතාවය දෙකඩ කරගෙන සදෙව් බස්නායක කතා කළේ බෙහෙවින් මන්දා ස්වරයකිනි. ඒ ස්වරයේ අතිමහත් ආදරයක් තැවරී තිබිණ. කෙල්ලකට වසංවී පලා යා නොහැකි අපූර්වත්වයක් විය. නමුත් මා මහත් අවාසනාවන්ත කෙල්ලකි. මට ඒ ආදරයට තුරුලු විය නොහැකි හෙයිනි. අප දෙදෙනා අතර පරතරය ගව් ගණනකි.

''මං දන්නව නංගි ඔයා මට ආදරෙයි කියල. ඔයාගෙ හිතේ තියෙන්නෙ බියක්.''

හරි පරිස්සමට වචන තෝරබේරාගෙන, ඔහු කතා කළේ

ආත්ම ගණිකාවකට මාව ඔහු වෙත බඳවමිනි.

"ඔයා ප්‍රශ්නයක් කරගෙන තියෙන්නෙ සල්ලි. සල්ලි කියන්නෙ අපි කාටත් හම්බකරන්න පුළුවන් දෙයක් මිසක්... ඉපදෙන කොට මිට මොළෝගෙන එන දෙයක් නෙවෙයි. ප්‍රශ්නයක් කොට ඒක විසඳන්න මට දෙන්න ආර්යා. ඔයා මං ළඟට තියෙනවනං ඒක විසඳන්න මට දෙන්න ආර්යා. ඔයා මං ළඟට වෙලා... මට ආදරේ කරගෙන ඉන්න. ඔයාව බලාගන්න තරං මගෙ අත් දෙකේ හයිය ඇති."

එහෙමම ඔහුගේ උරහිසට වාරු වී ඉකිබිඳ හඬන ලෝභකමක් මට දැනිණ. නමුත් මම අමාරුවෙන් මාව පාලනය කර ගතිමි.

"ඔයා තේරුං ගන්නෙ නෑ සදෙව් අයිය. අපි අතරෙ තියෙන් කවදාවත් යා කරන්න බැරි පරතරයක්. ඔයාගෙ ගෙදරිං කවදාවත් මෙහෙම දේකට ඉඩ දෙන්නෑ. ඉඩදෙන්න ඒගොල්ලන්ට බෑ. අවසර ඉල්ලන්න තරං අයිතියක්වත් පුහුකමක්වත් අපිටත් නෑ."

"අනේ මේ. මට ඔයාගෙ බණනං ඕන නෑ."

"දැන දැන වැරදි කරන්න ඕන නෑ නේද...?"

"මට ආදරේ කරන එක ඔයා ඔයාට කරගන්න වරදක් කියල ද හිතන්නෙ...?"

"පව් පිරෙන කතා කියන්නෙපා."

මගේ තිගැස්ම දුටු සදෙව්ගේ මූණේ විජයග්‍රාහී සිනාවක ඡේයා ඇඳිනි.

"මං කියන්නෙ අපි ඔයාලගෙ ගෙදරට වරදක් නොකර ඉමු කියල."

රිය පදවන ගමන්ම හිස හරවා තත්පර කිහිපයක බැල්මක් මවෙත හෙළාගෙන සිටි සදෙව්, ඊළඟට උකුළ මත වූ මගේ අතක් ගෙන සිය පපුවට තුරුලු කර ගත්තේ ය. ඊට කලින් එකමෙක විතාවක්වත් පිරිමියෙකුට ඒ තරම් සමීප වී නැති මම වෙව්ලා ගියෙමි.



"ඔයාගෙ ආදරේ වෙනුවෙං... ආදරේ උතුරන ඔයාගෙ ඇස් දෙක වෙනුවෙං... ඕන දෙයක් අත් අරින්න මං ලෑස්තියි ආර්යා."

"සදෙව් අයිය...! කාව අතෑරියත් ඔයාගෙ දෙමව්පියන්ව අතඇරින්න ඔයාට බෑ."

මම දැඩිව කීවෙමි. සිය පපුව මත තබාගෙන සදෙව් තවත් මොහොතක් දෙකක් මගේ අත උණුසුම් කළේ ය. අපමණ දුක් විඳින ජීවිතයක් තව කුමට දුක් එකතු කොට ගන්නවාදැයි කල්පනා වූ වෙලේ මම හෙමිහිට මගේ අත මුදවාගතිමි. ඒත් හිත අර උණුසුම ඉල්ලමින් කෑ ගැසුවේ ය.

"හරි. හරි. ඒව මං බලාගන්නංකො. මට ඕනෙ ඔයා මට ආදරෙයි ද නැද්ද කියන එකට උත්තරයක් විතරයි."

ඔහු හිතුවක්කාරයෙකි. දඩබ්බරයෙකි. ඔහුගේ පවුල් පසුබිමේ හා සමාජ තත්ත්වයේ හැටියට එය ඔහුට ආභරණයක් වන්නට පුළුවන. මාත් වශී වී හිඳිනුයේ ඒ ආභරණවල දිස්නයටය. නමුත් ආදරය අභියස අන්ධ වී මුළු ජීවිතයම අපා දුකක් කරගන්නේ කෙසේ ද...?

"හරි නේද...? ඔන්න මං උත්තරේ බාර ගත්ත."

"එපා සදෙව් අයියා. මාව අමතක කරල දාන්න. තාම ඔයා ලංකාවට ආව විතරනෙ. තව ඉස්සරහට ඕන තරං ගැනු ළමයිව ඔයාට හම්බවෙයි. එතකොට, හිතෙයි මොකට අර ආර්යා එක්ක ඕන නැති දේවල් කතා කරන්න ගියා ද කියල."

"ඒක ද අන්තිම තීරණේ...?"

මම නොදොඩා සිටියෙමි. සදෙව් අයියා ක්ෂණිකව කෝප වූයේ ය.

"ඒක ද අන්තිම තීරණේ...?"

ඔහු මගේ ඇඟට කඩා පැන්නා මෙනි. මම අන්ත අසරණ සාවියක් වගේ බියපත් වීමි. නමුත් අඩිය ආපස්සට තැබිය නොහැකි

වන වචනය පිට නොකරන්නට තරම් මම ප්‍රවේසම් සහගත වීමි. මගේ මූණේ වූ ඉරියව්වලින් සදෙව් අයියා යමක් වටහා ගන්නට ඇත. මා සිය අදහසට නම්මාගත නොහැකි වග ඔහු තේරුම් ගන්නට ඇත.

ඒ මහ මහම සදෙව් අයියා මහ හඬින් හිරිංග ගැසුවේ ය. ඉද්දූ ගැසුවා සේ රිය නැවතිනි. මම කැළඹී බැලුවෙමි. ඔහුගේ දෑස් දැවෙමින් තිබිණ. මදක් නැඹුරු වී සදෙව් මා සිටි පැත්තේ රිය දොර ඇරියේ ය. ඒ මට බසින්නට ය. ඔහු ඒ තරම් නපුරු වෙන්නේ කොහොම ද...? මම පුදුම වී බැලුවෙමි. තෝන්තු වූවෙකු සේ හිසෙත් අවුල් කර ගත් සදෙව් අයියා නැවත රිය දොර වැසුවේය.

"බහින්න ඕනනං මං බහින්නං අයිය."

කිසිත් නොකී සදෙව් නැවත රිය පණ ගැන්වී ය. මට දැනුනේ මා ගිනිගන්නවා මෙනි. තවත් නාඩා ඉන්නට මට බැරි විය. දෝතෙහි මූණ වසාගෙන මම හැඬුවෙමි.

"සොරි ආර්යා. අයිම් සෝ සොරි."

ඔහු ඉමහත් ස්නේහයකින් මහිස පිරිමැද්දේ ය.

"ඔයාගෙං මං ඉල්ලන්නෙ මෙච්චරයි. මාව පිස්සෙක් හරි යකෙක් හරි කරවන්න එපා. මට ඔයාව ඕන ආර්යා. මං ඔයාට ආදරෙයි."

"මාත් ආදරේ නැතුව නෙවෙයි දෙයියනේ..."

එහෙත් අමාරුවෙන් හිර කරගෙන සිටි ඒ වචන ටික ඒ වෙලාවේ ගිලගෙන ඉන්නට මට නොහැකි වූයේ ඇයි...? අයිනට කොට රිය නැවතූ සදෙව් බස්නායක මාව සිය පපුවට වැරෙන් තුරුලු කර ගත්තේ ය. ලෝකයේ මට දැනුණ සුවදායකම පහස ඒ ය. මුළු ජීවිතයම ඒ විඳිනට ඔහුගේ පපුවට තුරුළු වී ඉන්නට තියෙනවානම් මොනතරම් දෙයක් ද...? ඒත්...

"කොච්චර ආදරේ වුනත්.. අපිට අපේ වෙන්න බෑ සදෙව් අයිය. මං ඒක හොඳටම දන්නව. ඒකයි මං කියන්නෙ..."



"ශ්..."

සදෙව් මගේ දෙතොල් මත සිය දබරැඟිල්ල තබා මා නිහඬ කරවූයේ ය. ඔහුගේ දෙතොල් ලස්සන මදහසකින් සැරසිනි. මටත් සිනහ ගියේ ය. දෙවියනි ඒ මොහොත මොනතරම් ලස්සන ද...? මින් පෙර මගේ ජීවිතයෙහි තිබුණේ නැති ඒ තරම් ලස්සන මොහොතක් මින් මතුවට ද කිසිදාක උදා නොවනු ඇතැයි ඒ වෙලාවේම මට සිතිණ.

මේ සදෙව්ට තුරුලුව සිටින්නේ මහ මගයි මට කල්පනා වූයේ ද එවෙලේ ය. ඔහුගෙන් මිදුන මා වටපිට බැලුවේ කලබලයෙනි. සදෙව් දඟකාර ලෙස හිනැහිණ.

"බයවෙන්නෙපා. මේකෙ තියෙන්නෙ ටින්ටඩ් ග්ලාසස්. එළියට පේන්නෑ රානි මුඛර්ජි ඇතුළෙ ඉන්නව කියල."

මට ලැජ්ජා සිතිණ. ඒ ලැජ්ජාව මගේ මූණ රතු කරවන්නට ඇත. තාත්තාටවත් වැඩිපුර ළං වී නැති මා සදෙව් බස්නායක වගේ නාඳුනන තරුණයෙකුට කොහොම එහෙම සමීප වූවා ද...?

"මං නංගිට කියන්නං එයාගෙ හොඳම යාළුවව ඔන්න මං නෑනා කරල දුන්නා කියල."

"අනේ එපා සදෙව් අයිය."

මම බොහෙවින් කලබල වීමි.

"මේක කවදාවත් වෙන දෙයක් නෙවෙයි. ගෙදර ප්‍රශ්නයක් කිය කිය අඬන්නවත් මට ඉන්න එකම යාළුව - හංසිවත් මට නැති කරන්නෙපා..."

"හංසිවවත් මාවවත් ඔයාට නැති වෙන්නෑ ආර්යා. හංසි ඔයාව මේ තරං ආදරෙං අපේ ගෙදරට එක්කගෙන එන්න ඇත්තෙ මට දෙන්න වෙන්න ඇති. ඉරණම ලියවිලා තියෙන්නෙ එහෙම වෙන්නැති."

වසර ගණනක් බටහිර රටක ජීවත් වුන සදෙව් බස්නායක මේ වගේ දේවල් කියනවා කියා මං විශ්වාස කරගත්තේ කොහොම ද...? හැමදේම සිහිනයක් සේ ය. ඇහැරෙන්නට ලෝබ හිතෙන සිහිනයක් සේ ය.

"සදෙව් අයිය පාරට හරවන්නෙපා..."

රිය අපේ ගෙවල් තියෙන අතුරු පාරට හැරෙන්නට පෙර මම සදෙව් අයියාගෙන් ඉල්ලීමක් කළෙමි. රිය නැවතිණ.

"ඇයි...?"

"මෙතන නවත්වන්නකො. මං බහින්නං."

"ඇයි ගේ ළඟට මාව අරං යන්න ලැජ්ජ ද...?"

ඔහු මතමාල සිනාවක් පෑවේ ය.

"අනේ එහෙම එකක් නෙවෙයි. ඒත් මං සදෙව් අයියගෙ කා එකෙං නිතර ගෙදර යනකොට... අපේ අම්ම වුනත් මොනා හිතයි ද දන්නෑ..."

"ඉතිං... කියන්න මං ඔයාව මැරි කරනව කියල..."

"හැබෑ කරගන්න බැරි හීන දකින්නැතුව ඉමු."

මා එහෙම කීවේ දුකෙනි. පපුව පත්ලෙන් නැඟී ආ වේදනාවකිනි. වේදනාව ඉකියකට පෙරළෙන්නට කලින් රියෙන් බසිනට මට ඕන විය. නමුත් සදෙව් මගේ අතකින් ඇද මාව ඔහු වෙතට තුරුළු කර ගෙන නළලත හාදුවක සිසිල රැඳවී ය. වචනයක්වත් කතා නොකොට මම රියෙන් බැස ගතිමි.

මම වළට පැන්නා නොවෙම් ද...? දං ඉතින් ගොඩ එන්නේ කෙසේ ද...? එතැන එහෙමම හිඳ ඉකිබිඳ බිඳ හඬන්නට තරම් ඕනෑකමක් මට දැනිණ.

"ආ... දං ලොකු ලොකු කාර් වලම වගෙයි ගමං බිමං...?"



සවන්පත් ළඟම ඇසුන ඒ අපහාසාත්මක වචනවල අයිතිකරුවා රොෂාන් ය. කඩේ මුදලාලිගේ පුතා ය. මම කිසිත් මට නෑසුණා සේ - කිසිත් මා නුදුටුවා සේ ඉවත බලාගෙන පියවරක් ඉදිරියට තැබුවෙමි. රොෂාන් මගේ මග හරස් කළේ ය.

"අපි කතා කළහම තමයි ගොළුවා බීරා වගෙ යන්නෙ නේද...? එක එකාගෙ සැප කාර් වල එනකොටනං..."

සමස්ථ ඔහු වෙතින් මා දුටුවේ අවඥාවකි. ඉමහත් පිළිකුලක් දැනුනත් මම ඉවසාගතිමි.

"දිව්‍යලෝක සැප මං දෙන්නං ආර්යා. අපි බඳිමු."

එහෙම කියන ගමන්ම රොෂාන් මගේ අතකින් ඇල්ලුවේ ය. සර්පයෙක් ඇඟේ හැපුණා වන් පිළිකුලක් මට දැනිණ. මා අත ඇදගත්තේ විදුලිසැර වැදුන වේගයෙනි.

"රොෂාන් මේ. පාඩුවෙ ඉන්න."

කිව්වාට වඩා වැඩි දෙයක් මගේ මූණේ තියෙන්නට ඇත. මම උපරිම ශක්තිය යොදා ඔහුට රැව්වෙමි.

"ඕහොනං මං ඔයාගෙ ගෙදර ඇවිත් මේ ගැන කියන්නං ආර්යා. මේ මං වගේ කෙනෙක්ව කසාද බඳිනව කියන්නෙ ඔයාට ස්වීප් එකක් ඇදුණා වගේ තමයි."

මට ඔහුගේ කම්මුලට සෙරෙප්පුවෙන් ගසන්නට සිතිනි. දුවගෙන වගේ එතැනින් නික්මුණ මම ඉක්මන් ගමනින් පාර දිගේ ඇවිද ගියෙමි. රොෂාන් පස්සෙන් එනවාදැයි මම හැරී බැලුවෙමි. ඔහු හන්දියේ නතර වී අඩ සිනාවකින් මා යන දෙස බලා සිටියේ ය. ඔහු කරදර කරමින් පස්සෙන් නාව එක ගැන මම තිස්තුන් කෝටියක් දෙවිවරුනට පින් දුනිමි.

"මොකද ළමයො හතිදාගෙන දුවගෙන එන්නෙ...?"

පොල් අතු වගයක් පෙගෙන්නට දමමින් උන් අම්මා මා දැක පොල් අතු බිම දමා ඉදිරියට ආවා ය.

"අර බූරුවා..."

මා කතා කළේ තවදුරටත් පිටුපස බලමිනි.

"මොන බූරුව ද දරුවො...?"

"මුදලාලිගෙ පුතා... රොෂාන්... හන්දියෙදි අරව මෙව කියාගෙන ආව. මං ඇහුන්නැ වගේ එන්න එනකොට මගෙ අතිං ඇද්දා..."

"මොකව...? මේ කොසත්වාලය ඒ තරං අසමජ්ජාති වැඩක් කළා...?"

අම්මා රෙද්දට ගලවා නැවතත් එය ඉනෙහි ගසා ගත්තේ කෝපයෙනි. ඇය සිය බොර පැහැති දුක්බර ඇස් පාර දෙසට යොමු කරන මෙන්ම අඩියත් පෙරට තැබුවා ය. මම අම්මාගේ අතේ එල්ලුණෙමි.

"අනේ අම්මේ අම්මි ඔය කොහෙද යන්න හදන්නෙ...?"

"වෙන කොහෙද...? මං පිහිං අරකට හොඳවයිං දෙකක් කතා කරල එන්නංකො."

"අනේ අම්මේ ඔය ජරා සතාට මං කොච්චර කියල තියෙනව ද එයාගැන මට එතෙම අදහසක් නෑ කියල. අම්ම කතා කරන්න ගියොත් අපිත් එක්ක වෛර බැඳගන්නත් පුළුවං."

"ඒකත් ඇත්ත තමයි. ඕකා තාමෙට අහන්නෙ නැති එකානෙ."

අම්මා මගේ වචනයට මෙල්ල වූවා ය. පාර පැත්තට යනු වෙනුවට මාත් සමගම ඇය ගේ පැත්තට ඇවිදින්නට වූවා ය.

"මං සංසිලගෙ ගෙදර ඩ්‍රයිවර් කෙනෙක් එක්ක ආවෙ. මේ ගේ දොරකඩටම එන්න ඕන නැතෙ. ඉතිං මං හන්දියෙං බැස්සුවහම ඇති කිව්ව..."

ජීවිතයේ ප්‍රථම වතාවට මම අම්මාට බොරුවක් කීවෙමි.



දූවෙක් අම්මාට මුල්ම බොරුව කියන්නේ ආදරය හින්දා ද...? මම නොදනිමි. සදෙව් අයියා වෙනුවෙන් මට ඒ දේ කරන්නට සිදු විය. නැත්නම් අම්මාගේ ප්‍රශ්න කිරීම් වලින් ගැලවීමට මට බොරු කියන්නට සිදු විය.

"මං බැස්සා විතරයි රොෂාන් එක එක කටකැඩිච්ච කතා කියන්න ගත්ත."

"ආර්යා ඕකුංව ගණං ගන්නෙ නැතුව ලොකු ලොකු යාළුවංව ආශ්‍රය කරන එක ගැන මේ ගමේ උන්ගෙ ඇස් වල කටු අනිනව වගේ. ඊරිසියාවෙ පැලෙන්න යනව."

මූණකට සෝදා ගන්නේවත් නැතිව මම ඇඳට වැටුණෙමි. සදෙව් අයියා නළලත ඉතිරි කළ හාදුවේ උණුසුම් සිසිල තවමත් එහි ජීවමානව තිබිණ. ආදරය කියන්නේ කෙතරම් පවිත්‍ර හැඟීමක් ද...? හදවත මිහිරියාවකින් පණ ගන්වනු ලබන සජීවී හැඟීමකි. රොෂාන්ලා වගේ රළු පිරිමි නිසා ස්ත්‍රී ආත්මයක් ඒ හැඟීමෙන් පණ නොගැසෙන බව මට පසහිත ය. ඒත් ඒ සියලු හැඟීම් මට මගේ හදවත් කුහරය තුළම සිරකරන්නට සිදුව තිබේ.

"පුතේ... ආර්යා..."

අම්මා...! මගේ ආදරණීය අසරණ අම්මා...!

"දූං ඉතිං ඔය මදාවියා ගැන හිතන්න ඕන නෑ. මං හෙම්හිට මුදලාලිට කියන්නංකො පුතාට ටිකක් අවවාද කරන්න කියල."

අම්මා සිතන්නට ඇත්තේ මා රොෂාන් ගැන සිතනවා කියා ය. මම කිසිත් නොකියා සිටියෙමි. ඇය නිවැරදි කරන්නට යාමෙන් පලක් නැත. මා ජීවිතයේ දනටමත් පරාද වූ ගැහැනියක වග අම්මා දැනගත යුතු ද නැත.

# 07

නංගී මල්වර වූවා ය. ඒ අම්මා බලාපොරොත්තුව සිටි ප්‍රාර්ථනා කරමින් සිටි වෙනසකි. නැකත් සකස්කරන්නාන්ට අනුව, ඇයට දින විස්සක් ගෙතුලට වී සිටින්නට නියම විය. හරිහැටි ඉඩකඩක් නැති - එක් අඩුරු කාමරයක් පමණක් ඇති අපේ ගෙදර, නංගීට එය සිර අඩුවමටත් වඩා අඩුවමක් වූ බව මම දනිමි. ඊටත් වඩා නොසන්සුන්කාරී සිරකාර හැඟීමක් දනුනේ මට ය. මන්දයත් නංගී ගෙතුළ සිටි කාලය පුරාම කාමරයට වී ඇයට තනි රකින්නට මට සිදු වූ හෙයිනි.

සදෙව් බස්නායක කියන්නේ මට නෙලාගන්නට බැරි දුරකින් පිපුණ මලක් බව මම දනිමි. නමුත් තව එකම එක වතාවකට හෝ ඔහුව දකගන්නට මගේ හෙතු තළියෑවේ ය. නමුත් නංගීව නාවා ගෙට ගන්නා දා පළඳන්නට කරාබු කුට්ටුවක් හෝ ගන්නට අම්මාට ලොකුවට වීනැකම තිබිණ. ඒ අරමුණ ඇතිව, අත්වල කරගැට එනකල්ම ඇය පොල් අතු විව්වා ය. ඉතින් හංසිලාගේ ගෙදර ගිහිං එන්නට අම්මාගෙං අවසර ඉල්ලන්නට තරම් සාහසිය මට ඉඩ දුන්නේ නැත. සදෙව් බස්නායකගේ රුව ඉල්ලා සිටින හදවත නිහඬ කරගෙන මම තනියම දුක් ඉසිලුවෙමි.

මේ කාලයේ මල්ලි කාර්යබහුලව සිටියේ ය. ඒ තිලකරත්න බණ්ඩාරගේ දේශපාලන කටයුතු වෙනුවෙනි. කොලු කුරුට්ටන් සමග එකතු වී මල්ලි ද තිලකරත්න වෙනුවෙන් ප්‍රචාරක වැඩ



කටයුතු කළේ ය. ගෙයක් ගානේ ගොස් අත් පත්‍රිකා බෙදුවේ ය. මනාපය ඉල්ලුවේ ය.

"ඔන්න අක්කෙ අපේ තිලකෙ අයියට මනාපයක් දෙන්න ඕනෙ හරි ද...?"

අහම්බෙන් ගෙදර හිටි වෙලාවක මල්ලි මගෙන් ද මනාපය ඉල්ලුවේ ය.

"මේ මේ කාගෙවත් කැමැත්ත බලෙං ඉල්ලන්න බෑ. ඒක ප්‍රජාතන්ත්‍රවාදෙ නෙවෙයිනෙ..."

"බලෙං නෙවෙයි. අපි කියන්නෙ කැමැත්තෙං කතිරෙ ගහන්න කියලා. කැමැත්තෙං..."

"අනේ මේ... මම නං ඔය කාටවත් ඡන්දෙ දෙන්නෙ නෑ."

"එහෙම කරන්න එපා අක්කෙ. ඡන්ද බලය කියන්නෙ අපේ මූලික අයිතිවාසිකමක්. අපි කොච්චර අමාරුවෙන් ද සර්වජන ඡන්ද බලය කියන දේ දිනාගත්තෙ...? අපි ඒකෙං ප්‍රයෝජන ගන්න ඕනෙ. ඒකෙ වටිනාකම තේරුං ගන්න ඕනෙ..."

මට දනුනේ මං අහසින් පොළවට වැටුණා මෙනි. මල්ලි සර්වජන ඡන්ද බලය ගැන මේ තරම් දේවල් දගත්තේ තිලකේගේ ඡන්ද ව්‍යාපාරයෙන් ද...? සාමාන්‍ය පෙළ පන්තියේ සමාජ අධ්‍යයනය විෂයෙන් ඔහු මේ කරුණු හදාරා තිබුණා කියා මම නොසිතමි. පොත් පරිශීලනයෙන් න්‍යායික දනුමක් නොලත් ඔහු, සමාජය හා ගැටීමෙන් ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබේ.

"තිලකෙ අයියට මනාපයක් දීල අපිවත් එගොඩ කරන්න අක්කෙ..."

මල්ලි පවී කියා මට සිතිණ. තිලකේලා වගේ දේශපාලනය නැමති රෑහැනෙහි එල්ලී ගොඩ යන්නට අරාදින අනාගත සහිකයන්ගේ වල්ගේ එල්ලී දෙව්ලොව යන්නට මල්ලි හිත මවයි. තිලකේලා දවසක වල්ගය හලන බව මල්ලිලා තවම දන්නේ

නැත. එහෙම දැනගත් දවසක ඔවුන් තිලකේ ඇතුළු සමස්ථ දේශපාලනයට වෛර කරනු ඇත. එක අතකට ඒ පාඩමත් මල්ලි පිය සමාජ දේශපාලනයෙන් ප්‍රායෝගික ලෙස ඉගෙන ගන්නා එක හොඳයැයි මම තීරණය කළෙමි.

"කොල්ලට වරදින්නෙ නෑ පුතේ.."

තියාගෙන දවසක් අම්මා කාමරයට ආවා ය. ඇයට කලින් පෙඬුණු පොල් අතුවල පල්ගඳ ඉස්සර වී ආවේ ය.

"ආ.. දූ.. මොකද්ද අම්මෙ අතපය හෝදගෙන එන්නකො."

නංගී නැහැය හකුළා ගත්තා ය. අම්මා කතා කළේ නංගී කී දේ නෑසුනා තරම් සතුටිනි.

"මේ බලපං ආර්යා.."

අම්මා මට පෙන්වූයේ දාහේ නෝට්ටු කිහිපයකි.

"කොහෙන්ද අම්මෙ..? පොල්අතු විකුණල ද...?"

"ජීවිත කාලෙම පොල්අතු වියලා විකිණුවත් මෙහෙම ගාණක් අතට ගන්න පුළුවන් ද ආර්යා.."

අම්මා සතුටෙන් උදම් වී සිටියා ය. නංගී සමච්චල් සිනාවක් නගනු මම දුටිමි. මම ඇගේ හැසිරීම නොතකමින් අම්මා වෙත යොමු වීමි.

"එහෙනං... කොහෙන්ද අම්මෙ මේ සල්ලි...?"

"මල්ලි මෙහෙත් දුන්නෙ. පොඩි එකිට කරාබු දෙකකුයි ගවුමකුයි අරං දෙන්න කියල."

මට කරන්නට බැරි දේවල් මල්ලිට කරන්නට හැකි වීම ගැන ඊර්ෂ්‍යාවෙන් සිතන්නට තරම් මා නුහක අක්කා කෙනෙක් නොවේ. මට දුක මිනු පාසල් අධ්‍යාපනය අතරමගක කඩාකප්පල් කරගෙන මුදල් සෙවීම ගැනය.



"තිලකෙ තමයි ඔය සල්ලි දීලා තියෙන්නෙ. මල්ලිට කිව්වලු කිසි දේකට බය වෙන්න එපා ඕන දෙයක් තියෙනවනං කියන්න කියල."

"ආ... ඒකනං දේශපාලන ගුණ්ඩුවක්..."

ගත් කටටම මට කියවිණි. තිලකරත්න මේ දාහේ නෝට්ටු කිහිපයක් අත දිගහැර වියදම් කර තිබෙන්නේ නිකමට නොවේ. අපේ ගෙදර මනාප කිහිපයක් වෙනුවෙනි.

"මොන ගුණ්ඩුවක් වුනාහම මොකද... මට කරාබු දෙකකුයි ගවුමකුයි ගන්න පුළුවන්නෙ..."

නංගී කීවේ මට තෝන්තාඩුවකට සේය. හරියට අලුත් කරාබු දෙකක් හා ගවුමක් ලැබීමට යාම ගැන මා ඇයට ඊර්ෂ්‍යා කරනවා වාගේ ය.

හිත් පිදුමක් මට දැනිණ. මුදලක් හරිහම්බ නොකරන කෙනා අවලංගු කාසියක් මෙනි. කාටවත් වටිනාකමක් නැත. කවුරුවත් ගණං නොගනී. රස්සාවකුත් එක්ක ජීවිතයට වටිනාකමක් එන්නේ අන්න ඒ මුදලේ බලය නිසා විය යුතු යැයි මට සිතිණ.

"අපි ගිහිං නංගිට කරාබු දෙකක් ගමු නේද පුතේ...?"

අම්මා එකම ප්‍රශ්නය වෙනස් විදිහකට ඇසුවේ, මගේ හිතේ යම් වේදනාවක් ඇතිව තිබෙනවා නම් - ඒ අසන විදිහෙන් එම වේදනාව තුරන් කොට දමන බලාපොරොත්තුවකින් සේ ය.

"අනේ අම්මනං ගිහිං වැඩක් නෑ."

නංගී ගත් කටටම කීවා ය. මමත් අම්මාත් පුදුම වී ඇය දෙස බැලුවෙමු.

"අපේ අක්ක ගියත් ඉතිං වැඩක් නෑ වගේ තමයි. අන්න අර නංගි අක්කවත් ගියානං අලුත් ඩිසයින් එකේ ලස්සන එකක් තෝරයි..."

මේ ඊයේ පෙරේදා ජංගි කොටයක් ඇඳගෙන මිදුලේ දුව - පැන - නටමින් සිටි පුංචි කෙල්ල නේද...? මාස කිහිපයක් ඇතුළත ඇය මේ ලෙස සිතන්නට පටන් ගත්තේ කොහොමද...? සත්තකට මම පුදුම වී සිටියෙමි. පවුලේ ලොකුම ළමයා වී අදටත් මට ඔය ආකාරයට සිතාගත නොහැකි ය. නංගිලා අකලට පැහුණාවත් ද...?

"අනේ ලොකු පුතේ එහෙනං අර හංසි ළමයත් එක්ක ගිහිං පොඩි එකිට පුංචි කරාබු දෙකක් තෝරගෙන එන්න පුළුවංද...?"

අම්මා එකෙහෙලා නංගිට එකඟ වී තිබිණ.

"පුංචි කරාබුදෙකක් නෙවෙයි අක්කෙ, ටිකක් ඇහැට පේන එකක් ගේන්න හරි ද...?"

රත්තරං වල ගණං ගැන නංගිට අවබෝධයක් තිබෙනවා ද... තිබෙනවානම් ඒ අවබෝධයෙහි මට්ටම කෙබඳු ද කියා මම සිතන්නට නොගියෙමි. ඉබ්බා දියට දානකොට ඇන්නෑවේ කියන්නා සේ, අහම්බෙන් මුත් හංසිලාගේ ගෙදර යන්නට ලැබෙන පුවතෙන් මම ප්‍රබෝධයට පත් වීමි. කරාබු දෙක ගේන්න යන්න නංගිටත් වඩා උවමනාව වැඩි වූයේ මට ය.

"එහෙනං නංගි ළඟ මං ඉන්නං. ආර්යා අර ළමයගෙ ගෙදර ගිහිං... වවුමටත් ගිහිං එන්නකෝ..."

ඩවුමත් මිල දී ගැනීම සඳහා මම හිතෙන් නංගීගේ උස - මහත මැන ගතිමි.

මා ගෙට ගොඩවන විට හංසිලාගේ ආලින්දයේ සිටියේ සඳෙව් අයියා හා ඔවුන්ගේ අම්මා ය. මාව දුටු සඳෙව්ගේ දෑස් මල් සේ පිපුණත්, ගණං නොගෙන වගේ මුහුණ ඉවත බලාගත්තේ ය.

"ආර්යා දුව. නුඹ දවසකින්. එන්න එන්න..."

නයනා ඇන්ටි දැඩි ලෙංගතුකමකින් මා පිළිගත්තා ය. මා ගැන උනන්දුවක් පෙන්වූයේ නැතත් සඳෙව් ආලින්දයෙන් ඉවත්ව ගියේත් නැත.



"යාළුවත් ඔන්න මගේ කම්මැලිකමේ හිටිය. අද නෙට ආර්යාලගෙ ගෙදර ගිහිං එන්න ඕනයි කියලත් කියනව මං අහගෙන..."

"නංගි බිග් ගර්ල් කෙනෙක් වුණා ඇන්ටි. ඒකයි එන්න බැරි වුණේ..."

"හාතේ ඇත්ත ද...? නිකමටවත් දුව පණිවිඩයක් එව්වෙ නැතෙ. හංසි දන්නවනං කියටවත් නොයා ඉන්නෙ නැතෙ."

"තාම නංගිගෙ වැඩ ඉවර කළේ නෑ ඇන්ටි. මං මේ ආවෙත් හංසි එක්ක නංගිට මිත බඩු වගයක් ගන්න යන්න කියලා."

"ආ... එහෙමද...? හංසි... හංසි..."

"ඇයි...?"

හංසිගේ හඬ මතු මහලින් ඇසිණි. නයනා ඇන්ටිත් ඇයට ඇසෙන්නට හඬ නැගුවාය.

"මේ ආර්යා ඇවිත්..."

එකෙනෙහි තරප්පු පෙළ දිගේ දිව එන හංසිගේ රුව මට පෙනිණ.

"ආර්යාගෙ නංගි අවෙන්ඩ් වෙලාලු හංසි."

පණිවිඩය හංසිට දුන්නේත් නයනා ඇන්ටිම ය. හංසිගේ මුහුණේ මලක් පිපිණ.

"ආයි. ගේස්නෙ. කවදද පාටි එක...?"

"පාටි එකක්නං නෑ. ඔය චාරිත්‍ර ටික විතරක් කරනව කියල තමයි හංසි, අම්ම කිව්වෙ."

"හොඳම යාළුවගෙ නංගි වෙච්චි... දං හංසිත් ලොකු තෑග්ගක් එහෙම දෙයිනෙ..."

එහෙම කිවූ නයනා ඇන්ටි සිනාහවකින්ම නැගිට්ටා ය. ඔවුන්

මොනතරම් නිරහංකාර මිනිසුන් ද...? මට සඳෙව් අයියා දෙස බැලිණි. ඔහු ඇස් පුංචි කරගෙන කල්පනාවකින් වගේ මදෙස බලා සිටියේ ය.

"හංසි, අපි යමු ද නංගිට කරාබු දෙකක් ගන්න. එයා කිව්ව මයාට කියල තෝරල ගේන්න කියලා. තව... නංගිට ගවුමකුත් ගන්න ඕනෙ..."

"ඉතේ. මං ටක්ගාල වොෂ් එකක් දාගෙන... රෙඩි වෙන්නං. යමු උඩට."

හැගිවින මෙන් මට සඳෙව් දෙස බැලිණ. දිලිසෙමින් තිබූ ඔහුගේ ඇස් ක්ෂණිකව මලානික විය. මගේ අතින් ඇදගෙන දඟකාර ලෙස පියගැට පෙළ නගින ගමන් හංසි හැරී සඳෙව් දෙස බැලුවා ය. ඇය මට නොහැඟෙන සේ ඔහුට හිසෙන් අඩගසනු මට දනිණ. එසේ නම් සඳෙව්ට අනුබල දෙන්නේ හංසිද...? ඇය එවැනි දෙයක් කරන්නේ ඇයි...? අප අතර වන යා කළ නොහැකි පරතරය ඇයට නොතේරෙනවා නොවේ.

"ආර්යා මෙතෙං වාඩි වෙලා ඉන්නකො. මං ඉක්මනට එන්නං."

මාව සඳැල්ලේ පුටුවක හිඳුවා හංසි හැරෙන කොටම සඳෙව් එතැන විය.

"ආ... අයියෙ. ඔයාට පුළුවං නේද අපි දෙන්නව නුගේගොඩට එක්ක යන්න...? ඔයාට දං වැඩක් නැනෙ..."

සඳෙව් අයියා හංසි දෙසත් මදෙසත් යටැසින් බැලුවේ ය.

"මට පොඩි වැඩකුත් තියෙන... වා..."

හංසි කට ඇද කළා ය.

"ආ කමක් නෑ කමක් නෑ. අපි එහෙනං ට්‍රයිෂෝ එකකට කතා කරගන්නං..."



"කමක් නෑ එහෙනං... යමුකො..."

සඳෙව් අයියා යාන්තමින් හිස කැසුවේ ය. හංසි කට කොනකින් සිනහවෙනු මගේ අධෑසට පෙනිණ.

"යනව යනව. බොරුව නොදා ගිහිං රෙඩි වෙලා එනව."

හංසි කාමරය වෙත ගියා ය. ඒ පමාවෙන් සඳෙව් අයියා මවෙත ලං වූයේ ය.

"මාව මතක් වුණේවත් නෑ නේද...?"

එක හුස්මකටවත් මට ඔහු අමතක වූයේ නැත. නමුත් එහෙම කියා මේ බැඳීම තවත් දඩි කරගන්නට නුපුළුවන. මම බිම බලා ගතිමි.

"මේ වගේ කාලාන්තරේකට සැරයක් ද ආර්යා අපිට අපිව දකින්නවත් පුළුවන් වෙන්නෙ...?"

තන් අඩි රත්වේගෙන එනවා මට දනිණ. මේ ප්‍රශ්නවලට කෙසේ උත්තර දෙන්න ද...? මම මට හිමි ජීවිතය ගැන අවබෝධයක් ඇත්තෙක්මි. නමුත් සඳෙව් අයියා මේ විදිහට ආදරය තවරමින් හදවතට රිංගාගන්නට තදනකොට මං කෙසේ සිත් තවුළු වසාගන්න ද...?

"මං කීප සැරයක් ඔයාගෙ ගෙවල් ළඟිනුත් ගියා. ඒත් ඔයා පේන්න හිටියෙ නෑ."

මං වැඩිපුර හිටියේ නංගිට තනි රකිමින් අඳුරු කාමරය තුළට වී යැයි මම නොකියා සිටියෙමි.

"මට ඔයත් එක්ක කතා කරන්න ගොඩාක් දේවල් තියෙනව ආර්යා... දවසක අපි කොහෙහරි යංද...? අපි දෙන්නා විතරක්...?"

හදවතෙහි භූමිකම්පාවක හැස්මක් ඇති විය. නුහුරු නුපුරුදු රසවත්කමක් විදුලියක් සෙයින් සියොළඟ පුරා දිව ගියේ ය. සැබෑවින්ම ආදරණීය පිරිමියෙක් සමග පෙම් පිළිසඳරකට ඉඩ

ලැබෙනවා කියන්නේ මගේ වයසේ තරුණියකට අසිරිමත් අවස්ථාවක් වග අමුතුවෙන් පැවසිය යුතු නොවේ. මුළු සිරුර පුරාම දිව ගිය රුධිර දහර එක මොහොතකදී අයිස් සේ සීතල වූයේ ය. මම යටිතොල්පට සපාගතිමි.

"ම්... කතා කරන්නකො ආර්යා. අපි යංද කොහෙහරි...? ඩෝන්ට් මිස් අන්ඩස්ටෑන්ඩ්. මට ඕනෙ ඔයත් එක්ක ටිකක් නිදහසේ කතා කරන්න."

"අයියෝ... තාමත් මෙයා මෙතනට වෙලා කොඳුර කොඳුර ඉන්නව ද...? ලැජ්ජ වුණේ නැද්ද...?"

හංසි ඒ මොහොතේ එතනට ආපු එක හොඳයි කියා ක්ෂණිකව මට සිතිණ. නැත්නම් සදෙව් අයියාගේ ආදරය අභියස කෙළිකාර හැඟීම් පාලනය කරගන්නට මටත් නුපුළුවන් වනු ඇත.

සදෙව් අයියා, හොරෙන් තා අතටම අහු වුණ පූසෙක් වගේ බිම බලාගෙන යන්නට ගියේ ය. කවර හේතුවක් නිසා ද මන්දා හංසි හඬනගා සිනහ වූවා ය. මට නම් සිනහ වෙන්නට තියා යාන්තමින් තොල් සොලවාගන්නටවත් නොහැකි විය.

හංසි එහෙම කිවේ ඇයි යන ප්‍රශ්නය මසිත්හි මතු වූයේ ඉන් අනතුරුව ය. 'තාමත් මෙයා මෙතනට වෙලා කොඳුර කොඳුර ඉන්නව ද?' කියා ඇය ඇසුවේ නොරිස්සුමකින් ද? ඊළඟට ඇය සිනා වූයේත් අමුතු විදිහකට ද...? මේ දේවල් නිසා ඇයත් එක්ක තිබෙන හිතවත්කම නැතිව ගියොත් සිදුවෙන්නේ දිවි නසාගන්නටය.

"මොකද බයවෙලා වගේ...? සදෙව් මස්නායක මොනාද කිව්වෙ...? ම්... මොනාද ඇහුවෙ...?"

හංසිගේ ඊළඟ ප්‍රශ්නය මා දවා හළු කරන්නට ඇත. නිමේෂයකින් තොලකට වියළී යනවා මට දැනිණ.

"විශේෂ දෙයක් නෑ."



මම ඉක්මනින් කියාගතිමි. මා කලබල වී සිටින බව හංසිට නොතේරෙන්නට විදිහක් නැත. ඇය සමච්චල් සිනාවක් ගිලගත්තා ය. පොළොව පළාගෙන මා එහි ගිලා බහිනවා සේ මට දැනිණ.

මගේ සිත් කවුළු වසාගත යුතු ය. සදෙව් කොපමණ තට්ටු කළත් නොහරින්නට - දැඩි කොට සිත් කවුළු වසාගත යුතු ය. කඩාවැටෙන්නට හදන හිත, මම සවිමත් කරගතිමි.

නංගිට කරාබු ජෝඩුවක් ගන්නට ගියාට මගේ හිත තිබුණේ නොසන්සුන්ව ය. හිත එක අරමුණකට ගෙන එන්නට යම් යම් අවස්ථාවල මා උත්සාහ කළත්, එහෙම පිටින්ම මම පරාද වී සිටියෙමි. නමුත් හංසි නංගිට අසාධාරණයක් කළේ නැත. සොඳුරු වූ නිමැවුමක් ඇති ඇඳුමක් - පැළඳුමක් තෝරා ගන්නට බැරි තරමට මා අවුල් වී හිටියත්, හංසි එහිදී නංගිගේ අක්කා වූවා ය. එක අතකට එය මට සහනයක් විය.

ආයේ සදෙව්ගේ දෑස් මානයට නොඑන්නට මා දැඩි තීරණයක් ගත යුතු ය. නමුත් කොහොම එහෙම කරන්න ද...? කෙසේ හෝ කළ යුතු ය. නැත්නම් සියල්ල කෙළවර වනුයේ ලොකු විනාශයකින් පස්සේ වනු ඇත. එදාට මට හංසිගේ හෝ ඒ ගෙදර අනිත් අයගේවත් මූණු බැලිය නොහැකි වනු ඇත. එහෙම තත්ත්වයක් ඇති වෙන්නට ඉඩ හැරිය යුතු නැත. නුගේගොඩ ගොස් එන තුරාවට මසිත්හි හොල්මන් කළේ එවැනි සිතිවිලි සමුදායකි. මම මහත් වියවුලකට පත්ව සිටියෙමි. ඒ අවුල් සහගත බව හා බිය නිසාම මා සදෙව් දෙස නොබලන්නට ඇත. බැලුවත් නොදකින්නට ඇත.

"ඔන්න නංගි අක්ක නෙවෙයි තේරුවෙ මම."

හංසි අපේ අඳුරු කාමරයට කරපොවා නංගිට කීවා ය. අපේ කාමරයක හැටි...! හංසිගේ කාමරයත් එක්ක බලන විට මේ කාමරයක් ද කියා ඇයට සිතුනොත් පුදුම විය යුතු නැත. ඔවුන්ගේ කාමර එක්ක බලනකොට මේ කාමරය සත්ව කූඩුවකටවත් සම කළ නොහැකි ය. ඉතින් මෙහෙම තැනක යුවතියකට කරගසන්නට

අයියාට ඉඩ දී නංගි බලා සිටිනු ඇත්ද...?

මට පහසුවක් දැනුණේ නංගිලා නික්ම ගිය පසු ය. මගේ ජීවිතයේ ඒ පරිච්ඡේදය එසේ හමාර වනු ඇත. මම නංගී පසෙකින් ඇඳ කබලෙහි වැතිර ගතිමි. හදවත ගින්දරක දැවෙමින් තිබිණ. සැබැවින්ම මම පිච්චුණෙමි. ඒ වුනත් එහි සමාප්තියේදී මට දැනුණ වේදනාව සුළුපටු නොවේ. ආදරය කියන්නේ මේ තරම් ගින්දරක් ද...? එක අතකට මම ආදරයක උරුමකාරියක් ද නොවුණෙමි. සඳෙව් අයියා ප්‍රේමාරාධනයක් කළ බව ඇත්ත ය. නමුත් අප අතර පළවී සබඳතාවක් පැවතුණේ නැත. ඉතින් මා මේ තරම් ගින්නක දැවෙන්නේ ඇයි...?

"අක්කෙ..."

නංගිගේ හඬ මට ඇසුණේ සිහිනයකින් සේ ය. ඒ සිහිනය ගැන වද නොවී මම නිසොල්මනේම සිටියෙමි.

"අක්කෙ..."

එවර ඇය මට මගේ සිහිනය තුළට වී ඉන්නට ඉඩ නොදී අතකින් අල්වා සොළවා කතා කළා ය. මම අලස ලෙස නෙතු විවර කළෙමි.

"තරාබු දෙක තව චුට්ටක් ලොකු වුණාතං මෝක් නේ...?"

මට සුසුමක් පෙළිණි. අපේ තිබුණ ගාන පරෙස්සම් කරගෙන ගවුමකුත් මිල දී ගෙන මය තරාබු කුට්ටම වුව ගන්නට ලැබුණ එක ලොකු දෙයකි. නමුත් නංගි ලද දෙයින් තෘප්තිමත් වන්නට සූදානම් නැත. එක අතකට එය පොදු වූ ගැහැනු ගතියකි. මා ඒ පොදු ගැහැනු ගොඩට අයත් නොවුණාට බහුතරයක් ගැහැනු ඒ කුලකයට අයිති වෙති.

"ගවුමට මැච් වෙන්න සෙරෙප්පු දෙකකුත් ගන්න ඕනෙ."

නංගි තවත් දේවල් කියද්දී මම නැවතත් ඇස් පියා ගතිමි. මම ආත්ම ගණනක් පතාගෙන ආ ආදරයක් අත්හැර දමා ආවෙමි.



නංගිලා නොලැබුණ හෝ නොලැබෙන සුළු දේවල් වෙනුවෙනුත් තැවෙති. කම්පා වෙති. එහෙම එකේ මා නොහඬා ඉන්නේ ඇයි...? මා නොහඬා ඉන්නේ කෙසේ ද...? කඳුලක් ගැබ්බරව සිටියේ ය. නමුත් මම ඒ කඳුළ ඇස් මත්තේම ගබසා කළෙමි. හඬනවා කියන්නේ දුර්වල වෙනවා කියන එක ය. දුර්වල වුනොත් මා කඩා වැටෙනු ඇත. කඩා වැටුනොත් සඳෙව් ඉදිරියේ රඟපෑමක් කරන්නට මට නුපුළුවන් වනු ඇත. මම ලොකු හුස්මකින් ළය පුරවාගෙන නැගී සිටියෙමි.

අම්මා මුළුතැන්ගෙයි තැම පිසමින් සිටියා ය. මා දුටු ඕ වෙහෙසකර මූණ මත ජයග්‍රාහී සිනහවක් තවරා ගත්තාය.

"නංගිට බත් කන්න තැම්බුං හොද්දක් හැදුව."

මම කතා නොකර බංකුව මතින් හිඳගතිමි.

"නංගි කැමති නෑ තැම්බුං හොදිත් එක්ක කන්න. ඊයෙත් තරවල හරි මාළු හරි ඉල්ලුව..."

"ඉතිං දෙන්නනෙ අම්මෙ. අම්මා වැව් මාළු උයල තිබුණ නේද...?"

"යසට තියෙයි. ගෙට වෙලා ඉද්දි ඔය පිළී ජාති කන්න දෙන්න හොඳ නෑ ආර්යා. බඩේ ගායවල් හැදෙනව."

අම්මලාට නූතන විද්‍යාව ගැන අවබෝධයක් නැත. තේරුම් කොට දෙන්නට ද නුපුළුවන. මම නිහඬ වීමි. අම්මලාව වෙනස් කරන්නට මේ කාලය නොවේ...!

"අර ළමය කියල ගියා නංගිව නාවන දවසට මෙහෙ එනවමයි කියල."

නැවතත් මගේ උගුරේ දැවිල්ලක් හටගත්තේ ය.

"අනේ මන්දන්නෑ ලොකු පුතේ. අපි ඉතිං ඒ ළමයි වගේ සාද සාජ්ජ දාන එකක්යැ..."

''ඔය නිච්චට නංගි එයි ද කියන්න බෑ අම්මෙ.''

වචන ලෙස මා පිට කළේ මසිත්හි වූ පැතුම වන්නට ඇත. මින් මතු ටික කලක් යන තෙක් නංගිවත් මට හමු නොවෙනවා නම් හොඳයි කියා හැඟුමක් මා තුළ තිබේ.

නංගි දකින්දී මට කෙළෙව් බස්නායක සිහි නොවී තියෙන්නේ නැත. එසේ නම් අමතක කළ නොහැකි ලෙස දැනටමත් ඔහු මගේ ආත්මයෙහි ලැඟුම්ගෙන හමාර ද...? මම නැතැයි සිතන්නට උත්සාහ කළෙමි. ආදරයක් හින්දා කඳුළු හලන්නට පුළුවන්කමක් දුප්පත් අපට නැත. අපට හඬන්නට කාරණා තව ඕනෑතරම් තිබේ.

''ලොකු පුතේ...''

අම්මා මෙමෙහෙවින් මෘදු ලෙස කතා කළා ය. රළු ජීවිතයකට හැඩගැසී සිටින ඇයට ඒ තරම් මෘදු ලෙස කතා කරන්නට පුළුවන් ද...?

''ඕ... ඇයි අම්මෙ...''

''ඇයි පුතේ මූණ අඳුරු වෙලා...? ගමන් මහන්සියට ද...? නැත්තං අසනීපයක්වත් ද...?''

''නෑ අම්මෙ. ටිකක් හිසරදේ වගේ. මහලොකු අසනීපයක් නෙවෙයි. ඇරිල යයි.''

මා ඒ අන්තිම කොටස එකතු කළේ, නැත්තම් නංගිගේ වැඩ අස්සේ මට කොත්තමල්ලි තම්බන්නට අම්මා කරදර වනු ඇති බව දන්නා නිසා ය.

අම්මා ඉහළ පන්තියකට ඉගෙනගත් කෙනෙක් නොවේ. ඒත් අප සැම කෙනෙකුගේම සිත්වල කිසියම් වෙනසක් වී නම් මනාව එය හැඳිනගන්නා ඉවක් අම්මා සතු ය. මට මහත් වරදකාර හැඟීමක් දැනිණ. ජීවිතයෙහි අනන්ත දුක් විඳි - විඳින ඇයට තවත් වද දෙන්නේ කුමට ද...? ආදරයක් හින්දා මා හදවතින් හඬන වග ඇයට දනගන්නට හරින්නේ ඇයි...? නැත. කවදාවත් ඇයට එවැනි



දෙයක් දැනෙන්නට හැරිය යුතු නැත. මගේ කඳුළු මම මා තුළම හිර කර ගතිමි. ගල් කර ගතිමි. නිදන් කර ගතිමි. පෙම්වත් පිරිමියෙකුගේ එක් තෙත්සර පහරක්වත් නොවැදුන එකියක සේ, ප්‍රේමයේ එක් හීසර පහරක්වත් නොවැදුන එකියක සේ මම ඇය ඉදිරියේ රඟපාමි.

''පිදු... රු... සෙ... වි... කළ... පැල්... ප... තේ... ඇති... සාමමෙ... නැත මහ මන්... දි... රේ...''

මටත් අම්මාටත් දෙදෙනාටම හැරී බැලිණ.

''අන්න අද පැල්පතේ සාමෙ ගැන මතක් වෙලා.''

නංගී ඇතුල් කාමරයේ සිට උස් හඬින් කීවා ය.

''පොඩි එකී... කට කට... උඹ හිටපන් ලොකු ගෑනි නොවී...''

අම්මා සැර වූවා ය.

''ඉතිං මං දැං ලොකුයි නේන්නං...''

නංගී ගෙතුළ සිටම එකටෙක කීවා ය. මෑතක සිට ඇගේ හැසිරීමේ වෙනසක් සිදුව තිබේ. ඇය ගෙදර හැමෝවම නොරුස්සන අයුරින් හැසිරෙයි. විශේෂයෙන්ම තාත්තාව හෙළා දකිමින් කතා කරයි. තාත්තාගේ අවිචාරවත් කල්කිරියාව අප කිසිවෙකු අනුමත නොකරන බව ඇත්තකි. නමුත් නංගී තාත්තාව ඒ තරම් පහළට දමමින් කතා කිරීම මට සේම අම්මාටත් කෝපය නැඟවයි.

''නංගී දැං ඔය ඇති හොඳේ.''

මම තරමක් තදින් කතා කළෙමි. නංගී ඉන් එහාට කතා කළේ නැත. ඒ මට ඇති බයකට නොවේ. තාත්තාගේ හඬ උස්ව නැඟුණ නිසා විය යුතු ය.

''ලොකු... එකි...යෙ... උඹනං... ඇත්තමයි බං උඹනං... වාසනාවන්තයි. ඕකනෙ බං... ගෑනුංගෙ පින කුණු මුල්ලෙයි කියන්නෙ...''

තාත්තා කතා කළේ මට ය. මා ගැන ය. නමුත් ඔහු පවසන්නට අරාදින්නේ කුමක් ගැනදැයි මට තේරුණේ නැත. අම්මා නංගීගේ බත් පත බෙදාගෙන නැම්බුං හොදිත් සමග ගෙට ගෙන ගියා ය.

"ඇත්තමයි ලොක්කියෙ. උඹට සැප විඳින්න ලියවිලා තියෙන්න ඇති."

තාත්තා කුමක් හෝ අල්ලාගෙන බීමතින් කියවනවා විය යුතු ය. මම ලොකු හුස්මකින් ළය පුරවාගෙන බංකුව මතින් නැගී සිටියෙමි.

"අයියෝ... අදත් නැම්බුං හොද්දයි බතුයි ද අප්ප..."

නංගීගේ නොමනාපය මුසු හඬ උස්ව නැඟිණ. අම්මා රහසින් සේ යමක් මුමුණන මිමිණුම ද ඇසිණ. හරියට වැඩිවිය පැමිණ තිබෙන්නේ නංගී නොව අම්මා සේ ය. සියල් සිත් වේදනා මැද වුව මගේ දෙතොල් මතට මදහසක් ආවේ ය.

"නැම්බුං හොද්ද...!"

තාත්තා සමච්චලයට හිනැහුණේ ය.

"නැම්බුංහොද් නෙවෙයි පොඩි එකියෙ. අද... සව්දිය පුරන්න... ඕන... දවසක්..."

තාත්තා වැනි වැනී නංගීට පිළිතුරු දුන්නේ ය. අම්මා යළිත් මුමුණන හඬ ඇසිණ. ගෙතුළ සිටින කාලයේ දී පිරිමින් සමග කතා බහ නොකළ යුතුයැයි ඇය නංගීට අවවාද කරන්නට ඇත.

"ලොකු පුතේ..."

ලොකු සිනහවක් නගාගෙන තාත්තා මගේ ළඟටම ආවේ ය. මට ඔහු ළඟ සැර මත්පැන් ගඳක් දැනිණ. පුංචි කාලයේ සිටම ඔය ගඳ මට අප්‍රසන්න ය. ඔය ගඳට මගේ බඩබොකු කැලතීගෙන ඔක්කාරය එයි. හැම දවසකම රාත්‍රියේ අපේ ගෙදර ඔය ගඳ හැමුවත් තවමත් මට ඒ ගඳ අප්‍රසන්න ය. මම නැහැය හකුළා ඉවත බලාගතිමි.



අම්මා රෙදිපට ගලවා යළි ඉනෙහි ගසමින් කුස්සිය වෙත ආවා ය. ඇය රවා මගේ තාත්තා දෙස බැලුවත් කිසිත් කීවේ නැත. බීමතින් සිටින වෙලාවට, අම්මා මොනවා කිවත් තාත්තාට හොඳ නැත. වචනයක් කීවොත් බැණ අඩගසයි. ගුටිබැට දෙයි. මොනවා ඉවසුවත්, බීමතින් තාත්තා අතින් මට වචනයක හෝ වරදක් වුවහොත් අම්මා නොඉවසන වග ද මම හොඳටම දනිමි.

"අපි කැමති නැති වෙයි කියල උඹ බය වෙන්න එපා ලොකු පුතේ. මුදලාලි මහත්තයගෙ පුතාගෙ යෝජනාවට අපි කැමතියි. එසේ මෙසේ අත්තක්යැ බං..."

මට කාරණය හරි හැටි තේරුණේ දැන් ය. මමත් අම්මාත් මූණෙන් මූණ බලා ගතිමු. මෙච්චර වෙලා බීමතින් කතා කළ, වචන ගැලපූ තාත්තාට දැන් කිසිදු ගොතයක් නැත. පැටලීමක් ද නැත.

"ඒ ළමය කොච්චර ගුණ යහපත් ළමයෙක් ද කියන්නෙ, තෙලිංම ඇවිත් කතා කළේ මට. නිකං නෙවෙයි... යන ගමං මොනාහරි කරන්න කියලා මට රුපියල් දෙසීයකුත් දුන්න බං අම්මප..."

වැටෙන්නට ගිය තාත්තා උළුවස්ස අල්ලා ගත්තේ ය. වචනයක් හෝ පිට නොකළ අම්මා දත්මිටි කෑවා ය. අම්මා එසේ සිටියේ පුළුවන් කමකට නොව කතා නොකරන ලෙස මා ඇසින් ඉඟිකොට තිබූ නිසා ය.

"මේක මරාලයක් බං. විමලාවතියෙ... ලොකු එකිට කියල දීපං. උඹල අපි වගේ දුක් විඳින්න ඕන නෑ කියල."

බිත්තිය දිගේ ඇතිල්ලෙමින් තාත්තා වැනි වැනි යන්නට ගියේ ය.

"අහුරු කපුව. තූ විතරක්..."

තාත්තා යන්නට ගිය පසු අම්මා නොරිස්සුම එළියට දැම්මා ය.

"ඒ ගමන අපේ රොශාන් තාත්තව අල්ලගෙන එයේ අම්මෙ."

"හ්ම්. හිනිවතුර ටිකක් බොන්න තියන්නී මිට මොළවනවනං ඔය මිනිස්සු ගෑනුංව දරුවන්ව වුනත් විකුණයි..."

අම්මාගේ හඬ බිඳිගෙන ආවේ ය. මම විගස ඇයට ලංවී අම්මාගේ හිස පිරිමැද්දෙමි.

"අනේ දෙයියනේ මගෙ ඇස් දෙක පියවෙන්න කලිං මේ කෙල්ලො දෙන්නව හොඳ පිරිමි දෙන්නෙකුට දීගන්න ලැබුනොත් මට ඇති. නැත්තං මගෙ මිනී වළටවත් සැනසීමක් තියෙන එකක් නෑ."

"ඔච්චර ඒ ගැන හිතන්න එපා අම්මෙ."

"කොහොම නොහොමද දරුවො...? තාත්තා කෙනෙක් කරන වැඩ ද මේ...? දර කොල්ලා දුකක්ඒතත් එපොයි... මෙහෙම මිනී මරාගන්න සිද්ධ වෙන්නෙ..."

"මල්ලිව මිනං තියන්න එපා අම්මෙ. මේ රටෙ පෙරේදත් මල්ලි තාත්තා එක්ක සතුටින් ඇති කරගන්න."

"මේ මනුස්සය මැරිල ගිය දවසක තමයි අපිට සැනසිල්ලෙ බත් කටක් කරී කන්න පුළුවං වෙන්නෙ. අනේ දෙයියනේ අපි වගේ පව්කාරයො."

"විමලාවතී... උඹ මොනා කරනව ද කෑනිගෙ...? මොනාද යකෝ කන්නෙ...?"

එවර තාත්තාගේ කෝපයේ හඬ ඉස්තෝප්පුව දෙසින් ඇසිණි. වේලක් උයන්නට තිබූ එක රුපියල් දහයක් අම්මා අතට දෙන්නට තාත්තාට සිහිවන්නේ නැත. නමුත් බීමතින් පැමිණ ගෙදර වූ කලෙක බත් විකාන බෙදා ඔහු අතේ තැබිය යුතු ය. එසේ [illegible] එක වූව වේලාවට නොලැබුනොත් අම්මාට පහර කන්නට සිදු වේ. ඉඳුල් [illegible] අම්මා [illegible] නොඑවියහොත් [illegible] පොළොවේ [illegible]. අම්මා [illegible]. අපට



වූව ඇයව මේ දුකෙන් ගලවාගත නොහැකිව තිබෙන්නේ එනිසාවෙන් විය යුතු ය.

"කෝ මට වතුර..."

අම්මා තාත්තාගේ බත් පත බෙදාගෙන යද්දී නංගීගේ හඬ මතු විය. අසරණ අම්මා යළිත් හැරෙන්නට හැදුවා ය.

"අම්මා ඕක ගෙනියන්න. මං නංගිට වතුර දෙන්නං."

නැත්නම් අම්මාට තාත්තාගෙන් විසුමක් නොවනු ඇත. අපේ ගෙදරට රාත්‍රිය උදාවෙන්නේ බිය පව්කාර සිදුවීම් සමුදායක් සමගම ය. ඒ නිසාවෙන්දෝ පුංචි කාලයේ සිටම මම රාත්‍රියට බිය වීමි. රෑ වේගෙන එද්දී - පොඩි කාලෙදි මට වෙව්ලීමක් සැදිණි. දෙතොල් පවා ගැහෙන්නේ ය. මේ 'ලෙඩේ'ට බෙහෙත් ගන්නට අම්මා මාව තොම්ලේ බෙහෙත් දෙන රජයේ ඩිස්පෙන්සරියට ගෙන ගියා ය. මාව පරීක්ෂා කොට බලා, ගෙදර පසුබිම ගැන ද ප්‍රශ්න කළ වෛද්‍යවරයාගේ ඒකමතික නිගමනය වූයේ, තාත්තාගේ බීමත්කම හා බීමතින් ඔහු හැසිරෙන ආකාරය නිසා මගේ ළමා මනස භීතියට පත්ව ඇති බව ය. මේ 'ලෙඩේ' හොඳ කරන්නට එකම බෙහෙත ඇත්තේ තාත්තා ළඟ බව දොස්තර මහත්තයා අම්මාට තේරුම් කොට දුන්නේ ය. නමුත් ඒ බව තාත්තාට තේරුම් කොට දෙන්නට අම්මා කවදාවත් පොහොසත් වූයේ නැත.

අප කෙමෙන් වයසින් වැඩෙද්දී මගේ ඒ බිය ටික ටික පහව ගියත් සම්පූර්ණයෙන්ම තුරන් වූයේ නැත. අදටත් මා තුළ යම් පමණකින් ඒ බිය ඉතිරිව තිබේ.

"අම්මට වෙන වැඩ නැද්ද බීල ආවහම අරයට ආවතේව කරනව මිසක්...?"

නංගී මා අතින් වතුර කෝප්පය ගත්තේ වචනවලින් මට දමා ගසමිනි.

"මේ... ඔයා පැහෙන්නැතුව ඉන්නව."

මම ඇයට සැර කළෙමි. නංගී මට ගස්සා, හිස් කෝප්පය හඬ නැගෙන සේ මේසය වෙතින් තැබුවා ය.

මම යළිත් ඇඳට වැටුණෙමි. හිසෙහි වූයේ අපමණ බරකි. ඒ බර දරාගෙන ටික වෙලාවක් සිටිය දී ඇස ද බර වී ගෙන එනවා මට දැනිණ.

"ලොකු පුතේ, ආර්යා... අනේ පුතේ බත් ඩිංගක් කාලම නිදියාංකෝ..."

ඇස් බරවෙන්නෙ යන්දී මට අම්මා කතා කරනවා ඇසිණ. නමුත් බත්වලට වඩා ඒ සැනසිලිදායක නින්ද අගනා බව නින්දේම මට සිහිණි. මා යළි නෙතු හැරියේ උදෑසන කුකුළා හඬලන හඬට ය.

"අර බූරු කුකුළටත් කට පියාගෙන ඉන්න බෑ. ඇස් දෙක පියවිච්චි වෙලේ ඉඳල ඌ බෙරිහන්දෙනව."

කුකුළාගේ හඬලෑමට අවදි වූ නංගී උදේ පාන්දරම නෝක්කාඩු කීවා ය.

"කොයි වෙලාවක හරි මං ඒකගෙ කටට රබර් බෑන්ඩ් එකක් දානව. මළ වදේ."

මට සිනහ යන්නටත් ආවේ ය. නමුත් මම නංගීට සිනාවක් නොපෙන්වීමි.

"ඔයා ඉතිං කුකුළත් එක්ක හරි රණ්ඩු වෙවී ඉන්නව."

"ඇයි අප්ප, එළි වෙච්ච වේලාවෙ ඉඳල කුකුළා බෙරිහන් දෙනව. රෑ වෙච්ච වෙලාවෙ ඉඳල තාත්ත උඩු බුරනව."

"නංගී...!"

මගේ ස්වරයේත් පෙනුමේත් තරවටුවක් තිබෙන්නට ඇත. දරුවන්ගේ සිත්හි ගෞරවයක් උපදින ආකාරයට හැසිරීමට දෙමාපියන් දනගත යුතු ය. දෙමාපියන් මොන විදිහට හැසිරුනත්



ඒ තමන්ගේ දෙමාපියන් නිසා ඔවුන්ට ගෞරව කරන්නට දරුවන් ද දනගත යුතු ය.

නංගී මට ගස්සා නැවතත් පොරෝනය තුළට ගුලි වූවා ය. හැම තැනින්ම ඉරී ගිය අම්මාගේ පරණ චීත්තය නිසා මට පෙනුණේ නංගිගේ දරදඬුකම නොව අසරණකම ය.

උදේ මා මිදුල අතුගෑවේ පමා වී ය. හිත හොඳටම තුවාල වී තිබිණ. සදෙව් අයියා අමතක කිරීම මා හිතූ තරම් පහසු කටයුත්තක් වන්නේ නැත. අපහසුවෙන් වුවත් මා එය කළ යුතුව තියේ.

වෙනදා වගේ පොල් අතු රටාවට මිදුල අමදින්නට තරම් නිරවුල් සිතක් මට වූයේ නැත. මිදුල හැඩිකොට තිබූ වියළි කොළ ටික, මම කබල් ඉදලෙන් අපිළිවෙලට අතුගා එකතු කළෙමි. මට පාර දෙස බැලුණේ එකනොට ය. තාත්තා රොෂාන් සමග පාරේ කතා කරමින් සිටියේ ය. ඔවුන් කතා කරන දෙය මෙතනට ඇසෙන්නේ නැත. නමුත් නියත වශයෙන්ම ඒ මා ගැන කතාවක් විය යුතු ය. රොෂාන් වරින් වර මදෙසත් බැලුවේ ය. ඔහු සිටියේ යතුරුපැදිය මත හිඳගෙනම ය.

මට ජීවිතයේ ප්‍රථම වතාවට තාත්තා ගැන එපමණ පිළිකුලක් දැනිණ. බීමතින් සිටිය දී ඔහු වරදක් කළත් ඒ බීමත නිසායි සිතන්නට පුළුවන. අපි එහෙම සිතන්නට පුරුදු වී ද සිටිමු. අම්මා අපව එහෙම සිතන්නට පෙළඹවූවා කියා මම සිතමි. 'ඒ මනුස්සය බීලනෙ පුතේ. අපි බීල නැනෙ...' අපේ හිත් බිඳෙන යමක් තාත්තා අතින් වුණොත් අම්මා අනන්තවත් එහෙම කියා තිබේ. ඉතින් වරදක් වුනත් බීමතින් සිටිය දී වුනොත් එය අහෝසි කර්මයක් සේ සලකන්නට අපි පුරුදු වීමු. නමුත් සිහිය ඇතිව තාත්තා රොෂාන් සමග සතපතන් මන්ත්‍රණයක් කරනවා දකිත් දී මගේ කෝපය නිමහිම නැති වූයේ ය. මම කුණුරොඩු ටික ඔවුන් කතා කරන අසල වන කුණු ගොඩටම දමා ගිනිකූරක් ගැසුවෙමි. වියළි පරඬලා වී තිබූ කොළ ගොඩ ඇසිල්ලකින් මහ ගින්නක් සේ ඇවිලිණි.

"අම්මෝ රස්නෙ..."

තියාගෙන රොෂාන් යතුරුපැදිය පණගැන්වූයේ ය. තාත්තා මදෙස බැලුවේ 'මොකද්ද ලොකු පුතේ ඒ කරපු වැඩේ...?' වැනි ප්‍රශ්නාර්ථයකිනි. නමුත් මම ඔවුන් දෙදෙනා දෙසම බැලුවේ එකම බියගත් දෑසකිනි. රොෂාන් පවනට බඳු වේගයෙන් නික්ම ගියේ ය. තාත්තා ද යළි ගෙදර නැවීත් පාර දිගේ හෙමිහිට පල්ලම් බැස්සේ ය.

යුද්ධය ඇරඹෙන්නේ දැන්ය කියා මගේ ගැහැනු ඉව විසින් මට අනතුරු අඟවන ලදී. සටන් කරනවා ද නැත්නම් පලා දුවනවා ද...? මම නොදැන සිටියෙමි.



## 08

**නංගිගේ** මල්වර නැකත දා සාදයක් දමන්නට අපි කොහෙත්ම බලාපොරොත්තු නොවුණෙමු. නමුත් මල්ලි වැඩ කරන ඡන්ද අපේක්ෂකයා වන තිලක් ඇතුළු සහචර පිරිස එදිනට සප්පායම් වීමට එන බව කියා, මල්ලි නැම පිළිවෙල කරන්නට අම්මාට මුදල් දුන්නේ ය. මේ ගැන මගේ හිතේ නම් මනාපයක් වූයේම නැත. මතු මෙහි යෙන්වන්නේ පිරිමින් තඩයකි. නංගි වැඩිවිය පැමිණ පළල්ලි ඔසින ගැහැනු ළමයෙකි. එවන් දැරියක කුඩුළලේම පිරිමි ගොඩකට නිරාවරණය කිරීම ගැන ප්‍රසාදයක් මට නැත. නමුත් නංගීගේ 'කොටහළු මඟුල' කන්නට ලැබීම ගැන අම්මා නම් සතුටු වූවා ය.

"අපිට ඒ කාලෙ ආර්යාගෙ මඟුලවත් ගන්න බැරි වුණ එකේ... එහෙම පොඩි උත්සයක් ගන්න ලැබෙන එක කොච්චර දෙයක් ද...? ගමේ මිනිස්සුත් ඔය එන කෙනෙක් ඇවිත් බත් කටක් කාල යයිනෙ..."

අම්මාගේ සතුට එය නිසා මම ඇයත් එක්ක මේ වැඩේට විරුද්ධත්වය ප්‍රකාශ නොකළෙමි. නමුත් මාත් මනුස්සයෙකි. දැනෙන හැමදේම මට තනිව හිතේ ධීර කර ගෙන ජීවත් වීමට නොහැකි ය. ඒ හින්දා නංගී අසල දී මම මගේ අප්‍රසාදය ගැඩා යම් කරමකට කතා කළෙමි.

"බොරු වැඩ. ඒ සල්ලි වලිනුත් ඔයාට මොනාහරි අරගෙන දුන්නහං ඉවරයි."

"එතං ඊරිසියාව."

නංගි ගත් පටම කීවා ය.

"ඒ මොකද...?"

මට ඇය අදහස් කළ දේ වැටහුණේ නැත.

"ඔයාට පාටියක් ගන්නෙ නැහැනෙ. ඉතිං ඔහෙ පාටි එක ගන්නවට ඔයාට ඊරිසියාව."

මට දැනුණේ මාව උස්සා පොළොවේ ගැසුවා සේ ය. ඒ හිතෙන්වත් මා සිතා සිටි දෙයක් නොවේ. යටි හිතේ රහසකටවත් එහෙම ඊරිසියාවක් පැහැවී නොතිබූ බව මට දිවුරා පැවසිය හැක. නමුත් සිහින් සිනාවෙන් පලක් නොවේ. නංගි තීරණයකට පැමිණ කතා කොට තිබෙන්නේ. මම නිදොස් කරන්නට නොගියෙමි. මගේ සිත ගැන මට විශ්වාස ය. ඒ සිත කොපමණ අවංක ද - කොපමණ සත්‍යවාදී ද කියා මම දනිමි. සත්‍ය කවදාවත් ලෝකය මතුපිටට නොඑවි ද කියා මම නොදනිමි. නමුත් මට කරන්නට දෙයක් නැත..! මේ මා ලබා උපන් හැටි වන්නට පුළුවන.

ඒ දින කිහිපය මා ගත කරන්නට ඇත්තේ දැඩි හෝන්දුමාන්දු ගතියකිනි. ඊට හේතුව සඳෙව් මන්නායකගෙන් දුරස් වී හිඳිනට මවිසින්ම පතාගත් වාරණය විය යුතු ය. අංගුමාත්‍රික පැතුමක් හෝ බලාපොරොත්තුවක් නැති වී ගිය කල ජීවිතය ගරා වැටීම අරුමයක් නොවේ. නමුත් නංගි සේම සමහර විට අම්මා ද සිතුවා ඇත්තේ නංගි වැඩිවිය පැමිණීම නිමිත්තෙන් සාදයක් දැමීම මගේ දොම්නසට හේතු වී ඇති බවයි.

"සිලක් මහත්තයාටයි උන්දැගෙ ගෝලයෝටයි කන්න බොන්න ටිකක් දෙන්න ඕන කියලා මල්ලිනෙ මේ වැඩේ ලෑස්ති කරන්නෙ. නැත්තං ඉතිං අපි මොනා කාවි ද...?"



මට ඇහෙන්නට අම්මා කීප විටක් එසේ කියන්නට ඇත්තේ එනිසාවෙන් විය යුතු ය. මම නිවැරදි කරන්නට හෝ නිදහසට කාරණා කියන්නට නොගියෙමි. එවැන්නකටවත් උනන්දුවක් නොවන තරමට මා උදාසීනත්වයකට පත්ව තිබිණ.

"අර හංසි ළමයටත් එදාට එන්න කිව්වනං හරිනෙ පුතේ. බත් කටක් කාල යන්න කවදාවත් අපි ඉන්න කියල නැහැනෙ."

"අනේ ඕන නෑ අම්මෙ."

එයටනම් මම ක්ෂණිකව විරුද්ධ වීමි. අම්මා පුදුම වී මදෙස බැලුවා ය.

"ඇයි පුතේ... ඒ ළමයට කෑම වේලක් දුන්නහම මොකද වෙන්නෙ...?"

සඳෙව් අයියාට ඇරයුම් නොකර හංසිට ආරාධනා කරනට නුපුළුවන. නමුත් තව වතාවකට සඳෙව් අයියාව දුටුවොත් තව ආත්ම ගණනකටවත් මට ඔහු අමතක කළ නොහැකි වනු ඇතැයි බියක් මා පෙළයි.

"කෑම වේලක් දුන්නටනං මුකුත් වෙන්නෑ. ඒත් අම්මෙ හංසි කියන්නෙ වැදගත් තැනක ගෑනු ළමයෙක්. ඔය රස්තියාදුකාරයො ගොඩක් ඉන්න තැනකට ඒ ළමයව ගෙන්නන්න මං කැමති නෑ."

මා කතා කළේ සත්‍යවාදීව නොවේ. නමුත් මා බොරු කීවේ කමෝප්‍රයෝගයක් වශයෙන් නිසා මට පව් නොපිරෙනු ඇත.

"ඒකත් එහෙමනං තමයි. එහෙමනං ඉතිං ඔය කැව්ං කොකිස් ටිකක්වත් අයිං කරල ඒ දරුවට ගිහිං දෙන්න."

මා හංසිගේ ගෙදරට ආවේ ගියේ දැඩි ඇල්මකිනි. ඒ ගෙදර දී මට මා පහළ සමාජයට අයත්ය යන හැඟීම දැනුණේ නැත. ඔවුන් මට එහෙම දැනෙනට ඉඩක් තැබුවේ ද නැත. ඒ හින්දා මට ඒ ගෙය මගේම ගෙදර සේ දැනුණා කීවොත් අතිශයෝක්තියක්

නොවේ. නමුත් දැන් මට ඒ නිදහස් හැඟීමෙන් ඒ ගෙදරට පය ගසනු නොහැකි ය. ආදරය ජීවිතයේ එක් පැත්තක්ම මගෙන් උදුරාගෙන තිබේ.

මල්වර නැකතේ දිය නා ගෙට ආ නංගීගේ වත සඳක් වගේ මට පෙනිණ. ඒ විත දිනට ම උසින් මහතින් වැඩී - නව යෞවනියකගේ පිරිපුන් බව නොමඳව අත්පත් කරගෙන සිටියා ය. සොබා දහම කොයිතරම් ආසිරිමත් ද කියා මට සිතින. නංගීත් මල්ලීත් දෙදෙනාම ඊයේ පෙරේරා ජංගි කොටය ඇඳගෙන මිදුලේ දඟ කළ පුංචි එවුන් ය. නමුත් අද ඔවුන් දෙදෙනාම උසින් මහතින් වැඩී, මටත් වඩා පෙනුමක් ඇතිව සිටිති.

"දන්නං ආර්යා නංගි වගේ සිගිති අක්කා වගේ."

අම්මාගේ ඇරයුමෙන් උදේ කිරිබත් කන්නට ගෙට ගොඩවූ සෝමා නැන්දා එසෙම කිවා ය. නංගි ආඩම්බරයෙන් සිනාසුනා ය.

චාරිත්‍ර විත නිම වූ පමණින් අම්මා කුස්සිය මිදුලේ බිම ඉඳගෙන දිවා ආහාරය පිසින්නට පටන් ගත්තා ය. සෝමා නැන්දා හා තවත් අසල්වාසී කාන්තාවන් දෙතුන් දෙනෙක් අම්මාගේ සහායට පැමිණියහ. මම පොල් ගෑවෙමි.

"විමලාවතීට ඉතිං මොකද... විසි තිස් දෙනෙකුට කෑම වේලක් උයා ගන්න එක මහ ලොකු දෙයක්යැ..."

අම්මාගේ මුහුණේ මම ආඩම්බරයක් දුටිමි. අසල්වැසි කාන්තාවන් කියන්නේ ඇත්තකි. විස්සකට තිහකට නොව සීයකට දෙසීයකට වුණත් අම්මා කිසි වෙහෙසක් නැතිව කෑම උයා තිබේ. ඉස්සර නම් ගමේ මඟුල් තුලා වල දී කුස්සිය පැවරෙන්නේ අම්මාට ය. ඈගේ අතේ තිබෙන ගුණය ගමේ කිසිම ගෑහැනියකගේ අතක නොමැති බව පොදු අදහසයි. නමුත් දැන් අම්මා සිරුරෙන් දුර්වල ය. ඉතිරි වී තිබෙන්නේ හිතේ හයිය පමණකි. පොඩි වැඩක් කළත් ඈය වෙහෙසට පත්වී හති දමයි. ඒ නිසා ගමේ මඟුල් තුලා වලට ද දැන් දැන් වැඩි වශයෙන් කෝකියන් ගෙන්වනු දකිය හැකිය.



පාර අයිනේ වාහනයක් නැවතෙන හඬ ඇසිණ.

"අන්න තිලක් මහත්තය ද කොහෙද ඇවිත්."

මගේ අතින් පොල් ගෑවීම නැවතෙත්දීම අම්මා කිවා ය. හදවත ගැස්මක් ඇති වූයේ ඇයි...? වාහනයේ හඬ මට දැනුණේ සදෙව් අයියා පැමිණියා වාගේ ය. ඒ කියන්නේ ඔහු අද මෙහි එනු ඇතැයි පැතුමක් මගේ හිතේ කොතනවත් තිබුණා ද...?

"අක්කෙ..."

යළිත් මා පොල් ගෑම අරඹත්දීම නංගිගේ හඬට මම හිස නගා බැලීමි.

"හංසි අක්කල ඇවිත්..."

අර මුල දී දැනුණ හදවත් ගැස්ම විසි තිස් ගුණයකින් වැඩි වී ය. මේ කතාව විශ්වාස කරන්න ද නොකරන්න ද...?

"මොකද අනේ යකෙක් දැකල වගේ බය වෙලා බලං ඉන්නෙ...? මං කිව්වෙ හංසි අක්කල ඇවිත් කියලයි."

පොල් මැය බිම වැටිණ. මා හිරමනය මතින් නැගිටිණි. 'හංසි අක්කලා' කියා නංගී අදහස් කළේ කවුරුන් ද...? හංසි ඔවුන්ගේ රියදුරු සමගින් ඇවිත් ද...? නැත්නම් අමන්ත අයියා සමග ද...? එත් නැත්නම් සදෙව් අයියා සමග ද...? නැත. සදෙව් අයියා සමග පැමිණෙන්නට විදිහක් නැත. එදා නංගීට කරාබු ගන්නට ගිය දවසේත් සදෙව් අයියා මා ළඟට වී කතා කර කර සිටි එක ගැන හංසි ඇනුම් පද කිවා ය. නමුත් ඔහුව උඩුමහලට කැඳවූයේත් ඈයම ය.

"හරියට බිග් ගර්ල් මෙයා වගේනෙ. මෙයානෙ ගේ අස්සට වෙලා ඉන්නෙ."

හංසි මගේ කල්පනා ලෝකය බිඳ දමමින් මා සිප ගත්තා ය. සදෙව් බස්නායකගේ විදුලි කොටන ඇස් දෙක මා දුටුවේ හංසිගේ උරහිස මතිනි.

"හරි තරකයි. ලොකු පාටි එකක් ඇරේන්ජ් කරල තිබිලත් නිකමටවත් අපිට ඉන්වයිට් කළේ නෑ. නේද අයියෙ...?"

හංසි මට තොක්කගු තිවා ය. සදෙව් අයියාගේ දෑසින් මිදෙන්නට මට තත්පර කිහිපයක් ගත විය.

"අනේ නෑ හංසි. මල්ලිගෙ යාළුවො කට්ටියක් විතරයි එන්නෙ."

"හරි හරි ඉතිං... අපිව අමතක වුණාට අපිටනං නංගිගෙ පාටි එකේ වෙච්ච එක අමතක වුණේ නෑ."

හංසි නංගී අත පුංචි තිළිණයක් තබද්දී සදෙව් අයියා මට ලං වූයේ ය.

"මේක අපි දෙන්නගෙ ගානෙ නංගිට දෙන්න..."

"සදෙව් අයියා..."

"ගන්නකො ඉතිං... නංගිට දෙන්න..."

ඊළඟ මොහොතේ හංසි අප දෙසට හැරුණා ය. සදෙව් අයියාට පෙරැත්ත කර කර ඉන්නට ඉතින් මට අවසරයක් නොවිණි. මම අනිත් හැම දැනැතියක ලෙසම හැසිරෙමින් ව්‍යාජ සිනාවක් මුවට ගෙනිමි.

"නංගී, මේ සදෙව් අයියත් ඔයාට ප්‍රසන්ට් එකක් ගෙනත්." නංගී සදෙව් අයියාගේ තිළිණය ලබාගත්තේ සිනාමුවිනි.

"මගෙං විතරක් නෙවෙයි, මේක ඔයාගෙ අක්කගෙනුත්."

නංගී නම් සිටියේ සිහියකින් නොවේ. නමුත් එතැන හංසි සිටි නිසා මට මහත් අපහසුතාවයක් දැනිණ. සදෙව් අයියා ඒ විදිහේ කතාවක් කිව්වාම හංසිට සැක නොහිතී තියෙන්නේ නැත. ඔහුගේ මේ හිතුවක්කාරකම හංසිගේත් මගේත් හිතවත්කම පළුදු කරනු ඇති බවට දැන් ඉතින් මට සැකයක් නැත. ඒ හින්දා මේ සියලු පුවත් නොසඟවා හංසි හා පැවසිය යුතුව තිබේ.



මල්ලිගෙ සගයන් එන්නට පෙර හංසිලා නික්ම ගියහ. එහෙම වුණ එක හොඳයි කියා මම සිතුවෙමි. ඒ වුණත් තවත් ටික වෙලාවක් සදෙව් අයියාගේ විදුලි කොටන දෑස් ඉස්මත්තේ ඔට්ටු සෙල්ලං කර කර ඉන්නට තිබුණානම් හොඳයි කියාත් මට නොසිතුනා නොවේ. සත්තකින්ම ඔවුන් යන්නට ගිය පසු මට පාළු දැනිණ.

"අක්කෙ... එන්නකො හංසි අක්කල ගෙනත් තියෙන තෑගි පෙන්නන්න..."

නංගී මාව ඇදගෙන කාමරය වෙත ගියා ය.

"මේ තියෙන්නෙ හංසි අක්කා දීපු එක."

ඒ කුඩා මලක් සහිත පෙන්ඩන්ට් එකකි. නංගිගේ ඇස් දෙක දිලිසෙමින් තිබිණ.

"මේ පෙන්ඩන්ට් එක දාන්න ඔයාට චේන් එකක් නැනෙ නංගි."

"මේ... සදෙව් අයියගෙනුයි ඔයාගෙනුයි චේන් එකක් හම්බවෙලා තියෙන්නෙ."

මම මහත් විමතියට පත් වීමි. පුංචි රන් දම්වැලක් නංගි මවෙත පෑවා ය. සදෙව් අයියා මේ තරම් ලොකු දෙයක් තිළිණ කරාවියි මා සිහිනයෙන්වත් සිතුවේ නැත. මේ තිළිණය හංසි හා සදෙව් කතාබහ කොට ගන්නා ලද දෙයක් ද...? සදෙව් අයියා මිල දී ගත් රන් මාලයට හංසි පෙන්ඩන්ට් එකක් ගෙන ඇතිවා විය නොහැකි ද...? ඔවුන් මට මෙතෙම සලකන්නේ ඇයි...?

හංසි මට ළෙංගතු බව ඇත්ත ය. ඒ ළෙංගතුකම දඩමීමා කරගෙන සදෙව් මට ලංවීම සඳහා හංසිව යොදා ගත්තත්, ඔවුන්ගේ දෙමාපියන් කවදාවත් එසේම දේකට ඉඩ නොදෙනු ඇත. කොහොමටත් හංසි ජීවිතය දෙස බලන්නේ සැහැල්ලුවෙනි. සදෙව් අයියාට සේම ඇයටත් මේවායේ බරක් - පතලක් තේරෙන්නේ නැත.

"අනේ හැමෝට පොඩි කෙල්ලට වටිනම තෑගි හම්බවෙලා තියෙන්නෙ ආරාධනාවක්වත් නැතුව ආපු අර ළමයිංගෙ ගෙදරිංනෙ."

සාදය නිමවීමෙන් පසු අම්මා එහෙම කීවා ය.

"ඒකනෙ. ආරාධනා කළානං මට මීට වඩා හොඳ දෙයක් දෙන්න තිබුණා."

නංගිගේ මූණේ මා දුටුවේ වෙනදා මා දකින අසරණකම නොවේ. මීට පෙර මා දැක නැති තරවටුවකි.

"මහ ලොකුවට අපිට පාටි දුන්නට අර පිලේ අයිය දීල තියෙන්නෙ රුපියල් පන්දාහයිනෙ."

"හරි හරි..."

අම්මා පැවසුවා ය.

"අයියට ඇහුනොත් එහෙම ඒකටත් සෝලි අල්ලයි."

නංගි ජේසා ඉවත බැලුවා ය.

"අනේ ලොකු පුතේ. අර දරුවො දෙන්න කන්නවත් නොගිහිය එනේ... මිය කැවුං කොකිස් ටිකක් පාර්සල් කරල ගෙට ගිහිං දෙන්න."

"එපා නෑ අම්මෙ. ඒගොල්ලො කැවුං කොකිස් කාලෙන ඇති."

මා පුළුවන් තරම් උත්සාහ කළේ මීට පස්සේ හංසිගේ ගෙදර නොයා ඉමි යන තීරණයෙහි එහිවා කටයුතු කිරීමට ය. පසුව ලයිසාට මේ දේවල් අමතක වී යනතුරුවත් මා එසේ කළ යුතුව තිබේ.

"අපෝ හංසි අක්කලට මිය කැවුං නැතුවට මොකෝ...?"

මමත් හිස සලා නංගිට අනුමත කළෙමි. අම්මා ඉන් එහාට කතා කරන්නට ආවේ නැත.



හැන්දෑවේ විශේෂ සිදුවීමක් විය. මල්ලි හා ඔහුගේ පිරිස නික්ම ගිය පසු ආනාරාධිතවම තවත් පුද්ගලයෙක් අපේ ගෙදරට ආවේ ය. ඒ රොෂාන් ය. ගවුම් රෙදි කෑල්ලක් වැනි දෙයක් දමූ පාර්සලයක් ඔහු අත විය. ඔහු ගොඩවූයේ මනමාල සිනාවක් දෙතොල් මත තවරාගෙන ය.

"හප්පච්චියේ... රොෂාන් මහත්තය එනව කිව්වට මන්නං හිතුවෙ නෑ එයි කියල..."

තාත්තා කුදු හැසීගෙන ඇවිත් රොෂාන්ව පිළිගත්තේ ඉමහත් සතුටකින් හා ගෞරවයකිනි. එහෙමනම් මේ ගමන රොෂාන් එන්නට ඇත්තේ තාත්තාගේ අනුදැනුම පිට ය. ඔවුන් දෙදෙනා ගැනම පිළිකුලකින් මසිත හැකිළිණ.

"කාටද ආඩම්බර... දැං ඉතිං සුරංගනාවො වගේ ගෑනු ළමයි දෙන්නෙක්ම මේ ගෙදර ඉන්නවනෙ."

රොෂාන් අපූරු නෙතින් මදෙසත් නංගි දෙසත් කෑදර බැල්මක් හෙළුවේ ය. ඔහුව පුටුවෙන් ඇද ගෙයිනුත් දොට්ට දමන්නට මට සිතුණේ. නංගී මල් මල් සිනහවකින් රොෂාන්ට සංග්‍රහ කළා ය. මම ගස්සාගෙන ගෙදර පිළිකන්න පැත්තට ගියෙමි.

එක කරදරයක්වත් ඉවරයක් වන්නේ නැත. තාත්තලා මේ විදිහට අනුබල දෙනතාක් රොෂාන්ලා අපේ ගෙවල් දොරකඩ පිනුම් ගසන්නට පැකිළෙන්නේ නැත. දැන් මේ ගෙදර වැඩිවිය පත් ගෑනු ළමයින් දෙදෙනෙකු සිටින බවවත් තේරුම් ගෙන තාත්තා කටයුතු කළ යුතු ය. ඔහුගේ මේ වගකීමක් නැති හැසිරීම නිසා ගමේ පිරිමින් අතර අප අවතක්සේරු වී යාම වැළැක්විය නොහැකි ය.

"පුතේ..."

අම්මා...! ඇ අසරණ ලෙස මදෙස බලා ගෙන සිටියා ය.

"ඔන්නොහෙ තේ එකක් බීලා ගියාවෙ පුතේ. තාත්ත දුරදිග බලන්නෙ නැතුව කරන දේවල්නෙ."

මා දැඩි කෝපයකට පත්ව හිඳිනා බව, මගේ රතු වූ මුහුණෙන් අම්මා තේරුම් ගන්නට ඇත.

"මං හිතන්නෙ ඔය තාත්තා එන්න කියලත් නෙවෙයි. රොෂාන්ම තමයි එනව කියල තියෙන්නෙ."

ඒත් මා වචනයක්වත් කතා කළේ නැත. අම්මා යන්නට ගියා ය. මම පිළිකන්නේ ගලක් මත වාඩි වී කල්පනා කරමින් සිටියෙමි. ඊළඟට මවෙත ආවේ තාත්තා ය.

"ලොකු පුතේ, පිහිං දැන් රොෂාන් මහත්තයත් එක්ක ටිකක් කතා කළොත් නේද හොඳ...? ගෙදරට ගොඩ වෙච්ච මනුස්සයෙනෙ..."

"අනේ තාත්තෙ මේ, මට ඔය එක එක පාත්තයොත් එක්ක කතා කර කර ඉන්න උවමනාවක් නෑ."

මම කෝපයෙන් ගුගුළෙමි. මගේ ප්‍රහාරය අභියස හැකිගත් තාත්තා පසුබැසුවේ ය. ඔහු හිස සසමින් එතැනින් නික්ම යනු දුටු මගේ දෙනෙතේ මතට මදහසක් ආවේ නැත. තවදුරටත් මා සිටියේ කෝපයෙන් දවෙමිනි.

රොෂාන් කෙරේ මවෙත වන අප්‍රසාදය, ඒ සිදුවීමෙන් ගෙදර කවුරුත් හොඳින්ම තේරුම් ගන්නට ඇත. කිසිම කිසි දවසක ඔහු හා විවාහ වීමට මාව කැමති කරගත නොහැකි වනු ඇති බව තාත්තා ද වටහා ගන්නට ඇත. නමුත් රොෂාන් ලෙහෙසියෙන් පසුබටට වන මිනිසෙකු නොවන වග මම හොඳටම දත සිටියෙමි. පාසල් යන කාලයේ පටන්ම මා ඔහුව ප්‍රතික්ෂේප කළ හැටියට ලැජ්ජාවක් ඇති මිනිසෙකු නම් තවත් මා පස්සේ නොපන්නානු ඇත. ඔහුට ලැජ්ජාවක් කියා දෙයක් නොමැත...!



# 09

**මම** පුංචි රැකියාවක් ලදිමි. ඒ පෞද්ගලික ආයතනයක පිළිගැනීමේ නිලධාරිනිය වශයෙනි. සැබැවින්ම මා සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූයේ පුවත්පත් දැන්වීමේ සඳහන් වූ පරිදි ශීඝ්‍රලිපි ලිපිකාරිනියක වශයෙනි. නමුත් මා බලාපොරොත්තු නොවූ පරිදි ආයතන ප්‍රධානියා මෙම තනතුර පිළිගන්නට කැමතිදැයි මගෙන් විමසීමක් කළේ ය.

"මං මේ වේකන්සි එක ගැන පේපර් ඇඩ් එකක් දැම්මා. ඒත් ඒ ආපු එක ගර්ල් කෙනෙක්වත් මගෙ හිතට ඇල්លුවෙ නෑ. පිළිගැනීමේ නිලධාරිනියක් කියන්නෙ ෆැක්ටරියකිං එළියට දාන බෝනික්කියක් වගේ ගෑනු ළමයෙක් කියලයි අපේ හුඟක් අය හිතං ඉන්නෙ ළමයො."

මැදිවිය ඉක්මවමින් සිටින ආයතන ප්‍රධානියා බෙහෙවින් නිවුණු - සැනසුණු මහ හිමිනමක සරි විය.

"ඒත් මං හෙවුවෙ අපේ ආයතනයට ඇතුල් වෙනකොටම මේ ආයතනයෙ තියෙන වාමි - සිංහලකම ගැන වැටහීමක් අපේ කස්ටමර්ස්ලට ඇතිවෙන විදිහෙ රිසෙප්ෂනිස්ට් කෙනෙක්ව. ටෙලිෆෝන් එකෙන් කතා කරද්දි වුනත් කටහඬේම සංයමයක් තියෙන ගෑනු දරුවෙක්ව. ආර්යාට ඒ සුදුසුකම තියෙනව කියල බැලූ බැල්මටම මට පේනව."

මම වත පහළට හරවා ගතිමි. කුමක් හෝ රැකියාවක් ලැබෙනවා නම් ඒ ලොකු දෙයකි. නමුත් මෙම තනතුර ගැන කිසිදු අවබෝධයක් මට නොමැත. මීට කලින් එවැන්නක් ගැන උනන්දුවක් ද මට තිබුණේ නැත.

"අනේ සර්. ඒලෙවල් ලියපු දවසෙ ඉඳලම මං පුංචි හරි රස්සාවක් හෙව්ව. මට මොකක්හරි ජොබ් එකක් ලැබෙනවනං ලොකු දෙයක්. ඒත් මං රිසෙප්ෂනිස්ට් පෝස්ට් එක ගැන කිසිම දෙයක් දන්නෙ නෑ."

මම මගේ අවංක හැඟීම හෙළිදරව් කළෙමි.

"කොයි මිනිස්සය ද ළමයො මුල්ම රස්සාවට යද්දි තමංගෙ පෝස්ට් එක ගැන හරියටම දනගෙන යන්නෙ...? අන්න එහෙම නොදන්න බව දන්න එකත් කොච්චර ලොකු දෙයක් ද...? මං මේ ළමයව මේ තනතුරට තෝරගන්නව. සාධාරණ වැටුපකුත් ඔය ළමයට ලැබේවි."

මීට කලින් සම්මුඛ පරීක්ෂණ කීයකටනං මා සහභාගි වූවා ද...? ඒ නැමෙනතැඳිම තිබේ දන්වා එවනු ඇති බව ය. සම්මුඛ පරීක්ෂණය සිදුවන අතරේදීම මේ ආයතන ප්‍රධානියා මට තනතුරක් පිරිනමා තිබේ. ඉතින් දෙපා පාමුලටම ආ මේ අවස්ථාවට මා කෙසේ පයින් ගසන්න ද...? මම රැකියාව භාරගතිමි.

"හෙට ඉඳලම ඔය ළමය වැඩට එනවනං මං කැමතියි."

අවසාන වශයෙන් ආයතන ප්‍රධානියා කීවේ ය. ප්‍රබෝධයෙන් පිටතට ඇවිත් ප්‍රශ්නයෙහි බරපතලකම මට තේරුණේ ආයතනයෙන් පිටතට ආ පසුව ය. පිළිගැනීමේ නිලධාරිනියක වශයෙන් රැකියාවට එනවා කියන්නේ කඩේ යනවා සේ යා හැකි ගමනක් නොවේ. එහෙම රැකියාවකට එන්න නම් හොඳ ඇඳුම් කිහිපයක්වත් තිබිය යුතු ය. සඳෙව් අයියා ලංකාවට ආ වෙලේ හංසි දුන් ඇඳුම් කිහිපයක් හැරෙන්නට මට ඇඳුමක් ඇත්තේම නැති තරම්. හංසිලාගෙන් ලැබුණු ඇඳුම් කිහිපය ද පසුගිය දිනවල නාංගී දිගින්



දිගටම ඇඳීම නිසා අබලන් වී තිබේ. මේ වෙලාවේ මට අලුත් ඇඳුම් කිහිපයක් අරන් දෙන්නට අම්මා ළඟ මුදල් නැත. දේශපාලන හෙන්චයියෙකුට කඩේ යන මල්ලීගෙන් මට මුදලක් ඉල්ලන්නට සිත් දෙන්නේ නැත. එයින් වන්නේ මා ද ඔවුන්ගේ දේශපාලනයේ ඉන්නෙකු වීම ය. අඩු තරමින් ඇඳුම් දෙක තුනක්වත් දිනට සපයාගත යුතු ය. ඒ සඳහා ණය මුදලක්වත් ඉල්ලාගන්නට මට සිටින්නේ හංසී පමණකි.

ගෙදර යන්නේ නැතිව මම කෙලින්ම හංසිලාගේ ගෙදර ගියෙමි. මට රැකියාවක් ලැබුණු පුවත අසා ඕ බෙහෙවින් සතුටු වූවා ය.

"ගුඩ් ලක් කෙල්මලෙ. ඔය වෙන්නෙපා. ඔයාගෙ අම්ම වගේම මාත් විශ්වාස කරනව ආර්යා... ඔයා මේ ජීවිතේ ඉස්සරහට යන ළමයෙක් කියල. ඒකයි මං ඔයාට මේ තරමටම ආදරේ..."

මගේ උගුර හිරවී. නෑස් පුඩු පිරිගෙන ආවේ ය. මා ගැන එහෙම කරුණාවකින් සිතන ඇයට ද්‍රෝහි වන්නට ද සඳෙව් මට ඇරයුම් කරන්නේ...?

"ඉතිං... ඉතිං... දැං නංගි කොහොමද...? කෙල්ල එක පාරටම ලස්සන වුණා නේ...?"

"හ්ම්. එයානං ඔය ඉන්නෙ. කිසි දේක බරක් පතලක් තේරුං ගන්නෙ නැතුව."

"එහෙම තමයි ළමයො. තාම පුංචි කෙල්ලනෙ. උස මහත ගියාට මොන වයසක් ද...?"

හංසීට දන් ජීවිතය ගැන අවබෝධයක් ඇතැයි මට සිතේ. සමහර විට අවන්ත අයියා ඇගේ දඟකාර සෙල්ලක්කාර ගති වෙනස් කරන්නට ඉවහල් වූ සාධකය වන්නට ඇත.

"මොකද මං දිහා අමුතු විදිහකට බලන්නෙ...?"

"නෑ... අවන්තයිය එහෙම... කොහොමද මේ දවස්වල...?"

"අවන්තයිය ගැන මං බලාගන්නංකො. ඔයා ඔයාට අදාල දේවල් ගැන බලාගත්තොත්නෙ හොඳ..."

මගේ දෙකොල් මත තැලියමින් හිඳි තුනී සිතාව ඇසිල්ලකින් පලා යන්නට ඇත. සිතා සිසි වූව හංසි කී ඒ කතාවේ තේරුම මොකක් ද...?

"මුන්න මන්න ඉතිං මුඩ් එක අප්සට් ගියා. මෝඩියෙ... මං හිතං ජෝක් එකක් කළේ. ඉතිං ඉතිං... ජොබ් එක ලැබිච්ච ප්‍රීතිය තිබ්බත්තෙං... මගෙං මොනා ද කෙරෙන්න ඕනෙ...?"

ඇවිලෙන්නට හැදූ ගින්දර නිවන්නට හංසි දිය පොදක් ඉසින්නට වූවා ය. ඇය කපුරු සිසින් කිසිත් නොකරනැයි විශ්වාසයක් මා තුළ ඇති කරන්නට ඇගේ ඇස් සාක්ෂි දරන ලදී.

"මං ගෙදර නොයා කෙලිංම මෙහෙං ආවෙ... ඔයාගෙං උදව්වක් ඉල්ලන්නමයි හංසි."

"උදව්වක්...? මොකද්ද...?"

"හෙට ඉඳල ඔෆිස් අඳින්න තරං හොඳ ඇඳුමක් මට නෑ. පුළුවන්නං... ඇත්තිනෙං මට රුපියල් තුන්දාහක් විතර ඉල්ලල දෙන්න. පඩි ගත්ත ගමංම මං ඒක ගෙනත් දෙන්නං."

හංසිගේ ඇස් එක මොහොතකට ලොකු විය. මම එහි සැණික දුකක් දුටුවෙමි.

"මෝඩි. මාව එච්චරම පිට කෙනෙක් ගාණට දාල ද ඔයා හිතන්නෙ...?"

"අනේ එහෙම නෙවෙයි හංසි..."

හංසි එහෙමම ඇඳෙන් බැස අල්මාරිය ඇරියා ය. ඇගේ මුදල් පසුම්බිය හැර නෝට්ටු කිහිපයක්ම පිටතට ගත්තා ය.

"ආ... මෙතන රුපියල් හත්දාහක් තියෙනව. අපි දෙන්නම ගිහිං ඔයා ආස විදිහෙ ඇඳුං ටිකක් ගමු."



"අනේ එච්චර සල්ලි ඕන නෑ."

"මෙ මේ... කට වහගන්න. මේක ණයක් නෙවෙයි. මගෙ පොකට් මනී වලිං දුන්නෙ. හරි. මෙහෙම හිතමුකො. ඔයාට ඔෆිස් යන්න මගෙ ගානෙ ඇඳුං ටිකක් අරං දෙනව."

මගේ ඇසට කඳුළු පුරන්නට ඇත. මෙහෙමත් මිනිසුන් මිහිපිට ජීවත් වෙනවා ද...? මෙහෙමත් හිත මිතුරන් අප අතර සිටිනවා ද...? හංසි නම් යෙහෙළියක වී මේ අත්භවේ උපන්නත්, පෙර ආත්මයක මගේම සොයුරියක වී ඉන්නට ඇත. මතු අත්භවයකත් එක බඩවැල කඩාගෙන උපන් සොයුරියක වන්නට ඇය මා හා පෙරුම් පුරනවා ඇත.

"මූ මය ඉතිං... ඕන දේකට ඇස් දෙක දියකරගන්නවනෙ."

හංසි එය කී ආකාරයට කඳුළු අතරින් මට සිනහවක් නැගිණි.

"යං යං රාණි මුබරජ්ජව ඇඳුං තෝරන්නත් සෑහෙන වෙලාවක් යයිනෙ. ආ... අපේ ඩ්‍රයිවර්ට ඉන්ෆෝම් කරන්නත් වෙයි නේ..."

කට ඇද කළ හංසි ගිලගත් සිනහවකින් මදෙස බලා ඇඳුම් කිහිපයක් අතට ගත්තා ය.

"අයියා... අයියා..."

ඊළඟට ඇය දොරෙන් එබී හඬගෑවා ය. මගේ කකුල් දෙක ගැහී, මුළු සිරුරම සීතල වීගෙන යනවා මට දැනිණ.

"මං වොෂ් එකක් දාගෙනම එන්නං."

හංසිට උවමනා වූයේ සදෙව් අයියාට කතා කොට අප දෙදෙනාව තනි කරවා යන්න ද...? එහෙම කිරීමෙන් ඇය බලාපොරොත්තු වන්නේ කුමක් ද...? අයියාගේ සෙල්ලක්කාරකං වලට හංසිත් සෙල්ලමට වගේ උදව් කරනවා ද...?

මා හිටිගෙ දොරටුවට පිටුපාගෙන ය. කාමරයට අඳුරක් වැටෙනු මට දැනිණ. සදෙව් අයියා උළුවස්ස අවුරා සිටගන්නට

ඇත. ඔහුගේ දවැන්ත සෙවනැල්ලෙන් කාමරයට මඳ අඳුරක් වැටෙන හැටි මම සිහින් දුටුවෙමි. ඒ සෙවනැල්ලෙහි චලනයක් සිදුවෙනවා - අඳුරත් එළියත් එහෙ මෙහෙ වෙන ආකාරය අනුව සිතාගත හැකි විය. මේසය මත වූ හංසිගේ පොතක් පෙරළ - පෙරළා, මම සිහිනයක සිටියෙමි. මගේ ගෙල පාමුලට උණුසුම් හාදුවක ඉක්මන් පහසක් දැනිණ. මම විගස හිස හැරවීමි. සදෙව් අයියාගේ ආදරණීය දෑස් මත දගකාර සිනාහවක් විය.

"මං බලං හිටියෙ කෝල් එකක්වත් දෙයි කියල."

එදා හංසිගේ සාදයෙන් පස්සේ ඔහුගෙන් සැඟවී ඉන්නට මා කෙසේ උත්සාහ කළා ද...? සිතත් එක්ක මා කළ සටනින් මා වෙහෙසට පත් වූ තරම් දන්නේ මමත් මගේ සිතත් පමණකි. නමුත් මේ වෙලාවේ සදෙව් බස්නායකව දකිමෙනුත් ඔහුගේ උණුසුම් පිරිමි දෙතොලේ පහස ලැබීමෙනුත් බලාපොරොත්තු නොවූ අපූරු ප්‍රමෝදයක් ඇති විය.

"පුළුවං තමතට නෙවෙයි මං හිටියෙ. වෙන කරන්න දෙයක් නැතිකමට."

ඇත්ත වශයෙන් තරහින්නට ආදරය මට ඉඩ දුන්නේ නැත. ඒ ආදරයේ හැටියක් ද කියා මම නොදනිමි. ඒ වෙලාවේ මට උවමනා වූයේ ආදරය විතරක්ය කියා මම සිතමි. ආදරයෙහි හේතු අන්ධයයි කියන්නේ සමහරවිට එනිසාවෙන් වන්නට ඇත.

සදෙව් අයියා වැරෙන් මාව සිය සිරුරට තුරුලු කරගත්තේ ය. මම මොහොතකට නිසල වීමි. පිරිමියෙකු - ආදරණීය පිරිමියෙකු මුළු ජීවිතයම එහෙම දෝතින් වැළඳගත් දී, ගැහැනියකට වෙන කිසි දෙයක් හිතන්නට ඕන වෙන්නේ නැත. හිතා මතාම මම ඇස් පියාන උන්නෙමි. ලෝකයෙහි වෙන කිසි දෙයක් නොපෙනෙන සේයින් හේතු පියාන උන්නෙමි. මුළු ජීවිත කාලයක්ම මේ විදිහේ පිරිමි රැකවරණයක ඉන්න තියෙනවා නම් ගැහැනියකට - ආර්යා වන් ගැහැනියකට ජීවිතයෙන් වෙන පතන්නට දෙයක් ඇත්තේ නැත.



ඒ තත්පර ගණන කල්පයක් සේ දිගුව මට දැනිණ. මේ හංසිගේ කාමරයයි මට සිහි වූයේ එලෙස තත්පර කිහිපයක් ගෙවී ගිය ඉක්බිතිවය. ඇය දත් මා සමග යන්නට සූදානම් වී නාන කාමරයේ සිට මෙහි එනු ඇත. ක්ෂණික බියකින් මම තැතිගතිමි. මා සදෙව් අයියා වෙතින් මිදී ඉවතට වූයේ විදුලි සැර වැදුනා සේ ය. මගේ දෑස් බියපත්ව නාන කාමරයේ දොර දෙස බලන ලදී. එහි හාවක් හූවක් නැත. හංසි දිය නාන හඬ ඇසේ. සැනසිල්ලකින් වාගේ මම සදෙව් අයියා දෙස බැලුවෙමි. ඔහුගේ දෑස් මත හිතුවක්කාර මඳහසක් තලියමින් තිබිණ. ඒ හිතුවක්කාරකම්වලට අනුබල නොදී මම ඉවත බැලුවෙමි.

"මට ජොබ් එකක් හම්බවුණා සදෙව් අයිය. හෙට ඉඳල වැඩ."

"කොහෙද...?"

"පොඩි කම්පනි එකක... රිසෙප්ෂනිස්ට් කෙනෙක් විදිහට."

"රිසෙප්ෂනිස්ට්...?"

සදෙව් අයියාගේ මූණේ නොරිස්සුමක සේයාවක් ඇඳිනි.

"රිසෙප්ෂනිස්ට් කිව්වට... ඒක හුඟක් වාම් කම්පනි එකක්. ඉංගොල්ලන්ට ඕන සිංහල විදිහට වාමෙට වැඩ කරන්න පුළුවං රිසෙප්ෂනිස්ට් කෙනෙක්ලු. එයාලගෙ කැමැත්තෙංමයි මට ඒ පෝස්ට් එක දුන්නෙ. මේ වෙලාවෙ... මට මොකක්මහරි ජොබ් එකක් ඕන වෙලයි තියෙන්නෙ සදෙව් අයිය."

"මොකක් හරි ජොබ් එකක් කියල..."

සදෙව් අයියා කියා නිම කරන්නට පෙර නාන කාමරයේ දොර හැරිනි. සදෙව් බස්නායක සිටියේ කෝපයකින් වාගේ ය. මට මඳ බියක් දනෙමින් තිබිණ. හංසි සිනාසිගෙන ආවා ය.

"චූයිව. අපිට නුගේගොඩට යන්න ඕනෙ. මේ ආර්යාට ඇඳුං ටිකක් ගන්න."

සඳෙව්ගේ කෝපය නිවන්නට හංසිගේ විහිළුවට බැරි වූවා සේ ය.

"මොකද මේ... මූණ තිකං යකා මාත් එක වගේ...?"

හංසි සඳෙව්ට බෙහෙවින් සමීපව ඔහුගේ මූණ දෙස හොඳින් බැලුවා ය.

"නෑ නංගි මං ආර්යාට කිව්වෙ... ඔය රිසෙප්ෂනිස්ට් පෝස්ට් එක හරියන්නෙ... නැට්ටිච් කෙල්ලන්ටනෙ... ඉතිං..."

"අයියා... මෙච්චර තතා කියන්නෙපා. රිසෙප්ෂනිස්ට් කියන්නෙ ආයතනයක වැදගත්ම පෝස්ට් එකක්. සමහර අය ඒ පෝස්ට් එක තේරුං අරං ඉන්න විදිහයි වැරදි. අනිත් එක ආර්යාව ඒ පෝස්ට් එකට සිලෙක්ට් කරගෙන තියෙන්නෙ... වෙන ඉන්ටවිව් එකකට එනව නියාමනෙ. ඒ කියන්නෙ කම්පනි එකෙං හොයනව ඇත්තෙ ආර්යා වගේ වැඩ උස්සන රිසෙප්ෂනිස්ට් කෙනෙක්ව. කොයි ජොබ් එකකවත් වරදක් නෑ. අපි ඒක කරන විදිහයි දකින විදිහයි තමයි වැරදි."

හංසි දිගු දේශනයක් කළා ය. ඇය වචන තෝරා බේරා ගත්තේ බොහෝ ඇඳුම් පිරූ තැත් ඇති දනමුත්තියක වාගේ ය. උසස් පෙළ තොට පාසලෙන් සමුගෙනිත්දින් දඟකාර කෙල්ලන්කාරියක සේ හැසිරුන ඇයව මේ තරමට වෙනස් කරන්නට අවන්ත අයියාට පිළිවන් විනැයි මටනම් සිතාගැනීමටවත් නුපුළුවන.

"ඒ වුනාට මං කියන්නෙ... ආර්යා ටික දවසක් ගිහිං බලල... හොඳනං විතරක් දිගටම කියාතං තමයි හොඳ..."

සඳෙව් අයියා හංසිට මෙල්ල වී සිටිණ.

"මව් ඉතිං... එහෙම තමයි. හරක තැනක්නං ආර්යාට දිගටම යන්න බැනෙ."

"මං ඉක්මනට රෙඩි වෙලා එන්නං."



කියාගෙන සඳෙව් අයියා කාමරයෙන් නික්මිණි. මා සිටියේ තුෂ්නිම්භූතව ය. සඳෙව් අයියා හා හංසි මෙහෙම විවෘත ලෙස මා ගැන කතා කරන්නේ කෙසේ ද...? සඳෙව් අයියා මා ගැන වන අදහසත්, මට කළ යෝජනාවත් ගැන හංසිට පවසා ඇත්ද...? එසේනම් තවමත් එය රහසක් සේ තබාගෙන මා ඇයට කරන්නේ වරදක් ද...? මම දස අතේ කල්පනා කළෙමි.

"පිරිමින්ටනං මොනා කියන්න බැරි ද...? තමං ගැන විතරක් හිතල මිනතරං දේවල් කියයි. ඒව කරන්නනෙ බැරි."

හිසකේ සකසන ගමන් හංසි තනිවම දෙඩුවා ය. මම වචනයක්වත් කතා කරගත නොහැකිව සිටියෙමි.

"අපේ අයියත් ඉතිං පිරිමියෙක්නෙ. පිරිමි ඔක්කොම එකයි. ජේන් නැද්ද අවන්ත මට දාලා තියෙන තිති."

අවන්තයියා ඇයට තිති දැම්මත්, සඳෙව් අයියා මට තිති දැම්මත් සමපාත කරන්නට පුළුවන් කමක් හංසිට තිබේ ද...?

"හරි ද...? එහෙනං යං..."

ඩෙනිම් කලිසමකුත්, උඩින් දැමූ කොටු කමිසයකුත් හැඳ, ජෙල් ගා හිසකේ සැකසූ සඳෙව් ඔස්නායකව මට පෙනුනේ කුමාරයෙක් වාගේ ය. මොහොතක් දෙකක් ඔහුගෙන් නෙත් මුදාගන්නට පවා මට බැරි වෙන්නට ඇත. මගේ අවධානය යොමු කරවා ගන්නට දෝ හංසි බොරුවට කැස්සා ය. සඳෙව් අයියා අහංකාර සිනාවක් විසා ගත්තේ ය. මට ලැජ්ජා සිතිණ.

"යං යං. එළියට යන්න පුදුම අමාරුවක්නෙ තියෙන්නෙ."

හංසි මගේත් සඳෙව් අයියාගේත් උරහිස් දෙකෙන් අල්වා කාමරයෙන් පිටතට තල්ලු කොට දොර වසා දැමුවා ය. මුළු සිරුර පුරාම දිව යන රුධිර ධාරිකාව එකවර කම්මුල්වලට පිරුණා සේ කම්මුල් පුපුරු ගසනවා මට දැනිණ. සඳෙව් අයියා හරි ආදරණීය බැල්මක් හෙළුවේ ය.

"ආර්යා වෙහිකල් එකට යන්න. මං අම්මිට කියල එන්නං."

හංසි පහළ මාලයේ දී ගෙතුළට ගියා ය. සදෙව් අයියා ගෙයින් පිටතට පිය නැඟී ය. මම වඩාත් හෙමිහිට ඔහු පසුපස ඇදුනෙමි.

"ඇවිදිනව ද නැත්තං නැලවෙනව ද...?"

සදෙව් අයියා ආදරණීය තරවටුවක් කළේ ය. මම බිම බලාගෙන හිඟින් රියෙහි පසුපස දොර අගුල මත අත තැබුවෙමි. එවෙලේම සදෙව් අයියා ද දොර අරින්නට අගුල ඇල්ලුවේ ය. ඔහු අත තබා තිබුණේ මගේ අත මතයි. අපේ සිව් නෙත් එකම නිමේෂයක දී එකම රේඛාවක හමු විය.

"දැං මට ඔයා නැතුව ඉන්න බැ."

ඔහු මිමිණුවේ ය. මගේ මුළු මහත් ස්ත්‍රී ආත්මයම හිරු දුටු හිම සේ ඔහු ළඟ දිය වී යනවා මට දැනිණ.

"ඉක්මනට ජොබ් එකකට සෙට් වෙලා මං ඔයාව මැරි කරනව."

"ඉස්ට කරන්න බැරි බලාපොරොත්තු දීල... මෙ දුප්පත් හිතන්නිව අවුවන්නෙපා සදෙව් අයිය."

"ආදරේ කියන්නෙ මොකක්ද කියල දවසක ඔයා තේරුංගනී."

සදෙව් අයියා රියෙහි දොරවල් දෙකම එකවර ඇරියේ ය. මා පසුපස අසුනට ගොඩවුණේත් ඔහු ඉදිරි අසුනට ගොඩවූයේත් එකවම ය. හංසි දිවගෙන වාගේ පිටතට ආවා ය. ඇය පසුපස නයනා ඇන්ටිත් එනවා මම දුටිමි.

"ආර්යා... ජොබ් එකක් හම්බ වුණාට පස්සෙ අපේ ගෙවල් පැත්තෙවත් නැවිත් ඉන්න එකක් නෑ නේද...?"

"අනේ... කවදාවත් නෑ ඇන්ටි."



"විහිළුවක් දරුවො කළේ... මං දන්නව ඔයා එහෙම ළමයෙක් නෙවෙයි කියල..."

"අපේ අම්මට පුළුවන්නං ආර්යාව බඩ ඇතුළෙ තියං ඉඳල අජේම කරගනී."

හංසිගේ කතාවට අප කාටත් සිනා නැඟිණ. ඔවුන් කොයිතරම් දයාබර ආකාරයට ද මා ගැන හිතන්නේ...? මට සලකන්නේ...? නමුත් දනටමත් මා මට නොගැලපෙන කටයුත්තක් කොට බද්නායක පවුලේ පුතනුවන්ව රවටා ගෙන ඇතැයි ඔවුන් දැනගත හොත්...? ඒත් මා එවැනි රැවටීමක් සිදු කෙරුවා ද...? සදෙව් අයියාව මවෙතට වසඟ කරගනු පිණිස දනුවත්වනං එක ඉඟියක්වත් නොකළ බව මට සක් සුදක් සේ විශ්වාස ය.

රිය පණ ගැන්විණ. හංසි ඉදිරි අසුනට ගොඩ වූවා ය. රිය ගේට්ටුවෙන් පිටතට නැරවෙත්දී, මාව හොඳින් පෙනෙන සේ සදෙව් අයියා ඉදිරි කැඩපත සකසනු මට පෙනිණ. මම නොදුටුවා සේ ඉවත බලාගෙනම සිටියෙමි.

"අවන්තයියත් එනව කිව්ව හොපින් කම්ප්ලෙක්ස් එකට. ආර්යාට ජොබ් එකක් ලැබිච්ච එකට පාටි එකක් ගන්නම ඕන කිව්ව."

හංසි පිටුපස හැරී කීවා ය. මා අසරණ මදහසක් පෑවා පමණි.

"මේ මේ හිනාවෙලා විතරක්නං හරියන්නෑ. අපිට පාටි ඉල්ලගන්න කාරණා දෙක තුනක්ම තියෙනව."

මා ගල් ගැහිණ. හංසි ඒ කී දෙයින් අදහස් කෙරුවේ කුමක් ද...? ඇගේ බැල්ම ද තරවටුවක සරි වූයේ ය. මම බියපත් වීමි. සදෙව් හා හංසි මුහුණෙන් මූණ බලා ගන්නවා මට පෙනිණ. ඔවුන් දෙදෙනාම සිටියේ මදහසනි. මා විතරක් බිය වෙන්නේ ඇයි...? මා බිය වන්නේ අහේතුකව ද...? නැත. ඔවුන්ට ජීවිතයේ හැම සිදුවීමක්ම විනෝදයකි. නමුත් අපට බරකි. ඔවුන්ට අනාගතය ගැන

අවිනිශ්චිතකමක් නැත. අපට අනාගතය ගැන ඇත්තේ බියකි. වර්තමානය දුකක් නිසා අනාගතය සැලසුම් කිරීමේ දී අපි මෙහෙවින් සිතන්නෙමු. සිතුවක් වරදවා ගන්නෙමු. නමුත් ඔවුන් කිසිත් නොසිතා එන හැටියකට අනාගතය බාර ගනිති.

"ආර්යා ගෙදරට කියල එන්න ටිකක් ලේට් වෙයි කියලා."

සදෙව්ගේ හඬින් මා අහසින් පොළොවට වැටුණා සේ ය. මම වටපිට බැලුවෙමි. රිය නැවතී තිබුණේ අපේ කඩුල්ල ඉදිරිපිටයි. මම තැළුම්මෙන් පුතුව රියෙන් බැස ගතිමි.

"පාටි එකකුත් දෙන්න තියෙන නිසා ලේට් වෙන්නෙ. නැත්තං අම්ම බය වෙයි. යංකො... මාත් එන්නං කියල එන්න..."

හංසි ද රියෙන් බැස්සා ය. මා මෙහෙම ඉන්නේ ඇයි...? ඔවුන්ට සිතැ විදිනට මගේ ඉරණම විසඳන්නට ඉඩ හැර මා නිහඬව ඉන්නේ ඇයි...? මගේ ජීවිතයෙහි යතුර ඔවුන් අතට දෙන්නට තරම් මා දුර්වල - අසරණ කෙල්ලක වන්නේ ඇයි...? නමුත් මා එහෙම හිතන එක හරි ද...? හංසි කවදාවත් මගේ අසරණකම හෝ දුප්පත්කම මත මට කිසි බලපෑමක් කොට නැත. හිතවත්කමින් උදව්වක් කළා මිස. ඒ මත කවදාවත් කිසි අයුතු ප්‍රයෝජනයක් බලාපොරොත්තු වී නැත.

"මොකද මේ මහසෝනා දකල බය වෙලා වගේ...?"

ගෙටගොඩවෙන්නට පෙර හංසි මගෙන් විමසුවා ය.

"අම්මේ... අක්කල ඇවිත්..."

පියවර හඬට කරපොවා බැලූ නංගී කුස්සිය පැත්තට ගියා ය. අම්මා රෙදි පටෙහි අත් පිසදමමින් ඉදිරියට ආවා ය.

"අනේ පුතේ මං මේ පරක්කු නිසා බල බල හිටියෙ."

"ඉන්ටවිව් එක ඉවර වෙලා මං එහෙමම හංසිලගෙ ගෙදර ගියා අම්මෙ."

"ආ... ඒක මිසක්ක."



"මාව එතන වැඩට තෝරගත්ත අම්මෙ."

"මගෙ දරුවට රත්නත්තරේම පිහිටයි."

අම්මාගේ ඇසට සතුටු කඳුලක් උනන්නට ඇත. ඇය රෙදි පටින් ඇස් කෙවෙනි පිහිදා ගත්තා ය.

"කවද ඉඳල ද පුතේ වැඩ...?"

"හෙට ඉඳල."

"ඊවරං දෙයියනේ... හෙට ඉඳල...?"

අම්මා කලබල වූවා ය. දුප්පත් අපට එහෙම උත්හිටි ගමන් වැදගත් ගමනක් යන්නට හැකියාවක් නැති බව ඉතිහාසයේ සිටම අම්මා දනී. ප්‍රශ්නාර්ථය රැඳි බොරපැහැ ඇසින් ඈ අසරණ ලෙස මදෙස බැලුවා ය.

"කොහොමද නංගි ඉතිං...?"

හංසි නංගී සමග කතාවට වැටෙතැදී මම අම්මාගේ අතින් ඇදගෙන කුස්සියට ගියෙමි.

"අම්මෙ... ඇඳුං දෙක තුනක් ගන්න මං හංසිගෙන් සල්ලි ඉල්ලුව. එයා එක්ක ගිහිංම මං ඇඳුං ටිකක් අරං එන්නං."

අම්මාගේ බොරපැහැ දෑස් තාරුකා යුගලක් සේ දිළිසෙන්නට ගත්තේ ය.

"මගෙ පුතාට එහෙම යාළුවෙක් ඉන්න එකත් මොනතරං වාසනාවක් ද පුතේ. එහෙනං ගිහිං එන්නකො."

මගේ අත් ගොයිය පිරිමදිමින්ම අම්මා ගේ ඉදිරිපිටට ආවා ය. රටක් රාජ්‍යයක් දිනුවා වැනි ජයග්‍රාහී මඳහසක් ඇගේ මුහුණ මත ඇලියමින් තිබිණ.

"ආර්යාට ජොබ් එකක් ලැබුණට අපි හොඳ පාටි එකකුත් ඉල්ලගත්තව ආන්ටි, ඒක නිසා මෙයා අද ගෙදර එනකොට රෑ වෙයි."

"අනේ.. පාටි දෙන්න හයියක් මේ හිඟන්නිට තාම කොයින් ද...? පඩි ගත්තට පස්සෙනං ඔන්න..."

"අපොයි.. මේ පාටිය එච්චර කල් දාන්න බෑ ආන්ටි. දැනටමත් පරක්කු වැඩියි."

හංසිගේ කතාව අම්මාට නොතේරුණාට, මටවත් ඇය අදහස් කරන දේ නොවැටහුණාට, හංසි මනමාල සිනහවක් හෙළුවා ය. ඒ කියන්නේ දැන් ඇය හංසිගේ භාෂාව තේරෙන තරමට වැඩිහිටි වී සිටින බව ද...? මට කිසියම් භීතියක් දැනිණ. නමුත් මේ ඒ භීතිය ගැන සිත සිතා සිටිය හැකි අවස්ථාවක් නොවූයේ ය.

"ශං ශං. ටික ටික තව ලේට් වෙනව. ආන්ටී... රෑ වුනත් බය වෙන්නෙපා. මං ආර්යාව ගෙනත් ඇරලෝලමයි යන්නේ."

මටවත් ඇදගෙන රිය වෙත දුවන ගමන් හංසි කෑගැහුවා ය. මම පිටුපස හැරී බැලුවෙමි. අම්මාගේ මූණේ වූ ආඩම්බරය මට ඈතටත් දකිය හැකි විය.

අතුරුපාරෙන් රිය මහපාරට හැරෙද්දී, මම කඩමණ්ඩියේ සිටි සාන්තාව හා රොෂාන්ව දුටිමි. රොෂාන් මෝටර් බයිසිකලය මත හැපී සාන්තා සමඟ කතා කර කර සිටියේ ය. රියෙහි පසුපස වීදුරුව හැරී තිබූ නිසා රොෂාන් මාව දුටුවේ ය. ඒ එක මොහොතකට ය. රිය ඉගිලිණ.

හංසි මට ඇඳුම් ගොඩක් තේරුවා ය. මම සාරියක් ද තෝරා ගතිමි. පසෙක සිට මා සාරි තෝරනතුරු බලා සිටි සදෙව් අයියා එතැනට ඇවිත් තවත් සාරි දෙකක් ගෙන මා අත තැබුවේ ය. මම නෙතු විදා ඔහු දෙස බැලීමි.

"ඔෆිස් යද්දී ඔයා සාරි අඳිනවට මං ආසයි."

හංසි ළඟපාත සිටි නිසා ඔහුත් එක්ක වාද කරගන්නට මට පුළුවන්කමක් තිබුණේ නැත.

ඇඳුම් ටික ගෙවීමේ කවුන්ටරයට දී මා මුදල් පසුම්බිය අරින පමාවෙන් සදෙව් අයියා මුදල් ගෙවා තිබිණ.



"අනේ... මං පේ කරන්නං..."

"සැලරි ගත්තහම ගෙවන්නකො..."

මට තවත් යමක් කියන්නට ඉඩ නොතියා, සදෙව් අයියා ඇඳුම් බෑග් දෙක මා අතට දුන්නේ ය. හංසි ඉවත බැලුවේ කිසිවක් නොදුටු බවක් මට හැඟවීමට විය යුතු ය. නමුත් ඇය නොදුටු දෙයක් නැත. මට තවදුරටත් ආත්ම වංචාවක නිරත විය නොහැකි ය.

"හංසි... සදෙව් අයියා ඇඳුංවල සල්ලි ගෙව්වනෙ. එහෙනං මං ඔයාගෙං ගත්ත සල්ලි ආපහු දෙන්නං. පඩි ගත්තහම මං සදෙව් අයියට දෙන්නං."

"මේ... මය දෙන්නගෙ දේවල් මය දෙන්න බේරගන්න. මං කිව්වනෙ මං ණයක් දුන්නෙ නෑ කියල. ඒ සල්ලිවලිං ඔයාට ඕන වෙන දෙයක් අරගන්න. මේ මාසෙ ඔෆිස් යද්දිත් කීයක් හරි අතේ තියෙන්න ඕනනෙ."

හංසි මගේ පසුම්බියටම පළි මුදල් එබුවා ය. ඔවුන් මට මෙහෙම සලකන්නේ ඇයි කියා මටනම් තවමත් සිතාගත නොහැකි ය. හංසිගේ දුරකථනය නාදවෙන්නට ගත්තේ ය.

"අවන්ත ඇවිත් වගේ... හෙලෝව්...? ආ... ඉවරයි ඉවරයි. දැං අපි ඔතනට එනව."

හංසි සමඟ සදෙව් අයියාත් පය ඉක්මන් කළහ. රිය වේගයෙන් ඉගිලිණි. අලුත් ඇඳුම්වල සුවඳින් මගේ නාස්පුඩු පිරී තිබිණ. මේ තරම් ඇඳුම් ගොඩක් කවදාවත් අප එකවර මිල දී ගෙන නැත. එකක් දෙකක් ගෙන නැවතෙන්නට මා උත්සාහ කරද්දීත් ඊට ඉඩ නොදුන්නේ හංසි ය.

"අලුතෙංම ඔෆිස් එකකට යනකොට ලස්සනට යන්න ඕනෙ. ඊටත් වඩා රිසෙප්ෂනිස්ට් කෙනෙක් කිව්වහම...?"

හැමදේම සිහිනයක් වාගේ මට දැනිණ. සිහින ලස්සනය. නමුත් ඒ ඇහැරෙන්නේ නැතිව හිඳිනතාක් කල් පමණකි.

අප ඉක්මනින්ම අවන්හලක් වෙත පැමිණ තිබිණ. එය සුපිරි අවන්හලකි. මෙහි එක් කෑම වේලකටම දහස් ගණන්වලින් ගෙවන්නට සිදුවන බව බැලූ බැල්මටම පෙනේ. ඔවුන් පාටි ඉල්ලන්නේ මගෙන් නම් මුදල් ගෙවිය යුතු වන්නේ ද මවිසිනි. හංසි දුන් මුදල මගේ පසුම්බියෙහි වේ. නමුත් මට මෙවැනි තැනකට මුදල් ගෙවන්නට ඔවුන් ඉඩ දේවි ද...? මම නොසිතමි.

"යටබාගෙ දන්නෙ සැහෙන කාලෙකිං."

මං දුටුවනම් අවන්ත අයියා එහෙම කිවේ ය. මම ලෙංගතු සිනහවක් නගාගතිමි.

"ඉතිං කොහොමද ආර්යා...?"

"හොඳිං ඉන්නව අයියෙ."

"හංසි කිව්ව හෙට ඉඳං ඔයා ජොබ් එකකට යනව කියල. ගුඩ් ලක් නංගී..."

"තැන්ක්ස් අයියෙ."

"ජොබ් එකක් කළාට... ආර්යා කැම්පස් ගිහිං හයර් ස්ටඩිස් කළොත් තමයි හොඳ. මොකද ඔයා වගේ ක්ලෙවර් ළමයෙක් ස්ටඩිස් කඩාකප්පල් කරන්න එක අපරාධයක්."

මම කිසිත් නොකියා හිමට සිනාසුණෙමි. සදෙව්ගේ දෑස් මා වෙතටම හැරී තිබෙන බව මට නොතේරුණා නොවේ. මේ වෙලාවේ මම පුළුවන් තරම් ඔහුගේ ඇස් මගහැර සිටියෙමි. නැත්නම් අවන්ත අයියාගේ උකුසු ඇස්වලට මා හසුවනු ඇත.

"මටනං හොඳටම ෂුවර් ආර්යා මෙඩිසින් සිලෙක්ට් වෙලා තියෙයි."

හංසි ස්ථිරවම කීවා ය. වෛද්‍යවරියක වීම කුඩා කාලයේ සිටම මගේ හීනයක් වූයේ ය. නමුත් එය හීනයක්ම වන වග මට තේරෙන්නේ දැන් ය. වෛද්‍ය පීඨයට මා යවා වියහියදම් කරන්නට දෙයක් අපේ අම්මාට නැත. අඩු තරමින් වැටී සිටින පැල



හැරෙන්නට, විකුණන්නට ඉඩකඩමක්වත් ඇය සන්තක නොවේ. ඉතින් වෛද්‍යවරියක වීමේ හීනය පසෙකලා පොළොවේ පය ගසා ජීවත් වෙන්නට පුළුවන් රැකියාවක් කිරීම දැන් මගේ බලාපොරොත්තුවයි.

නමුත් හිතට නැගුණු කිසිවක් මම වචන බවට නොපෙරළුවෙමි.

"ඉතිං ඉතිං... අද ආර්යලගෙ පාටි එක නේද...?"

'ආර්යලගෙ...?' මම හංසි දෙස බැලුවෙමි. අවන්ත අයියාත් සදෙව් අයියාත් එක්ව කෑම වර්ග ඇනවුම් කළහ. හංසි ඔවුන්ට උදව් කළා ය. මම ඔහේ බලා සිටියෙමි.

"ඉතිං ඉතිං මචං. දැං හන්තානෙ යන්න පුළුවං තත්ත්වයක් තියෙනව ද...?"

කෑම ඇනවුම් කිරීමෙන් පසු අවන්ත අයියා සදෙව් වෙතට හැරිණි. සදෙව්ගේ ඇස් එක්වරම මවෙත යොමු වූයේ ය. මා සීතල වී යනවා මට දැනිණ. මට සිහි වූයේ එදා නුවර ගමන ය.

"හන්තානෙ යංද ආර්යා...?"

අවන්තයියාගේ ප්‍රශ්නයට දෙන්නට පිළිතුරක් මට වූයේ නැත.

"අවශ්‍යතා ටික සම්පූර්ණ ද බං...?"

අවන්තගේ බැල්ම මාරුවෙන් මාරුවට මවෙතටත් සදෙව් වෙතටත් යොමු වේ. මට මහත් අපහසුතාවයක් දැනෙන්නට වූයේ ය.

"කොහෙද ඉතිං... බයේ ගැහෙනවනෙ..."

සදෙව් ඒ වචන ටික කීවේ කෙලින්ම මදෙස බලාගෙන ය. හදවත ඇතුළේම බෝම්බයක් පිපිරුවා සේ මා කම්පිත වූයේ ය. හංසි මේ සියල්ල දෙස සිනා වෙවී බලා හිඳී. නමුත් සිනහ වෙන්නට පුළුවන්කමක් මට නම් නැත. මගේ යටිතොල්පට වෙව්ලනවා මට දැනිණ. මම යටිතොල දත් වලින් සපා ගතිමි.

"ඒ කියන්නෙ... බය විනාඩියෙ ප්‍රශ්නෙ... මොන මුකුත් අවුලක් නැතෙ...?"

"කවුද මුදලාලි කෙනෙක්ගෙ පුතෙක්ගෙ ප්‍රශ්නෙකුත් තියෙනව මගෙ හිතේ."

මුවුන් මේ කතා කරන්නේ ව්‍යංගයෙන් නොවේ. කවුරුත් හැම දේම දන්නා වග පොරොපෙසකි. හංසි හඬනගා හිනැහෙන්නට වූවා ය. අවන්ත අයියා ඇය වෙතට දඩි බැල්මක් හෙළුවේ ය. හංසි එහෙමම හිනාව පිල පත්තා ය.

"ඉතිං ඉතිං ආර්යා... ළඟදීම අපිට හන්තානෙ යන්න බැරි වෙන එකක් නැතෙ... නේද...?"

ඒ තරම් ලැජ්ජාවක් හෝ අපහසුතාවයක් ඊට පෙර මට දැනී ඇතැයි මම නොසිතමි. නමුත් සිසිඳවී මිහිරකින් ද මගේ ගැහැනු ආත්මය නැහැවෙමින් තිබිණි. මා වඩාත් අසරණව හිටියේ එතැන හංසි සිටි නිසා ය. නමුත් ඇයට නම් මා අළලා කළ, ඊන් මා ගැන වචනයක්වත් කතා නොකළ ඒ කතා බහ ගැන කිසිදු වගක් නොවී ය.

ඒ කැන්දාව නොදුරු විය. කොහොමටත් අවන්ත අයියා ඉදිරි විහිළුවක් - සිනහවක් අඩු වන්නේ නැත.

"දං කවුද බිල ගෙවන්නෙ...?"

අන්තිමට එසේම ඇසුවේත් අවන්ත අයියා ය.

"වෙන කවුද...? උඹ ගෙවපං."

සදෙව් ඉවත බලාගෙන කීවේ ය.

"එපා. එපා අවන්ත."

හංසි විරෝධය පෑවා ය. මම පුදුම වී බැලුවෙමි.

"ඊගොල්ලන්ගෙ පාටි එකනෙ. අපි මොකටද ගේ කරන්නෙ...?"



හංසි මදෙස බැලුවේ යටැසිනි. සිනා වෙන්නට මට අමතක වී ගියේ ය. නැවතත් අවන්ත අයියාගේ නෙත් මවෙත යොමු විය.

"ඒකනෙ නේද හංසි...? හැබැයි හංසි එදා කැන්ඩි යද්දිම අපි දැනගත්ත නේද ගොනා හැරෙන්නෙ කැඹිලි පැලේට තමයි කියල..."

"ගොනා...? කාටද උඹ ගොනා කිව්වෙ...?"

"ආ... කැන්ඩි යද්දි නෙවෙයි. එනපොට හොඳ නෑ කෙල්ලව ගෙට ගන්න වෙනව කියල මට තේරුනෙ අපේ ගෙදර පාටි එකේදි..."

"කොහොමහරි කමක්නෑ ඉක්මනට අපිට හන්තානෙ යන්න පුළුවං වෙනවනං..."

"ඉතිං මච්චර අමාරුවක්යැ... පලයල්ලකො."

"නෑ ඉතිං පව්නෙ... උඹවත් අරගෙනම යන්නයි අපි මේ බල බල ඉන්නෙ..."

පෙරත්තය අවසාන වූයේ බිල ගෙවීම සඳහා සදෙව් අයියාම නැඟිට යාමෙනි.

"පාටි එකක් කම්ප්ලීට් වෙන්නෙ ඒකෙ අයිතිකාරයම බිල් එක පේ කළහම. නේ හංසි...?"

"හ්ම්..."

අවන්ත අයියාගේ සේම හංසිගේ ද ඇස් මා විනිවිදලමින් තිබිණ. මම ඔවුන් දෙදෙනාගෙන් එක්කෙනෙක් දෙසවත් නොබලා බිම බලාගෙන සිටියෙමි. සදෙව් අයියා යළි ආවේ පිටතට ගෙන යාම සඳහා කෑම පැකට් කිහිපයක් ද ගෙන ය.

"ආ... මේ මොකට ද මේ...?"

හංසි ඒවා දැක පුදුම වූවා ය.

"ආ... අම්මට අද රෑට උයන්න එපා කියන්න."

සදෙව් අයියා බෑග් එක පෑවේ මවෙත ය. උගුර කට වියළී

යනවා මට දැනිණ. නිවන්ත අයියා බොරුවට කැස්සේ ය. මම මොනවා කරන්නදැයි නොදන අසරණව සිටියෙමි. තවමත් මවෙත දිගු කරගෙන සිටින කෑම පාර්සල් සහිත බෑග් එක සඳෙව් අයියාගෙන් ගෙන නංගි මගේ අතෙහි තැබුවා ය. අමන්ත අයියා අසුනෙන් නැගිට්ටේ ය.

"ආර්යා... එහෙමනං ඉක්මනට හත්තාගෙන යන්න ලැබෙවා කියල ප්‍රාර්ථනා කරනව හොඳේ."

සමුගන්නට මොහොතකට පෙර අවන්ත අයියා කීවේ ය. මම අමාරුවෙන් මඳහසක් නගා සිටිමි. අවන්තගේ රියත් සඳෙව්ගේ රියත් මංසන්ධියක දී දෙපසට හැරී මාර්ග දෙකක ඇදී යන ලදී. අපේ ගේ ළඟට එනතුරුත් ඉන්පසු අප අතර ලොකු කතා බහක් සිදු නොවී ය.

හෝටල් කෑමත්, අලුත් ඇඳුමුත් දුක නංගි උද්දාමයට පත් වූවා ය.

"ෂෝක් ඇඳුං අක්කෙ... නියමයි."

"ෂෝක් වුනාට කමක් නෑ. උඹ එහෙම මය ඇඳුං ඇඳල පට්ට ගහන්නෑ පොඩි එකියෙ. අක්කට බෑ ඇඳුං ගන්න ආයෙත් ණය වෙන්න."

අම්මා කල් ඇතිවම නංගිට අනතුරු ඇඟවූවා ය.

"අපෝ මෙයාලගෙ ගෑස්. මට මින්නැති කෙහෙල්මලක් නෑ."

නංගි ද එකවෙක කීවා ය. මම ඒ රාත්‍රියේම යාබද නිවසක ඇඳුම් මසන්නියක වෙත ගොස් සාරි හැට්ටයක් මස්සවා ගතිමි.

සැන්දෑවේ මුහුණ දෙන්නට වූ සිදුවීම්වල රසවත් කමත්, හෙට අවතීර්ණ වන අලුත් රැකියාව ගැන තිගැස්මත් සිහිවිලි කැලතූ නිසා, අලුයම් යාමය වන තෙක් මවෙත නින්දක් ආවේම නැති තරම්.



# 10

අත් බෝරිච්චි හැට්ටයට මම මසරිය ඇන්දෙමි. කොණ්ඩය ගෙල මුලට බඳින්දී අම්මා ආගොවෙන් වගේ මදෙස බලා සිටියා ය.

"පොඩි පුතේ... උඹට අර මහත්තය කෑම දීපු මාලෙ අක්කට දීපංකො දාං යන්න. අක්කගෙ කර පාලුයිනෙ."

"අනේ එපා නෑ අම්මෙ. ඒක නංගිගෙ වෙන් එකනෙ. මට පස්සෙ හෙමිහිට එකක් ගන්න බැරියැ."

"නෑ මං කිව්වෙ කර පාළුවට හිඟිං නිසා. තියාගන්නම ගන්නව නෙවෙයිනෙ."

"ඒ වුනාට එපා."

"ආ... දාගෙන යනවා."

ඇඳුම් දමන කාඩ්බෝඩ් පෙට්ටිය ඇද නංගි වෙන් එක මගේ මිට මෙළවූවා ය.

"කොහොමටත් මට ඉස්කෝලෙට වෙන් දාන්න දෙන්නැනෙ."

රන් දම්වැල මගේ ගෙල ලූයේත් නංගි ය. අම්මා කිරිබතකුත් පිස තිබිණ.

"අක්ක දහට මය ජොබ් එකට යන්නකො. තිලක් අයිය

දිනුවොත් අත්තට හොඳ ජොබ් එකක් දෙන්න මට පොරොන්දු වෙලයි ඉන්නෙ."

මල්ලී කීවේ ය. ඡන්ද පොරොන්දු ගැන විශ්වාස කරන මිනිසුන් තවමත් විරල නැත. මල්ලිලාත් ඒ කණ්ඩායමට අයත් ය. මා කිසිත් නොකියා සිටියේ ඔහුට එකඟ වූ නිසා නොව ඔහුගේ හිත රිදවන්නට හිමි නොසැමැත්තට යි.

"අර රොෂාන් මහත්තයව කසාද බඳින්න කැමැත්ත දුන්නනං ඔය රස්සාවල් ගානෙ හිහිං දුක් විඳින්න ඕන නැනෙ. එහෙනං සැපට කාල ඇඳල ඉන්නව. කොහෙද ඉතිං... පවට පිං දෙන්නයැ."

නංගියා මට ඇහෙන්නට කීවේ ය. මම ඒක නිහඬවම උන්නෙමි. කවුරුවත් හිතන විදිහ වෙනස් කරන්නට පුළුවන් කමක් අපට නැත. තමුන් අප ක්‍රියාත්මක විය යුත්තේ අපේම වූ දර්ශනයකට අනුව යි.

මත් එක්ක යන්න ඉන්න කියද්දීත් නංගි තනිව ඉස්සර වී පාසල් ගියා ය. ඒ හින්දා මට තනිවම බස් පාර තෙක් ඇවිද යන්නට සිදු විය. තනිකමක් මට නැත. මේ උදේ පාන්දර රොෂාන් හමු වී කතාවක් ඇති වුවහොත් දවසම මුස්පේන්තු වේවියි බියක් පමණි මට ඇත්තේ. මම හිතට දිරි ගෙන බස් නැවතුම තෙක් ගියෙමි. නංගී පේන මානයකවත් සිටියේ නැත. ඇය පාසල් ළමයි රංචුවට වැටී කල්ලි ගැසී යන්නට ඇත. මම ඈත එන බස් රථ දෙසට නෙතු යොමා ගතිමි.

සිය ඝණතක් විය ගලා තව අතරේ එක රථයක හෝන් හඬක් විශේෂිත වන්නේ නැත. අනිත් එක හෝන් කොට මට කතා කරන්නට කෙනෙක් වෙතැයි සිහිවිල්ලකින් මා සිටියේත් නැත.

"ළමයො... මය ළමයට නේද අර කතා කරන්නෙ...?"

බස් නැවතුමේ සිටි පිරිමි කෙනෙක් මට ඇඟිල්ලෙන් ද ඇන කීවේ ය. තිගැස්සී හිහින් මම බැලුවෙමි. සඳෙව් අයියා රිය නවතාගෙන බලා සිටියේ ය. ඔහු දුටු සැනෙන් මගේ දෙපා



මොනතරම් ඉක්මක් වූයේ ද කියා මට පවා සිතාගත නොහැකි ය.

"සඳෙව් අයිය..."

"ගුඩ් මෝනිං මැඩම්."

"ගුඩ් මෝනිං. අයිය මේ කොහෙ යන ගමං ද...?"

"නගින්නකො. මං ඔයාව ඩ්‍රොප් කරන්නං."

මට පැකිළිය නොහැකි ය. අද මා මේ ඇඳගෙන සිටින වස්ත්‍රය පවා මහත් දයාවකින් ඔහු විසින් අරගෙන දෙන ලද්දකි. ඉතින් කුමටනම් මා ආඩම්බර පානවා ද...? මම රියට නැගගතිමි.

"හරි ලස්සනයි ආර්යා. මට මෙහෙමම රෙජිස්ට්‍රාර් කෙනෙක් ළඟට එක්කගෙන ගිහිං ඔයාව මගේම කරගන්න හිතෙනව."

ඒ කොහොම හැඟීමක් ද කියා මා කොහොම ඔබට පහදා කියන්න ද...? මගේ ගැහැනුකම් ස්නේහයෙන් හිරිවැටී ගොස් තිබිණ. මට ඕනෑ වූයේ ඒ සියල් ප්‍රකම්පනයන් පරයා නැඟී සිටින්නට ය.

"සඳෙව් අයිය මේ කොහෙ යන ගමං ද...?"

"වෙන කොහෙ යන්න ද...? ඔයාව පික් කරන්න ආවෙ."

ආයෙත් අප පුළිපුළං වැනි හැඟීම් සමුදාය මා කළඹවාලී ය.

"ඇයි - විශ්වාස කරන්නැද්ද...?"

විශ්වාස නොකරන්නට කාරණා කිම...? වෙන මොනවා නැතත් සඳෙව් බස්නායකගේ ආදරය විශ්වාස කරන්නට බැරිකමක් මට නැත. ඔහුගේ ආදරය පිළිගන්නට පුළුවන්කමක් ලෝකය මට දී නැතිවා පමණි.

"රීගෙ මං ඇඳුංවලට පේ කළාට ඔයා මාත් එක්ක තරහ ද...? මං එහෙම කළේ... ඔයාව අසරණියක් ගානට දාන්න නෙවෙයි ආර්යා. ආදරේ හින්දා. වැරදියටනං හිතන්න එපා."

මට කියන්නට දෙයක් නැත. ඔහු ප්‍රශ්න අසා ඔහුම පිළිතුරු දී ඇති හින්දා මට කියන්නට දෙයක් නැත.

"අවන්තයගෙ පිස්සු ජෝක් වලටත් ඔයා අප්සට් වෙලා නේද හිටියෙ...? ගණං ගන්නෙපා."

"මට කිසි දෙයක් හිතාගන්න බෑ. සඳෙව් අයිය... හංසියි අවන්තයියයි දන්නව ද...?"

අසන්නට ගිය ප්‍රශ්නය අසා හමාර කරන්නට තරම් මට හයියක් වූයේ නැත. සඳෙව්ගේ තොල් කොනක් සිනාවකට ඇදුණේ ය. ඒ සිනහව ළඟ මං වශී වන්නට ඇත.

"මොනාද ඒගොල්ලො දන්නව ද අහන්නෙ...?"

"ඒගොල්ලො... ඔයා..."

"ඇයි මං...?"

ඔහුට උත්තරයක් දෙන්න නොව ඔහුගෙන් ප්‍රශ්නය අසාගන්නටවත් බැරිව මම ලත වීමි.

"මොකද්ද ඉතිං... මං...? ම්...?"

සඳෙව් අයියා ඔය හදන්නේ ගිලගෙන හිඳින වචනය මගේ මුවින්ම පිට කර ගන්නටයි.

"මොකද්ද ළමයො...?"

"මේ... මේ..."

සඳෙව් අයියා දිගු සුසුමක් අත්හළේ ය. ඊළඟට මුදු ලෙස මගේ අතක් පිරිමැද්දේ ය. මම හැඟීම් දැනීම් නැති ප්ලාස්ටික් බෝනික්කියක් වගේ මන් සිටියෙමි.

"ඔව් ආර්යා. මං ඔයාට ආදරෙයි කියලා ඒගොල්ලො දන්නව."

"හංසි...?"



මගේ ඇස් බියපත්ව තිබිණ. සඳෙව් අයියා හඬ නගා හිනැහිණ.

"හංසිට එච්චර බය ද...?"

"අනේ සඳෙව් අයියා."

"මං ඔයාට ආදරෙයි කියල විතරක් නෙවෙයි, ඔයා මට ආදරෙයි කියලත් හංසි දන්නවා. මේකට... නංගිගෙ අකමැත්තක් නෑ."

උගුරකට වියළී ගිහින් තිබිණ. මා කෙළ බිඳක් ගිලගත්තේ අමාරුවෙනි.

"වෙන දෙයක් වෙයිනෙ. අපි ඒවට ෆේස් කරමු."

සඳෙව් අයියා මාව සිය සිරුර වෙත තැඹුරු කර ගත්තේ ය. මම ඉතාමත්ම හෙමිහිට ඔහුගේ අත්ගොබයක කම්මුල තබා ගතිමි. එහෙමම පහත් වී ඔහු මගේ හිස් මුදුන සිප ගත්තේ ය.

"මං දැං හංසිට මොනා ද කියන්නෙ...?"

මා ඇහුවේ සඳෙව්ගෙන් නොව මගෙන්ම සේ ය. ඒ තරමටම හෙමිහිට ය.

"හංසිට කියන්න ඉස්සෙල්ල මට කියන්නකො."

සඳෙව්ගේ දෑස්වල සිනාවක් විය. මං ඒ සිනහව දුටුවේ ඔහුගේ අත් ගොබයේ මූණ ඔබාගෙන සිටිමින්ම, නෙතු ඔසවා බලද්දී ය.

"මොනාද...?"

"මට ආදරෙයි කියල..."

මම මගේ දෑස් පියන් ඔහුගේම උරහිසෙහි සඟවා ගතිමි. දුන් හැඟුවට සඳෙව් ඔස්නායක ඒ ඇස්වල තිබූ ආදරය දකින්නට ඇත්තේ මීට පෙර ය. ඔහු දිගින් දිගටම මා හඹා එන්නට ඇත්තේ ඒ ඇත්තම ඇත්ත ආදරය බව වටහාගත් නිසාම විය යුතුයි.

"කටිං නොකිව්වට කමක් නෑ. ඇස්වලින් මට කියල තියෙනවනෙ."

මා ඒ උණුසුමෙන් මිදුනේ ආත්ම ගණනකටවත් ඔහුගෙන් මිදෙන්නට බැරි බැඳීමක් ඇති කරගෙනයි. ඒ වුනත් කිසියම් පශ්චාත්තාපයක් මවෙත විය. දමනය කරගෙන සිටි මගේ ආත්මය ඒ මොහොතකට පාලනය කර ගන්නට මට බැරි විය. මම දැඩිව හිටියානම් සදෙව් අයියාට ඕනෑ විදිහට මේ දේවල් සිදු වන්නට ඉඩක් නොමැත. දැන් ඉතින් ඉදිරියේ දී කවරක් කෙසේ කළ යුතුදැයි සිතිය යුතු ය. සදෙව් බිස්නායකගේ දෙමාපියන් මාව සිය ලේලිය කරගන්නට කොහොමටවත් එකඟ නොවනු ඇත. එසේ නම් අපේ ඇසුරේ අරුත කුමක් ද...? මේ ඇසුරෙහි අවසානය කුමක් ද...?

මම ඒ ප්‍රශ්නවලට උත්තර හොයන්නට නොවෙහෙසුනෙමි. දැන් ඉතින් මා මගෙන් කුමන ප්‍රශ්නය ඇසුවත් පලක් නැත. නොසිදු විය යුතු දේ සිදු වී හමාරව තිබේ. නහයට උඩින් වතුර ගියාට පස්සේ හිසට උඩින් ගියත් කම් නැත.

"ආර්යා වගේ ජලසන්ධි ළමයෙක්ව එමනනට හොයාගන්න මං කොච්චර මහන්සි වුණා ද...?"

අලුත් පදවියෙහි කටයුතුවල මා උද්‍යෝගයෙන් නිරත වෙද්දී ආයතන ප්‍රධානී සල්කාලු මහතා තිබේ ය. සැබැවින් ම මා ඒ තරමටම ප්‍රබෝධයෙන් හිටියේ අලුත් පදවිය නිසා ද...? නැත්නම් උදේ පාන්දරම ලැබුණු සදෙව්ගේ ප්‍රේමාලිංගනය නිසා ද...? මම නොදනිමි.

හැන්දෑවේ මා බස් එකෙන් බහිනකොටම රොෂාන් එතැන විය.

"ආර්යා මට මිගෙල්ලන්ගෙ තාත්ත කිව්ව අලුත් ජොබ් එකකට ගියා කියල."

සිනහ කටකින් රොෂාන් මවෙත ලං විය. එසේ නම් ඔහු මේ මා එන බව දන මග රැකගෙන සිටියා ද...?



"ඔසරියට ආර්යා හරි හැඩයිනෙ."

මගේ බැල්ම රැවුමක් වන්නට ඇත.

"ලස්සනයි කිව්වහම මොන ගැනි ද අම්මපා රවන්නෙ...?"

රොෂාන්ගේ කතාවටත්, ඔහු එය කී තාලයටත් මට සිනා නැගෙන්නට ආ තරම්. නමුත් මම ඒ සිනහව ගිල ගතිමි. යන්තම් සිනාවක් පෙන්වනවා කියන්නේ රොෂාන්ලාට ඔළුව උඩට නගින්නට ඉණිමඟක් තියනවා වැනි වැඩකි.

"ආර්යා නවත්තං මට බල බල ඉන්න බෑ. ඇයි අප්ප මේ බලාගෙන ඉඳිල්ලට තේරුමක් තියෙන්න එපැයි. ඉස්කෝලෙ යන කාලෙ ඉඳලනෙ මං ඔයාගෙං වචනයක් ලැබෙනකල් බලං ඉන්නෙ."

ඔහු කියව කියවා මගේ පස්සෙන් එන්නට පටන් ගත්තේ ය. දවල් දවසම වැඩ කර, බස් එකේ තෙරපිගෙන එන කෙනෙකුට මය වගේ කනිපින්දම් කියාගෙන නාහෙං අඩාගෙන එන කෙනෙක්ව වහ කදුරු වගේ මිස වෙන විදිහකට දැනෙන්නට පුළුවන් ද...?

"අනේ මේ රොෂාන්, මං කියල නැතෙ මං වචනයක් දෙනකල් ඔයාට බලං ඉන්න කියල. අනික් එක, කල්ප හතක් බලං හිටියත් ඔයා හිතං ඉන්න වචනෙනං මගෙං හම්බවෙන එකක් නෑ."

මම කැත්තට පොල්ල වගේ කතා කළෙමි. එහෙම කතා කරන්නට වෙනදානම් මට ශක්තියක් තිබුණේ නැත. රොෂාන්ට ඔගේ අඩිය ඉක්මන් කර ගනු මිස, වචනයක්වත් කතා නොකර මගෑරීනු මිස මෙහෙම කෙලින් කතා කරන්නට මා එඩිතර වූයේ නැත. අද ඒ හයිය කොහෙන් ලැබිණි ද...? මගේ ආත්ම විශ්වාසයට අලුගු තැලුවේ අලුතෙන්ම ලද රැකියාව ද...? නැත්නම් සදෙව් බිස්නායක ද...? සමහර විට ඒ දෙකෙහිම එකතුවක් වන්නට ඇතැයි මම තීරණයකට ආවෙමි.

"ඔච්චර නපුරු විදිහට කතා කරන්නෙපා ආර්යා. මොකද ඉතිං... ගමේ නපුරු ගමේ කාක්කන්ට නමයිනෙ. මොකද වෙන ගමක කාක්කන්ට අපේ නපුරු අරං යන්න අපි ඉඩ දෙන්නෙ නැනෙ."

"මේ රොශෙන්, ඔයා කාක්කෙක් ද කුකුළෙක් ද කියන්න මං දන්නෑ. හැබැයි මම්නං ඔයා හිතන විදිහට කප්පක් නෙවෙයි."

වේගවත්ව කියා දමූ මම ගමන ඉක්මන් කළෙමි. අදහාගත නොහැකිව වගේ රොශෙන් මොහොතක් මදෙස බලා සිටියේ ය. සිය නෙත් මානයෙන් මා ඉදිරියට ඇදෙත් දී ඔහුට මහා සිහිය ලැබෙන්නට ඇත.

"ආ... එහෙම ද නංගි... හරි හරි... බලමුකො... එහෙනං කවුද දිනන්නෙ කියල."

මග නැවතීමෙනම ඔහු කෑගැසුවේ ය. මම හැරී බලන්නේවත් නැතිව ඇවිද ගියෙමි. දැන් මටත් හයියක් තිබේ...! දෙපයින් නැගී සිටින්නට මගේම කියා හයියක් තිබේ...!

ඒ සැන්දෑව ඊට පෙර අපේ ගෙදර තිබී නැතිම විදිහේ සැන්දෑවකි. අම්මා කෑම පිසුවේ මගෙන් රැකියාවේ විස්තර ගැන අසමිනි. මම පළා මිට අසුලමින් හෝ පොල් බෑය ගාමින් හෝ විශේෂ සිදුවීම් අම්මා එක්ක කීවෙමි. නංගී ද බංකුවක හිඳ නොයෙකුත් දේ ගැන ඇසුවා ය.

"පොලිසියෙං වගේ ප්‍රශ්න අහ අහ ඉන්නෙ අක්ක අතිං ඔය පොල් බෑය අරගෙන කාපංකො සිසිසි. අක්ක උදේ ඉඳලම නැහිල නැහිලනෙ ඇවිත් ඉන්නෙ."

නංගි අතක් නොලවා වැඩක් නොකරද්දී අම්මා මතක් කළා ය.

"කමක් නෑ අම්මේ මට පුළුවං."

මා එහෙම කීවේ මෙතැන දැන් පවතින සන්තුෂ්ටිය නැති වෙනවා දකින්නට හිතේ තිබුණ නොකැමැත්තටයි.



"මොකද්ද අක්කට ඔය තරං තියෙන අමාරුව...? මොකෝ එයා උදේ ඉඳල මුට්ට කරගහල ආවයැ."

නංගී ගත් කටටම කීවා ය. අම්මා ඇය දෙස රවා බලනු මම දුටුමි. නමුත් ඒ රැවුම දකින්නට නංගී අම්මා දෙස බැලුවේ නැත. සේන්තියක් හිතට දැනුණත් මම කරබා ගතිමි.

ආගන්තුක සතුටක්වත් අපිට උරුම නැත. තාත්තාගේ බීමත් කෑකොස්සම කඩුල්ල දෙසින් ඇසිණ.

"ඒ...හෙම කොහොමද කරන්නෙ...? එහෙනං ඉතිං... එහෙනං ඉතිං... උන්ට ගිය රට... උන් දං වැඩ කරන්න ඕනෙ මට ඕනෙ විදිහට. මට ඕනෙ විදිහට."

අදත් කා සමග හෝ ඔහු පටලැවිල්ලක් ඇති කරගන්නට ඇත. තාත්තාගේ පටලැවිලි වචනයෙන් විතරය. මත් පැන් බිඳක් තොල ගාගත් කල ඔහු චණ්ඩියෙක් වෙයි. නමුත් කටින් පිම්බත් තමන්ව විසිවී වැටෙනු ඇතැයි තාත්තා නොදනියි. නොසිතයි.

"මූං වැඩ කරන්නෙ... මං... මලා කියල හිතල ද දන්නෑ. ඈයි යකෝ... මං මැරිලා නැනෙ තාම..."

"මන්න අදත් ජාතිය අමතන්න හදන්නෙ."

නංගී සමච්චල් සිනාවකින් කීවා ය. අම්මා කට හෙළෙව්වේවත් නැත. ඇය පවී ය. එක පැත්තකින් දරුවන් ය. එක පැත්තකින් කොපමණ වැරදි කරනවා වුනත් ස්වාමි පුරුෂයා ය. දරුවන් එක්ක කියා වුව, විසි වසරක් තිස්සේ එක වහලක් යට ජීවත් වෙන සැමියාට දොසක් කියන්නට ඇයට හිත හදාගත නොහැකිවා වන්නට පුළුවන.

"මං උංගෙ තාත්තා. මං මොකාද...? තාත්තා..."

අපි තිදෙනා මූණෙන් මූණ බලා ගතිමු. එහෙනම් අද අඩව්ව පිට කෙනෙක් අරබයා නොව අප තිදෙනා අරබයා ය. නමුත් ප්‍රශ්නයට හේතුව කවුද - කුමක් ද කියා අප තිදෙනාම දැන නොසිටි සෙයකි මූණුවලින් පෙනුනේ.

"ලොකු එකියේ... ලොකු එකියේ..."

ඇමතුම කෙලින්ම මට ය. වෙනදා මට කතා කරද්දී තාත්තාගේ එක මොළොක් බව වෙනුවට හඬෙහි තැවරී තිබුණේ නොරිස්සුමක් වගේ දෙයකි. මම තරමක් නැති ගතිමි. දනුවත්වනාම් මා තාත්තාට වරදක් කර නැත.

"ලොකු පුතේ හිහිං බලන්නකො. බය වෙන්න එපා ආර්යා."

මා සිටින්නේ බයෙන් යැයි අම්මාගේ හදවතට දනෙන්නට ඇත. ඇ කෙතරම් දරුවන්ගේ සිත්වලට සමීප අම්මා කෙනෙක් ද...? මම හෙමිහිට තාත්තා වෙත සමීප වීමි. වෙනදා මා දකිද්දී විමසිල් සිටිය දී වුව ඔහුගේ මුව අගට එන ආඩම්බරකාර සිනාව අද මම නොදුටිමි.

"ඇයි තාත්තෙ...?"

"ඇයි තාත්තෙ...? ඇයි කියල මගෙන් ද අහන්නෙ...?"

ඔහු පිපිරූ පාරට මා විසි වෙන්නට ගිය තරම්. අම්මාත් නංගීත් පුදුමය රැඳි නෙතින් ඉස්තෝප්පුවට පැමිණියහ.

"මොකද අනේ මයා ලොකු ළමයට කෑගහන්නෙ...? ඒ දරුව මේ උදේ ඉඳල රස්සාවට හිහිං නැතිල ආව විතරයි."

"රස්සාව...? උඹ කියල දීනං විමලාවතියෙ මට මය රස්සාවල් ලොකු නෑ කියල. රස්සාව...! තප...! අපි මෙච්චරකල් කෑවෙ මුං රස්සාවල් කරල හම්බකරල ගෙනාපුවගෙංනෙ."

"මොනාද අනේ මයා මේ කියවන්නෙ...? දරුව මොනා කළාට ද මේ බැරිනත් දෙන්නෙ...?"

"බැරිනං...? විමලාවතියෙ මේ... උඹත් මගෙං මැරුං කන්නෙපා. උඹ තමයි මය ළමයි තුන්දෙනාව කෑවෙ. කෑව උංව. මට ඕන විදිහට හැදුවනං මේව නෑ."

තාත්තාගේ කතාවලට හිතා නොවී බැරි ය. නංගීගේ මූණෙ තිබෙන සමච්චල් සිනාව ගැන මට තේන්ති නොගියේ එනිසාවෙන් වන්නට ඇත.



"හරි දූං මොකද්ද වෙලා තියෙන්නෙ...?"

"වෙලා තියෙන්නෙ ද...? වෙලා තියෙන්නෙ මේකි අර රොෂාන් මහත්තයත් එක්ක හරි හරියට එකට එක කියල. ඒ වගේ මහත්තයෙක්ට එහෙම නොසන්ඩාල විදිහට කතා කරනව ද මං අහන්නෙ...? ඒ මහත්තය තමංගෙ තත්ත්වෙ ගැනවත් හිතන්නෙ නැතුව මේකිව කසාද බඳින්න කැමති වුණාතේද...? ඒ කෙලෙහිගුණේවත් තිබ්බ ද මේකි...?"

කියන්නට දේවල් මගේ තට ළඟට පේළි ගැසී ආවේ ය. තාත්තා ගැන ඒ තරම් තේන්තියක්. ඊට කලින් මගේ හිතේ ඇති වී ඇතැයි මම නොසිතමි. හිතේ තියෙන වේදනාව කෑ ගසා එළියට දමන දැඩි උවමනාවකින් මම දුක් වින්දෙමි. නමුත් බීමතින් හිඳින මිනිසෙකුට තව මිනිසෙකුගේ හැඟීම් කීමෙන් ප්‍රයෝජනයක් නැත. ඔහු ඒවා තේරුම් ගන්නා සූදානමක ද නොසිටී.

"හැමැයි ලොකු එකියෙ මං එකක් කියන්නං. උඹ කසාද බඳින්න ඕනෙ රොෂාන් මහත්තයව. ඒකෙ ආයෙ දෙකක් නෑ."

මම දිවගෙන ගොස් කාමරයේ ඇඳට වැටුණෙමි. සොරොව් විදුනා සේ කඳුළු වැව් වාං දමයි. කොට්ටයේ මූන ඔබාගෙන මම ඉකිළුම මා තුළම සඟවා ගතිමි.

:

වැටත් නියරත් ගොයම් කද්දී තාටනම් ඒ අවනඩුව කියන්න ද...? මහත් අසරණකමත් හා ආත්මානුකම්පාවක් මා පෙළඹීත් තිබිණ. හැමදාමත් මට ඕන වුනේ මේ අපායෙන් ගොඩවෙන්නටයි. කනිව නොගෙ මගේ මුළු පවුලත් එක්කම මේ නරාවලෙන් එතෙරට යන්නටයි. තාත්තා ඒ සඳහා තෝරාගෙන ඇත්තේ මා පිළිකෙව් කරන රොෂාන්වය. ඔවුන්ට මුදල් තිබෙන බැව් සැබව්. නමුත් මුදල් කියන්නේ හැමදේම නොවේ. දනැඋගත්කම හෝ මිනිසත්කම මුදල්වලින් මිල කරන්නට නුපුළුවන් බව තාත්තා දන්නේ නැත.

"ලොකු පුතේ... ආර්යා..."

අම්මා අඳුරේම වින් කබල් ඇඳ මත හිඳගත්තා ය. ඇඳ කිරි

කිරි ගෑවේ ය. ඒ හඬට මා කොතරම් මනාප ද...? අපේ නැතිබැරිකම ගැන අපිත් එක්ක කම්පා වන්නට කවදත් මේ කබල් ඇඳෙහි කිරි - කිරිය අපත් සමග සිටියේ ය.

"අනේ අම්මෙ..."

මම හඩාගෙන අම්මාගේ උකුළෙහි මූණ ඔබා ගතිමි.

"තාත්තා නොවෙයි කවුරු කිව්වත් මා රොෂාන්වනං බඳින්නෙ නෑ අම්මෙ. කවදාවත් නෑ."

"හරි. හරි. මගෙ පුතා දං නාඩා ඉන්නකො. කටේ තොලේ මොනාහරි ගාගන්නගම තාත්තා ඉතිං ඔහොම තමයි කියල ආර්යා දන්නවනෙ. ඒ වුනාට මල්ලිටයි නංගිටයි වගේ නොවෙයි, ආර්යාට තාත්තා හරිම ආදරෙයි. ඒ මනුස්සයගෙ හුස්ම ටික ලොකු පුතා."

අම්මාගේ හඬ බිඳිණි.

"ඉස්සෙල්ලං අපිං වුන දවසෙ ඉඳල හුල්ල හුල්ල ඉඳල මං රස්සාවකට යන්න පටං ගත්ත විතරයි. ඇයි අම්මෙ තාත්තා මට සැනසිල්ලෙ ජීවත්වෙන්න ඉඩ දෙන්නෙ නැත්තෙ...?"

මා ඊළියට දම්මේ මගේ අවංක හද දුක ය. අම්මා කිසිත් කීවේ නැත. තවත් ටික වෙලාවක් අඳුරට වී උන් අම්මා සුසුමක් හෙළමින් නැඟිට ගත්තා ය.

"මගෙනමම නින්ද යයි. මත් ටිකක් කාල නිදාගනිං පුතේ."

හිතේ හින්දර ඇවිලෙනකොට බඩේ ගින්දර යටපත් වෙයි. අප හුගක් දවස්වල සිටියේ හිතේ ගින්නෙනි. ඒ නිසාම බඩගින්න ඒ තරම් ප්‍රශ්නයක් නොවී ය. බඩගින්නක් දැනුණානම් වේල් පිටින් අප බඩගින්නේ සිටි තරමට කුසගිනි උහුලා ගන්නට නොහැකි වන්නේම ය.

"තාත්තා කියනව වගේ නමුසෙනං හරිම මෝඩයෙක් තමයි." කියාගෙන නංගී කාමරයට ආවා ය. 'ඇයි...?' කියන ප්‍රශ්නය මගේ සිතේ ඇති විය. නමුත් මුවින් ඒ ප්‍රශ්නය පිට කරන්නට තරම්



උනන්දුවක් මට වූයේ නැත. නමුදු ඒ ප්‍රශ්නයට නංගීම උත්තර දුන්නා ය.

"ඇයි හලෝ රොෂාන් අයියා නිකං රිතික් රෝෂන් වගේ ලස්සනයිනෙ. ඊටත් වඩා සල්ලි තියෙන මිනිස්සු. මං එහෙමනං පැනපු ගමං හා කියන්නෙ."

"නංගි මේ. ඔයා පැහෙන්නැතුව ඉන්න. ඔයා තාම පොඩි ළමයෙක්. මේව ගැන කතා කරන්න තරං ඔයා මොනාද දන්නෙ."

මම තරමක් තදින් නංගීට අවධාරණය කළෙමි. ඈගේ මුවට ආවේ දත් දත් මා නිතර දකින සමච්චල් සිනහව ය.

අපට අසමිට දිග හැර වියදම් කරන්නට මුදල් නැති බව ඇත්ත ය. අප කනවාට වඩා නොකා හිටින වේල් ගණන වැඩි බව ඇත්ත ය. නමුත් මුදල් කියන්නේ හැමදේම නොවේ. මුළු ජීවිතයම නොවේ. නංගිලාත් ඒ බව තේරුම් අරගෙන ජීවිතයට මූණ දෙනවානම් හොඳ ය. නැත්නම් ඔවුන් ලොකු අමාරුවක වැටෙනු ඇත.

තාත්තා මට කැගසා කිවුණේ බීමතින්ම නොවන බව මා තේරුම් ගත්තේ පසුවදා උදේ ඔහු මා මගහැරි ආකාරයෙනි. අලුත් වේදනාවකින් මා දවෙන්නට ගත්තේ ය. දෙමාපියන් දරුවන්ගේ යහපත පතන බව මා නොදන්නාවා නොවේ. තමන්ට වඩා ඉහළ තැනකට දරුවන් දීග දෙන්නට ඔවුන් වෙහෙසෙන බවත් මා නොදන්නාවා නොවේ. නමුත් සෙල්ලක්කාර සල්ලාලයින්ට දූවරු දීග දෙන්නට කැමති පියවරු සිටිත්ද...? තාත්තා මෙහෙම කරන්නේ රොෂාන් විසින් අසමිට මොළවනු ලබන රුපියල් සියය හෝ දෙසීය නිසා ය. දැඩි කලකිරීමකින් මම අප්‍රාණික වීමි.

අම්මා උදේ තාත්තාගේ ක්‍රියා පිළිවෙල ගැන කිසිත් කීවේ නැත. මට ඒ ගැන තේත්පියක් දැනුණත්, අම්මාගේ අසරණකම ගැන තේත්පි ගත යුතු නැතැයි මම ඊළඟට සිතුවෙමි. හැම පැත්තෙන්ම තැළෙන්නේ මා ය. හැම කෙනෙක්ගේම හිත් රිදුම් නැති කරන්නට ගිහින් හිත රිදුවා ගන්නට සිදුව ඇත්තේ මට ය.

# 11

වී ජීවිතයේ ලස්සනම දවස් ටික කියා මම සිතමි. ජීවිත වසන්තය කියන්නේ එයට විය යුතු ය. හැම උදයකම වාගේ සඳෙව් අයියා අපේ ගේ අසල බස් නැවතුමේ දී මාව සිය රියට නංවාගන්නා ලද්දේ ය. එතැන් සිට කාර්යාලය අසල දී රියෙන් බැස යන්නා තෙක් කාලය බෙහෙවින් ආදරණීය විය. නමුත් අළු යට ගින්දර නොනිවුණා නොවේ. හංසිලාගේ ගෙදරින් අපේ ඇසුර ගැන දැනගෙන සිහින සිඳී බිඳී යන දවස ගැන හැම මොහොතකම මම බියේ උන්නෙමි.

"මුහුද හත් ගව්වක් ඈත තියාගෙන මෙයා මෙහෙ දියරෙද්ද අඳින්න හදනව."

සඳෙව් අයියා මගේ බිය ගැන විහිළු කළේ ය.

"හෙට දුක් වෙන්න තියෙනව කියල අද ඉඳලම දුකෙන් ඉන්න එකේ තේරුමක් නෑ ආර්යා. හෙට දුක්වෙන්න තියෙන එකට හෙට මූණ දෙමු. අපි අද දවසෙ සතුටත් නැති කරගන්න ඕන නෑනෙ."

සඳෙව් අයියාගේ අදහස එබඳු විය. ඔවුන්ගේ සමාජ ආර්ථික පසුබිම අනුව ඔවුන් එසේ සිතන එක ගැන පුදුම විය යුතු නොවේ. තවත් දුකකට බිය වෙන්නේ දුකෙහි ඇති නිරස බව හොඳහැටි අත්විඳින අයයි.



කෙසේ වෙතත් හංසි සමග විවෘතව මේ ගැන කතා කරන්නට මට ඕනෑ විය.

"ප්‍රශ්නයක් නෑ. මට කලිං ඔය දෙන්නා යාළුවො දෙන්නනෙ."

සඳෙව් අයියා ද මට විරුද්ධ වූයේ නැත. එහෙයින් දවසක් මම කාර්යාලය නිමවී එහෙමම හංසිලාගේ ගෙදර ගියෙමි.

"අනෙ අම්මේ ලොකු නෝනල වුනාට පස්සෙ අපිට දකින්නවත් නැතෙ."

මා දුටුවනම නයනා ඇන්ටි තෝක්කාඩුවක් කිවා ය.

"අනේ නෑ ඇන්ටි. එන්න විවේකයක් හම්බවුණේ නෑ. ඔෆිස් ගිය අලුත නිසා... සෙනසුරාදාවත් මං නිවාඩුවක් ගත්තෙ නෑ."

"ඒක හොඳයි ආර්යා. නැඟෙන ළමයි එහෙම තමයි වැඩ කරන්න ඕනෙ. කරන දෙයක් අවංකව කරන කෙනෙක්ට වරදින්න විදිහක් නෑ. මං එහෙම කියන්නෙ අත්දැකීමෙංමයි."

ඈ ඒ අන්තිම වචන ටික කියද්දී මගේ ඇස්වල ප්‍රශ්නාර්ථයක් ඇඳෙන්නට ඇත.

"ආර්යාට පුදුම හිතුන නේද ඇයි මං එහෙම කිව්වෙ කියල...?"

මම මදහස පෑවෙමි. නයනා ඇන්ටි ද ලස්සන සිනාවක් පෑවා ය.

"අද මෙහෙම හිටියට අපිත් ජීවිතේ පටං ගත්තෙ හරිම පුංචි තැනකිං. හංසිල එහෙම ඒ ජීවිතේ මොකද්ද කියලවත් දන්නෑ. අද අපි මෙතන හිටියට අපිට මුල අමතක නෑ. ඒකයි මං ආර්යාටත් කියන්නෙ... ඔයා වගේ උගත්, හැදිච්ච දරුවෙක්ට මේ ජීවිතේ අතට ගන්න එක මහ ලොකු දෙයක් නෙවෙයි."

නයනා ඇන්ටී ගැන මහත් ගෞරවයකින් මගේ ළය පිරිණි. ඉහළට නැගගත් කල හිනිමගට පයින් ගසන මිනිසුන් බහුල මේ ලෝකයේ, ඇය වගේ නිරහංකාර මනුෂ්‍යයින් ඇදහිය යුතු ය.

"ආ... මිස් රිසෙප්ෂනිස්ට්... ගොඩක් වෙලා ද ඇවිත්...?"

හංසි පැමිණීයෙන් නයනා ඇන්ටි කතාව නතර කළා ය. සමහර විට අතීතයේ කටුක ජීවිතය ගැන හංසිලා දැනගන්නවාට නයනා ඇන්ටීලාගේ කැමැත්තක් නැතිව වන්නට පුළුවන. මමත් ඉක්මනට මාතෘකාව වෙනස් කොට හංසි වෙතට නැඹුරු වීමි.

"මං මේ ආව විතරයි හංසි. ඇන්ටි මගෙං ඔෆිස් එක ගැන විස්තර කතා කළා."

"දූං ඉතිං ලොකු නෝනා කෙනෙක්නෙ අම්මි. ජේන්නැද්ද දූං ලස්සන. සමහරවිට මේ අපේ ගෙදර එන අන්තිම දවස වෙයි ද දන්නෙත් නෑ."

"අනේ මේ ඉන්න. ඔයාට එහෙම වෙනව ඇති. ඒත් මට නං එහෙම වෙනස් වෙන්න බෑ."

හංසි මගේ ඔසරි පොටින් ඇදගෙන මතු මහලේ ඇගේ කාමරය වෙත පියගැට පෙළ නැංගා ය.

"ඉතිං ඉතිං... කොහෙට ගහගෙන යන ගමන් ද මේ පැත්තට ගොඩවැද්දෙ...? ම්...?"

"මෙහෙටමයි හංසි ආවෙ..."

"ඔන්න ඔන්න ඉතිං ටොම් පචයක් ඇද බෑවා. මෙයාට දූං ඉතිං මෙහෙ එන්න උවමනාවක් නෑ කියල අපි දන්නව."

"ඔන්න කිව්ව කතාවක්. හිතාගෙන ඉන්නෙ රස්සාව හම්බවුණාට පස්සෙ මට අතීත් හැමදේම අමතක වුණා කියල ද...?"

හංසි අඩැසින් බැලුවා ය. කියනවාට වැඩි දෙයක් ඇය නොකියා සිටින බව මට ඇගේ බැල්මෙන්ම හැඳිනගත හැකි විය. මා මේ ගමන ආවේ හංසිට සියල්ල පවසා මගේ හිත නිදහස් කර ගන්නට ය. නමුත් මේ කාරණාව කීවාට පස්සේ කොහෙත්ම මගේ සිතට නිදහසක් නොලැබෙනු ඇත.



"හංසි..."

මම මාතෘකාවට ගොඩවෙන්නට තැනක් සෙව්වෙමි. නමුත් උගුර හිරවී වගේ. වචන ගොළු ගැහිණි.

"මොකද නෙරපබාන්නෙ...?"

"හංසි මං... මං..."

"මොකද...? ටොපියක් හිරවෙලා ද...?"

හංසි විහිළු කෙරුවා ය. ඇගේ විහිලුව මට පහසුවක් නොව තවත් අපහසුවක් දනවන්නට ඇත. නමුත් මම හිතට දිරි ගතිමි.

"මං ආවෙ... ඔයාට දෙයක් කියන්න හංසි. සමහර විට... මේ දේ ඇහුවට පස්සෙ... ඔයා මාව යාළුවෙක් නෙවෙයි හතුරෙක් කියල ඔයාගෙ ජීවිතෙං අත්ඇර කරල දායි කියල මට බයයි. ඒත්... ඒත්..."

හංසි මා දෙස හොඳින් බැලුවේ නැත. ඇය එහෙම කළේ හිතාමතාමයි කියා මම සිතමි.

"ඒත් මට මේ දේ ඔයාගෙං හංගගෙන ඉන්න බෑ හංසි. මේක කිව්වට පස්සෙ ඔයා මට බැනල... මගෙ කම්මුලටත් ගහල මාව මේ ගෙදරිං පන්නල දාන්න. ඒත් කමක් නෑ."

අන්තිම ටික කියාගෙන යද්දී මගේ හඬ බිඳෙන්නට ගත්තේ ය. හංසි යටැසින් මදෙස බැලුවා ය.

"මට ටික කලකට කලිං... සඳෙව් අයිය කිව්ව... එයා... එයා... මට ආදරෙයි කියල..."

හංසි කෂණික බැල්මක් හෙළුවා ය. මට බිය සිතිණි.

"මං එයාට තේරුං කරල දුන්න හංසි. ඒක කෙරෙන දෙයක් නෙවෙයි කියල. මුලදී වගේ මං මෙහෙ එන්නෙත් නැතුව හිටියෙ... සඳෙව් අයියට මාව මගඇරෙන්න. ඒත්... ඒත්... ඒකෙන් වැඩක් වුණේ නෑ හංසි."

මා හිතා මතා හැඬුවා නොවේ. හංසිගේ අනුකම්පාව දිනාගන්නා කපටි අරමුණකින් හැඬුවාත් නොවේ. හැඬීමේ උවමනාවක් මට තිබුණෙත් නොවේ. නමුත් මගේ කම්මුල් දිගේ කඳුළු ගලමින් තිබිණ. ඒවා හුදු ගැහැනුකමට හෝ ආත්මානුකම්පාවට ඉනූ කඳුළු ද කියාත් මම නොදනිමි. මෙතෙක් නොසැලකිල්ලෙන් වගේ සවන් දීගෙන සිටි හංසි මදහසකින් මවෙත ආවා ය.

"ඊයි... ඉතිං මොකද මේ අඬන්නෙ...?"

මහත් ලැජ්ජාවකින් මම දැතින්ම දෙකොපුල් පිසගතිමි.

"අඬන්න දෙයක් සිද්ධ වෙලා නැහෙ පිස්සි. අයියට හිතෙන්න ඇති ඔයාව එයාට මැව් වෙනව කියල. ඉතිං මං මොකට ද ඔයාව අපේ ගෙදරිං එලෝගන්නෙ...? ම්...?"

"හං...සි..."

මට ඇගේ ප්‍රතිචාරය අදහාගත නොහැකි වෙන්නට ඇත.

"ඒ තරමට ඔයා අපේ පවුලට වද්දගන්න වටින්නැති කෙල්ලෙක්නං... අපේ අයිය වගේ කොල්ලෙක් ගෙදර ඉද්දි මං කියටවත් ඔයා වගේ ලස්සන කෙල්ලෙක්ව මෙහෙට එක්කගෙන එයි ද...?"

"මං මගෙ තත්ත්වෙ හොඳටම දන්නව හංසි. මං ඒක සදෙව් අයියටත් තේරුං කරල දෙන්න පුළුවං තරං මහන්සි වුණා."

"හරි හරි. තවත් අපි දෙන්න ඔය ගැන කතා කරල වැඩක් නැහෙ. මං කෙලිංම කියන්නංකො. ඔන්න මං මගෙ නැනා පොඩ්ඩව ආදරෙං පිළිගන්නව."

හංසි මගේ කොපුලක් සිප ගත්තා ය. මට නම් මේ පිළිගැනීම විශ්වාස කරගත නොහැකි තරම් විය. පුංචි සසලවීමක්වත් මට ඇය වෙතින් දකිය නොහැකි විය. සමහරවිට හංසිට මේවාගේ බරක් - පතලක් නොතේරෙනවා විය හැක. ඇයත් සදෙව් අයියා සේම ජීවිතයේ සැහැල්ලුව පමණක් අත්විඳි යුවතියකි. කෙසේ



නමුත් මට යම් අස්වැසිල්ලක් දැනිණ. එතෙක් හිතේ පැටවී තිබූ බරකින් නිදහස් වූවා සේ ය.

"දැං ඉතිං හරිනෙ. ඒකත් ඉවරනෙ."

සදෙව් අයියා මට සමච්චල් කළේ ය. ඒ සිදුවීම එසේ නිමා වුවත් සියල්ල ඒ ආකාරයෙන් සමාප්ත නොවන බව මම හොඳටම දැනගෙන සිටියෙමි.

★ ★ ★

බලා සිටිය දී වගේ නංගි උසින් මහතින් වැඩුණා ය. වැඩිවිය පැමිණ ඒ හැට් තලත් යන්නටත් මත්තෙන් ඇය මනා පෙනුමැති තරුණියකගේ තත්ත්වය ගෙන සිටියා ය. ඇගේ කල්ක්‍රියාවෙහිත් මම කිසියම් වෙනසක් දුටිමි. කවදාවත් මට තිබී නැති විදිහේ දාංගලයක් නංගිට විය. විශේෂයෙන්ම පිරිමි පුළුටක් පේන්නට හිටියොත් ඇයට අමුතු දාංගලයක් නැගේ. පිස්සුවෙන් වගේ හැසිරේ. දෙතුන් විටක් මේ ගැන කෝප ගත්තත් මම නංගිට කිසිත් කියන්නට නොගියෙමි.

"පොඩි කෙල්ලො ඔහොම තමයි ආර්යා. ටික දවසක් යනකොට ඔවා ඇරිලා යයි."

මා ඒ ගැන සදෙව්ට කී විට ඔහු කීවේ එවැනි කතාවකි.

"ඒ වුනාට සදෙව් අයියෙ... අපිත් ඔය වයස පහු කළානෙ. අපිට ඔහොම වීසයක් තිබුණෙ නැහෙ."

"හැමකෙනාම එක වගේ නැහෙ ආර්යා. ඔයාට ඕනෙනං ඉතිං නංගිට අවවාදයක් දෙන්න. ඒත් මං හිතන්නෑ ඔයා කියන දෙයක් පිළිගන්න සූදානමක එයා ඉන්නවයි කියල."

"මං මොනා කිව්වත් එයා හිතන්නෙ එයා ගැන ඊරිසියාවෙං මං කියනවයි කියල. ඒකයි සදෙව් අයියෙ මං මේ අමාරුවෙං වුනත් ඉවසගෙන ඉන්නෙ."

මා ඉවසාගෙන හිටියාට, එක දවසක් මල්ලිගේ ඉවසීම නම්

සීමාව ඉක්මවා ගොස් තිබිණ. එදා මනුත් එක්ක තිලක්ගේ ඡන්ද වැඩවලට උදව් කරන තරුණයන් කිහිප දෙනෙක්ම අපේ වත්තේ රොක් වී සිටියහ. ඉරිදාවත් නිසා මාත් හිටියේ ගෙදර ය. මල්ලි සීනි තේ කොළ ගෙනත් දී අම්මාට කියා තරුණයන්ට තේ හදවා ගත්තේ ය. මා හිතන විදිහට ඔවුන් ප්‍රචාරණ සැලසුම් ගැන සාකච්ඡා කරමින් සිටියහ.

නංගී සරුංගලයක් සේ එහා මෙහා පාවෙන අයුරු මම දුටිමි. ඇය විසාවක් ඇඳුම් මාරු කොට අලුත් ඇඳුම් කට්ටලයකින් ද සැරසී කවුළුව වෙත ගියා ය. කවුළුව ළඟටත් - ගෙදරත් - නැවත කවුළුව ළඟටත් - ගෙදරටත්. මේ විකාර හැසිරීම මා කෝප නොගැන්වූවා නොවේ. නමුත් මම නොදක්කා සේ සිටියෙමි. මොනවා හෝ කීවොත් නංගී එන්නේම එල්ලෙන්නට ය. අම්මා නැත්නම් මං ඇඟිලි ගසා සොයා බැලිය යුතු ය. නමුත් අම්මා සිටින එකේ මං ප්‍රශ්න ඇති කර ගන්නට නොයා යුතුයැයි මම සිතුවෙමි.

"දෙන්න මං ගෙනියන්න."

අම්මා තේ කෝප්ප ටික බන්දේසිය මතින් තැබූ සැණෙන් නංගී එය අතට ගන්නට හැදුවා ය. මට මාව පාලනය කරගත නොහැකි වන්නට ඇත.

"නෑ. නෑ. ඔයා යන්න ඕන නෑ ඔය කොල්ලො ගොඩ අස්සෙ. අම්ම මල්ලිට කියන්න තේ ටික ගෙනියන්න කියල."

මගේ විරෝධතාවයට නංගී මෙල්ල වූවා ය. නමුත් ඇය එතැනින් නික්ම ගියේ මා දෙස රවා බලා ගස්සාගෙන ය. මම ගණන් නොගෙන උන්නෙමි. නොදන්නාකමට වුව ඔවුන් අමාරුවේ වැටෙන්නට යද්දී සහෝදරයන් වශයෙන් අප බලාගෙන ඉන්නේ කොහොමද...?

මල්ලි තොවිලය පටන් ගත්තේ ඡන්ද සගයන් නික්ම ගිය පසුව ය. ඔහු කිසි ඇඹිල්ලක් බැලිල්ලක් නැතිව පැනපු ගමන්ම නංගීගේ කෙස් වැටියෙන් අල්ලා ගත්තේ ය.



"අනේ... මේ... මොකද මේ..."

නංගී මල්ලීගේ අත ගසාදමන්නට හැදුවා ය. නමුත් මල්ලීගේ හැඩිදැඩි අත්වල ශක්තිය පරා ද කරනට නංගීට නුපුළුවන.

"අතාරිනවකො..."

"අතඅරින්න...? අතඅරින්න නෙවෙයි මං උඹව අල්ලගන්නයි හිටියෙ..."

"අනේ පුතේ මොකද මේ...?"

අම්මාත් මැද්දට පැන්නා ය.

"අම්මෙ මේ. අම්ම පැත්තකට වෙන්න. අම්මට හදන්න බැරිනං මේකිව මං හරි හදන්නං"

"මාව හදන්න තමුසෙ මගෙ තාත්ත ද...? අත අරිනව..."

"තාත්තා...? අනේ උඹ තාත්ත කියන දේ අහන දුව. දතගතිං, මීට පස්සෙ මගෙ යාළුවො ඉස්සරහට ඇවිත් ඉස්කුරුප්පුව වගේ කැරකෙරන්න ගත්තොත්... බලාගනිං කරන දේ..."

මල්ලී නංගීව තල්ලු කොට දැම්මේ ය.

"මොනා බූරුවෙක් ද මන්දා...?"

ඇය ද කෝපය එළියට දැම්මා ය.

"ලැජ්ජාවෙ බෑ. කවුරුහරි ආවොත් මේකි එනවා නාඩගං ටික පෙන්නන්න."

"අපෝ වැඩේමයි. නාඩගං පෙන්නන්න තරං ලස්සන කොල්ලොනෙ මෙයාගෙ යාළුවො. මා...ර නළුවො..."

නංගී කොහොම මේ විදිහට සමච්චල් කරන්නට ඉගෙන ගත්තා ද කියා නම් මට නොතේරේ. කොහොම වුනත් මල්ලී හෝ ඇගේ හැසිරීම සම්බන්ධයෙන් මැදිහත් වුණ එක හොඳයි කියා මම සිතමි. නැත්නම් ඇය සිතනු ඇත්තේ අප අන්ධයින් - ගොළුවන් - බිහිරන් කියා ය.

"මෙයා තමයි අයියවත් අවුස්සල තියෙන්නෙ. උල්පන්දං දීලා."

නංගී මදෙස රවා බලා කීවේ මල්ලී ගෙයින් දොට්ට බැස ගිය ඉක්බිතිය.

"අනේ මේ. මාවනං ඔවට ගාවගන්න එන්න එපා හරි ද...?"

"ගාවගන්න තමයි. දන්නගෙ මං තේ ටික අරං යන්න හදන කොටත් මෙයා පැනපු හැටි."

"මං කිව්වෙ හොඳක්. පිරිමි ගෙඩක් මැද්දට එහෙම ගියාම ඒ මිනිස්සු හිතන්නෙ අපි කිසි ගාණකට නැතුව හැදිච්ච කෙල්ලො කියල."

"ඔණං පෙන්න පෙන්න ගෙදරට නාකි වෙනවකො එහෙනං."

"පොඩි එකියෙ. කටවහ ගනිං."

අම්මා කතා කළේ හුගක් වෙලා බලා සිටීමෙන් අනතුරුව ය. නංගී මගේ තම්මුලට ගැහුවා සේ මට දැනිණ. මනමාලකම කරනවානම් ඉස්කෝලේ යන කාලේ සිටම මට ඊට අවස්ථාව තිබිණි. නංගී සේ තමේ පාසලට නොව මා ගියේ නගරයේ ජනප්‍රියතම බාලිකාවකට ය. පිරිමි ළමයින් කී දෙනෙක්නම් ඒ කාලේදීත් මගේ ඇසුර පතාගෙන ආවා ද...? නමුත් මට උවමනා වුනේ නිස්කාරණේ නාස්ති වී යන්නට නොවේ. ඉගෙන ගෙන අපේ මුළු පවුලම මේ නරකාදියෙන් ගොඩ ගන්නට ය. නංගිලාට එහෙම හැඟීමක්වත් නැත. ඒ මදිවාට කිසිදු දැනුවත්කමකින් තොරව ඇය මගේ දෙසට ඇඟිල්ල දිගු කරයි.

"පොඩි එකියෙ දං උඹගෙ දාංගලෙයි කටයි දෙකම වැඩියි නොද ද...? මං මේ කට පියාගෙන ඉන්නෙ කොල්ලා අවුස්සන්න බැරිකමට. උඹ උඹගෙ තරමට වැඩ කරපං. මේ ගේ ඇතුළෙ ඉන්න ඔක්කොම එවුං උඹට වැඩියෙ වයසිං වැඩියි."



"වයස විතරක් වැඩි වුනාම මදයි. මොළේ කලලක් නෑ."

ඇත්තමයි මට නංගීව අල්ලාගෙන පහර දීගෙන දීගෙන යන්නට සිතිණි. සිතේ ඇති වූ කෝපය ඒ තරම් ය. එසේනම් නංගී සිතාගෙන ඉන්නේ මේ ගෙදර අනිත් සියලු අය ඇයට වඩා බුද්ධියෙන් අඩු බවයි. මේ සිතිවිලිලත් එක්ක ඇය කොයිතරම් දුරක් යාමට සිතාගෙන සිටිනවා ද...? ඇයට කොයිතරම් දුරක් යා හැකි වනු ඇත්ද...? මම නොදනිමි.

අපේ ගෙදර තත්ත්වය පෙරට වඩා බෙහෙවින් නරක අතට හැරී තිබිණ. ඒ කාලයේ නම් තිබුණේ ආර්ථික ප්‍රශ්න හා තාත්තාගේ බීමත පිළිබඳ ප්‍රශ්න පමණකි. දැන් මා සේම මල්ලී ද ගෙදරට මුදල් උපයා දෙයි. ඒ නිසා ඉස්සර තරම් අපට ආර්ථික ප්‍රශ්න දං නැත. කෙසේ හෝ තුන් වේල කා ඉන්නට පුළුවන්කම ඇති හෙයිනි. නමුත් දැන් අලුත් ප්‍රශ්න උද්ගත වී තිබේ. නංගිගේ හිතුවක්කාරකම එකකි. මා රොෂාන්ව ගණන් නොගැනීම ගැන තාත්තා හැම රැයකම බීමතින් කෑගොස්සන් දැමීම නව එකකි. දේශපාලකයෙකුට සම්බන්ධ වීම නිසා මල්ලී විරුද්ධ පාර්ශ්වික තඩියන් සමඟ බේධ ඇති කර ගැනීම නවත් ප්‍රශ්නයකි. අනිත් ප්‍රශ්නවලටත් වඩා අප බියෙන් සිටියේ මේ ගැනයි.

"කඩේ ළඟ දී තිලක්ගෙ තරනකාරයො ටිකක් මට ඇහෙන්නම කිව්ව තිලක්ට උදව් කරන එවුං එකෙක්වත් ඉතුරු කරන්නෑ කියල."

අම්මා මගේ එක්ක රහසින් වගේ කීවා ය. ඇගේ බොරපැහැ ඇස්වල පෙර කවදාවත් නුවූ බියක් දිළිසෙනවා මට පෙනිණ.

"එහෙම කොහොම ද අම්මෙ. ඕන කෙනෙක්ට අයිතිය තියෙනව තමං කැමති දේශපාලන පක්ෂෙක කැමති කෙනෙක්ට සහයෝගය දෙන්න. මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්නෙ."

"අනේ මං ඔය දේවල්නං දන්නෙ නෑ ආර්යා. මට බය මේ කොල්ලට මුකුත් කරදරයක් වෙයි කියල."

ලංකාවේ දේශපාලනය ගැන එහෙම බයක් ඇති වීම අසාධාරණ හෝ පදනම් රහිත නොවේ. දේශපාලනය ඒ තරමටම මඩ ගොහොරුකි. බොරුවට මැතිවරණ පැවතුනාට, රජයන්නේ භූක්තියමය. විරුද්ධ පක්ෂවල නොව එකම පක්ෂවල අය ද බලය වෙනුවෙන් ගහගන්නවා පමණක්ද නොව මරාගනිති. නමුත් මල්ලීලා සිටින්නේ දේශපාලන පිරමීඩයේ පහළම මට්ටමෙහි ය. ඒ නිසා ඔවුන්ට හානියක් වේතැයි මම නොසිතමි.

"එහෙම මුකුත් වෙන්නෑ අම්මේ. ඒ වුනාට මං කියන්නෙ ඔය එක එකාල පස්සෙ ගිහිං වැඩක් වෙන්නෑ කියලයි. නිකං කාලෙ නාස්ති වෙනව විතරයි."

"ඒකා ඉතිං එහෙම නොයනවනං කුලී වැඩක් තමයිනෙ ලොකු පුතේ කරන්න වෙන්නෙ."

"ඒක තමයි මං මුලදිම කිව්වෙ අඩු ගානෙ විභාගෙ ගන්නකල්වත් ඉස්කෝලෙ යන්න කියල."

මා කතා කළේ තරමක නොරිස්සුමකින් වන්නට ඇත. අම්මා මදෙස බලා හරවා ගත්තා ය. එක අතකට මේ දේවල් ගැන අම්මාට දොස් කියා ඇති වැඩක් නැත. මල්ලීව දිගටම පාසල් දක්කන්නට තරම් හැකියාවක් අසරණ ඇයට තිබුණේ නැත.

"බලමුකො මං මට දන්න කියන කෙනෙක්ටවත් කියල බලන්නං මල්ලිට පොඩිහරි රස්සාවක් හොයාගන්න."

මා එහෙම කීවේ අම්මාව සනසන්නට පමණක්ම නොවේ. එහෙම කළ යුතුයි කියා මට සිතුන බැවිනි. නමුත් එවන් උදව්වක් ගන්නට තරම් මා දන්නා කෙනෙක් නැත. මගේ රැකියාව වුව සොයාගත්තේ කෙතරම් අමාරුවෙන් ද...? සදෙව් අයියාට හෝ මල්ලී ගැන කිව යුතුයැයි මම එවෙලේ තීරණයකට ආවෙමි.

මේ වෙද්දී සදෙව් බස්නායක, බස්නායක හෝල්ඩින්ස් නමින් ක්‍රියාත්මක වූ ඔවුන්ගේ පියාගේ ව්‍යාපාරයට අනුයුක්තව සිටියේ ය. ඒ නිසා පෙරදීට වඩා ඔහු කාර්යබහුල වූයේ ය. සිය ලෝකයෙහි



ඈතට ඈතට ගමන් කරද්දී බොහෝ විට ඔහුට මා අමතක වී අත් හැරී යනු ඇතැයි ඇතැම් විට මට සිතිණ.

"මෙයා එහෙනං බලං ඉන්නෙ මං ඉක්මනටම එයාව අමතක කරල දානවනං. ඒ කියන්නෙ මේක මං බලෙං වගේ තියං ඉන්න බැඳීමක් නේ...?"

මගේ සිතැඟි කී වෙලේ සදෙව් අයියා අවඥාවෙන් ද - නොරිස්සුමෙන් ද කතා කළේ ය.

"එහෙම නෙවෙයි දෙයියො. මට මයා රටක් රාජ්ජෙකටත් වඩා වටිනව. ඒත් එච්චර වටින කුමාරයෙක්ව එයාගෙ දෙමව්පියො මේ මං වගේ හිඟන්නියක්ට දෙයි ද...?"

"මං හිතනව අම්මල මං කැමති දේකට අකමැති වෙන එකක් නෑ කියල."

"දෙමව්පියො කැමතියි තමයි දරුවො සතුටෙං ඉන්නව දකින්න. ඒත් එයාලට එකඟ වෙන්න පුළුවන් දේවලුත් තියෙනව බැරි දේවලුත් තියෙනවනෙ."

"ඔයා හැම තිස්සෙම නෙගටිව් විදිහටමනෙ ආර්යා හිතන්නෙ."

"එහෙමම නෙවෙයි, දෙන්න බැරි දෙයක් ඔයාගෙ අම්මගෙං ඉල්ලල පව් පුරෝගන්න මං බයයි. ඒකයි."

සදෙව් අයියා සුසුමක් හෙළමින් මගේ හිස් මුදුන සිප ගත්තේ ය.

"ඔයා අහිංසකයි. අපිට වරදින එකක් නෑ කියල අපි හිතමු ආර්යා."

මට සැනසීමකට තිබුණේ සදෙව් අයියා විතර ය. දත් දත් ගෙදර ජීවිතය අපායක් සේ ය. තාත්තා නිතරම මාත් එක්ක දැටලෙන්නට බලා සිටියේ ය. සමහර වෙලාවට ඒ කතාවලට කට දමන්නට ගොස් මල්ලී හා තාත්තා අතර ද බහින්බස් වීම ඇති වේ.

"අක්ක රොෂාන්ට කැමති නැත්නං අපි කාටවත් අයිතියක් නැතෙ රොෂාන්ට කැමති වෙන්න කියන්න."

දවසක් තාත්තාගේ කියවිල්ල අසාගෙන ඉන්නා බැරි තැන මල්ලී කීවේ ය.

"ඇයි නැත්තෙ...? මට අයිතියක් තියෙනව. මං එයාගෙ තාත්තා. වෙන කාට නැතත් මට අයිතියක් තියෙනව."

"අයිතිවාසිකං ගැන කතා කරන්න ඕනෙ යුතුකං ඉෂ්ට කරපු මිනිස්සු. තාත්ත මොනාද දරුවො වෙනුවෙං කරල තියෙන්නෙ...? කුලී වැඩ කරල ගන්න කීය හරි කසිප්පු බොන්න වියදං කරල ගෙදර එනව. ඒ ආපු වෙලාවෙ ඉඳලත් ගෙදර මිනිස්සුන්ට කතාක් ඇහිල නිදහසේ නිදාගන්න තිබුණ ද...? නෑ..."

මල්ලී වසර ගණනාවක් තිස්සේ හිතේ පැවති ආවේගය පිටතට දමමින් කතා කළේ ය.

"මොකද්ද යකෝ තෝ කිව්වෙ...?"

තාත්තා චණ්ඩිකම් පෙන්වූයේ පෙරදා රාත්‍රියේ බිව් මත්පැන්වල මත ඉතිරිව තිබූ බැවිනි.

"මං කිව්වෙ තාත්තට ඇහුන දේ තමයි."

"උඹ මේ ගෙදර මහ එකා නෙවෙයි. අන්න ඒක මතක තියාගනිං."

"මහ එකා වුණෙ නැති වුනාට කමක් නෑ. අක්ක රොෂාන්ව බඳින්නෙ නෑ කෑමයි. මාත් ඒකාට කැමති නෑ."

මල්ලි එවර කතා කළේ දවෙන කෝපයෙනි. තාත්තාත් හයිය හත්තිය ඇති මිනිසෙකු සේ නැගී සිටියේ ය.

"අනේ මල්ලි..."

මම මල්ලී වෙත පැන ඔහුව අල්වා ගතිමි.

"දැං මය කතාව නතර කරන්න මල්ලි."



"මූ යකෝ එක එකාගෙ පෝස්ටර් අලවන්න ගිහිං මටත් උගන්නන්න එනවනෙ. බැහැපිය ගොං වස්ස දොට්ට."

"ගොං වස්සා ඉතිං කවුද කියල මං අමුතුවෙං කියන්න ඕන නැතෙ."

"මල්...ලී..."

"පු... තේ..."

"එයාට බොන්න කීයක් හරි මිට මොළවන නිසා තමංගෙ දුවෙක්ව හරි රොෂානයට විකුණන්න හදන්නෙ."

"ඌ නොදයි තමයි යකෝ තොපිට වඩා."

"යං මල්ලි යං අනේ යං."

මම මල්ලීව ඇදගෙන පාර පැත්තට ගියෙමි.

"අනේ මගෙ රත්තරං මල්ලියෙ අපි උඩ බලාගෙන කෙළ ගහන්නෙ නැතුව ඉමු. එයාට ඕනදෙයක් කියවගන්න ඇරල ඔයා සද්ද නැතුව ඉන්න."

"මෙච්චරකල් අපි සද්ද නැතුවනෙ අක්කෙ හිටියෙ. සද්ද නැතුව ඉන්න ඉන්න ගෝනි නැතුව කරේ යන්නමයි එන්නෙ."

"උඹ මේ හතරමායිමේ පස් පාගනව නෙවෙයි මීට පස්සෙ."

තාත්තා වෙරිහන් දී කෑගසනු පාරටත් ඇසිණි. මල්ලි එහෙමම පාරට බැස යන්නට ගියේ ය. ආරවුල නිම වූවාය කියා හිතේ තිබුණ නොසන්සුන් ගතිය ගියේ නැත. කරදර එකක්වත් නිමා වන්නේ නැත. වැඩි වෙවී ගිහට වද දෙනවා පමණකි.

"අනේ මන්දන්නෑ මේ දේවල් කොතනිං කෙළවර වෙයිද කියල. මට බය කොල්ල මේවට පැටලිලා තාත්තාල පුතාල ගුටි ඇනගනී කියලයි."

අම්මා විස්සෝප වූවා ය.

"ඒක තමයි අම්මෙ මාත් මල්ලිට කිව්වෙ මගෙ ප්‍රශ්නවලට සාත්තු එක්ක පැටලෙන්න යන්න එපා කියල..."

"උංටත් ඉතිං සහෝදරකමක් කියල දෙයක් තියෙනවනෙ."

"ඒ වුනත්... අනේ මන්ද..."

"අපි ඔක්කොමල්ලා එකතු වෙලා කොයි ආත්මෙකහරි ලොකු පවක් කරල තියෙනව ලොකු පුතේ. ඒකයි මේ."

අම්මා සතා කළේ හදවත පත්ලේ හිර වී තිබූ සුසුමක් පිටතට ඇද දමමිනි. මටත් අම්මා වාගේම සුසුමක් හෙළිනි. වෙලක් නොහැර සත්හට වත් පන ලැබී තිබිය දී අදත් අප මේ විඳවන්නේ අම්මා කියනවා වගේ පෙර අත්භවයක කළ පවක් නිසා විය යුතු ය.

රොහාන් එක්ක මේ ප්‍රශ්නය විසඳන්නට මම සූදානමින් හිඳිමි. මාව මරා දැමුවත් ඔහුගේ පිරිදු වෙන සූදානමක මම නොසිටිමි. ප්‍රශ්නය විසඳාගන්නට බැරි සාත්තු එක්කයි, ඔහු මා ජාතක කළ පියා ය. අපව උස් මහත් කිරීමේ හෝ ඉගැන්වීමේ වගකීමක් කවදාවත් ඔහු විසින් දරනු නොලැබුවේ වී ද, ඔහු අපගේ පියා ය. පියා හා පුතෙකුට තරග කොට හෝ රණ්ඩු සරුවල් කොට හෝ දිනිය හැකි දෙයක් නොවේ.

★ ★ ★

එවර ප්‍රාදේශීය මැතිවරණයෙන් තිලකරත්න ජයග්‍රහණය කළේ ය. මල්ලිලා හිටියේ නිමහිම නැති සතුටිනි. ජයග්‍රහණයෙන් පසු තිලකරත්න විසින් ආධාර කරනු ලැබූ අයට පිටුපාවියි මාත් සිතා සිටියෙමි. නමුත් ඔහු මල්ලිව නොසලකා හිටියේ නැත.

"තිලක් අයියගෙ බොඩිගාඩ්කමට මාව අරගත්ත. මට හොඳ පඩියකුත් ගෙවනව කිව්ව."

මල්ලි අපත් එක්ක උදම් ඇනුවේ ය. ඔහුට ලැබී තිබෙන රැකියාව ආඩම්බර වෙන්නව තරම් දෙයක් නොවුනත්, මම මල්ලිගේ හිත රිදෙවෙන කිසිත් නොකීවෙමි. ඔහු තමන් යා යුතු



මග තෝරාගෙන හමාර ය. දැන් ඉතින් ඒ මග වෙනස් කළ හැකි හයියක් මට නොමැත්තේ ය. ඔහුගේ බලාපොරොත්තු ඉටු වී තිබෙනවා නම් හා ඔහු සතුටින් සිටිනවා නම් එපමණකි. මම මට හිතෙන හොඳම යෝජනාව අවසාන වශයෙන් කළෙමි.

"මල්ලි පුළුවන්නං තිලක් අයියට කියල වෙන ජොබ් එකක් හොයාගන්න බලන්න. මොකක් හරි ප්‍රයිවට් තැනක හරි කමක් නෑ."

මල්ලි සමච්චල් සිනාවක් හෙළුවේ ය.

"ඔෆිස්වල වැඩ කරන්න මං විභාග පාස් කරල තියෙනව ද අක්කෙ...? මේ ජොබ් එක මට හොඳටම හොඳයි."

තවදුරටත් කියන්නට දෙයක් මට ඉතිරිව තිබේ ද...? මම කරබා ගතිමි.

"ඇයි ලොකු පුතේ...? මල්ලිගෙ රස්සාව හොඳ නැද්ද...?"

මල්ලි ගෙදරින් නික්ම ගිය පසු අම්මා මා විමසුවේ 'බොඩිගාඩ්' යන රැකියාව ගැන ඇයට අදහසක් හෝ අවබෝධයක් නොතිබූ නිසා විය යුතු ය.

"නෑ අම්මෙ මං කියන්නෙ. ස්ථිර රස්සාවක් තියෙනවනං හොඳයි. ඔය මිනිස්සු ඊළඟ ඡන්දෙන් පැරදුනොත් මෙගොල්ලංට රස්සාවක් නෑනෙ."

"හ්ම්. අනේ මන්ද මේ කොල්ලන් දන් නාහෙට අහන්නැනෙ."

මල්ලි දැන් ගෙදෙවින් මුරණ්ඩු ය. ඉස්සර ඔහු වෙත නොතිබූ රළු දරදඬුගති දැන් ඔහුට වේ. සමහර විට ඒවා උරුම කරගන්නට ඇත්තේ ඔහු ඇසුරු කරන සමාජය ඇසුරෙනි. කොහොම වුනත් සිදුවෙන දෙයක් බලාගෙන ඉන්නවා මිස අම්මාට හෝ මට කළ හැකි දෙයක් නොමැත.

## 12

ඊට හවසක මම සඳෙව් අයියාගේ මෝටර් රථයෙන් විත්, අනුරුපාරට හැරෙන තැන කඩපිළ ළඟින් බැස ගතිමි.

"පරිස්සමෙං යන්න. බුදු සරණයි."

රියෙන් බසිමින්ම, රිය දොර අල්වාගෙන මම මිමිණුවෙමි. ඔහු ඇස් වලින් සිනාසුණේ ය. අතැර දා යන්නට බැරි ලෝභකමින් මං රියදොර වසා දමන්නට හැලුවා පමණි. කවුදෝ එය දැඩිව අල්වා ගන්නා බවක් දැනිණ. මා පිටුපස හැරී බලන්නට ඇත්තේ තේරුම් ගත නොහැකිව ය. බෝම්බයක් පිපිරුවා සේ මා තිගැස්සිණ. රියදොර අල්වාගෙන සිටියේ රොෂාන් ය. ඔහු සමච්චල් සිනාවක් හෙළුවේ ය.

"ලොකැති ගණං උස්සන්නෙ කාර්වලිං ඇවිත් මගිං බහින නිසා වෙන්න ඇති නේ...?"

මගේ තොලකට වියළී යමින් තිබිණ. රොෂාන් කියන්නේ නාහෙට නාහන රස්තියාදුකාරයෙකි. තමන් ඉදිරිපිටදීම ඔහු මා අරබයා මේ විදිහට හැසිරෙද්දී සඳෙව් අයියා බලා ඉන්නේ කොහොමද...? ඔහුව මේ ප්‍රශ්නවලට පටලාගත නොහැකි ය. උගුරකට වියළී යන්නට ඇත. මම වෙර යොදා දොර වසන්නට හැදුවෙමි. නමුත් රොෂාන්ගේ හැඩි දැඩි අත්වල හයිය පරදන්නට මට පිළිවන් ද...?



"පුළුවන් ද දන්නෑ නේද මේ බ්‍රදර් එක්ක ටිකක් කතා කරන්න."

එවර රොෂාන් හැඹුරු වූයේ සඳෙව් වෙතට ය. සඳෙව් මදෙස බැලුවේ ය. මා අසරණව සිටි අයුරු ඔහු දකින්නට ඇත. ඒ දෑස්වල මා දුටුවේ එදා - මා ඔහු දුටු මුල්ම දා - ඔහුගේ බිමත් මිතුරෙකුගේ ග්‍රහණයට මා හසු වූ වෙලේ ඒ දෑසේ මා දුටු කෝපයමය. සඳෙව් අයියා ක්ෂණයකින් රිය දොර හැරගෙන බිමට බැස්සේ ය.

"ඇයි...? මොකද්ද ප්‍රශ්නෙ...?"

ඔහුගේ හඬේ දැඩි පිරිමිකමක් තැවරී තිබිණ. හවහරණ ගැන මහත් හැඟීමක් මට දැනිණ.

"නෑ නෑ මුකුත් ප්‍රශ්නයක් නෑ. ටිකක් කතා කරන්නයි පුළුවන් ද කියලා ඇහුවෙ...?"

"හොඳට කතා කරන්න පුළුවං. දං මොනාද මේ මිස්ටව මාත් එක්ක කතා කරන්න තියෙන්නෙ...?"

සඳෙව් අයියා කාර් එක ඉදිරියෙන් විත් මගේ ළඟින්ම සිට ගත්තේ ය.

"මේ බ්‍රදර් අපේ ආර්යාගෙ ඔෆිස් එකේ යාළුවෙක් වෙන්න ඇති."

"නෑ. මං ආර්යාගෙ ඔෆිස් එකේ නෙවෙයි."

"ආ එහෙමද...? ඔෆිස් එකේම වෙන්න ඕනයැ යාළුකම් පවත්වන්න...? නේද...?"

රොෂාන් මේ අරාඳින්නේ මොකාට එන්න ද...?

"මං තමයි මේ ආර්යාව කසාද බඳින්න ඉන්නෙ."

මට රොෂාන්ගේ කම්මුලට සෙරෙප්පුවෙන් ගහන්නට සිතිණ. මා සඳෙව් දෙස බැලුවේ තැතිගැන්මෙනි. ඔහු සාවඥ සිනාවක් හෙළුවේ ය.

"ආ... ඒ කියන්නෙ මේ මිස්ට ද රොෂාන් කියන්නෙ...?"

"ඒ කියන්නෙ මං ගැන දන්නව...?"

"අපෝ ඔව්. මට ආර්යා කියල තියෙනව, මිස්ට රොෂාන් ඉස්කෝලෙ යන කාලෙ ඉඳලම ආර්යගෙ පස්සෙං ආව කියල."

රොෂාන්ගේ මූණට මහාමාල සිනාවක් ආවේ ය.

"ආර්යා දන්නව මං එයාට කොච්චර ලව් එකක් තියනව ද කියල. ආර්යගෙ තාත්තටත් මං මේක කියලයි තියෙන්නෙ..."

"ඒ වුනාට ඉතිං... මිස්ට රොෂාන්ව මැරි කරන්න ආර්යා කැමති නෑ නේද...?"

රොෂාන්ගේ මූණ මොහොතකින් අඳුරු වූයේ ය.

"එයාගෙ කැමැත්තෙං අකමැත්තෙං වැඩක් නෑ. සිද්ධවෙන්නෙ ඒ දේ තමයි."

සදෙව් මදහසක් නගා ගත්තේ ය.

"ආර්යාව කවදහරි මැරි කරන්නෙ මම. මම සදෙව් බස්නායක. එහෙනං මිස්ට රොෂාන්... අඳුරගන්න ලැබුනට සන්තෝෂයි..."

සදෙව් ජයග්‍රාහී සිනාවකින් තොස් රියට නැගුණේ ය. දෙපා පණ නැතිවෙන්නට නොදී මම තොදින් හුස්ම ගත්තෙමි. දන් ඉතින් මා රොෂාන්ට බිය වන්නේ කුමට ද...? කියන්නට ඇති සියල්ල සදෙව් විසින් මනුට පවසන ලදී. ලැජ්ජාවක් ඇති මිනිසෙකු නම් රොෂාන් ආයේ මට කරදර නොකරනු ඇත. නමුත් රොෂාන් කියන්නේ ලැජ්ජාවක් ඇති මිනිසෙකු නොවේ කියා ද මම දනිමි.

මම අඩියක් දෙකක් පෙරට තැබීමි. රොෂාන් පැන මගේ අත්ගොබය තදකොට ඇල්ලී ය. මම හැකි වෙර යොදා අත නිදහස් කර ගත්තෙමි.

"මේ... මගෙ ඇඟට අත තියන්නනං හදන්නෙපා."



ඇඟිල්ලක් උරුක් කොට මා කීවේ දත්මිටි කමිනි. කෝපය මා දවමින් තිබිණ.

"ඇයි...? හිතාගෙන ඉන්නෙ වෙන කාටහරි කියල ඒක කරගන්න ද...?"

"මේ රොෂාන්. දන් දන්නවනෙ මං මැරි කරන්න කෙනෙක් ඉන්නව කියල. දැවත් මට මගෙ පාඩුවෙ ඉන්න දුන්නොත් හොඳයි."

"ආ එහෙමද හිතං ඉන්නෙ...? බලමු වෙන එකෙක් එක්ක යන හැටි. උඹ නයාට ඉහල පොල්ල වරද්දගන්න ආර්යා."

රවා බලා මම යන්නට හැරුනෙමි.

"ලොකු අතු අල්ලන්න ගිහිං පස්ස බිම ඇනගෙන වරෙංකො."

මම පුළුවන් තරම් පය ඉක්මන් කළෙමි. අහල පහළ වූ හැම නෙතක්ම මා වෙත දල්වී තිබිණි. මට දැනුනේ බලවත් ලැජ්ජාවකි. දන්නම් මා ලැජ්ජාව නිසා ඉවසා සිටින්නේ නැත. එහෙම වුනොත් මට රොෂාන්ගේ පදයටම නටන්නට සිදුවනු ඇත.

ගෙදර ගිහිනුත් නොයිස්සුමෙන්ම ඇඳට වැටුණා විනා මම අම්මාටවත් සිදු වූ දේ නොකීවෙමි. මේ අවනඩු කාටවත් කියා වැඩක් නොවේ. මගේ ප්‍රශ්න මමම විසඳගන්නවා මිස කාගෙන්වත් උදව් පතා පලක් නොවේ. එක අතකට මගේ පව්වලට කාටවත් පින් දිය නොහැකි ය.

"ය...තෝ... මේකි හිතාගෙන ඉන්නෙ... මේකි... මහ ලොකු... කෙරුමියක් වුනා කියලනෙ..."

තාත්තා කඩුල්ල පනින හඬ ඇසිණ. මය මා බලාපොරොත්තුව සිටි දෙයකි. රොෂාන් කේලම තාත්තාගේ කනේ නොගිගිඹෙන් පුදුම විය යුතු ය. ඒ හින්දා අද රාත්‍රියේ උදා වෙන අමිහිරි තත්ත්වයට මම ඉතා අපහසුවෙන් සූදානම් වෙමින් උන්නෙමි.

"මන්න අදත් කන්දොස්තිරියාව පටං ගන්න යන්නෙ. අර පිස්සු රොෂාන්ට මෙළේ හොඳ නැද්ද මන්ද මෙච්චර කෙල්ලෙක්ට බැල්දු වෙන්නෙ..."

නංගී නොරිස්සුමෙන් කියාගෙන එළියට ගියා ය. කොහොමටත් දන් ඈය සිටින්නේ මාත් එක්ක නොරිස්සුමෙන්ම ය. මා මොනවා කිවත් - කළත් ඈයට වැරදි ය. එයට හේතුව මම නොදනිමි. මා දන්නේ ඈයට මා වරදක් කර නොමැති බව විතර ය.

"ඈ බං ලොකු එකියෙ...? නැමැ ද උඹ ලොකු අත්තක් අල්ලගෙනෙයි කියන්නෙ...?"

තාත්තා කාමරයේ උළුවස්ස ළඟටම ඇවිත් තිබිණ. සාමාන්‍යයෙන් ඔහු කවදාවත් කාමරයට එන්නේ නැත. ඉස්තෝප්පුවේ සිට අපට කතා කරනවා පමණි. තාත්තාට අද හොඳටම සෝත්ති පොස් ඇතිවා විය යුතු ය. මම හෙමිහිට නැගිට ඇඳෙහි සිඳ ගතිමි. තාත්තාගේ දෑස්වලින් ගින්දර පිට වෙමින් තිබිණ.

"උඹේ කටේ පිච්චු ද...? මොකද්ද මේ කතාවෙ තේරුම...?"

කවදාවත් නැති තරම් උස් හඬින් ඔහු ගුගුළේ ය.

"මොකද අනේ මේ නැගෙන්නෙ...? දෙයියංගෙ නාමෙට ඒකිට වැඩ ඇරිල ආවකම පාඩුවෙ ඉන්න දෙන්නකො. මොකද්ද මේ කරුමෙ...?"

අම්මා තාත්තා පිටුපස වූවා ය.

"කරුමෙ...? කරුමෙ මගේ ද යකෝ...? නැත්තං මුංගෙ ද...?"

"මගේ රොෂාන්ගෙ සල්ලිවලිං ලෙඩිය බිච්චයි කියල... ඒකි ඒ මිනිහට කැමති නැත්තං මොනා කරන්න ද...?"

"කැමති නැතිවෙන්න හේතුව මොකද්ද කියල උඹ නිකමටවත් මේකිගෙං ඇහුව ද...? ආ...? ඇහුව ද...?"



එවර තාත්තා අම්මාගේ ඇඟට ගොඩ වූවා ය. තව ටිකකින් ඔහු ඇගේ කෙස් වල්ලෙන් අල්ලා ඈයට පහර දෙනු ඇත. පුරුදු ගීතියෙන් මම වෙව්ලන්නට වීමි.

"කැමති නැත්තෙ ඒ යකා රස්තියාදුකාරයෙක් නිසා. මගෙ කෙල්ල මේ පැලේ ඉපදුනාට ඒ වගේ මිනිහෙක් එක්ක යන්න ඕන නෑ. හිගන්නෙක් හරි කමක් නෑ. ඒකි හොඳ මිනිහෙක්ව හොයා ගනී."

"හොයාගනී...?"

තාත්තා සමච්චලයෙන් සිනාසුනේ ය. මා බියෙන් වෙව්ලන්නට විය.

"හොයාගනී නෙවෙයි යෝදියෙ. ඕය උඹ දන්න තරම තමයි. හොයාගෙන ඉවරයි. රස්සාවට ගිහිං මාස කීය ද...? ඒකි මේ ටිකට කාර් කාරයෙකුත් අල්ලගෙන. උඹ දන්නව ද ඒව...? ආ...? උඹ දන්නව ද ඒව...?"

අම්මාගේ උරයට පිටුපසින් මම විශ්මයට පත් නංගිගේ දෑස දුටිමි.

"පව් කතා කියන්නෙපා මනුස්සයො. තමුං ජාතික කරපු දරුවෙක්ට නේද ඔය කතන්දර හදන්නෙ...?"

"කතන්දර...? මේව මං කියන කතන්දර නෙවෙයි ගෑනියෙ. මේකිගෙ ඔය ලොකු කාර්කාරයා තමයි රොෂාන් මහත්තයට කියල තියෙන්නෙ..."

නංගී ඈයට පුරුදු සමච්චල් සිනහව නගනු මම දුටිමි. අම්මා මදෙසත්, තාත්තා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා ය.

"දූවගෙ කෙරුවාව එයාගෙංම අහගනිල්ලකො. හැබැයි ලොකු එකියෙ මේක මතක තියාගනිං. අර රොෂාන් මහත්තය වගේ රත්තරං කොල්ලෙක්ව නැතිවෙන්න අරින්නෙ නෑ මේ මම."

උරයෙහි දමාගෙන උන් ලේන්සුව ගසා නැවත කරෙහි දමා

සෙමින් සාත්තා නික්ම ගියේ ය. ඒ ලේන්සුවේ හඬු ගඳ තවත් ටික වෙලාවක් යන තෙක් කාමරයෙහි පැතිරෙමින් තිබිණ. බිමකින් කියව - කියවා සිටි සාත්තා නින්දට වැටෙන්නට ඇත. ඔහුගේ කියවීම නතර වූයේ එනිසා විය යුතු ය. තවත් ටික වෙලාවකින් අම්මා කාමරයට ආවා ය.

"ලොකු පුතේ... ආර්යා... කෝ නැගිටපං... නැගිටල බත් කටක් කාලා හිටිං..."

ඇයව වෙහෙසට පත් කිරීම පවකි. එහෙයින් අම්මා තවත් පෙරැත්ත කරන්නට පෙර මම ඇඳෙන් නැගිට ගතිමි. තවමත් හරිහැටි තොවියළුණ කඳුළු පැල්ලම්වල සීතල මට දැනිණ. ගවොම් කරින් කම්මුල් පිසිමින්ම මම කුස්සි කැල්ලට ගියෙමි. නහය ද මුරුල් වී තිබී තිත්දා මා හඬන්නට ඇතැයි අම්මා තේරුම් ගන්නට ඇත.

වෙනදාට බත් ටික බෙදාගත්තේ මා ය. නමුත් අද අම්මා මට බත් එක බෙදා දුන්නා ය.

"ම්... කාල හිටිං. බඩගින්නෙ නිදාගත්තනං එහෙම හාමත් වෙනව."

වංගෙඩිය මත හිඳ බත් කමින් සිටි නංගී බොරුවට කැස්සා ය. ඒ මට මලොක්කුවට වග මට නොතේරුණා නොවේ. නමුත් නිහඬව ඉන්නට මට සිදුව තිබේ.

"ආ ලොකු පුතේ... මොකද්ද අර සාත්ත කියවපු කරුමෙ තේරුම...? තවසට ආර්යා වැඩ ඇරිල එන්නෙ කාර් එකකිං කිව්වෙ...?"

සඳෙව් අයියා ගැන අම්මාට හැඟවීමේ උවමනාවක් මට වූයේ නැත. ඇය හැමදාම හිතුවේ මා කැඳවාගෙන යන්නට කුමාරයෙක් මංගල පෙරහැරකින් එවි කියා ය. නමුත් සඳෙව් බස්නායක ගැන අම්මාට කියන්නට මා පමා වූයේ, එහි අවසානය කෙසේ වේවි ද කියා ස්ථිර විශ්වාසයක් මටවත් නොවූ බැවිනි.



තවත් දුක හිතෙන කතාවක් අම්මාට සමීප කොට ඇගේ හදෙහි ගිනි අවුළුවන්නට මට උවමනා නොවූ බැවිනි.

"ඒ කතාව... බොරුවක්ම නෙවෙයි අම්මෙ. අදත් මාව ගෙනත් ඇරලුවෙ සඳෙව් අයිය. එතන රොෂාන් ඉඳල කතාවකට ආව."

"සඳෙව් කිව්වෙ අර හංසි ළමයගෙ අයිය...?"

"ඔව්."

"දෙයි හාමුදුරුවනේ... ඉතිං ඉතිං... රොෂාන් මොනාද කියෙව්වෙ...? අර ළමයි මොනව හිතන්න ඇද්ද...?"

නංගී නැවතත් සාවඥ සිනහව හෙළුවා ය.

"මොනා හිතන්න ද...? මේ දෙන්නගෙ මොකක්හරි හොරයක් තියෙනව කියලා එදා මගෙ පාටි එක දවසෙම මටනං තේරුණා."

නංගී කට දම්මා ය. අම්මා බෙහෙවින් උදහස් වූවා ය.

"කට වහගන්නයි කිව්වෙ. එනව මෙතන හැම එකටම කට දාන්න."

"අපෝ... අම්මට ඉතිං ලොකු දුව විතරනෙ හොඳ. බලමුකො ලොකු දුව මොනා කරගෙන එයි ද කියල..."

බත් පිඟාන් ගෙන නැඟී සිටි නංගී ගස්සාගෙන ඉස්සරහට ගියා ය. අම්මා ඇයට රැව්වත්, මට නම් කිසිදු හැඟීමක් පහළ වූයේ නැත. මා වැරැද්දකරුවියක් ද...? මගේ පවුලේ අයට මා නොදැනුවත්ව හෝ මගේ අතින් වරදක් සිදු වී තිබෙනවා ද...?

"අම්මේ... තව ටික දවසක් ගිහිං මේ ගැන අම්මට මං කියන්නයි හිටියෙ. සඳෙව් අයිය මාව බඳින්න කැමතියි කිව්ව. ඔක කියල ටික කලක් වෙනව."

අම්මා දෑස් ලොකු කරගෙන මදෙස බැලුවා ය.

"මං කිය කිය හිටියෙ ඔකට එයාලගෙ ගෙදරිං කැමති වෙන

එකක් නෑ කියලමයි. ඇත්තටම මට නංගිගෙ යාළුකමත් නැති වෙයි කියල මං බයේ හිටියෙ."

"එහෙනං...!"

අම්මා ද මට එකඟ වූවා ය. මට මද සහනයක් දැනිණ.

"ඒත් සදෙව් අයියා කියන්නෙ එයාට කවදහරි ගෙදරිං කැමැත්ත ගන්න පුළුවං කියලයි."

"ඒත් පුතේ.. නංගි ළමය මේව දැනගත්තොත්...?"

"නංගි දන්නව අම්මෙ. සදෙව් අයියත් කියල ඇති. මාත් නංගිට කිව්ව."

"ඉතිං...?"

"නංගිත් මේකට කැමතියි අම්මෙ."

අම්මාගේ මුහුණට සිනාවක් ආවේ ය. ඒ වගේ ලස්සන - අවසාන සිනාවක් මගේ මතක ඉතිහාසයේ කවදාවත් මා අම්මාගෙන් දැක තිබුණේ නැත.

"මගෙ කෙල්ලට රත්තත්තරේ පිහිටයි."

අම්මා ඉහළ බැලුවේ තිස්තුන්කෝටියක් දෙවි දේවතාවුන්ට පින් දීමට මෙනි.

"මං දැනගෙන හිටිය පුතේ.. උඹ මේ පැල්කොටේට අයිති වස්තුවක් නෙවෙයි කියල."

"ඒත් අම්මෙ... මං කිසි දෙයක් ගැන ලොකුවට බලාපොරොත්තු තියං නෑ."

"මං හෙටම පලේ පන්සලට ගිහිං බාරයක් වෙන්නං. මගෙ දරුවට වරදින්න විදිහක් නෑ."

අම්මා ඒ තරම් ස්ථිර විශ්වාසයකින් කතා කළේ කොහොමද කියා මම නොදනිමි. නමුත් ඇගේ ඒ විශ්වාසය මට මහත් ශක්තියක් සේ දැනුණ බව නම් කිව යුතුම ය.



රොෂාන් සම්බන්ධ සිද්ධිය එතෙකින් අවසාන නොවී ය. තව දින කිහිපයකට පසු එක රැයක රොෂාන් බීගෙන ඇවිත් අපේ ගේ ඉදිරිපිට කෑගැසුවේ ය. මා ඔහුට එකඟ නොවුනොත් අපේ ගෙදර ගිනි තබන බවට තර්ජනය කළේ ය.

"රොෂාන් මහත්තය කැමති දෙයක් කරන්න. අපිට මේකිව බලෙං කසාද බන්දෝල දෙන්න බෑනෙ."

රොෂාන්ගේ කෑමොර දීම අසාගෙන සිට අහවර අම්මා සන්සුන් ලෙස කීවා ය. අප දවා හළු කරන බැල්මක් හෙළාගෙන රොෂාන් යන්නට ගියේ ය. මට මතක හැටියට ඊට පස්සේ ඔහු වැඩිය මට කරදර කරන්නට ආවේ නැත.

මා කියන්නේ රොෂාන් සම්පූර්ණයෙන්ම වැදගත් මහත්මයෙකු වූ බව නොවේ. මඟ තොටේ දී මා දකින ඔහු ඇනුම්පදයක් හෝ කටකැඩිච්ච කතාවක් නොවරදවාම කියයි. නමුත් මට බලපෑම් කරන්නට එන තත්ත්වය අඩු විය. මේ ගැන තාත්තා මෙතෙවින් උදහස් වූවේ ය.

"කොපිට කෙණ ගහන්න ඕන යකුනේ. අර දෙයියෙක් වගේ මට කියන්හරි අතම්ට මොළොප්පු රත්තරං කද... ඒකාව තරහ කළා. මහ අම්මණ්ඩි මහ නපංසකම්තෙ කරල තියෙන්නෙ. දුවගෙ පැත්ත අරගෙන අර කොල්ලව ගෙදරිං දොට්ට දාල. ඒකෙං පාඩු වුනේ කාටද...? මේ මට. තවකට නිකං ඉඳල මගෙ සාක්කුවට වැටෙන රුපියල් සීය නැතුව ගියා."

මගේ පපුව දැවේ ය. තාත්තා හිතන්නේ මොනතරම් ප්‍රාථමික මට්ටමක සිට ද...? ඔහු ගැන අනුකම්පා කළ යුතු ය. නමුත් මට අප ගැනම අනුකම්පාවක් හෝ ආත්මානුකම්පාවක් ඇති වේ. මේ පවිකාර තාරාවලෙන් අප ගොඩ යන්නේ කෙසේ ද...? කවදා ද...?

"උඹ ඕව ගැන දුක් වෙන්න එපා ලොකු පුතේ."

මා සුසුම් හෙළනු දැක අම්මා කීවා ය. මට නංගි දෙස බැලිණ. ඇය දන් හැඩරුව පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වන බව බව පෙනේ.

"මේ හැමදේකිංම පාඩං ඉගෙන ගන්න නංගිට පුළුවං. ඒක නිසා මං ඔයාට කියන්නෙ මේ සිද්ධවෙන දේවල් දිහා බලාගෙන හොඳට ඉගෙන ගන්න කියලයි. වෙන ගොඩයාමක් අපිට නෑ."

නංගී සමච්චල් සිනාව මුහුණට ගත්තා ය.

"ඔයා වගේ සල්ලිකාර කොල්ලෙක්ව අල්ලගන්න ද...? අයියෝ... ඕකට මහලොකුවට ඉගෙන ගන්නම ඕන නෑ."

පැතපු ගමං ඇගේ කටට ගසන්නට මට සිත් විය. නමුත් මම මාව පාලනය කර ගතිමි.

"ඔය කිව්වෙ කතාවක්. අනේ ලොකු පුතේ මුං එක්ක දං කතා කරල පිරිමහන්න බෑ."

එය එසේයි මටත් සිතිණ. දෙයක් කී විට අසනා - පිළිගන්න කෙනෙකුට නම් කියන්නට පුළුවන. නංගී එහෙම කෙනෙක් නොවේ. මල්ලී එක්ක යමක් කතා කළත් නංගී එක්ක එසේ කළ නොහැකි ය. පණ්ඩිතයන් දහ දෙනෙක් එක්ක කතා කළත් එක මෝඩයෙක් එක්ක කතා කළ නොහැකියි කියා කතාවක් තිබේ. ඉතිං තවදුරටත් කතා නොකර මම කරබා ගතිමි.



# 13

**මන්සන්ධියේදී** රොෂාන් සදෙව් හා කළ බහින්බස් වීමත්, ඉන්පසු ඔහු අපේ ගෙදරටම ඇවිත් කළ තර්ජනයත් ගැන අප මල්ලීට කීවේ නැත. ඔහු සිටින්නේ ඉහවහ යන කොලුකම් සහිත වයසෙහි ය. කොහොමටත් මල්ලී දැන් දඩබ්බර වැඩි ය. මේ දේවල් දනගත් විට නාහෙට නාහන ඔහු රොෂාන් සමග පැටලෙන්නට හොස් තරදර ඇති කර ගනීවි කියා බයෙන් මල්ලීට මේවා නොකියා ඉන්නට මමත් අම්මාත් කතිකා කර ගතිමු. නමුත් දෙතුන් සතියක ඇවෑමෙන් ඔහුට එය ආරංචි වී තිබිණ. මල්ලී ගෙදර ආවේ වෙඩි වැදුන ඌරු නාම්බෙකු සේ ය.

"ඇත්ත ද රොෂාන් පාරෙදි අක්කට ඕනනැති පාට් එකක් දුම්මයි කියන්නෙ...? ඒ මදිවට ඌ මේ ගේ දොරකඩටත් ඇවිත් තර්ජනය කළා ලු නේද...?"

අම්මා කියන්නට වචන තෝරා බේරා ගත නොහැකිව ඇදිවතේ දැත් පිසදම්මා ය.

"ඇයි අම්මට කතා කරන්න බැරි ද...?"

මල්ලී කෑගැසුවේ ය.

"දං ඒව ඉවරනෙ මල්ලි."

මම අම්මාව අසරණ නොවන්නට පිළිතුරු බැන්දෙමි.

"ඉවර කතාවක් නෙවෙයි මං අහන්නෙ. එහෙම දෙයක් වුණා ද කියල."

"එහෙම දෙයක්... වුනානං තමයි පුතේ..."

"යකෝ මේව මට පිරිං ආරංචි වෙනකල් ගෙදර මිනිස්සු කියන්නෙ නැතෙ. මොකද මට ඕව හංගන්නෙ... මං දැං පිට මිනිහෙක් ද මේ ගෙදරට...?"

"අනේ මල්ලි එහෙම දේකට නෙවෙයි. මල්ලි ඕවට පැටලිලා තේරුමක් නැති කරදර ඇති කර ගනී කියලයි අපි කිව්වෙ නැත්තෙ."

"ඌ එහෙනං ඒ තරං චණ්ඩියෙක් වුනා ආ...?"

"අනේ මල්ලි අපි දැං ඕව අමතක කරල දාමු."

"ඊට පස්සෙ රොෂාන් අයිය අක්කට කරදර කරන්න ආවෙත් නැතෙ. එයාව බඳින්න කියල."

නංගි කතා කළේ අප කෙරේ සේන්හියකින් ද...? ඒ වෙලාවේ මට ඒ ගැන දුරට දිගට සිතන්නට අවස්ථාවක් උදා වූයේ නැත.

"අනේ මව් පුතේ. දැං ඉතිං අපිට අපේ පාඩුවෙ ඉන්න පුළුවන්නෙ. අනික් එක රොෂාන් දැං දන්නවනෙ අක්කව බඳින්න අර නංගි ළමයගෙ අයිය කැමති වෙලයි ඉන්නෙ කියල."

"ඌ හිතාගෙන ඇති ඌ ගමේ කෙරුමා කියල."

මල්ලි සේන්හියෙන් දක්මිටි කෑවේ ය. එක අතකට ගෙදර වැදගත් කාරණයක් ඔහුගෙන් සැඟවීම ගැන මල්ලිට දුකක් තිබෙන්නට පුළුවන. නමුත් අප එසේ කළේ ඔහුගේ යහපත ගැනම සිතීමෙන් නිසා අපට දුක් නොවී සිටිය හැක.

"මල්ලි දැං ඉතිං ඔය ගැන රොෂාන් එක්ක කතා කරන්න නොයා ඉන්න."

"මව්. අහක ඉන්න තයි අවුස්සගන්න ඕන නැතෙ."

නංගි ද අලගු තැබුවා ය. මල්ලි ඇය දෙස රවා බැලුවා ය.



"නයි...? නයෙක් නෙවෙයි යකෝ... මට ඌ නිකංම නිකං ගැරඬියෙක් විතරයි."

නංගි කට ඇද කර ගත්තා ය. එකක් ඉවර වෙන කොට තව එකක් පටන් ගැනීම ගැන මගේ හිතට නම් දැනුනේ විඩාවකි. අපට නිස්කාංසුවේ ජීවත්වීමට ඉඩක් ඇත්තේම නැද්ද...? ඒ අප කළ අතීත අකුසල කර්මයක විපාකයක් ද...?

ගෙදර ප්‍රශ්න නිසා හිතේ එක් පැත්තක් නිරන්තර දුකෙන්, සන්තාපයෙන්, බියෙන් හා අවිනිශ්චිතකමෙන් ඔද්දල්ව පැවතිය ද හිතේ අනික් පැත්ත තෘප්තව තිබිණි. ඒ සඳෙව් අයියාගේ ආදරය හා රැකියා ස්ථානයේ මට තිබුණ සැලකිල්ල නිසා ය. ආයතන ප්‍රධානියා මගේ අධ්‍යාපන කටයුතු ගැන බෙහෙවින් සැලකිලිමත් විය. වෛද්‍ය පීඨයේ අධ්‍යයන කටයුතු ඇරඹුන පසු හැකි අවස්ථාවල පමණක් රැකියාව කරමින් වෛද්‍ය අධ්‍යාපනය හදාරන්නයි ඔහු මට යෝජනාවක් කළේ ය.

"අනේ සර්, පොඩි කාලෙනං මාත් ආසාවෙං හිටිය තමයි ඩොක්ට කෙනෙක් වෙන්න. ඒත් දැං මට තේරෙනව සර්... එහෙම දේකට වියදං කරන්න තරං හයියක් මගෙ දෙමව්පියන්ට කොහොමටවත් නෑ. අනික් එක... කවුද දන්නෙ මං මෙඩිසින් සිලෙක්ට් වෙයි ද කියල."

"ආර්යා... ආර්යාට මං හැම තිස්සෙම කියල තියෙනව මමත් ඔයාගෙ තාත්තා කෙනෙක් කියල හිතන්නයි කියල. වෙන ළමයින්ට ඉන්නෙ එක තාත්තයි. ඒත් ඔයාට තාත්තල දෙන්නෙක්ම ඉන්නව. ඒක කොච්චර වාසනාවක් ද...?"

කල්ගාඩු මහතා හඩනගා හිනැහුණේ ය. සාමාන්‍යයෙන් ඔහු එසේ හැසිරෙන්නෙක් නොවේ. ඒ නිසාම ද මන්දා කිහිප දෙනෙක් ම අප දෙස බැලුහ.

"මට හිතෙනව ආර්යා මෙඩිසින් සිලෙක්ට් වෙයි කියල. මොකද දොස්තරකං කරන්න තරං හොඳ වාසනා ගුණයක් ආර්යාට

තියෙනවා. ඔයාගෙ වෛද්‍ය අධ්‍යාපනේට යන මුළු වියදම දරන්න මං පොරොන්දු වෙනව ආර්යා. ඒක කඩ නොවෙන පොරොන්දුවක්."

මට විශ්වාස කරගත හැකිකමක් තිබුණේ නැත. සල්ගාදු මහතා මා වෙනුවෙන් ඒ තරම් පරිත්‍යාගයක් කරන්නට හදන්නේ ඇයි...?

"ආර්යා හිතනව ඇති ඇයි මං එහෙම කරන්නෙ කියල. ඇත්තම කියනවනං... මට පුතෙක් හිටියනං මං ආර්යාව මගෙ ලේලි කරගන්නවා. ලබන ආත්මෙවත් ආර්යා මගෙම දුවෙක් වෙලා මගෙ ගෙදර උපදින්න ඕන කියන ප්‍රාර්ථනෙං තමයි මං ඔයාගෙ ඉගෙනීමට උදව් කරන්න හිතුවෙ. ඒ වෙනුවෙං මං වෙන කිසිම කිසි දෙයක් බලාපොරොත්තු වෙන්නෙ නෑ."

එහෙම පියවරු සිටිත් ද...? අපේ තාත්තා රොෂාන්ගෙන් ලැබෙන රුපියල් සිය වෙනුවෙන් මාව ඒ සල්ලිකාර පෙල්ලන්කාරයාට විවාහ කොට දෙන්නට හැදුවේ ය. ඒ තාත්තාත් මේ තාත්තාත් අතර කෙතරම් වෙනසක් තිබේ ද...? ඒ වෙනසට හේතුව ඇති හැකි පරතරය ද...? එසේ නොවෙයි මට සිතේ. සමහරවිට මේ අප ලබා උපන් හැටි වන්නට පුළුවන. දෙමාපියන් වැරදි කළා කියා ඔවුන් එක්ක තරහ වෙන්න දරුවන්ට නුපුළුවන.

"තාමෙවත් උදව් ඕන නෑ. ඔයාගෙ ස්ටඩීස්වලට වියදං කරන්න මට පුළුවං."

සල්ගාදු මහතාගේ යෝජනාව ගැන අසා සදෙව් තරමක් නොරිස්සුම් වූයේ ය. මම ඔහුගේ අත් ගොබයෙහි මූණ තියාගතිමි.

"වරිසියා කරන්න එපා. ඒ අපේ තාත්තා වගේ කෙනෙක්."

"අපි ඉක්මනට මැරි කරමු. මැරි කළාට පස්සෙ ඔයාගෙ ස්ටඩීස් ගැන බලාගන්න අයිතිය කොහොමත් තියෙන්නෙ මටනෙ."

"ඔයා කියන ඕන දේකට මං කැමතියි. ප්‍රශ්නෙ තියෙන්නෙ...



ඔය දේ කරන්න මිස්ට ඇන්ඩ් මිසිස් බස්නායක කැමති වෙයි ද කියන එක උඩ තමයි."

මම සිනහවක් දෙතොල් මත තබාගෙන, තරමක් බර කොට කතා කළෙමි.

"මං කිව්වනෙ මං ඒව ගැන බලාගන්නං කියල."

සදෙව් සැර කළේ ය.

"ඉසිං වච්චර ටෙන්ෂන් ගන්න එපා. මං නිකං කතා කළා විතරනෙ."

මගේ ස්වභාවයට සදෙව්ට සිනා ගියේ ය. ඔහු කෝපත් වෙන බොහෝ අවස්ථාවල, වචනයෙන් දෙකෙන් ඒ කෝපය නිවන හැටි දන් මම දනිමි. සමහර විට මා ඒ අවබෝධය රැගෙන එන්නට ඇත්තේ පෙර ආත්මයෙන් වන්නට ඇත. පෙර ආත්මවලදීත් මා ඔහුගේ පෙම්බර පාදපරිචාරිකාව වී ඉන්නට ඇත.

* * *

අවන්ත අයියාගේ පැතුම් ඉටු කරමින් අපි හන්තානේ ගියෙමු. සදෙව් හා හංසිලා එක්ක තවත් ගමන් කිහිපයකටම සහභාගි වෙන්නට මට හැකි විය. ඒ හැම වතාවකම ඔවුන් මට සැලකුවේ ඔවුන්ගේ පවුලට අයත් කෙනෙකු මෙනි. එය මට සැනසිල්ලක් විය. නමුත් ජීවිතයේ එක පැත්තක් විතරක් සැනසී ඇති වැඩක් නැත. අනිත් පැත්තෙහි ඇවිලෙන ගින්දරම විය.

මල්ලී හා රොෂාන් අතර බහින්බස්වීම් කිහිපයක්ම ඇතිව තිබිණ. අන්තිමට එය මගේ සම්බන්ධයක් නැති - රොෂාන් හා මල්ලී අතර වන ආරාවුලක් බවට පත්ව තිබිණ.

"ඊයෙත මං කිව්වෙ ආයෙ ඔය ප්‍රශ්නෙ ඇදල ගන්න එපා කියල."

මේ ගැන දැනගත් වෙලේ මම මල්ලීට නොමනාපය හැඟවීමි.

"නෑ අක්කෙ. නැත්තං ඌං හිතන්නෙ අපි නිකං පොල්කුඩු කියල. අක්ක අර මහත්තයත් එක්ක කාර් එකේ එන වෙලාවක වුනත් ඕකා ආයෙ අතං මතං කිව්වොත්... ඉඳල මොකට ද...?"

"නෑ මල්ලි. රොෂාන් එහෙම කරන එකක් නෑ."

"මං ඌට අඹරල තියෙන්නෙ ඉලිය. වැඩිය දඟළුවොත් ඌ මේ ගමේ ඉන්න නොවෙයි."

"අපෝ. මෙයා ඊතරං නෙරුම්."

නංගි පැත්තක සිට කට දම්මා ය. මල්ලි හැරී බැලුවේ දවෙන දෑසිනි. නංගි දත් දත් කකා කරන්නේම මුළු පවුලම ඇයට හතුරුකම් කරන හතුරු ජේනාවක් ගානට දමා ය. මේ වගේ සිතිවිල්ලක් කොහොම ඇගේ සිතට ආවා ද කියා මම නොදනිමි. ඇත්ත තත්ත්වය නම් මා හා මල්ලි තරමට ඇය දුක් වින්දේ නැති බවයි. මේ වගේ වෛරී චේතනාවකින් හැසිරෙනවා නම් එය කළ යුත්තේ මා හෝ මල්ලි ය. 'පොඩි එකී' කියා පාත් බාගයක් ගත්තත් අප වැඩි කොටස දුන්නේ ඇයටය. එහෙම නංගි අද මෙහෙම වෙනස් වී සිදීම හද දවන වේදනාවකි. නමුත් කරන්නට දෙයක් නැත.

ඒ සිදුවීමෙන් දෙදිනකට පසු උදයේ මම රැකියාවට යාම සඳහා සූදානම් වෙමින් සිටියෙමි. මල්ලිගේ මිතුරෙක් වේගයෙන් බයිසිකලය පැදගෙන අපේ ගෙමිදුල වෙත ආවේ ය. ඊයේ රාත්‍රියේ මල්ලි ගෙදර ආවේ නැත. දැන් ඔහු බොහෝ අවස්ථාවල රෑයේ ගෙදර නොඑන නිසා අපට එහි විශේෂත්වයක් නැත.

"මල්ලි මොනාහරි කියල එවල මගෙ හිතේ."

මල්ලිගේ මිතුරා එනු දැක අම්මා එහෙම කීවා ය. බයිසිකල්කරු බයිසිකලය නවතාගෙන හති දම්මේ ය.

"මොකද ළමයො... අපේ ළමයගෙං මුකුත් පණිවිඩයක් ද...? ඊයෙ රෑ ගෙදර ආවෙත් නෑ. එයාට දං ගෙදර නොඑන එක ගානක් වගක් නැතෙ."



"නැන්දෙ... නැන්දෙ... මේ..."

තරුණයා වෙතින් මට නැතිගැන්මක් දැකිය හැකි විය. හේතුවක් නොදනම මා තුළ ගැස්මක් ඇති විය.

"නැන්දෙ... සංජීවට වෙඩි තියල..."

මා කැරකෙනවා වාගේ මට දැනිණ. එවැනි කැරකිල්ලක් තුළ සිටියදිය මා දුටුවේ අම්මාව වැටෙන්නට යන බව. මා කොහොම පැන අම්මාව වත්තන් කරගත්තා ද කියා මමම නොදනිමි.

විලාපය ඇරඹුණේ එතැන් පටන් ය. අම්මා පපුවට අත් දෙකෙන් ගසා ගනිමින් හැඬුවා ය. මෙහෙම දෙයක් කෙසේ දරාගන්න ද...? තරුණයා කී විදිහට ඊයේ රාත්‍රියේ දී වෙඩි තැබීමකින් අනතුරුව රෝහලට ගෙන යද්දීත් මල්ලි මිය ගොස් හමාර ය.

මම හඬන්නට උත්සාහ නොකළෙමි. උත්සාහ කොට හැඬුම පාලනය කර ගන්නට ද මහන්සි නොවුනෙමි. සමහර වෙලාවට කඳුළු ගැළුවේ ය. සමහර වෙලාවට මම ගහක් ගලක් සේ ඔහේ බලා සිටියෙමි. මේ සිදු වූයේ නොසිදුවිය යුතුව තිබුණ දෙයකි. මල්ලී අනාගතය ගැන බලාපොරොත්තු ගොඩගසාගෙන සිටියේ ය. ඔහු ගත් හැම තීරණයක් - තින්දුවක්ම ගත්තේ අනාගතයේ සැපවත් ජීවිතයක් ගත කිරීම අරමුණු කරගෙන ය. ඒ තරමටම ඔහුට දුක කියන දේ තීරස වී තිබෙන්නට ඇත. ඒ ගැන මම කිසිවිටෙක මල්ලිට දොස් නොකියමි. නමුත් ඔහු සැපවත් ජීවිතයක් ළඟා කර ගැනීම සඳහා තෝරා ගත් මග පිළිබඳව මට සෑහීමක් නැත.

"ඔය වැඩේතං කරන්න ඇත්තෙ රොෂාන්. පහුගිය දවස්වල දෙන්නා නයයි මුගටියයි වගේ හිටියෙ."

"තිලක් අයියගෙ තරහකාරයෙක් මෙක කළා කියල තමයි අපිට හිතෙන්නෙ. මොකද... තිලක් අයියට සංජීව නිසා ලොකු ආරක්ෂාවක් ලැබෙනව කියල හැමෝම දනගෙන හිටිය."

මල්ලීගේ මරණයට හේතුව වශයෙන් ඔය කතා දෙකම තිබිණි. අවමංගල්‍යයට සහභාගි වූ අයගේ ප්‍රධාන මාතෘකාව වූයේ මේ මරණයට හේතුව අනාවරණය නොවීම ය. මල්ලීට වෙඩි තබා තිබුණේ ඔහු තනිව මග යමින් සිටිය දී ය. ඒ නිසා වෙඩි තැබීම කර ඇත්තේ කවුරුන් විසින්දැයි කාටවත් හරියටම කිව නොහැකි විය.

මා සිටියේ බලවත් කලකිරීමකින් හා සන්තාපයකිනි. මම මල්ලීට බෙහෙවින් ආදරය කළෙමි. ඇත්තම ඇත්ත නම් නංගීට වඩා සෙනෙහසක් පොඩි කාලේ සිටම මල්ලී කෙරේ මවෙත විය. හොරු අරන් ගියා වගේ දැන් මට ඔහු අහිමිව තිබේ. අනිත් අතට තාමට පමණක් තාත්තා කෙනෙක් හිටි මේ ගෙදර හිතේ හයියටවත් පිරිමියෙකුට හිටියේ මල්ලී ය. දැන් ඉතින් අප මේ පැල් කොටය ඇතුළේ එහෙම පිටින්ම අනාරක්ෂිත වනු ඇත.

තැඩිම වැලපීම් මැද්දේ අවමංගල කටයුතු අවසාන විය. මල්ලීගේ මරණය දේශපාලන වාසියක් කරගන්නට උත්සාහ කළ අය අපමණ වී ද, මගේ හිතේ රැව් දුන්නේ මල්ලීගේ සමීපතම මිතුරෙක් හෙළි කළ පුවත ය.

"මටනං හිතෙන්නෙම අක්කෙ මේක රොෂාන්ගෙ වැඩක් කියල."

ඔහු කීවේ ය. මම එකග නොවූනෙමි.

"ඒක හරියටම කියන්න බෑ මල්ලි. අනික් එක ඔය පොඩි බනින්බස්වීමක් තිබුණට, රොෂාන් එක්ක මරාගන්න තරං වෛරයක් අපේ මල්ලිගෙ තිබුණෙ නෑනෙ. මං හිතන්නෙ රොෂාන් වුනත් එහෙමයි."

"මං අක්කගෙං කාරණයක් අහන්න ඇත්තම කියනව ද...?"

"අහන්න. බොරුවක් කියන්න මට ඕන නෑ."

"මේ ළඟදි දවසක්... සංජීව ගෙදර කැඟැහුව ද රොෂාන් දකලනව වැඩියි... කරන්න ඕන දේ දන්නව වගේ දේවල් කියල."



"ඔව් ඔව්."

"අන්න ඒක රොෂාන්ට ආරංචි වෙලා තියෙනව අක්කෙ. මේක හරිම රහසිගත ආරංචියක්. අපිටනං හිතෙන්නෙ... මේ සිද්ධිය නිසා රොෂාන් සංජීවගෙන් පලිගන්න හිතල තියෙනව. සංජීවට වඩා ඉස්සර වෙන්නයි රොෂාන්ට ඕන වුනේ."

මගේ සර්වාංගයම පිළිස්සෙනවා සේ මට දැනිණි. රොෂාන් මල්ලීව මරා දැමුවා ද නැද්ද කියන්නට හරියටම මම නොදනිමි. නමුත් අපේ ගෙදර අර කී කතා බහ සිදු වූ බව ඇත්ත ය. එය රොෂාන්ගේ කනට ගියේ කොහොම ද...? තාත්තාව සැක කරන්නට පුළුවන. ඔහුට රුපියල් සීයක් පෙන්වූ විට සියල්ල පාවා දෙන නිසාවෙනි. නමුත් ඒ වෙලාවේ තාත්තා ගෙදර නොසිටි බව මට හොඳටම විශ්වාස ය. එහෙමනම් ඒ සිදුවීම රොෂාන් වෙත ඉගිළුනේ කෙසේ ද...? ආරංචිවලට අත්තටු මැවෙනවා ද...?

මා සිටියේ කොන්තුවාවෙනි. ඔළුව එහෙම පිටින්ම අවුල් වී තිබිණි. ජීවිතය ගැන මහත් අප්‍රුලක් පමණක් ඉතිරි වී තිබිණි. සති දෙකක් ගෙවෙන තුරුත් මම රැකියාවට පවා නොගියෙමි.

"දැං ඉතිං මිනිස් යන්න ආර්යා. ඔයා මෙහෙම ගෙදරට වෙලා කල්පනා කර කර හිටිය කියල කිසි දෙයක් වෙනස් වෙන්නෑනෙ."

හංසි මගේ හිත හදන්නට කොතෙකුත් උත්සාහ කළා ය. සදෙව් අයියා ද එසේම ය. නමුත් හදවතේ මල්ලී උන් තැන මට දැනෙන හිස්තැන පියවන්නට සමත් වෙන කෙනෙක් මේ ලෝකයේ නැත.

"එකම දෙයක් ගැන කල්පනා කර කර ඉන්නකොට ඔළුව පිස්සු වැටෙනවා. ඔයාගෙ මල්ලි නැති වුන එක ඔයාට දරන්න බැරි දුක්ක තමයි. ඒත් ආර්යා ඔයා මේ ජීවිතේ තවදුරටත් ඉතිරි වෙලා ඉන්නවනෙ. ඉතිං ඔයා දැං සාමාන්‍ය විදිහට දවසට මූණ දෙන්න ඕන."

හංසි කීවේ ඇත්තකි. මට හැමදාම මෙගෙම අඳුරු කාමරයට වී මල්ලී ගැන කල්පනා කරමින් හඬ හඬා සිටිය නොහැක. දැන් අයියේ මල්ලීගෙන් ගෙදරට වූ යුතුකම් ද ඉටු කරන්නට සිදුව තිබුණේ මටයි. මා රැකියාවට යා යුතු ය. වේලක් ඇර වේලක්වත් අම්මලාට කන්නට දෙයක් උපයා - සපයා දිය යුතු ය. අමාරුවෙන් හිත හදාගෙන මම යළි රැකියාවට යන්නට සූදානම් වුණෙමි.

"අනේ ලොකු පුතේ... මං දැං තනියම මේ ගෙදර ඉන්නෙ කොහොම ද ලොකු පුතේ..."

අම්මා නොනා කඳුළු අලුත් කර ගන්නා ය. ඇයට මේ දරාගත නොහැකි සිදුවීමක් බව මම දනිමි. පසුගිය දෙසතිය පුරාම මම උවැටැන් කරමින් සති නොකතියට ඇය ළඟ රැඳුනෙමි. නංගීගෙන් ඒ දේ බලාපොරොත්තු විය නොහැකි බව මා සේම අම්මා ද දනී.

"රස්සාව නැති කරගෙන බෑ අම්මෙ. ඒක නිසා අපි කොහොම හරි මේ දේවලට පුරුදු වෙමු."

මගේ තත්ත්වය අම්මා තේරුම් ගත්තාට ඇත. මම නංගි ඉදිරියේ කිසිදු ඉල්ලා සිටීමක් නොකළෙමි. මළගම දිනවල ඇය හැසිරුණේ මගේ හිත සම්පූර්ණයෙන්ම බිඳවමිනි. ගෙදර මරණයක් වූවාය කියා හැඟීමවත් ඇයට නැද්ද කියා මට සිතුනා තරම්. සරුංගලයක් වගේ ඒ මේ අත පාවෙච් මී දකුරුවේ මේ මළගෙයක් නොව මඟුල් ගෙයක් ලෙස සලකාගෙන මෙනි.

"මයා හිත හයිය කරගන්න එක හොඳයි. අපිට මේ ජීවිතේට මූණ දෙන්නම වෙනවනෙ ආර්යා."

සදෙව් අයියා මුදු ලෙස මහිත පිරිමැද්දේ ය.

"ඉස්සරට වඩා දැං මයාට ආරක්ෂාවක් ඕනෙ ආර්යා. මං ඉක්මනට මයාව මගෙ ළඟට ගන්නවා. මයා ඒ ගැන හිත කරදර කරගන්න ඕන නෑ. මං හෙමිහිට මේ ගැන අපේ අම්ම එක්ක කතා කරන්නං."



ඒ කියන්නේ ඉක්මනටම මට සදෙව් අයියා ද අහිමි වෙන්නට යනවා කියන එකයි. දෙයක් වෙන්නට තිබෙනවා නම් එය වැළැක්විය නොහැකි ය. ඒ නිසා වෙන දේකට මූණ දෙන්නට මම හිත හදා ගතිමි.

අශුභ දවස්වලටත් ශුභ පණිවිඩ පැමිණේ. මල්ලීගේ වියෝව ගැන තැවි තැවී සිටින දවස්වලම විභාග ප්‍රතිඵල පැමිණීම මට දැනුනේ එසේ ය. විෂයයන් සියල්ලටම අධි සාමාර්ථ සහිතව මා වෛද්‍ය පීඨයට සුදුසුකම් ලබා තිබිණ.

"දක්ක ද...? මං කිව්වෙ ආර්යා මෙඩිසින් සිලෙක්ට් වෙනව කියල."

හංසි බෙහෙවින් සතුටු වූවා ය. නමුත් එවන් සතුටකට ඉඩක් මගේ හිතේ ඉතිරි වී නොතිබිණ. මුළු හිතම ශෝකයෙන් පිරී තිබිණ. ප්‍රතිඵල ආවාට අධ්‍යයන කටයුතු ඇරඹීමට තව බොහෝ කල් තිබේ. ඒ නිසා මම තාවකාලිකව ඒ ගැන අමතක කොට දැමුවෙමි.

"අනේ දෙයියනේ කොල්ල හිටියනං අද මොනතරං සන්තෝස වෙනව ද...? මං කුලී වැඩ කරල හරි අක්කට දොස්තර විභාගෙ කරන්න සල්ලි හොයල දෙනව කිය කියනෙ හිටියෙ."

අම්මා හැම සිදුවීමකම මල්ලී දකිමින් හැඬුවා ය. හඬන්නටත් හයියක් නැතිව, මම දෑස තර කොට පියා සිටියෙමි.

කරදර එනකොට එක පෙළට එනවා කියන කතාවේ බොරුවක් නොවේ. අඩුල් තැවුල්වලින් හිත මදක් සුවපත් වෙන්නටත් කලින්ම තවත් ලොකු කරදරයක් අපට පිඩා ගෙන දෙමින් කවුළුව පැන ආවේ ය.

මත් නංගීත් නිදන්නේ අපේ එකම කාමරයේ තිබෙන එකම එක කබල් ඇඳෙහි ය. මේ කියන උදයේ මා නැගිටින විට නංගී ඇඳෙහි උන්නේ නැත. සාමාන්‍යයෙන් මා නැගිටින්දීත් ඇය නිදනවා වුනත්, මම මේ සිදුවීමෙහි විශේෂයක් නොදුටුවෙමි. අප ඇයව සෙව්වේ අම්මා තේ පිළියෙල කිරීමෙන් පස්සේ ය.

"පොඩි එකියේ... පොඩි එකියේ..."

අම්මා කිහි වරක්ම නංගීට හඬ ගෑවා ය. ඇයගේ 'හ්ම්' සද්දයක්වත් වූයේ නැත. හිත් තිගැස්සී ගියේ ඉනික්බිති ය. අපි ඇයව හැමතැනම සෙව්වෙමු. අන්තිමට මම කාමරය අවුස්සා බැලුවෙමි. පොතක් යට නංගිගේ කෙටි ලිපියක් විය.

"මම රොෂාන් අයියා එක්ක යනවා. මාව හොයන්න එපා."

එහි වූයේ එපමණකි. අම්මා දෑතින් පපුවට ගසා ගෙන හැඬුවා ය.

"මං ඇස් දෙකේ තියාගෙන හැදුවත් ඒකි විනාස වෙලා ගියා දෙයියනේ... මේ අසරණ මං මොනවයි කියල කරන්න ද...?"

අම්මා පව් ය. ඇය දරුවන් තිදෙනෙක් උස් මහත් කරන්නට අපමණ දුක් විඳි අම්මා කෙනෙකි. තාත්තා කෙනෙක් වගේ වෙහෙස වුණ අම්මා කෙනෙකි. එක දරුවෙක් අකාලයේ ඝාතනය කෙරිණ. බාල දියණිය අඩු වයසින්ම තරුණයෙකු සමග පැන ගොස් තිබේ. ඉතින් අම්මා විඳි දුකෙන් ඇති පලයක් තිබේ ද...? ඇයව තමන් විඳි දුක ගැන සැනසෙන්නට කාරණා ඉතිරි කර දෙන්නට බැරි වූ දරුවන් මොන තරම් අවාසනාවන්ත ද...?

"දූං ඉතිං මොනා කරන්න ද අම්මෙ..."

මම ඇඳ මතට වැටුනෙමි. වැඩට යාම පසෙක තබා මම ඇමදකි ඇලවුණෙමි. අම්මා හඬන හඬ ඇසේ. මගේ පපුව පැලීගෙන එනවා වගේ දැනිණ. එය හරියට ගිනි කන්දක් පිපිරීම සඳහා ලාවා කැකෑරෙනවා වගේ සංවේදනයකි. සියල්ල අවසානව තිබේ. මුකුත් නැති වී තිබේ.

මම කාලයක් තිස්සේ හීනයක් දක්කෙමි. අපේ පවුල විඳින මේ දුකින් ගලවාගැනීම ඒ හීනයයි. ඉගෙන ගන්නට පුළුවන් තරම් වෙහෙසුනේ අපට වෙන මාර්ගයක් නැති නිසා ය. දැන් මගේ ඉගෙනීමෙහි ප්‍රතිඵල පැමිණ තිබේ. බලාගෙන හිටි තැනට යන්නට



මට වරම් ලැබී ද තිබේ. නමුත් මා කාව එතැනට අරගෙන යන්න ද...? ජීවිතය අග්ගිස්සේ වැනි වැනී හිඳින අම්මාව හා තාත්තාව පමණක් එතැනට රැගෙන යන්න ද...?

හදිසියේම මට සිහිවිල්ලක් පහළ විය. නංගී රොෂාන් එක්ක පැන ගියේ මවුන් අතර ඇසුරක් තිබූ නිසාවෙනි. අපේ ගෙදර දී මල්ලි රොෂාන්ට එරෙහිව කිවූ දේවල් එහෙනම් රොෂාන්ගේ කන කැබුවේ නංගී ද...? එතෙක් නංගී ගැන ඇතිව තිබූ ශෝකය මරාගෙන මහත් කෝපයකුත් කළකිරීමකුත් මා තුළ ලියලා වැඩෙන්නට ගත්තේ ය.

"මල්ලිව මරාගත්තෙත් ඔකි තමයි."

මම ඉක්මනට නැගිට ගොස්, කුස්සියේ බිම හිඳ හඬන අම්මාට ඇසෙන්නට කීවෙමි. අම්මා කඳුළු දෝරෙගලන නෙතු ඔසවා, මදෙස බැලුවා ය.

"මාත් මේ ඊක හිතුව විතරයි ලොකු පුතේ."

මේ අවතැඩුවලට කාගෙන්ය කියා තීන්දු පතන්න ද...? අපම නඩු අසා අපිම තීන්දු දෙන්නෙමු. අපිම දුක් බිඳ අපිම හිත් හදා ගන්නෙමු.

මම ආයෙම විප් ඇඳට වැටුණෙමි. එක පිට එක මරණ දෙකක් සිදු වූවා සේ මුසල බවක් හාත්පස පැතිරී තිබේ. අප ගෙල සිඳගෙන තිබෙන්නේ අපගේම අත්වලින් නොවේ ද...?

"ආර්යා..."

නොතින්දේ වුනත් ඇස් තරකොට පියා සිටින් දී මට සිහිනයෙන් සේ සදේව් ඛස්නායකගේ හඬ ඇසිණ. ඔහුගේ අතක පහස මගේ නම්මූලකට දැනිණ. මම එහෙමම ඒ අත මගේ කොපුලට තද කර ගතිමි. සොරොව් බිඳුනා සේ කඳුළු ඉහිරෙන්නට ගත්තේ ය. කඳුළු..! කල්ප කාලයක් මා හදවතෙහි තිදන් කරගෙන ලෝකයෙන් වසංගාගෙන සිටි මගේ කඳුළු...!! කිසිදු ලැජ්ජාවක් හෝ බියක් නැතිව ඔහේ ගලාගෙන ගියේ ය.

"අඬන්න ආර්යා. ඇති වෙනකල් අඬන්න. මං ඔයාට කියන්නෑ අඬන්නෙපා කියල. මෙච්චර කාලයක් ඔයා අඬන්නෙ නැතුව හිටපු එකයි පුදුමෙ."

බොහෝ වේලාවක් හැඬීමෙන් දෙඩීමෙන් පසු මගේ පපුවට මද සැහැල්ලුවක් දැනිණ. අම්මා පමණක් නොව දරුවන් ගැන කවදාවත් කිසි වගකීමකින් කටයුතු නොකළ තාත්තා පවා බිම ඇල තියා කල්පනා කරමින් සිටියේ ය. ඔහුගේ මූණේ මා දුටුවේ දඩි පශ්චාත්තාපයකි. පසුතැවීම පසුවටයි කියා කතාවක් තිබේ. පෙර දී කළ වැරදි වෙනුවෙන් පසුතැවෙන්නට දැන් තාත්තාට සිදුව තිබේ.

පසුවදා හැන්දෑවේ මා වැඩ ඇරී ආ ගමන් ත්‍රිරෝද රියක් අපේ කවුළුල ළඟ නැවතිණ. අම්මාත් මමත් උවමනාවෙන් බැලුවෙමු. තාත්තා නම් සිහිය විකල් වීගෙන එනවා සේ තනිව මුමුණමින් සිටියේ ය. මුලින්ම කවුල්ල පැන්නේ කඩේ මුදලාලි ය. ඊට පිටුපසින් නංගී බිම බලාගෙන ආවා ය. මමත් අම්මාත් විශ්මිත වන්නට ඇත.

"අරකි නේද...?"

මේ වෙලාවේ නංගිව දුටුවා කියා අම්මා සොම්නස් වූයේ නැත.

"මහ එකාව ඉස්සර කරගෙන එන්නෙ මාව බය කරගන්න වෙන්නැති. අපුදෙංකො උන්ද."

"අම්මෙ, පොඩ්ඩක් කලබල නොවී ඉන්නකො. අපි බලමු මොකද වෙන්නෙ කියල."

මුදලාලි ගෙට ගොඩවූයේ කපටි සිනාවකිනි. නංගී නම් හයක් හතරක් නොතේරෙන කිරි සප්පයෙක් සේ බොරු රඟපෑමක් කළා ය.

"විමලාවති... මං මේ මේ ළමයව එක්කගෙන ආවෙ උඹල කලබල වෙලා ඇති කියල."



"නෑ නෑ. අපේ කිසි කලබලයක් නෑ. මෙකි ලියල ගිහිං තිබුණ ලියුමත් අරං ගිහිං අපි පොලිසියෙ ඇන්ට්‍රියක් දැම්ම. මෙකිත් මලා කියල මං හිත හදාගත්ත. මගෙ කොල්ලව මරාගත්ත එකී. උඹ මගෙ ඇස් දෙක ඉස්සරහට එන්න එපා."

පුදුම එඩිතරකමකිනි අම්මා කතා කළේ. මම පුදුම වීමි. තාත්තා පවුලේ සියලු වගකීම් අම්මාට බාර දුන්නා වගේ මුණිවතින් බලා සිටියේ ය.

"නෑ විමලාවති... දන්නැද්ද ඉතිං නරක වයසනෙ. දෙන්නා හිතුවක්කාර ගමනක් ගියා තමයි. දවාලෙ අපේ ගෙදරට ආව. දරුවොනෙ ඉතිං... අහක දාන්න කියලයැ. ඒත් මේ ළමයගෙ වයස සම්පූර්ණ නැති නිසා කසාද බන්දන්න නීතියෙං තහනං."

මුදලාලි ඒ වින තිබේ තමංගේ නම් කිසි වරදක් නැත, සියලු වැරදි ඇත්තේ නීතියේයැයි අපට හැඟවීමට මෙනි. කපටි මිනිස්සු..! එහෙනම් ඔහු මේ නංගීව ඉස්සර කරගෙන විත් තිබෙන්නේ අත සෝදාගෙන යාමට ය.

"ඒක යස කතාවක්නෙ. රෑ දෙකක් ගෙදරිං පිට හිටපු එකීව ආයෙ මේ ගෙදරට ඇරලවන්න ද මුදලාලි ආවෙ...?"

"මේ වෙලාවෙ වෙන ඉතිං මොනා කරන්න ද විමලාවතී...? අඩු ගානෙ වයස සම්පූර්ණ වෙනකල්වත් ඉවසන්න එපැයි. වයස එහෙම සම්පූර්ණ වුනාට පස්සෙ අපි මොනාහරි කරමුකො. නේද...?"

මුදලාලි පුටුවෙන් නැගිට්ටේ ය. අම්මාට දෙලොව සිහි වෙන්නට ඇත. ඇගට පතට නොදැනෙන සේ මුදලාලි ලිස්සා ගියේ ය. නංගී එහෙමම හිද හඬන්නට ගත්තා ය. කිඹුල් කඳුළු...! අම්මා ගස්සාගෙන එතැනින් යන්නට ගියා ය.

"අනේ මට සමාවෙන්න අක්කෙ..."

නංගී මගේ දෙපා මුල කඩාගෙන වැටුණා ය. ඇය පැමිණ

තිබෙන්නේ ලොකු වරදක් නොව ය. අපට පමණක් නොව ඇයටත් වරදක් කරගෙන ය. එහෙමය කියා කොහොම ඇයට පයින් පහරක් ගසන්න ද...? මට වඩා හාත්පසින්ම වෙනස් වූවාට ඇය එක බඩවැල කඩාගෙන ආ මගේ ම නංගී ය.

"වැන්දයි කියල ඇඬුවයි කියල ඔයා කරපු වරද හෝදල දාන්න බෑ නංගි. මන්දන්නෑ ඔයා දැං අනාගතේට කොහොම මූණ දෙන්න ද කියල–"

මට කියන්නට තිබුණේ එපමණ ය. ඇය සිය ජීවිතයට කරගනු ලැබ තිබෙන්නේ කොහොම නස්පැත්තියක් ද...? දැන් ඒ වරද කොහොම නිවැරදි කරන්න ද...?

"මටනං තේරෙන්නෑ ලොකු පුතේ දැං අපි මොනා කරන්න ද කියල."

මුළු ගෙදරම නිශ්ශබ්දව ගෙවුනු හෝරා කිහිපයකට පසු අම්මා මා විමසුවා ය. දෙන්නට පිළිතුරක් මට තිබුණේ නැත. නමුත් අම්මා නංගිව අත් නොහරින බව මම දනිමි. ගහේ ගෙඩි ගහට බරවැඩි නැත..!

වෙනදා ඒ මෝ වෙන්දි තාත්තාගේ බීමත් කැකොස්සමෙන් පිරී යන පරිසරය. දැන් අල්පෙනෙති තුවත් බිම වැටුණත් ඇසෙන තරම් නිහැඬියාවක් ගනී. තත්පරයක් නොපමණ දිගු ද කියා දැනෙන්නේ එවැනි නිහැඬියාවක දී ය. ඒ නිහැඬියාව මහා ඝෝෂාවක් සේ කන් අඩි පුපුරුවන්නට හදයි. ඒ නිහැඬියාව තුළ දුක් විඳිමින් සිටිය දී වාහනයක හඬක් ඇසිණ. ඊළඟට බල්ලන් රැනක් මහ හඬින් බුරා නැලෙන්නට පටන් ගත්හ. ඒවා එසේ සිදු වූවාය කියා මටනම් කිසිදු වෙනසක් දැනුණේ නැත. මම ඇඳට වී මහේ උන්නෙමි. ටික වෙලාවකට පස්සේ, හැරදමා තිබෙන අපේ ලෑලි දොරට තට්ටු කරන හඬක් ඇසිණ.

"ආර්යා... ආර්යා..."

ඒ හඬ හංසිගේ ය. මේ රෑ ඇ...? මම ඇඳෙන් බිමට පැන්නෙමි.



සමහරවිට නංගී ගැන පුවත අසා, මගේ හිත සනසන අටියෙන් ඇය එන්නට ඇත.

හංසි පමණක් නොව සඳෙව් අයියා හා නයනා ඇන්ටිත් ඉස්තෝප්පුවෙහි උන්හ. මට දැනුනේ පොළොව පලාගෙන මා ගිලාබහිනවා සේ ය. නයනා ඇන්ටි අපේ ගෙදර පැමිණි මුල්ම වතාව මෙයයි. මා සිටින්නේ මේ තරමම අපායකැයි දැන ගත්තාට පස්සේ පෙර දී සේ ඇය මට 'දුව' කියා කතා කරාවි ද...?

"ආර්යා... ඇස් දෙකත් ඉදිමිලා... හොඳටම අඬල."

හංසි මා ළඟටම විත් මගේ දෙළරහිස් වටා අතක් යවා ගත්තා ය. ඇස් දෙක ආයේම බර වීගෙන එනවා මට දැනිණ.

"ජීවිතේ තියන්නෙ ප්‍රශ්නවලට උත්තර හොයන එක තමයි දුව."

කියාගෙන නයනා ඇන්ටි ද මවෙත ආවා ය. එසේ නම් ඇය මට 'දුව' කියා කතා කළා ය. මට සැනසිල්ලක් දැනිණි ද...?

"ජීවිතේ කොයි මට්ටමක හිටියත්... හැම මනුස්සයෙක්ටම ප්‍රශ්න එනව ආර්යා. ජීවත් වෙන කාලෙ පුරාම අපි කරන්නෙ ඒ ප්‍රශ්නවලට උත්තර හොයන එක. එක ඔයාට විතරක් පෞද්ගලිකව සිද්ධ සිද්ධ වෙච්ච දෙයක් නෙවෙයි."

මුදල් හදල් යහමින් තිබුණොට, සමාජයෙහි හොඳ තත්ත්වයක් ඇති කරගෙන තිබුණොට ඔවුන් කෙතරම් නිහතමානී මිනිසුන් ද...? ඔවුන්ගේ ජීවිත සරුවපිත්තල ලෝකයක් සේ අපට පෙනුණාට, ඔවුන් ජීවිතය දෙස බලන්නේ කෙතරම් අර්ථයක් ඇතිවද...?

"ජීවිතේ තියන්නෙ මේ මොහොතයි අතීතෙයි විතරක් නෙවෙයි දුව. ජීවිතේට අනාගතේත් අයිතියි. ඔයාට ලස්සන අනාගතයක් තියෙනව. පැහැදිලි අනාගතයක් තියෙන නිසා ඔයාට බය නැතුව ඒ අනාගතේට මූණ දෙන්න පුළුවං."

"අනේ ඇන්ටි... මෙහෙම ඇවිත් මාත් එක්ක වචනයක් කතා කරල යනවට වුනත්... මං ඇන්ටිලට කොහොම පින් දෙන්න ද...?"

නයනා ඇන්ටි මදහසක් නගා ගත්තා ය.

"මං ආවෙ පිං බලාගෙන නෙවෙයි ආර්යා. ඔයාව එක්කං යන්න එනව කියන්න."

"එක්කං යන්න...? කොහෙද ඇන්ටි...?"

මම නයනා ඇන්ටි දෙසත්, තවමත් ඉස්තෝප්පුවේ කෙටි තාප්පය ළඟ සිටගෙන සිටින සදෙව් අයියා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවෙමි. සදෙව්ගේ ඇස්වල තිබුණේ පෙම්වතෙකුගේ දෑසක දකිය හැකි හිතුවක්කාර සෙනෙහසක් නොව, ස්වාමිපුරුෂයෙකුගේ දෑසක දකිය හැකි විදිහේ සන්සුන් සෙනෙහසකි.

"අපේ ගෙදරට ආර්යා. වෙන කොහෙද...?"

"අනේ ඇන්ටි... අම්මල තනියම දාල... අනික් එක... මල්ලි හැකි වුනා විතරයි. මං ඉන්නෙ ගමං යන්න පුළුවං තත්ත්වෙක නෙවෙයි."

"කවුද ළමයො ගමං යන්නෙ... මං කිව්වෙ අපි ඔයාව නැන්දගෙන යනව කියන්න ආව කියල. අපේ ගෙදර ලේලි විදිහට... අපේ එකම පුතාගෙ ජීවිතේ අලුතෙං උපද්දවන ආදරණීය වයිෆ් විදිහට."

මට ඇහුණේ හැබෑවක් ද...? නැත්නම් ඒ හීනයක් ද...? මම තෙතු පිය හොඳින් ගසා බැලුවෙමි.

"ඇයි... මගෙ පාළු කපන නැනා පොඩ්ඩ විදිහට."

හංසි කවටකමක සරින් කිවා ය. එසේනම් මේ හීනයක් නොවේ. මම ඈතින් සිටින අම්මා දෙස බැලුවෙමි. ඇගේ ඇස්වලට



කඳුළක් පුරා දිළිසෙමින් තිබිණ. ඒ කඳුළ ඇගේ වැහැරුණ කොපුල් දිග රූරා වැටෙන්නට පෙර මම අම්මා වෙත පැන්නෙමි. ඈ සිය දුක් විඳි පපුවට මාව තුරුලු කර ගත්තා ය.

ඒ හීනය අයිති අම්මාට මිස මට නොවේ. ඒ හැබෑ වූයේ අම්මාට මිස මට අයිති හීනයක් නොවේ.

"ආර්යා වගේ දුවෙක් හදපු අම්ම... ලෝකෙට වෙන මොනාවත් නොකළට කමක් නෑ. මෙහෙම දුවෙක් හදල මගෙ පුතාට දුන්නට... ආර්යාගෙ අම්මට පින් සිද්ධ වෙන්න ඕනෙ. අපි ඉක්මනට මේ දරුවංගෙ කටයුතු පිළිවෙලක් කරමු අක්කෙ."

"අනේ... එහෙමයි නෝනෙ..."

"මට නංගි කියන්න අක්කෙ. දැං ඉතිං අපි එක පවුලක උදවියනෙ. කසාද බැන්දය කියල ආර්යාගෙ අධ්‍යාපන කටයුතුවලට කිසිම බාධාවක් වෙන්නෙ නෑ."

"දොස්තර නෝනා නෙතෙක්වම මැරි කරන එක හොඳයි. මොකද... අපේ අයියට විතක් පිස්සුනෙ. ගෙදරදීම බෙහෙත් කරන්න පුළුවං වේවි."

හංසි විහිළුවක් කළා ය. කඳුළු සයුරේ කරවටක් ගිලී උන් අම්මාගේ මුවට පවා සිනාවක් ආවේ ය. තාත්තා ද අහක බලාගෙන සිනාසෙනවා මම දුටිමි. අඳුරු කාමරයේ දොරකඩින් මම නංගීගේ මුව දුටිමි. ඇය අභිංසක ලෙස බලා සිටියා ය. මට මල්ලීව නතර කරගත නොහැකි විය. අතරමගක දී වුව නංගීව යළි නතර කරගත හැකි වීම පෙර පිනකැයි ඒ වෙලාවේ මට සිතිණ.

- අවසානයි -

kathapothak.blogspot.com

# සමනළයෙකුගෙන් පාර ඇසුවෙමි

## ගංගා ෂයිනි ගමගේ

කුසෙහි නොව වෙන කොහේදෝ මා නොදන්නා මට නොතේරෙන තැනක හිස්වීමක් පිළිබඳ හැඟීමක් නම් යටි හිත පහුරුගාමින් තිබිණ. ඒ අඩුව කුමක්දැයි හඳුනා ගන්නට මට ඕනෑකමක් තිබුණේ නැත. හැකිනම් එය හඳුනාගන්නට මම බිය වෙමි.

kathapothak.blogspot.com

ISBN - 978 - 955 - 667 - 173 - 5

මිල රු. 400/-

පහන් ප්‍රකාශන

717/1, මරදාන පාර, කොළඹ 10.
(011) 5 852714, (011) 4 965629
E-mail : pahanpub@hotmail.com